යෞවන සමීන්ද්‍ර රත්නායක
YAWWANA SAMEENDRA RATHNAYAKA



# සුළං කුරුල්ලෝ 2

http://e-pusthakalaya.blogspot.com

# හුළං කුරුල්ලෝ - 2

## යෞවන සමින්ද්‍ර රත්නායක

The Reader...
http://e-pusthakalaya.blogspot.com/
Sinhala Novels

kan e-community

යෞවන සමින්ද්‍ර රත්නායක
ටගේන් ප්‍රකාශන
අංක 41/2,
තිස්ස පාර,
මොණරාගල.
දුරකතන : 077 - 6885563
yawwana@gmail.com
Facebook

දෙවනි මුද්‍රණය 2012 ජුනි

# පුළිං කුරුල්ලෝ - 2

I. S. B. N. 978 - 955 - 98724 - 0 - 5

කවර නිර්මාණය : විහංග නයනජිත්

පරිගණක අක්ෂර සංයෝජනය : දිනුෂා විරාජිනී

කවරයේ කර්තෘ සේයාරුව : විහංග නයනජිත්

ප්‍රකාශනය හා බෙදා හැරීම : යෞවන සමින්ද්‍ර රත්නායක
වශේන් ප්‍රකාශන
අංක 41/2,
තිස්ස පාර, මොණරාගල.
දුරකතන : 077 - 6885563
yawwana@gmail.com
Facebook

මුද්‍රණය : තරංජි ප්‍රින්ටර්ස්, මහරගම.

Uploaded by SIRRIUS + Handaya

# කර්තෘගෙන් :

මේ පළවන්නේ **සුළං කුරුල්ලෝ** නවකතාවේ 2 වන කොටසෙහි නවතම මුද්‍රණයයි. විහඟ වික්‍රමසිංහ, ෂහනාස් මොහොමඩ් හා අංජලී විදානපතිරණ අතර ඇදී ගිය මේ ත්‍රිකෝණාකාර ප්‍රේම කතාවේ පළමු කොටස නිමවූයේ විහඟ, අංජලී සමග ප්‍රේමයෙන් බැඳීමෙනි. එයින් ඉක්බිතිව ගලා ගිය රසබර සිදුවීම් වලින් මෙම දෙවන කොටස ලියැවී ඇත. මෙය පාරමී යොවුන් පුවත්පතෙහි පළවූ නවකතාවක් වන අතර ඒ අවධියේදී පුවත්පතෙහි වැඩිම පාඨක ප්‍රතිචාර හිමි කරගත් නවකතාව ද වේ. බොහෝ පාඨකයින් මෙම නවකතාවේ එන 'ෂහනාස්' නම් වූ මුස්ලිම් ජාතික යුවතියගේ චරිතයට, මා හට සිතා ගැනීමටවත් අපහසු තරමේ ලෙංගතුකමක් දැක්වූ අතර ඔවුන් මට එවූ ලිපි හා නිසඳැස් වලින් බොහොමයක්ම අකුරු කර තිබුණේ ෂහනාස් වෙනුවෙනි. 'ෂබී' යන ලෙංගතු නාමයෙන් හැඳින්වෙන ෂහනාස්, ප්‍රධාන චරිතය වන විහඟ නොහොත් 'පාට්නර්' ටත් වඩා ජනප්‍රිය වෙද්දී මම පුදුමයට පත්වීමි. එසේම, නිරන්තර අදහස් දැක්වූ දුරකතන ඇමතුම් දුන් පාඨකයින්ගේ අදහස වූයේ පාට්නර් හා ෂබී අවසානයේ එකතු විය යුතුය යන්නයි. 'පාරමී' ප්‍රධාන කර්තෘ ලලිත් රෝහිත මිතුරාට ද ඔවුන් දුරකථන ඇමතුම් දී කතාව මේ මේ ආකාරයට නිමාවිය යුතු යැයි සතිපතාම වාගේ දැනුම් දී තිබිණි.

එසේ නවකතාවේ එන මද්දු, චූටි ඩොක්ටර්, රාජ් යන චරිත ද බොහෝ පාඨකයින්ට තමන්ගේ ළඟම හිතවතුන් ආකාරයෙන් සිත්වලට බැඳී තිබුණි. කතාව පත්‍රයේ පළවෙද්දී එය පොතක් වශයෙන් එළි කරන්නට යැයි මා උනන්දු කළේ ද මාගේ සුවහසක් පාඨකයින්ය. ඒ ගැන මම ඔවුන් හට තුති මල් මිටක් පුදමි.

**සුළං කුරුල්ලෝ** මාගේ මුද්‍රණ ද්වාරයෙන් පිටවූ පළමු නවකතාවයි. **හිතට දුකයි ආදරියේ** හි මුලික කොටස් මුලින් ලියැවුණද ප්‍රථමයා වූයේ **සුළං කුරුල්ලෝය**. එතැන් පටන් ගෙවී ගිය අවුරුදු දහයක පමණ කාලය තුළ මා අතින් නවකතා විසි හතරක් නිර්මාණය වී තිබේ. විසිපස් වන නවකතාව ලෙස **ගුඩ් බායි රම්** හෝ **ආදරණීය බෙකම්** මේ 2012 වසරේදී එළි



SL-UNLIMITED

දැක්වෙනු ඇත. මේ සියලු දෑම පිටුපස සිටි මාගේ ආදරණීය පාඨකයින් හට තුති පුදන්නට ද මම මෙය අවස්ථාවක් කර ගනිමි.

අති දැවැන්ත වූ නවකතා ක්ෂේත්‍රයේ මේ තරම් දුරක් පැමිණීමට මා හට හැකිවූයේ ඔබ සියලු දෙනාම මා සමඟ සිටි නිසාය. මට නිරන්තරයෙන් දිරිය, ශක්තිය පැතූ නිසාය. ඔබලා වෙනුවෙන් දිගින් දිගටම මගේ පෑන ගිජ හාල්මිට කොල අතරේ සැරිසරන බවත් අවසානයේ සඳහන් කරමි.

ඔබ සැමට ජය..!

යෞවන සමින්ද රත්නායක
අංක 41/2, තිස්ස පාර
මොණරාගල.

දුරකතන : 077 - 6885563
yawwana@gmail.com
Facebook

SL E-Books
The Spirit of Sri Lanka



Uploaded by SIRRIUS + Handaya

# පිදුම..

පඬු පාට සඳ එළිය සීතල පින්නත් එක්ක එකතුවෙලා හිනාවෙද්දි ඔයගේ තුරුළේ ඉඳන් ඔයා හිනාවුණේ පුංචි සුරංගනාවියක් වගේ. ඇත්තමයි.. මට හිතුණෙ මගේ ලෝකෙට පුංචි සුරංගනාවියක් හොයරන් ඇවිල්ලද කියලයි. ඔයාගෙ හිනාව ඒ තරම් ලස්සනයි. ඔයාට මතකද.. ඉස්සරම ඉස්සර.. ඔයයි මමයි විතරයි. අපි දෙන්නගෙ හැමදේකටම හිටියෙ අපි දෙන්නා විතරයි. රෑට නිදාගන්න ගියහම, සමහර දවස්වලට ඔයා හීනෙන් බයවෙලා මාව තුරුළු කර ගන්නවා. මම බුදු ගුණ ගාථාවක් කිය කියා ඔයාට නින්ද යනකන් ඔයාගෙ ඔළුව අතගානවා.

ඔන්න ඉතිං පහුවෙගිද්දා උදේට ඔයා දැකපු හීනෙ කියන්න ගන්නවා. අපොයි.. ඒකෙ කෙළවරක් නෑ.. අගක් මුලක් නෑ. කොහොමහරි මට ඔෆිස් යන්නත් පරක්කු වෙනවා. හීනෙ අහන්නැතුව යන්නත් බෑ. ඔයාගෙ හිත රිද්දගන්නත් බෑ. මං කරන්නෙ ඔයාවත් උස්සගෙන ඔෆිස් එකට යන එක. විනාඩි දහයක්වත් යන්නෑ. 'අනේ හරිම බඩගිනියි' ඔයා කෑගහනවා. ඉතිං හැම වැඩක්ම පැත්තකට දාලා, මං ඔයාවත් අරගෙන කෑම කන්න දුවනවා. අනේ.. ඒ දවස් හරිම සුන්දරයි. බාහිර ලෝකයේ විසකටු ගැන දැනීමක් නැතුව තමන්ගේ පාඩුවේ ඉඳපු ඒ දවස් හරිම ලස්සනයි. ඔයා ඒ.. ලස්සන දවස්වල.. හිටපු විදියටම පුංචියටම හිටිය නම්..?






SL-UNLIMITED

# වෙන්වීම

ජීවිතයට හිමිවෙන්න ඕන හැම දෙයක්ම අත ළඟටම ඇවිදින්, හිතාගන්නවත් බැරි විදියට අහිමිවෙලා ගියහම හිතට දැනෙන පසුතැවීම ගැන කියන්න එක වචනයක්වත් හිතට එන්නෑ. ඒක දුකක්. හිත පුච්චල දාන මහා දුකක්. සතා කරගන්න බැරිවෙලා ඇස්වලින් උණුම උණු කඳුළු එළියට පනින්නෙ ඒ පිච්චෙන හිතේ රස්නෙට.



''නොවරදින දියක සියපත් නොපිපෙන සේම..
ඔබ මට අහිමි බව වාවන්නද නෝම..
හිනැහෙන වසන්තය දැක දැක කඳුළේම..
ගිමකල මියැදෙමි ඔබටත් නොකියාම....''

අපි අපේ ජීවිතේටත් වැඩියෙන් ආදරේ කරපු කෙනෙක්ගෙන් ඈත්වෙලාම යන්න උනොත්, ඒ දුක අපි දරාගන්නෙ කොහොමද..? ඇත්තටම මේ හැමදේම අතරෙ අපි අතරමං වෙනවා. ඒක අපි කාටවත් පොදුයි. තනිකමේ මහා දුකෙත් අපි වල්මත් වෙනවා. අපේ ජීවිතයත් එක්ක බද්ධවෙලා තිබුණු හැම දෙයක්ම මතක්වෙනා මතක්වෙන පාරක් පාරක් ගානෙ, පපුව දාලා පිච්චිලා යනවා. මොකක්දෝ කියාගන්න බැරි අසරණකමකින් හිත සිරිහැවිල යනවා. ඒත් ඉතිං ... හැමදේටම වැඩිය දුක දැනෙන්නෙ, මේ හැම දෙයක්ම හිතේ දරාගෙන අපිට ජීවත්වෙන්න වෙලා තියෙන හන්දා. ඒ තමයි අපේ ආදරේ අපිට ඉතිරි කරල ගියපු සදාකාලික දායාදය..!

AFTER MY DEATH,
I'LL MOVE UP TO SKY..
I'LL WRITE BY YOUR NAME ON EVERY STAR...
SO... YOU LOOK UP EVERY NIGHT AND SEE....
HOW MUCH
I LVED YOU...!



Uploaded by SIRRIUS + Handaya




කැමරාවත් බෙල්ලෙ එල්ලගෙන මං ගෙදර එනකොට හුඟාක් හවස් වෙලා. යොවුන් පත්තරේක මුල් පිටුවට දාන්න මින පිංතූර වගයක් ගන්නයි මං ගියේ. ඒත් ඉතිං වහින්න වගේ තිබ්බ හන්දා ඒ වැඩේ සම්පූර්ණයෙන්ම අබ්ලික් වුණා. බොහොතකටවත් පිංතූරයක් ගන්න බැරිවුණ හන්දා මට නිකං සාංකාව වගේ. බෑක් ග්‍රවුන්ඩ් එක කට්ට කළුවෙ තියෙද්දි මොන පිංතූරද අප්පා.

කැමරා එක කාමරේන් තියලා ෆ්‍රිජ් එකේ තිබ්බ ලීටරේ කුල් වතුර බෝතලේ තුන් කාලක් විතර මං ඇදල ඇරියා. මොකෝ අතින් පයින් යනවද..? කුල් වෙන්නෙ මගේ බඩනෙ.. ගලවපු ටී ෂර්ට් එකත් අතේ ගුලි කරන් මං ආවෙ වොෂින් මැෂින් එකට ඒක ඔබන්න.. කොහෙද.. තත්පරයක්වත් ගියේ නෑ ටෙලිෆෝන් එකේ අඳෝනාව සාලෙන් ඇහුණා. අම්මපා මගේ එකක් නෙමෙයි නම් ඔය ෆෝන් එක මං පොළේ ගහලා හුඟාක් කල්.. මේ ඉර බහින වෙලේ මොන බහිරවයද මංදා..

"හලෝ.. විහඟ හියර්.."

"ආ..‍ ඇත්තද.. ෂුවර් එකටම ඔය විහඟද..?"

විහඟ නොමෙයි නම් කවුද යකෝ මේ කතා කරන්නෙ..? මට තදවුණා.

"ඔව්.. මං විහඟ.. විහඟ වික්‍රමසිංහ.. ඔය කවුද කතා කරන්නෙ..? මොනවද කොරන්න ඕන..?"

මං ටිකක් සීරා විදියට කතා කරා. ඒත් එහා පැත්තෙන් කතා කරන එකාව මට හෝට් වුණේ නෑ.

"මං මේ දේවානම්පියතිස්ස කතා කරන්නෙ.. මචං.. මගෙ මුවා එහෙම ඔය පැත්තට ආවද..?"

මොකා..? පිස්සෙක්ද මංදා.. මුවෙක් ගැන අහන්නෙ.. මට මල පැනගෙන ආවා. එක්කො පිස්සන් කොටුවෙන් පැනපු මල යකෙකුට මගේ ෆෝන් නම්බරේ අහුවෙලා.. හපොයි බලන් ඉඳල බෑ.. තව ටිකක් තදට කතා කරන්නෝන.. මං එක හිතින්ම හිතාගත්තා.

"කවුද යකෝ..?"

"මුවා බං.. මුවා.."

එහෙම කියලා එහා පැත්තෙන් කතා කරපු බූරුවා ෆෝන් එක තිබ්බා. මට දැන් ඩබල් එකේ මල. ෂිකේ.. මටමනෙ යකෝ මෙහෙම දේවල් වෙන්නෙ.. මද්දු අයියා ආවහම කියන්න ඕන දේවානම්පියතිස්ස රජ්ජුරුවො කතා කරා කියලා. හුටා යකෝ.. එතකොට පොර මැරිලා නැද්ද..? මෙහෙම ගියොත් නම් මටත් පිස්සන් කොටුවෙයි නතර වෙන්න වෙන්නෙ.. ඒත් ඉතිං.. මේ කතා

The Spirit of Sri La

කරපු පොලොස් කොට්ටෝරුවා මොකාද..? මද්දු අයියවත්ද..? ඕකටනෙ ඔය වගේ ඩෙංගු උණ තියෙන්නෙ.. එහෙම හිතලා මං ආයෙත් කෑම කාමරේට යන්න හැදුවා විතරයි මෙන්න බොලේ ෆෝන් එක ආයෙත් රිං වෙන්න ගත්තා.. ඒ පාර මොකාද..? ආයෙත් අර දේවානම්පියතිස්සයාද දන්නෑ.. කෝකටත් කියල මං විතක් සැකෙන් ෆෝන් එක ගත්තා.

"හෙලෝ.."

"ආ.. මචං.. හලෝ ද කතා කරන්නෙ.. මං මේ මුවා කතා කරන්නෙ.. දැන් ටිකකට කලින් දේවානම්පියතිස්ස කතා කරල මාව හෙව්වද..?"

"ඈ බොල හැටගෙ පුතෝ.. මුවෙක් කොහොමද යකෝ කතා කරන්නෙ.. තොගෙ ආච්චිට.."

මගේ ශබ්ද කෝෂෙ මං දන්න හොඳම සිංහල වචන සෙට් එක මං ඇදල ඇරියා. ඇයි යකෝ තද වෙන්නැද්ද..? එක එකා මගෙ ලේ කෝප කරනකොට.. මෙහෙම ගිහින් තව ටිකකින් කවුරු කතා කරයිද දන්නෑ... සමහර විට කඩොල් ඇතා කතා කරලා දුටුගැමුණු රජ්ජුරුවො ගැන හරි, එළාර රජ්ජුරුවො ගැන හරි අහන්නත් බැරි නෑ.. කෝකටත් කියල මං රිසීවර් එක අයින් කරල තිබ්බා.. ෂත්.. හොඳ වෙලාවට කවුරුත් හිටියෙ නැත්තෙ.. හිටිය නම් වහකන්න තෝන්ඩිය.

ටී ෂර්ට් එක වොෂින් මැෂින් එක ලගට දාලා බාත්රූම් එකට ගිහින් මං වොෂ් එකක් දාගත්තා. හිතේ පිරිලා තිබ්බ කෝන්තිය ඒ වොෂ් එකත් එක්කම ඩිංගෙන් ඩිංග හේදිලා ගියා. අම්මත් ගෙදර නෑ. මද්දු අයියත් එන්න තව වෙලා තියෙනවා. ඒක

හන්දා මං කිරි එකකුත් හදාගෙන කාමරේට ආවා. කිරි එකෙන් බාගයක් විතර බීලා කාමරෙත් ලයිට් එක දාලා මං ගේ ඉස්සරහ පඩිය උඩට ආවා. තව ටිකකින් මද්දු එව්වනෙ. ගෙදර තනියම ඉන්න ගියහමත් වස කම්මැලියි. ජොබ් තට්ටක්වත් තියෙනව නම් කියලා මට හිතුණා. ඒත් ඉතිං මද්දුට වගේ එක තැනක ඉන්න බැරි අමාරුවක් මට තියෙන හන්දා ඒක කරන්නත් බෑ. කලින් අර පත්තරේ වැඩ කරපු එකත් නැතිකර ගත්තෙ ඒ හින්දනෙ.

"මොකෝ පාට්නර් එළියට වෙලා..?"

මද්දු ළඟට එනකන් මං දැක්කෙ නෑ. ඒ කියන්නෙ මගේ කල්පනාව හුඟාක් දුර ගිහින් තිබිලා.

"ගේ ඇතුළෙ ඉන්න වස කම්මැලියි මද්දූ.. පිස්සු හැදෙනවා.. තනියම ඉන්න ගියහම..."

මං කියාගෙන කියාගෙන ගියා. මද්දුගෙ මූණට අර සුපුරුදු කුණු හිනාව ආවා. ඒ කියන්නෙ දැන් මද්දූ මොකක් හරි කුණු කතාවක් තමයි කියන්න යන්නෙ.

"මිනත් අර පිස්සු බලු රෝගෙ වගේ පාට්නර්.. හැදුනොත් බේත් නෑ.. කරන්න තියෙන්නෙ එක දෙයයි.. ඉක්මනට කසාද බැඳපං.."

මට පේන්නෙ නම් මද්දුවට කසාද බඳින්න හිතිල වගේ. ඒකනෙ මහොම ධර්ම ටෝක් දෙන්නෙ.. අර ආපු කෝල් එක ගැන මුට කියනවද.. නෑ.. මිනෙ නෑ.. මූ පස්සෙනුත් හිනාවෙයි ඒක කිව්වොත් හෙම.. ටිකකින් බෑග් එකත් වන වනා මද්දූ ගේ ඇතුලට ගියා. මාත් මිනිහ පස්සෙන්ම ගෙට ආවා.

"ඒක නෙමේ පොඩී.. අන්න නුගේගොඩ පැත්තෙ කවුද ගෑනියෙක් නැතිවෙලා කියලා පෝස්ටර් ගහලා.."

කාමරේට වෙලා ඇඳුම් මාරු කරන ගමන් මද්දු කිව්වෙ අමුතුම කතන්දරයක්.

"මොකක්..?"

"බව් පොඩි.. 30 වෙනිදා නැතිවෙලා තියෙන්නෙ.. තාප්පවලයි බිත්තිවලයි ගහන්න පුළුවන් හැම තැනම පෝස්ටර් ගහලා.."

ආයෙත් මද්දු කිව්වා. මට දැන් මාර හොල්මං. ඇයි අප්පා වෙන්න පුළුවන් දේවල්ද මූ කියන්නෙ.

"ම.. මට තේරෙන්නෙ නෑ මද්දූ.."

"ඒකවත් තේරෙන්නෙ නැද්ද බං..? '30 දා සිට ඔබ කොහෙද ප්‍රියේ' කියලා අන්න පෝස්ටර් ගහලා.."

ඌ කාමරේ ඉඳන් හිනාවෙනවා. යකෝ මූ මැරුවත් මදි.. මූ මේ ෆිල්ම් එකෙක ගහපු පෝස්ටර් එකයක් ගැන නේද කියලා තියෙන්නෙ.. අනේ අම්මප මට මූත්තෙත්ක එන කේන්තියක්. ඒත් ඉතිං මොනව කියල කරන්නද..? මට නම් දැන් බුදු නුවර් දේවානම්පියතිස්සගෙ කතාවත් මූම තමයි කිව්වෙ කියලා. ඒත් ඉතිං දැන් ඒක අදින්න ගියොත් එහ කාලා ගහේ පැන්න එගේ තමයි. මොකටද නිකං කවර් දාලා තියෙද්දී ඇඳගෙන තාන්නෙ. මං කට වහගත්තා. තේ එකක් හෙම බීලා මද්දු සාලෙට ආවා. ඒ එක්කම තමයි අම්මත් ගෙට ආවෙ. අම්මගෙ මූණේ තිබ්බෙ හුනාක් මාන්සි වෙච්ච පාටක්. මද්දුයි මායි දිහා බලලා අම්මා කෑම කාමරේ පැත්තට ගියා.

"ඒකා හෙමේ පොඩී.."

අම්මා යනකල් ඉඳලා මද්දු කතාව පටන් ගත්තා.

"එහෙනම් කෝකද..?"

තවත් බයිලයක් අහන්න හිතාගෙන මං සෙට් වුණා. ඒත් මද්දු අයියා කිව්වෙ වෙනමම දෙයක්.

"අංජලිව හම්බවෙන්න ගියාද..?"

"මිහු.. නෑ මද්දු.. මට වෙලාවක් හම්බවුණේ නෑ.. අදත් අර ෆොටෝස් ටිකයක් ගන්න ගිහින් චාටර් වුණා.."

"මේකයි වැඩේ.. එදා නුගේගොඩදි අංජලී එයාලගෙ ගෙදර ගැන මුකුත් කිව්වද..?"

මගෙ පපුවෙ ස්පීඩ් එක ටිකෙන් ටික වැඩිවෙන්න ගත්තා. මද්දු මොනවද මේ කියන්න යන්නෙ..?

"නෑ මද්දූ.. මටත් ඒ ගැන සිරාවට අහන්න බැරිවුණා.."

"කොහෙද ඉතිං.. ඒකි ආවා විතරයි උඹට ඔක්කොම අමතක වුණානෙ. මට පේන විදියට නම් අංජලී උඹ ගැන ගෙදරට කියල නෑ.."

මද්දු එහෙම කිව්වහම මං හීතල වෙලා ගියා.

"ඇයි.. ඇයි මද්දු එහෙම කිව්වෙ..?"

"උඹට මතකද.. එදා නුගේගොඩදි මං අංජලීගෙන් ඇහුවා ගෙදර ප්‍රශ්න කොහොමද කියලා.. ඒ මං ඇහුවෙ උඹ ගැන ගෙදරට කිව්වද කියන එක. ඒත්.. එයා කිව්වෙ මොකක්ද..? කියපං බලන්න. උඹට මතක නෑ.. ආදරේ මත්තෙම නැහෙන්න එපා පොඩී.. උඹෙ ලෝකෙ හරි පුංචියි.. ඒ පුංචි ලෝකට එළියෙන් මහ විශාල ලෝකයක් තියෙනවා.. අපි වටේ තියෙන දේවල් තේරුම් ගනිං.."

මද්දූ කියවනවා.. ඌ කියන ඒවත් ඇත්ත.. ඒත් මට එදා අංජලී කියපුව මුකුත් මතක නෑ. මට මතක තියෙන්නෙ අංජලී ආපු එක විතරයි. මගෙ හිතට මීන වෙලා තිබ්බෙත් ඒක විතරයිනෙ. කොහොම වුණත් මද්දූ කියපුවයින් මගේ හිතේ බර වැඩිවුණා.

"උඹට මතක නෑ. මං හුණා කිව්ව වගේ කියන්නම් පොඩී.. ඔහොම ගියොත් ළඟදීම උඹ ඇත ගන්නවා..."

"මද්දූ කියන්නෙ මට මොනව කරන්න කියලද..?"

"බයවෙන්න එපා.. මං මුකුත් කරන්න කියන්නෑ.. ඒත් ආදරේ කරනකොට ඒ වටේ තියෙන දේවල් ගැන ටිකක් පරිස්සම් වෙයං.. මට උඹ ගැන බයයි පොඩී.."

මද්දූ කියන ඒවා මට තේරෙන්නෑ.. ඌට මං ගැන බයයිලු.. මං හොල්මනක්ද යකෝ බයවෙන්න කියලා අහන්න හිතුණත්, මද්දූ සීරියස්ම කතා කරන නිසා මං ඒ අදහස අයින් කර ගත්තා.

"මං හිතුවා උඹට අංජලී ලංවුණාම මේ හැමදේම හරියාවි කියලා.. ඒත් මට තේරෙන්නෙ නැත්තෙ ඇයි අංජලී උඹ ගැන ගෙදරට කිව්වෙ නැත්තෙ කියලා. මීට වැඩිය දේවල් උඹට කියන්නත් මට තේරෙන්නෙ නෑ.."

එහෙම කියලා මද්දූ කාමරේ ඇතුළට ගියා. මගේ හිතේ තිබුණෙ කියාගන්න බැරි මහා බරක් වගේ හැඟීමක්. ඇවිය උඩ හාන්සි වෙන ගමන් මද්දූ කියපු දේවල් මං කල්පනා කරා. ඒත් අලුතින් කියල කිසිම දෙයක් මගේ ඔළුවට ආවෙ නෑ. කොහොමටත් අංජලී කිව්වෙ තීරණයක් ගන්නව කියලනෙ. කිව්ව වගේම එයා නුගේගොඩට ආවා. එතනින් එහාට මට මුකුත් මීන නෑ. අංජලී

ළඟ ඉන්නව නම් වෙන කවුරු මගේ ළඟ නැති වුණත් කමක් නෑ කියල මගේ හිත මට කිව්වා.

* * * * *

මං උදේ නැගිට්ටිනකොටත් හුඟාක් පරක්කු වෙලා. අංජලීව හම්බවෙන්න යන්නත් ඕන. දවස් දෙක තුනකින් දැක්කෙ නැතිවුණාම යාංකාව වගේ. බෙඩ් ෂීට් එක ඇඳේ කෙළවරටම ගුලි කරල දාලා මං ඇඳෙන් නැගිට්ටා. ඒ වෙලාවෙම තමයි ටයි එකත් හද හදා මද්දු කාමරේට ආවෙ.

"යකෝ.. නැගිට්ටහම මූණ කට හෝදගනිං.. නැත්තං උඹව දකින එකාට අන්තිම අපලයි. අන්න අංජලී ෆෝන් කරා. උඹ නිදි හන්දා මං උඹව නැගිට්ටෙව්වෙ නැහැ. දහයාමාර වෙනකොට නුගේගොඩ හන්දියට එන්න කිව්වා.."

මද්දු කියවගෙන ගියා.

"සිරාවටනේ මද්දූ.."

මං ටිකක් අවිශ්වාසෙට ඇහුවෙ. මු ගැන කිසිම ඉන්ෂුවරන්ස් එකක් තියන්න බෑනෙ. ගුන්ඩු ඔස්තාර්නෙ. මු මාව කී පාරක් නම් අන්දල තියෙනවද..?

"නැත්තං බං.. ආයෙ කිව්වා හෙල්මට් එක අරන් එන්න කියලා.. ඒකි එන්නෙ වැලිමෙලූ.."

පිස්සු හැදෙනවා... ඒකත් එහෙමද..? අද එහෙනම් බයික් එකත්තෙක්ක තමයි ලව් කරන්න වෙන්නෙ.. ඒත් ඉතිං හෙල්මට් එක අතේ අරන් බස්වල යන්න ගියාමනෙ අමු වාටරේ වෙන්නෙ. මිනිස්සු නිකං අමුතු අමුතු විදියට බලන්නෙ.. වැරදිලාවත් හෙල්මට්

ඒකත් දාගෙන බස් එකේ වාඩිවෙලා ගියොත් මිනිස්සු කොහොම බලාවිද..?

නුගේගොඩ බෝගහ ළඟට මං එනකොට දහයයි හතලිස් පහයි. මේ කුණු ට්‍රැෆික් එකත් එක්ක ගමනාගමනෙ කොහොම කරන්නද අප්පා. හෙල්මට් එකත් කරකව කරකව මං බස් එකෙන් බැහැගත්තා. බැහැලා වටපිට බලනකොට තමයි මං දැක්කෙ බෝ ගහට එහා වැලි බයික් එක නවත්තලා ඒකට හේත්තු වෙලා ඉන්න අංජලිව.

"බලාගෙන ඉඳලා ඇස් දෙකත් රිදෙනවා අයියා.."

අංජලී ළඟට යනකොට කිව්වා. පව්.. රෝස පාට මූණ රතු පාට වෙලා ගිහිල්ලා. ඒ ලොකු ඇස් දෙක ආදරෙන් පිරිලා දිලිසෙනවා. බයික් එකේ සීට් එක උඩ තිබ්බ අංජලීගෙ අත මං තද කරලා අල්ල ගත්තා.

"ලංකාවෙ ගමනාගමනෙත් එක්ක ලව් කරන්න ටිකක් අමාරුයි උංගී.. මං ආපු බස් එක ආවට වැඩිය මග නැවැත්තුවා.."

ඒ පුංචි මූණ දිහා බලාගෙන මම කිව්වා. ඇත්තටම නුගේගොඩ තියෙන රස්නෙවත් මට ඒ වෙලාවෙ දැනුණෙ නෑ. අංජලීගෙ කතා කරන ඇස් දෙක මට මොනවදෝ කියනවා.

"දැන් ඉතිං යමු.. හෙල්මට් එක දාගන්න අයියා.."

අංජලී වැලියට නැගලා ස්ටාර්ට් කර ගත්තා. කොහේද යන්නෙ කියලා මං ඇහුවෙ නෑ. මාත් වැලියට නැගලා අංජලීට හොඳටම ළංවෙලා එයාගෙ පිටෙන් අල්ලා ගත්තා. කොහොමටත් ගෝල්ෆේස් එකෙයි, පාක් එකෙයි, අරහෙයි මෙහෙයි ඉඳගෙන ලව් කරනවට වැඩිය වැලියක යන ගමන් ලව් කරන එකත් මාරම ගතියක් තියෙනවා. ඇයි ඉතිං ට්‍රැෆික් එක හන්දා යන්නෙත් හෙමීටනෙ.

"ඉතිං අයියා.. කියන්නකෝ මොනා හරි.."

හෙල්මට් එකත්තෙක්ක ඔලුව යාන්තමට මං ඉන්න පැත්තට හරවලා අංජලී කියනවා.

"හපෝ උංගි.. ඉස්සරහ බලන් යමු.. මතකනෙ අර මං වැටිලා අංඩ කඩාගෙන මාස ගානක් හිටියා.."

"ඒ මං හින්දනෙ අයියා වැටුණෙ.."

"කමක් නෑ.. එහෙම වැටුණෙ නැත්තං මට මේ පුංචි කෙල්ල හම්බවෙන්නෑනේ.. කකුල කඩාගෙන හරි මට ඔයාව හම්බ වුණානේ.."

මං අංජලීගේ ඉණ වටේට අත දාලා එයාව බදා ගත්තා.

"අ.. අපෝ.. ම.. මට කිතියි විහඟ අයියේ.. අ.. අනේ.. ඔය බලන්න... තව ඩිංගෙන්..?"

කිව්වත් වගේ ඇත්ත තමයි. තව ඩිංගෙන් ඉස්සරහින් ගියපු වෑන් එකක අපේ වැලිය වදිනවා. මං ඉක්මනට අත් දෙක ඇත් කර ගත්තා. බලන් ගියාම උංගිටත් මාර කිතිනෙ.. වෙලාවක අල්ලගෙන හොඳටම කිති කවන්න ඕන. මං හිතා ගත්තා.

"අපි මේ කොහෙද යන්නෙ උංගි..?"

කිරුළපනට ලංවෙද්දි මං ඇහුවා.

"ඇයි මගෙත්තෙක්ක යන්න බය ද අයියා..?"

මං අහපු ප්‍රශ්නෙට උත්තරේ හම්බවුණේ තවත් ප්‍රශ්නෙකින්. හරිම හුරතල් විදිහට අංජලී ඒක ඇහුවෙ.

"බය නම් නෑ.. ම.."

The Spirit of Sri La

මං එහෙම කියලා කතාව නැවැත්තුවා. කිරුලපන හංදියෙන් තාරාතේන්පිට පාරට දාලා ටික දුරක් ගිහින් අංජලී බයික් එක නැවැත්තුවා.

"එහෙනම්..?"

"ගුටි පූජාවක් දෙන්න එක්කන් යනවද කවුද දන්නෙ..?"

මං කිව්ව දේට අංජලී බයික් එකේ ස්ටාට් එක නැවැත්තුවා.

"ගුටි..?"

එයා පුදුම වෙලා වගේ ඇහුවෙ. ඇස් දෙකත් ලොකු කරගෙන, තොල් දෙකත් එකට තද කරගෙන අංජලී ඉඳපු ඒ ඉරියව්වෙ අමුතු ලස්සනක් මං දැක්කා.

"නෑ ඉතිං.. 'කුණු දැම්මොත් ගුටි' කියලා ඔය හැම තැනම බෝඩ් ගහලා තියෙන්නෙ.."

අංජලීට ඛතස් ගාලා හිනා ගියා. පොඩි එකෙක් වගෙයි හිනාවෙන්න ගත්තහම.

"උංගි හිනාවෙනකොට හරි ලස්සනයි.."

ඒ දිලිසෙන ඇස් දිහා බලාගෙන මං කිව්වා. අංජලීගෙ මූණ ලැජ්ජාවෙන් රතුවෙලා ගියා.

"අ.. අයියා එහෙම කියනකොට ම.. මට ලැජ්ජයි.. ඒත් අයියා හිනාවෙනකොටත් කොයි තරම් ලස්සනද..?"

අංජලී මගේ අතකින් අල්ල ගන්න ගමන් කිව්වා.

"දැන් ඉතිං යන්න ආපු ගමන යමුද..?"

"මොන ගමනද අයියෙ..?"

"ඇයි මාව එක්කන් ආවෙ ගමනක් යන්නනේ.."

අංජලීගෙ මූණට ලොකු හිනාවක් ආවා.

"අනේ නෑ විහඟ අයියෙ.. මට ඔයාවත් දාගෙන රවුමක් යන්න හිතුණා.. මං ඊයෙ අක්කලගෙනෙ හිටියෙ.."

එයා හෙල්මට් එක ගලවලා වැලියෙ හෑන්ඩ්ල් එක උඩින් තිබ්බා. මාත් හෙල්මට් එක ගැලෙව්වා. මෙතන තැනත් හොඳයි වගේ. වැඩිය කවුරුත් ඇත්තෙත් නෑ. අව්වත් නෑ.. බලන් ගියාම අංජලිත් හොයාගන්නෙ මාර තැන් තමයි. කලින් ඇවිල්ලා තියෙනවද දන්නෑ.

"අයියගෙ මූඩ් එක වෙනස් වුණා.."

අංජලී හිටියෙ මගේ මූණ දිහා බලාගෙන. එයාගෙ ඇස් දෙකේ මූණ රඳවගෙන මං වැලි බයික් එකට හේත්තු වුණා.

"ක්‍රිෂාන් එක්කත් ඔයා මෙතනට ඇවිල්ලා තියෙනවද..?"

මං බොහොම හෙමීට ඒක ඇහුවෙ. අංජලීගෙ මූණ සුදුමැලි වෙලා ගියේ තත්පරෙන් දෙකෙන්. හිතුවෙවත් නැති තරම් ඉක්මනට ඒ ලස්සන ඇස්වලට කඳුළු උනාගෙන ආවා.

"අ.. අනේ ඔ.. ඔයා මොනවද විහඟ අයියෙ අහන්නෙ..? ම.. ඔයා මං ගැන හිතන් ඉන්නෙ එහෙමද..? දෙයියනේ වැරැද්දක් වුණා කියලා මාව තවත් අසරණ කරන්න එපා.. ඔය කකුල් දෙක අල්ලලා වඳින්නම් අයියෙ.."

ගහක් ගලනව වගේ අඬාගෙන අංජලී කියවන් ගියා. ඒ ලොකු ඇස්වලින් ගලපු කඳුළු කන්දරාව එයාගේ රතු පාට වෙලා

තිබ්බ කම්බුල් දිගේ බේරුණා. අනේ මන්දා මාත් අහන්නෙ මග මැටි ප්‍රශ්නනෙ.

"අඬන්නෙපා උංගි.. ම.. මං විහිලුවට ඒක ඇහුවෙ.. ඔයා ඔය තරම් අප්සට් යයි කියලා මං හිතුවෙ නෑ.."

ලේන්සුව අරගෙන අංජලීගෙ කඳුළු පිහදාන ගමන් මං කිව්වා.

"ඔ.. ඔයා විහිලුවට නෙමේ අයියෙ ඇහුවෙ.. ඔයාට තාමත් මාව විශ්වාස නෑ නේද..? මාව තවත් අසරණ කරන්නෙපා අයියේ.. මං.. මං ඉන්නෙ ගිනි ගොඩක් මැද්දෙ දෙයියනේ.. හැමදේම අමතක කරලා ඔයා ළඟට එන්නෙ ඩිංගක් හිනාවෙන්න බලාගෙනයි විතහ අයියේ.. එහෙම ඔයා ළඟට ආවනමුත් ඔයා මාව අඬවනවා.. අනේ.. අ.. හ්.. ශ්.."

අංජලී හොඳටම අප්සෙට් වෙලා. මාත් ඉඳල හිටල මැටි කතාගෙ අහන්නෙ.. ඒත් දැන් කොහොමද අංජලීගෙ මූඩ් එක හදන්නෙ.. ටිකක් වෙලා කල්පනා කරලා මං අංජලීගෙන් බයික් එකේ යතුර ඉල්ලා ගත්තා. බයික් එක ස්ටාට් කරල මං ඒ අඬන ඇස් දිහා බැලුවා.

"මගේ අතින් ඔයාගෙ හිත රිදුන නම් මට සමාව දෙන්න රත්තරං.. දැන් ඉතිං හොඳ බබා වගේ බයික් එකට නගින්නකො උංගි.."

මේ පරිසරයෙන් ඩිංගක් ඈත් වුණාම අංජලීගෙ හිත හරියාවි කියලා මට හිතුණා. ඒත් මං අංජලීගෙන් ඇහුවෙ මගෙ යටි හිතේ තිබ්බ දෙයක්ද මංදා. අංජලීත් මගේ ඉනෙන් අල්ලගෙන පිටට හේත්තුවෙලා හිටිය මිසක, නාරාහේන්පිටට එනකන්ම මුකුත් කතා කෙරුවෙ නෑ. නාවල පාරට දාලා හයිලන්ඩ් 'අවුට්ලට්' එක ගාව බයික් එක නවත්තලා මං අංජලීගෙ අතින් අල්ලා ගත්තා.

"ම්.. දැන් චූටිටක් හිනාවෙන්නකො.."

"බෑ.."

අංජලී මූණ බිමට හරවා ගත්තා.

"අනේ චූටිටක්.."

"චූටිටක්වත් බෑ.. මගේ හිත රිද්දන එකමයි කරන්නෙ.."

"හරි.. සමාව භාජනයක දාන්නකො උංගි.. මං ඉස්සෙල්ලත් කිව්වනෙ. එන්නකො ඔයාට මං කල්කිරි එකක් අරන් දෙන්න.."

මං එහෙම කිව්වහම අංජලීගෙ මූණට පුංචි හිනාවක් ආවා.

ඔය තියෙන්නෙ.. කැවයි.

"කල්කිරි විතරක් බීලා මදිනෙ අයියා.."

අංජලීගෙ සුදු මූණෙ අර කලින් තිබ්බ හිනාව එහෙම්මමයි.

"එහෙනම්..?"

එයා කියන්න හදන්නෙ මොනවද කියලා තේරුම් ගන්න බැරිව මං ඇහුවා.

"මට යෝගටුත් ඕන.."

"යෝගටුයි, කල්කිරියි දෙකක් හොඳ නෑ උංගි.. බඩේ අමාරුව හැදෙනවා.. අනිත්තෙකා දවසට හතර පස් පාරේ ටොයිලට ගියාම, ටොයිලට් එක වුණත් මොනවද හිතන්නෙ..?"

මං කිව්වෙ ටිකක් අමුතු කතන්දරයක්. ඒක අහල අංජලීගෙ මූණේ හිනාව තව ටිකක් වැඩි වුණා.

"ඔ.. ඔයා ම.. මහ ටොම් පවයෙක්. කට ඇරියොත් බොරුවක්මයි කියන්නෙ.."

කටත් ඇද කරලා අංජලී ඇදලා පැදලා කාලෙට කිව්වා. ඕන්.. මාත් කන මඩක හැටි.. ඒත් ඉතිං.. මං ටොම් පවයා නම් අංජලී ටොම් පවී වෙනවනෙ..

"ඇයි අයියා හිනාවෙන්නෙ..? මොනාද මතක් වුණේ..?"

"මුකුත් නෑ උංගි.. එන්නකො අපි යමු කල්කිරි බොන්න.."

කවුන්ටරේ ගාවට ගිහින් මං කල්කිරි බෝතල් දෙකකුයි යෝගට් දෙකකුයි ගත්තා. අංජලී හිනාවෙනවා. කල්කිරි දෙක බොන ගමනුත් අපි දෙන්නා මූණෙන් මූණ බලන් හිටියා.

"ඉතිං උංගි..?"

යෝගට් දෙකත් ඉවර කරලා වැලිය ගාවට එන ගමන් මං අංජලීගෙන් ඇහුවා.

"අයියා හරි ලස්සනයි.."

"තව..?"

"ඒ ලස්සන හින්දම අයියා මට නැතිවෙයි කියලා බයක් හිතෙනවා.."

අංජලී ඒ ටික නම් සීරියස් විදියට කිව්වෙ. එයාගෙ මූණත් ටිකක් අඹුකුවෙලා තිබුණා.

"ඔයාට තියෙන ඔය ප්‍රශ්නෙම, මටත් තියෙනව කියලා කිව්වොත්..?"

"මං එහෙම වෙන්නෑ අයියා.."

එයා මගේ අතින් අල්ල ගන්න ගමන් කිව්වා. ඒ ඇස් දෙකේ තිබ්බෙ මං ගැන ඉපදිච්ච ලොකු ආදරයක්.

"මට ඔයාගෙන් අහන්න දෙයක් තියෙනව උංගි.."

වැලියට නගින්න හදලා, මං එහෙම කිව්වහම අංජලී ආයෙමත් මගේ දිහාට හැරුණා. ඒ සුදු මූණ මැද්දැවෙ තිබ්බෙ ලොකුම ලොකු ප්‍රශ්නාර්ථ ලකුණක්.

"මං අහන දේට ඔයා මට ඇත්තම කියනව නේද..?"

"මං දන්න දෙයක් නම් මං කියන්නම් විහඟ අයියා.."

"ඒත් උංගි මට මහා මොකක්ද වගේ.. ඔයා අප්සට් යාවිද දන්නෙත් නෑ.."

"එහෙම නෑ.. මං අප්සට් යන්නෙ ඔයා මිය නොකිය අගේ කරන්න හදනකොටයි අයියෙ.."

දැන් ඒ මූණට පුංචි මුරණ්ඩු පාටකුත් ඇවිත්.

"ඉතිං කියන්නකෝ.."

මගේ අතින් එයා දිහාට අදින ගමන් අංජලී කිව්වා.

"ඔයාගෙ ෆොටෝ එකක් අරන් අපි කවර් පේජ් එකක් කරමුද උංගි..?"

මං එහෙම් ඇහුවෙ අංජලීගෙන් අඩි දෙක තුනක් ඈත්වෙන ගමන්. මොකද මං දන්නවනෙ ටොපියෙ තරම. ඒත් වෙනදට කේන්තියෙන් රතුපාට වෙන ඒ සුදු මූණට ආවෙ ලොකු හිනාවක්.

"අනේ ඇත්තමයි දෙනව දෙකක් ආයෙ ඔය වගේ කතා නොකියන්න.. ඉන්නවකො ඔහොම.."

තත්පරයක්වත් ගියේ නෑ. අංජලී අඩියට දෙකට ළඟට ඇවිත් මගේ කනෙන් අල්ල ගත්තා.

"ආයෙ ඔහොම මින්නැති විහිලු කරනවද.. ආ..?"

කනෙන් අල්ලල හොලවන ගමන් අංජලී ඇහුවා. පාරෙ යන මිනිස්සුත් බල බලා යනවා. ඒත් ඉතිං මොනාට කරන්නද..? ආදරේ කරන කොට තියෙන ගතිය මේම මේමයි කියලා හැම එකාටම කියල දෙන්න මට බෑනේ.

"හප්පේ.. සොරි.. සොරි.. ආයෙ කියන්නෑ.. ආයෙ කියන්නෑ.. හොඳ ළමය වගේ දැන් කන අතහරින්නකො.. බැරි වෙලාවත් ඕක ගැලවුණොත් එහෙම.."

ටිකකින් මගේ කණ අතෑරලා අංජලී බයික් එක ස්ටාර්ට් කරා. හෙල්මට් එකේ ගාන්චුව දාගන්න ගමන් එයා මං දිහා බැලුවා. මං තාම හිටගෙන.

"යන්න අදහසක් නැද්ද විහඟ අයියා.."

"යමුකෝ.."

හෙල්මට් එක දාගෙනම මං වැලියෙ වාඩිවුණා. අංජලී වැලිය රේස් කරලා නාවල පාරට ගත්තා.

"හිත්... මේ වැලිය හදපු මිනිස්සුන්ට බැරිවුණානෙ මේක තව ටිකක් පුංචි කරලා හදන්න.."

අංජලීගේ ඉණ වටේ අත්දෙක දාලා අල්ල ගන්න ගමන් මං කිව්වා.

"ඒ ඇයි අයියා..?"

"නෑ ඉතිං.. මට ඔයාගෙ කරේතෙ එහෙනම් යන්න වෙන්නෙ.."

අංජලීට බකස් ගාලා හිනා ගියා.

"ඔයා නම් හරි ඒවා තමයි කියන්නෙ.. ඇත්තමයි ඔයා ගාව ඉන්නකොට වෙලාව යනව තේරෙන්නෙ නෑ විහඟ අයියෙ.."

"එදා නම් තේරුණේම නෑ නේද..?"

"කවදද අයියෙ..?"

"අර අපේ ගෙදරදී මං ඔයාව දමාගෙන ඉම්බ වෙලාවෙදි.."

"අනේ ඇත්තමයි.. මේක පාර නෙමෙයි නම් මං දෙනව දෙකක්.. මේක නම් කටක් නෙමේ.."

අංජලී කිව්ව දේට මං මුකුත් කියන්න ගියේ නෑ. මං එයාට තවත් ළංවුණා. එයා ගාවින් ආපු මොකක්දෝ වත්සුණු සුවඳක් මගේ හිත ඇතුළටම රිංග ගත්තා. මේ පුංචි කෙල්ලගෙ මහා මෙරක් වගේ ආදරේ මගේ ජීවිතය මොන තරම් වෙනස් කරාද..? පාලු කාන්තාරයක් වගේ තිබ්බ මගේ හිත දැන් කොයි තරම් සංතෝසෙන් පිරිලා තියෙනවද..?

"අයියා.."

"ම්.."

"ඒ පාර මොකෝ කිසි සද්දයක් නැතිවුණේ..? මං කියපුවට තරහ වුණාද..?"

"අනේ නෑ උංගි.. මං මේ වෙන දෙයක් ගැන කල්පනා කරේ.."

"මොකක්ද විහඟ අයියා..?"

"ඔයා මොකද මං ගැන ඔයාලගෙ ගෙදරට නොකිව්වෙ කියලා.."

මං ඒ ප්‍රශ්නෙ බොහොම හීන් සීරුවෙ ඇහුවෙ. මද්දු අයියා උදේ පාන්දර කියපු ඩිංගක් මගේ හිතේ රැඳිලා තිබුණා.

"ම.. මට තේරුණේ නෑ.."

වැලිමය ස්පීඩ් එක ඩිංගෙන් ඩිංග අඩුවෙද්දි අංජලී කිව්වා.

"ඔයා එදා නුගේගොඩ එන්න කලින් මං ගැන තාත්තටයි අම්මටයි කියනව කියලා ඔයා අපේ ගෙදරදි පොරොන්දු වෙලානෙ ගියේ. ඒත් ඔයා එදා නුගේගොඩ ආපු සන්තෝසෙට මං ඒ ගැන ඇහුවෙ නෑ. ඒක හින්දා ඔන්න මං අද ඇහුවා.."

අංජලීගේ මූණ මට පේන්නැති හින්ද එයා මොන ඉරියව්වක ඉන්නවද කියල මං දැක්කෙ නෑ. එයා සද්ද නැතුවම බයික් එක පැද්දා. දැන් බලමුකෝ උංගි මොනවද කියන්නෙ කියලා. ඒත් මං හිතපු තරම් ඉක්මනට අංජලී කතා කරේ නෑ.

"මං.. මං ඔයාට ආදරෙයි විහඟ අයියේ.. ම.. ඔයාට ඒක වි.. විශ්වාස නැද්ද දෙයියනේ..?"

අංජලීගෙ කටහඬ බිඳිලා ගියා. එයා අඬනවවත්ද..?

"මට ඔයාව විශ්වාසයි උංගි.. මට ඔයාව විශ්වාසයි.. ඒත් මට උත්තරේ ඕන මං අහපු ප්‍රශ්නෙට.. ඒක මට හුඟාක් වැදගත්.."

"මගේ ආදරේටත් වැඩියෙන්..?"

ඉස්සරහයින් ආපු බස් එකට ඉඩ දීලා බයික් එක පාර අයිනට ගන්න ගමන් අංජලී ඇහුවා. මෙන්න මේ වෙලාවෙ එයාගෙ මූණ බලන්න පුළුවන්නම්..? මට හිතුණා.

"මං එහෙම එකක් කිව්වෙ නෑ උංගි.. එහෙම හිතන්නත් එපා.. ඔයා එහෙම හිතුවොත් ඒක මගේ හිතට මහ වදයක් වේවි.."

කතාවෙන් කතාවෙන් අපි දෙන්න නුගේගොඩටත් ඇවිල්ලා තිබුණා. එතකොට අදත් මට උත්තරේ නැතුවද යන්න වෙන්නෙ..?

"මං ඔයාට ඇත්තම කියන්නම්.."

නුගේගොඩ සුපර් මාර්කට් එක ගාවට වැලිය දාන ගමන් අංජලී කිව්වා. එයා කියන්න යන ඇත්ත මොකක්ද කියල මං කට ඇරන් බලන් හිටියා.

"මට සමාවෙන්න අයියේ.. කිව්ව විදියට ඔයා ගැන මට ගෙදෙට්ට කියන්න පුළුවන් වුණේ නෑ. ඒත් මං හුඟාක් උත්සාහ ගත්තා තාත්තිටයි අම්මිටයි ඔයා ගැන කියන්න. ඒත්.. තාත්ති ඉස්සරහ මං ගොළු වුණා අයියෙ.. තාත්තිගෙ මූණ දිහා බලාගෙන එකපාරටම මට මේ වගේ දෙයක් කියාගන්න ශක්තියක් ආවෙ නෑ. මට ටිකක් කල් දෙන්න රත්තරං.. ඔයාව මට ඕන.. හැමදාටම ඕන.. ජීවිතේ තියෙනකන් මං ගාවම තියාගන්න ඕන.."

මගේ අත් දෙකෙන් අල්ලගෙන පිස්සියක් වගේ අංජලී කියවං ගියා. මං ගැන ගෙදරට කිව්වෙ නෑ කියන එක, එයාගෙ කතාවෙන්

පස්සෙ මගෙ හිතට ඒ තරම් වද දුන්නෑ.. වද දීලා ඔවු දුවන්න හදපු තුවාලෙ අංජලී හොඳ කරලා තිබුණා.

"කමක් නෑ උංගි.. ඔයාට පුළුවන් දවසක මං ගැන ගෙදරට කියන්න.. ඒ ගැන මගේ තරහක් නෑ.. ඉතිං.. ඉතිං ඇයි රත්කරං මේ ඇස්වල කඳුළු පුරවගෙන..?"

"මොන දේ ආවත්.. මාව අමතක කරන්නෙපා විහඟ අයියේ.. ම.. මට ඔයා නැතුව බෑ.. මට නිතරම ඔයාව මතක් වෙනවා.. ඔයා ළඟ නැතිවුණාම හරි පාලුයි අයියේ.."

ඒ අඩහ ඇස් දෙකේ උතුරන ආදරේ මුළු හිතින්ම මං විඳගත්තා. ඇත්තටම ආදරේ ඉස්සරහ මුළු ලෝකෙම අමතක වෙනව කියන්නෙ බොරුවක් නොමෙයි.

"උංගි..? ආයෙ කවදද මාව හම්බවෙන්නෙ..?"

"අද ෆෝන් කරා වගේ.. මං ෆෝන් කරලා කියන්නම්කො අයියෙ.."

මං හිතුවටත් වැඩිය ඉක්මනට ඔරලෝසුවේ කටු කරකැවිලා තිබුණා. අංජලීටත් දෙවැනි පාරට වෙලාව මතක් වුණේ මං බලනව දැකලා.

"ම්.. හුඟාක් වෙලා ගිහින්.. මං ආවෙ නුගේගොඩට එනවා කියලා.. එහෙනම් මං යන්නම් විහඟ අයියේ.. පරිස්සමින් ඉන්න.."

දහස් ගානක් මිනිස්සුයි, වාහනයි අතරෙ අංජලීව ජේත්තැසිවෙලා යනකන් බලන් ඉඳලා මං ආපසු හැරුණා.

❋ ❋ ❋ ❋ ❋




මම ගෙදරට ගොඩවෙනකොට තුනාමාරත් පහුවෙලා. හොඳ වෙලාවට අර කල්කිරි එකයි යෝගට් එකයි ඇදලා ඇරියෙ. නැත්නම් වීරයා වගේ හිටියට බස්සෙකේදිම කලන්තෙ දානවා.

"කොහෙද පොඩී උදේම ගියේ..?"

පුදනකොටම කාපි යකා වගේ අම්මා මගේ ඉස්සරහම්. දැන් මොකේද දත් වළඳන්නෙ..? මං ටිකක් වෙලා කල්පනා කරා.

"හොඳ උදේ.. මං යනකොට දහයත් පහුවෙලානෙ අම්මා.."

එහෙම කියාගෙන මම කාමරේට රිංග ගත්තා. තව තත්පරයක් පරක්කු වුණා නම් අම්මා තව ප්‍රශ්න දෙක තුනක් අහන එක ෂුවර්. හප්පා.. මක්කොම හරි මේ රස්නෙත් එක්කනෙ බේරෙන්න බැරි. වහින පාටක්වත් නෑ. මං මගේ සුපුරුදු ෂෝට හොයන්න ගත්තා.

"අම්මෙ මගේ ෂෝට් දැක්කද..?"

ෂෝට් හොයල හොයලා එපා වෙලා මං අම්මට කෑගැහුවා. දැන් නුවර් එකටම අම්මා දුවගෙන එයි. ඇවිත් 'මොකද පොඩී කෑගහන්නෙ' කියල අහයි. අම්මා එන අඩි සද්දෙ අහන්න මං කන් දෙකත් කෙලින් කරගෙන අහගෙන හිටියා. ම්හු.. මෙලෝ සද්දයක් නෑ.. යකඩෝ ඒ පාර අම්මට මොකද වුණේ..? ටී ෂර්ට් එක ගලවලා රක් එක උඩට දාලා මං වෙනිම පිටින්ම සාලෙට එබුණා. අම්මගෙ කැල්ලක්වත් නෑ. ඒත් ඉස්සරහ මිදුලෙ පැත්තෙන් පුංචි සද්දයක් ආපු හින්දා මං ඉස්තෝප්පුවට ඇවිත් මිදුල දිහා බැලුවා. අම්මා මිදුලෙ බෝගන්විලා පඳුර ගාව.

"අම්මෙ.. මගෙ ෂෝට් දැක්කද..?"

මං ආයෙත් ඇහුවා. ෂිහ්.. මේ කුණු ෂෝට් එක හින්දා මං විඳින වදයක්. මන්න ඒ පාර නම් අම්මා මං දිහා බැලුවා. අම්මගෙ මූණෙ තිබ්බෙ තේරුම් ගන්න අමාරු හිනාවක්.

"මං ඇඳලා අන්න රූම් එකේ ඇති.."

අම්මා හෝන්ඩියට වගේ කිව්වා. මදැයි මාත් අහගන්න ඒවා. මං ආපහු මද්දුගෙ කාමරේ පැත්තට හැරුණා. මගේ ෂෝට් අම්මා ඇන්ද නම් හොඳට තියේවි. එහෙනම් ඒකෙ කකුල් දෙක ඉරීලා නිකන්ම ස්කර්ට් එකක් වෙනවා. මං ඊනාවට එබුණෙ මද්දු අයියගෙ කාමරේට. අද පොරට සරමවත් නමන්න අමතක වෙලා. කොහෙද ඉතිං චූටි ඩොක්ටර්ගෙ සිහියෙන්නෙ ඌ උදේට ඇස් අරින්නෙ. මද්දුගෙ කාමරෙත් ෂෝට් තිබ්බෙ නෑ. ඒ කියන්නෙ මගේ ෂෝට් අභාවප්‍රාප්ත වෙලා. දැන් ඉතින් ඔහු කළුවූ දානයක්වත් දීලා නිකං ඉන්නවා. මය අතරෙ තමයි මද්දුගෙ මේසෙ උඩ තිබ්බ ලොකු කහ

පාට පොතක් මං දැක්කෙ. ඒක බැංකු ගැනයි, බැංකු කටයුතු කෙරන විදිය ගැනයි ලියල තිබ්බ පොතක්. නිකමට වගේ ඒ පොත අතට ගනිද්දි පොතට යටවෙලා මේසෙ උඩ තිබ්බ හතරට නැමුනු සුදු කොලයක් මං දැක්කා. සුවර් එකටම පූජනී එවපු ලව් ලෙටර් එකක්. අයියගෙ ලෙටර් මල්ලි කියෙව්වට අහින් පයින් යන්නැනෙ. ඉතින සංතෝස මූඩ් එකේ මං කොලේ දිගෑරියා. ඒත් ඒකෙ තිබ්බ ඒවා දැක්කහම මගේ ඔලුව අවුල්වෙලා ගියා.

"භාරිය මහත්තයාට...

තමුසෙට දෙපාර තුන්පාර වෝනින් දෙන්න අපිට වෙලාවක් නෑ. ඒත් එකක් මතක තියාගන්නවා. තමුසෙ කොයි තරම් නැටුවත්, දැන් ඔය නටන නැටුම තමුසෙගෙ අවසන් නැටුම කියලා. මට තමුසෙවයි, පූජනීවයි බ්ලාස්ට් කරලා දාන එක ඒ තරම් දෙයක් නෙමේ. එතකොට තමුසෙ මං කොහොම එකෙක් ද කියල දැනගන්නෙ කොහොමද..? ඒක හන්දා අවසාන ජවනිකාව හොඳට කරපං. මොකද මටත් ගරු රඟපෑමක් කරන්න තියෙනවා..."

ෂෝට හෙවිල්ල මට මතක නැතිවෙලා ගියා. මේ මොකක්ද මේ..? කවුද මේක එවල තියෙන්නෙ.. පූජනීගෙ හස්බන්ඩ්ද..? ඇයි මද්දු මේ ගැන මට කිව්වෙ නැත්තෙ..? මගේ හිතට ආවෙ උත්තර නැති ප්‍රශ්න ගොඩක්. එහෙනම් මං දන්නැති වුණාට හීන් සැරේ තාමත් ගේම යනවා. මද්දුයි, පූජනීගෙ හස්බන්ඩ්යි අතරෙ. මං මෙච්චර දවසක් හිතන් හිටියෙ මේ හැමදේම හොඳට විසඳිලා ඇති කියලනෙ. වැඩේ කියන්නෙ පූජනී වුණත් මට මුකුත් කිව්වෙ නැනෙ. ෂෝට හොයල අප්සට් වුණ ඔලුව තවත් අවුල් කරගෙන මං මද්දුගෙ කාමරෙන් එළියට ආවා.

"ඔයාගෙ ෂෝට් එක හම්බවුණාද..?"

සාලෙ හරියෙදි අම්මා මගෙන් ඇහුවා.

"පව් අම්මා.. ඒක අභාවප්‍රාප්ත වෙලා.."

හිතේ තිබ්බ ඔක්කොම අවුල් පැත්තකට දාලා මං කිව්වා. අම්මගෙ මූණට ආවෙ මං හැමදාම දකින්න ආශ කරපු ලොකු හිනාවක්. මං හෙමින් සැරේ කාමරේට රිංගද්දි 'පිස්සා' කියල අම්මා කියනාව මට ඇහුණා.

"අම්මා.. පොඩී ආවද..?'

මද්දු අයියා, අම්මගෙන් මං ගැන අහනවා මට ඇහුණා. ළුවටත් ගෙදර ආපු ගමන් මිකක් වෙන්නෙ මාව. මද්දූ අයියා මූණ කට එහෙම හෝදගෙන තේ එකක් බොනකන් මං ඉවසන් හිටියෙ බොහොම අමාරුවෙන්. ඒත් මට වැඩිවෙලා එහෙම ඉන්න ඕන වුණේ නෑ. මද්දූ මගේ කාමරේට එබුණා.

"අංජලී හම්බවුණාද පොඩී..?"

"හ්ම්.."

"මං කියපුව උඹ ඇහුවද..?"

"හ්ම්.."

"එයා ගෙදරට උඹ ගැන කියල නෑ නේද..?"

"හ්ම්.."

"මොකෝ පාට්නර්.. උඹ ඒ පාර බකමූණු චරිතෙ රඟපානවද..? ඇයි අංජලිත්තෙක්ක කොක්කක්වත් දාගත්තද..?"

මං මද්දුගෙ මූණ දිහා ටිකක් වෙලා බලන් හිටියා. මගේ මූණට හුඟාක් සමානකම් තිබ්බ ඒ මූණේ අලුතෙන් කුරුලෑ දෙක තුනක් ඇවිල්ලා තිබුණා. සුවර් එකටම පූජනී මුව බඳාගෙන ඉඳින්න ඇති. අංජලීව ඉඹල දවස් දෙකකට පස්සෙ මගෙත් කුරුලෑවක් ආවෙ.

"අංජලිත් එක්ක හමි කොකු නෑ මද්දූ.. ඒත් මට වෙලා තියෙන්නෙ උබත්තෙක්ක කොක්කක් දාගන්න.."

කාමරේ ඇතුලට ආපු මද්දූ තේ කෝප්පෙ මේසෙ උඩින් තියලා පුටුව ඇදගෙන වාඩිවුණා.

"අහවල් එකක් බෙදාගන්න බැරුවද පාට්නර්...?"

මද්දූ ඇහුවෙ හරිම සැහැල්ලුවෙන්.

"මටයි ඔයාටයි බෙදාගන්න බැරි දේවල් නෑ මද්දූ.. ඒත් ඇයි ඔයා ඔයාගේ ජීවිතේ හැමදේම මට නොකියන්නෙ..? ඇයි හුඟාක් දේවල් හංගන්නෙ..?"

"මට තේරෙන්නෙ නෑ පාට්නර්.."

"ඔයා හරිහ වෙන්නෙපා මද්දූ අයියා.. මං අර ඔයාගේ කාමරේ තිබ්බ ලියුම බැලුවා..."

"මොන ලියුමද..?"

මද්දූගෙ ඇස් ලොකුවුණා.

"අර ඔයාට තර්ජනේ කරලා තිබ්බ ලෙටර් එක. ඇයි මද්දූ මට ඒ ගැන නොකිව්වෙ..?"

"ආ.. ඒකද..? ඒක ඒ තරම් ගණන් ගන්න දෙයක් නෙමේ පාට්නර්... මේ කොන්ද පණ නැති බැල්ලිගෙ පුතෙක්ගෙ මෝඩ වැඩක්. උඹට කියන්න තරම් දෙයක් එතන නෑ.."

"ඒ වුණාට ඒකෙ තිබ්බෙ තර්ජනේ කරලා.."

"අතෑරලා දාපන් පාට්නර්.. මාවයි පුජනීවයි වෙන් කරන්න නම් උංට ඔයිට වැඩිය බැහැලා වැඩ කරන්න වෙනවා.. උං කරන්නෙ ගොඩ ඉඳන් ඊතන එක.."

"මට ඔයා ගැන බයයි මද්දූ අයියා.."

මට එකපාරටම එහෙම කියවුණා.

"මං ගැන බයවෙන්න දෙයක් නෑ පොඩී.. මට බය තියෙන්නෙ උඹ ගැන.. උඹ හැමදේම දිහාම බලන්නෙ පොඩි එකෙක් වගේ. ඒකයි තියෙන ප්‍රශ්නෙ.."

කුරගෙන ගියපු කතාව නවත්තල මද්දූ අයියා කිව්වෙ අමුතුම කතන්දරයක්. ඒත් ඉතිං මහ එකෙක් වගේ ප්‍රශ්න දිහා බලන්න මං කාම ඉගෙන ගෙන නෑ කියනෙක මාත් දැනන් හිටියා. ඒකයි මං මද්දූ අයියට මුකුත් නොකිව්වෙ.

"රාජ් ආවෙ නෑ නේද තුන දවසකින්.."

හිටපු හැටියෙ මද්දූ මගෙන් ඇහුවා.

"මහු.."

"මොකෝ උඹල දෙන්නත් ඇරගත්තද..?"

"පිස්සුද මද්දූ.. මං මොකටද උෟත් එක්ක ඇරගන්නෙ.. ඒත් මොකද මංදා උෟ කෝල් එකක්වත් දුන්නැත්තෙ.."

"ෂෝර්කටත් කියල ගිහින් බලපං පොඩී.. හරි නෑනේ.. උඹෙ හැම මළදානෙටම උෟ බඩ බැඳන් එනවා.. කාගෙන් හරි ගුටි කාල ඉස්පිරිතාලෙකවත්ද දන්නැනෙ.."

අපත කතාවක් කියාගෙන මද්දූ කාමරෙන් ගියා. ජුවර් එකට මද්දූට අර ගෝල්ෆේස් වලිය මතක් වෙන්නැති. හප්පොච්චියෙ කවද ගහපු ගැහිලිද අපි එදා ගැහුවෙ.

* * * * *

පහුවෙනිදා මම කුකුළෙක් කරේ තියාගෙන රාජ්ලගෙ ගෙදර ගියා. මූ නැගිටල නැද්ද...? නැත්තං මූ කොහේ හරි පල්ලියකට ගිහින් නෝම්බි අල්ලලාද..? ප්‍රශ්න ගොඩක් ඔලුවෙ තියාගෙන මං බෙල් එක එබුවා. ටිකක් වෙලා ගිහිල්ලා ඇරිච්ච දොරෙන් එළියට ආවෙ රාජ්ගෙ අම්මගෙ මූණ.

"ආ.. විහඟ පුතා.. හුඟ දවසකින් මේ පැත්තෙ.. මොකද අපිත්තෙක්ක තරහ වෙලාද..?"

"අනේ නෑ ඇන්ටි.. මේ දවස්වල පුර් බිසී.. හුස්ම ගන්න බැරි තරමට වැඩ.."

ගෙට ඇතුවෙන ගමන් මම ලෝකෙ වෙළෙඳ පොළේ කෙප්පයක් අතෑරියා.

"ඒයි.. බොරු කියන් නැතුව කාමරේට වරෙන්. අපේ අම්මට බොරු අහල පුරුදු නෑ.."

මැද කාමරෙන් රාජ්ගෙ කටහඬ ඇහුණා. මං ඒ කාමරේට එබුණා. මෙන්න මූ හතර ගාතෙ දාලා ඇඳේ දාලා.

"මොකෝ බං උඹට උනේ..?"

මං උගේ ගාවින් වාඩිවෙන ගමන් ඇහුවා.

"කතා කරන්නෙපා.. මගේ සෙයිවර්භාවය නැති කරපු මිත්‍ර ද්‍රෝහියා. තොට දැන්ද මාව මතක් වුණේ. අරකිත් එක්ක සෙට් වුණාට පස්සෙ තෝ මාව සහමුලින්ම අමතක කරා.."

බලන් ගියාම මූ පුදුම විදියට සිංහල කියටනාවනෙ.. ඒත් අද මූ මොකද මෙච්චර වෙලා නිදාගෙන තියෙන්නෙ.. ඊයෙ මූ හොර කුරුම්බාවත් කඩන්න ගිහින්ද..?

"ඒ පාර මොකෝ උඹ බුම්ම ගත්තෙ..?"

ටිකක් වෙලා ගියාට පස්සෙ රාජ් මගෙන් ඇහුවා. ආපු වෙලාවෙ ඉඳල උගේ අඳෝවැඩියාව ගහල දැන් අහනව බුම්ම ගත්තෙ මොකද කියලා. මූත් ඇවිල්ලා අපේ මද්දූ අයියටම හරියන පොරක්. මද්දූ අයියත් දෙක තුනක් ගුටි ඇනල ඉවර වෙලානෙ රිදුනද අහන්නෙ.

"නෑ බං.. උඹ මොනවද මේ දවස් ටිකේ කරේ.. උඹ මට කතා කරෙත් නෑ.. මොකද කෙල්ලෙක්වත් මාට්ටු උනාද..?"

"පිස්සුද බං.. උඹ දන්නවනෙ මං ඔය සබ්ජෙක්ට් එකට ඒ තරම් ඉන්ටරෙස්ට් නෑ කියලා.."

ඒකත් ඇත්ත. මූ කවදද කෙල්ලෙක් ගැන මට කියල තියෙන්නෙ..

මුගේ ජීවිත පොතේ මුට ගැලපෙන ගෑනු චරිත ගැන ලියවිලා නැතුව ඇති.

"සිරාවට මචං මං මේ අහන්නෙ.. උඹ ඇයි එෆෙයාර් එකක් පටන් ගන්නැත්තෙ..?"

කවදාවත් අහපු නැති ප්‍රශ්නයක් මං රාජ්ගෙන් ඇහුවා. උගේ මූණට ආවෙ ලොකු හිනාවක්.

"හේතු දෙක තුනක්ම තියෙනවා විහඟ.. ඒත් ප්‍රධාන හේතුව මොකක්ද කියල මට හිතාගන්න බෑ.."

"ප්‍රධාන හේතුව මං හිතාගන්නම්.. උඹ ඉස්සර වෙලා කියල ඉඳපංකො.."

මෙච්චර වෙලා ඇඳේ හාන්සිවෙලා ඉඳපු රාජ් ඇනුමක් හෙම ඇරලා බිත්තියට හේත්තු වුණා.

"මෙකනෙ බං.. ඉස්සෙල්ලම කෙල්ල දාගන්න අම්බානක කට්ට කන්න ඕන.. එහෙම කට්ට කාලා දාගත්ත කියමුකො.. ඊට පස්සෙ ලව් එක බ්‍රේක් කර ගන්නැතුවම දිගටම කරන් යන්න ඕන. අනිත්කෙක බං.. ඔය එෆෙයාර්වල තියෙන්න හුඟාක් සංතෝසෙට වැඩිය දුකනෙ.. හැමෝම බයිල ගහනව මේක තරම් ආතල් එකක් වෙන කොහේවත් නෑ කියලා.. මං හරිද කියපං.."

යකෝ.. බලන් ගියාම ජීවිතේට කෙල්ලෙක් දා ගත්තෙ නැති එකෙක් කියන දේවල්නෙ මට අහන් ඉන්න වෙලා තියෙන්නෙ.. ඒත් ඉතිං මු කියන ඒවලත් ඇත්තක් නැත්තෙමත් නෑ.

"උඹ කියපුව ඔක්කොම හරිය කියල කියන්න බෑ බං.. ලව් එකක හුඟාක් සන්තෝසෙත් තියෙනවා.. මින්නම් උදාහරණෙකට

ගනිං මගෙයි අංජලීගෙයි එෆෙයාර් එක. අපි කොයි තරම් සන්තෝසෙන් ඉන්නවද..?"

මං කිව්ව දේට රාජ්ට මුකුත් කියන්න හම්බවුණේ නෑ. රාජ්ගෙ අක්කා 'අමාති', කිරි දෙකකුත් අරන් කාමරේට ආවා. මං කිරි එකක් අතට අරන් අමාති අක්කා දිහා බැලුවා. ඒ මූණෙ තිබ්බෙ නෝන්ඩියට වගේ හිනාවෙන ගතියක්. ඒ පාර මොකද මේ වෙන්න යන්නෙ..?

"මං දැනගත්තා අර කලින් දවසක මෙහේ ආවහම..."

ට්‍රේ එකෙන් මූණෙ බාගයක් විතර කවර් කරන් අමාති අක්කා කිව්වා.

"මොකක්ද අක්කෙ..?"

මං හොල්මන් වෙලා ඉන්නාව දැකල රාජ් ඇහුවා.

"හැබැයි හොඳ අත්තක් තමයි අල්ලන් ඉන්නෙ.."

රාජ්ගෙ අක්කා මොනව කියනවද මංදා. මට නම් මේ ලෝකෙ හැඩරක් තේරෙන්නෙ නෑ. මං රාජ් දිහා බැලුවා. උං කුන්කුන්දුන් වෙලා වගේ උඩ බිම බලනවා.

"කියන දෙයක් තේරෙන්න කියන්නකො අක්කා..?"

බැරිම තැනද කොහෙද රාජ් කෑගැහුවා.

"මං කිව්වෙ 'ෂක්' ගැන මල්ලි.. විහගත් සිංහල කෙල්ලො නැතුව වගේ අපේ කෙනෙක්ම ළං කර ගත්තනේ.."

හිනා වෙවී එහෙම කියලා රාජ්ගෙ අක්කා කාමරෙන් පිටවුණා.

"මොකක්ද බං ඒ අවනඩුව..?"

"ගණන් ගන්න එපා බං.. අපේ අක්කගෙ කොහේ හරි වයර් ශෝර්ට් එකක්.. එයාට ඉඳල හිටල ඔහොම මිස්ටේක් වෙනවා.."

"මිස්ටේක් නෙමෙයි බං.. උඹලගෙ අක්කා ෆුල් සිරාවට කිව්වෙ.. හරිනෑනෙ බං.. අපි ඇත්ත පහදල දෙමු.."

"අනේ මේ.. මගෙන් කුණුහබ්බ නාහ ඉඳිං... ඇත්ත පහදන්න.. අපේ අක්කට ඇත්ත පහදන්න ගියොත්, අපි උඹගෙ පාර්ට් එකේ බිම හලපු එකේ ඉඳල්, ගෝල්ෆේස් පිට්ටනියෙ වළිය වෙනකන් සජීවීව දෙන්න වෙයි. ඒ කිව්වත් පිළිගන්නෑ.. ඒක මුදු මුවර්.. ඔන්න ඔහේ එයා කැමති දෙයක් හිතා ගත්තාවෙ බං.."

මූ හාල්පාරුව වගේ කියෙව්වට මගේ හිතට නිකං මහ මොකක්ද වගේ. අමානි අක්කා එහෙම කතාවක් කිව්වෙ ඇයිද මංදා. ෂහනාද්, අමානිත් එක්ක මං ගැන මොනව හරි කියලද කියලත් කියන්න බෑ. කොහොම වුණත් එදා ගෝල්ෆේස් ගියපු දවසෙ හැම දෙයක්ම මං අබිට තේරුම් කරල දුන්නනෙ. සමහරවිට අමානි අක්කා මගේ කටින් අල්ල ගන්න හිතාගෙන කිව්වද දන්නෙත් නෑනෙ. ටිකකින් රාජ් මූණ කට එහෙම හෝදගෙන ආවා.

"ඉතිං..?"

ඌ මගේ මූණ දිහා බැලුවා.

"ටිකක් විකර බැඩ් සීන් එකක් රාජ්.."

"උඹ කවදද බං මට හොඳ සීන් එකක් කිව්වෙ..?"

The Spirit of Sri Lan

හිතේ.. මූ ඒක කියපු කැත. ඒත් ඉතිං කරන්න දෙයක් නෑ.. මං නවත්තපු තැනින් කතාව පටන් ගත්තා.

"මද්දුවට තර්ජනයක් දාලා පුජනීගෙ හස්බන්ඩ් ලියුමක් එවලා.. ඌ නම් ඒක වැඩිය ගණන් ගන්නෙ නෑ. ඒත් මගේ හිතට හරි නෑ බං.."

"කෝකටත් මද්දුවට ටිකක් පරිස්සම් වෙන්න කියපං.. දැන් කාලෙත් හොඳ නැතෙ බං.. ගේමක් දීලා ඕක කැතකින් මාරුවෙන්න පුළුවන්.."

ටිකක් වෙලා කල්පනා කරලා රාජ් කිව්වා. ඌ කියන එකත් ඇත්ත. වීරයා වගේ මද්දු කයිය ගැහුවට මොනව කර ගනීවිද මංදා.

"උඹ කියනෙක ඇත්ත රාජ්. ඒත් මට නම් හිතෙන්නෙ මද්දු අයියා ඕක ඉක්මනට විසඳගත්තොත් හොඳයි කියලා.."

රාජ්ගෙ කාමරේ ජනේලෙන් එළිය බලන ගමන් මං කිව්වා. එනකොටම වගේ පාරේ මහා හයියෙන් කැසට් එක දාගෙන ත්‍රීවීල් එකක් ගියා. ත්‍රීවීල් එක ගියේ මුළු නුගේගොඩටම මියුසික් දෙන්න වගේ. මං රාජ් දිහා බැලුවා. ඌ හිනාවෙනවා.

"මොකෝ උඹ හිනාවෙන්නෙ..?"

"හිනා යන්නැද්ද බං.. ඔය දැන් මහ සද්දෙ දාගෙන ගියේ මොකක්ද දන්නවද..?"

ඌ අහපු දේට දන්නෑ කියන්න වගේ මං ඔලුව වැනුවා.

"කැසට් එකකට ත්‍රීවීල් එකක් හයි කරලා.."

මට බකස් ගාලා හිනා ගියා. ඉදල ඉදල මුත් කියන්නෙ මාර කතන්දර තමයි.

"ඒක නෙමේ මචං.. කොහොමද දැන් අංජලිගෙ තත්වෙ..?"

"අවුලක් නෑ රාජ්.. මං දැන් සන්තෝෂයෙන් ඉන්නවා.."

"උඹ සන්තෝසෙන් නම් මාත් පිට තමයි.. දාපං අත.."

උං මගේ දිහාට අත දික් කරා. ඒත් ඊළඟ තත්පරේ කාමරේ කර්ටන් එක උඩ ගියා. දොර ගාව හිටියෙ රාජ්ගෙ අක්කා. එයාගෙ ඇස් දෙක තිබ්බෙ මගෙ මූණෙ.

"ඔයාල දෙන්නගෙ යාලුවෙක් ඇවිත්.."

"කවුද අක්කා..?"

"කවුද කියල ඇවිල්ලම බලන්නකෝ.."

රාජ්ගෙ අක්කා ඒක කිව්ව තාලෙ මට ඇල්លුවෙ නෑ. මායි රාජුයි එළියට එන්න ඇඳෙන් නැගිට්ටා.

"කවුද දන්නෑ..?"

එහෙම කියාගෙන රාජ් කාමරේ දොර ළඟට ගියා. මාත් උගේ පස්සෙන්ම හිටියෙ. සාලෙ හිටපු කෙනාව දැකල මගේ පපුව ගැහෙන වේගෙ වැඩිවුණා.

"එහෙනම් ඔබ්බටත් අපිව මතක් වෙනවා.."

ෂහනාස්ව දැක්ක ගමන් රාජ් කෑගැහුවා.

"අමතක වුණේ මට නෙමේ රාජ් අයියා.."

The Spirit of Sri

ෂහනාස් එහෙම කිව්වහම මං බිම බලා ගත්තා. ඒ වෙනකොට රාජ් සාලෙට ගිහිල්ලා හිටියත් මං කාමරේ දොර ගාවයි හිටියෙ.

"එහෙනම් කාටද ෂබී..?"

ෂහනාස් ළඟ තිබුණු ඉංග්‍රීසි පත්තරේ පැත්තකට දාලා රාජ් එයා ළඟින් වාඩිවුණා. රාජ් අහපු දේට එයා කියන්නෙ මොනවද කියලා අහන්න මං කන්දෙක හොඳට දිග ඇරගත්තා.

"නුහාක් ලංවෙච්ච කෙනෙකුට, එයා කැමති කෙනා ලැබුණ කියල මට ඇවිල්ලා කිව්ව නම් මං විෂ් කරන්නෙ නැතුව ඉන්නවද රාජ් අයියා... ම.. ඔයා දන්නවනෙ ම.. මං ගැන.."

ෂහනාස්ගෙ කටහඬ බිඳිලා ගියා. මගේ පපුවටත් මොනවද වුණා වගේ. ෂබී ඉන්නෙ නුහාක් දුකින් කියල මට තේරුණා. ඒත් මට කරන්න දෙයක් තිබුණේ නෑ. මං කතා කරන්නෑ කියල තේරුණ නිසාදෝ කොහෙද රාජ් කතාව පටන් ගත්තා.

"ප්ලීස්.. අප්සෙට් ගහන්නෙපා ෂබී.. අපෙ අම්මත් ඇතුලෙ ඉන්නවා.. දන්නවනේ.. හොඳ බර බරයක් හම්බවෙයි.. ආයෙ දෙකක් නෑ. ඒංගත් කූල් වෙන්න බලන්න.."

රාජ් එහෙම කිව්වත් ෂහනාස් කතාව නැවැත්තුවෙ නෑ. එයා තීන් සීරුවෙ ආයෙත් කතාව පටන් ගත්තා.

"මට නුහාක් ලංවුණු කෙනාට කියන්න බැරිවුණ දේ ඔයා හරි ඇවිල්ල කියපු එක ගැන මට නුහාක් සන්තෝෂයි රාජ් අයියා.."

ෂහනාස් එහෙම කිව්වහම මං ඔළුව උස්සල එයා දිහා

බැලුවා. ඔලුව සම්පූර්ණයෙන්ම වහල තිබ්බ සුදු පාට ඩාවනි එක, ඒ මැද්දෙන් හඳක් වගේ තිබ්බ සුදු මූණ, පිරිසිදු නිල් ඇස් දෙක, තද නිල් පාට සල්වාර් ඇඳුම, ක්‍රීම් පාට වැටිච්ච ස්ලිපර්ස් දෙක, මගේ එක බැල්මට අහුවුණා. ඒත් ඒ වෙනකොටත් ශහනාස්ට කියන්න ඕන කිසිම දෙයක් මගේ ඔලුවට ආවෙ නෑ.

"හුඟාක් ලංවුණ කෙනෙක් කියල වචන නාස්ති කරන්නෙපා ෂබී..! විහඟ මෙහෙ වරෙන්.. මෙයා මේ මෙච්චර බර වචන දාලා අමාරුවෙන් කතා කරන්නෙ උඹ ගැනනෙ.. උඹටත් මොනව හරි කියන්න ඇතිනෙ.."

රාජ් ඔලුවෙන් මට අඬ ගැහුවා. ෂබී ඉන්න තැනට යනවද නැද්ද කියන තීරණේ ගන්න බැරිව මගේ හිත කං කෙඳිරි ගෑවා. ඒත් ඒ කංකෙඳිරිය පැත්තකට දාලා ගිහින් ෂබී ඉස්සරහ තිබ්බ පුටුවෙ මං වාඩිවුණා.

"ම.. මං ඔයාට හුඟාක් ලංවුණ කෙනෙක්ද ෂබී..?"

ඒ නිල් ඇස් දෙක දිහා බලාගෙනම මං ඇහුවා. පුදුම හිතෙන තරම් සන්සුන් බවක් ඒ ඇස්වල තිබුණෙ.

"ඒ වගේ ප්‍රශ්නයක් ඔයා ඇහුවෙ කොහොමද විහඟ අයියා..? ඒත් මං අද ඒක කියන්නෙ නෑ. ඔයාට කවද හරි දැනගන්න පුළුවන් වේවි.. මගේ මුළු ජීවිතේටම මං ආදරේ කරපු එකම පිරිමියා කවුද කියලා.. මගේ හිත ඉල්ලපු කෙනා කවුද කියලා..."

ශහනාස් එහෙම කිව්වහම මට මතක් වුණේ එදා ගෝල්ෆේස් එකේදි එයා මට ආදරෙයි කියල කිව්ව හැටි.

"ෂබී.. ඔයා රෑන් යනවා වගේ.."

ඒ පාර රාජ් මැද්දට පැන්නා. ඇත්තටම ඌ පැනපු එක හොඳයි. ෂහනාස් කියපු දේවල් වලින් මගේ හිත අසරණ වෙලයි තිබුණේ.

"නෑ රාජ් අයියා.. මං රෝන් යන්නෙ නෑ. විහඟ මගේ නොමෙයි කියනෙක මට තේරෙනවා. එයා මට අයිති නෑ කියලත් මං දන්නවා. ඒත් අර ගර්ල් එක්ක එෆෙයාර් එකක් පටන් ගත්තා කියලා ඇයි මට නොකියා හිටියෙ.. මං ඉර්සියා කරයි කියලා හිතුවද..? ඔයා දන්නෑ රාජ් අයියා.. ඔයා ඒ විත්තිය මට කියපු දවසෙ මං කොයි තරම් ඇඬුවද කියලා. ඒත් මගේ රිදිච්ච හිත පැත්තකින් තියලා මං මුළු හිතෙන්ම විහඟට සුභ පැතුවා. අඩුගානෙ මට ෆෝන් කරලවත් ඒ විෂ් එක ගන්න විහඟ ට්‍රයි කරේ නෑ. මං කොහොමද මට නොකියන දේකට බලෙන් ඔයාට විෂ් කරන්නෙ..?"

ෂහනාස් දිගටම කියවගෙන කියවගෙන ගියා. කතා කරගන්න බැරුව මං ගල්වෙලා හිටියෙ. රාජුත් මෙලෝ දෙයක් කිව්වෙ නෑ. අංජලීට ලංවුණාට පස්සෙ මගේ හිත ළඟ ඉඳපු ෂහනාස්ව සහමුලින්ම අමතක කරා කියන දේ මගේ හිතට වද දෙන්න ගත්තා. සිද්ධවෙච්ච හැමදෙයක්ම ෂහනාස් කියාගෙන යද්දි, මේ මුස්ලිම් කෙල්ල කොයි තරම් අහිංසකද කියලත් මට හිතුණේ පාරක් දෙපාරක් නම් නොමෙයි. මං ආයෙත් ෂහනාස් දිහා බැලුවා. අර නිල් පාට ඇස් දෙක යාංතන් රතු පාටට හැරිලා. මටයි රාජ්ටයි පේන්න එයා ඇඬුවෙ නැතිවුණාට හිත යටින් එයා අඬනවා කියලා මට තේරුණා.

"මගෙන් වැරැද්දක් වුණා නම් මට සමාවෙන්න ෂබී.. මං.. මං.. ඒක හිතල කරපු දෙයක් නෙමේ.."

මං ඉස්සරහට නැමිලා ෂහනාස්ගෙ දණහිසට තට්ටුවක් දාන ගමන් කිව්වා. ඒ තට්ටුවට එයා ගැස්සිලා වගේ මං දිහා බැලුවා.

ඊත් එත්කම රාජ්ගෙ අක්කා අමානි ආයෙමත් අපි තුන්දෙනා ළඟට ආවා.

"මෙයාල දෙන්නාට මේ කරන උදව් වලට අපිට වෙනම ගෙවන්න ඕන.. නැද්ද මල්ලි..?"

මගෙයි ෂබීගෙයි මූණු දිහා බල බල අමානි රාජ්ගෙන් ඇහුවා.

"ඒක හරි.. ඒක හරි.. ඒව පස්සෙ ඉල්ලගමුකෝ.."

රාජ් එහෙම කියලා ෂහනාස්ගෙ පැත්තට හැරුණා. අමානි අක්කා තවත් බයිල ගහයිද කියල මං හිතුවත් හොඳ වෙලාවට එයා ආයෙත් ගේ ඇතුළට ගියා.

"ඉතිං ෂබී.. බේරුවල පැත්තෙ ගියේ නැද්ද..?"

විංගෙත් වෙලා ඉඳලා මං ෂහනාස්ගෙන් ඇහුවා. එයාගෙ මූණට ආවෙ හිතාගන්න අමාරු හිනාවක්.

"මේ පිච්චෙන කොළඹ නගරෙට තියෙන ආශාවට මං බේරුවල අමතක කරා අයියේ.. ඒත්.. ඒත්.. දැන් මට ආයෙ බේරුවල යන්න හිත හදාගන්න බෑ.. මං යන්නෙත් නෑ.."

මං ඇහුව ප්‍රශ්නෙට ගැටිලා යන්න වගේම, මගේ හිත හොල්මං වෙලා යන්න හොඳ සිරා උත්තරයක් ෂහනාස් දුන්නා. රාජුත් මෙලෝ දෙයක් කියන්නැතුව ඉන්නවා. වෙන වෙලාවට මූ දේවදත්තයා වගේ මොන මොනවා කතා කරලද..? ඒත් දැන් මාවම කන්නද කොකහද කට බලිය වගේ කරගෙන උඩ බලන් ඉන්නෙ. මං ආයෙත් රාජ්ගෙ මූණෙන් ඇස් දෙක අරන් ෂහනාස් දිහා බැලුවා. ඒ ලස්සන නිල් ඇස් දෙක මගේ දිහාට හැරිලයි තිබුණේ. ඒ

ඇස්වලින් මගේ මුළු ආත්මෙම පිරික්සන්න වගේ එයා මං දිහා බලන් හිටියා. විනාඩි ගානක් එහෙම ඉඳලා එයා මොනවාදෝ කියන්න කට හදනවා මං දැක්කා.

"මේ ආත්මෙදි මට ඔයාව හම්බවුණේ ටිකක් පරක්කු වෙලා.. ඒත් ඊළඟ ආත්මෙදි එහෙම වෙන්න මං ඉඩ දෙන්නෑ.."

මහනාස්ගෙ වචනවල තිබ්බ, අධිෂ්ඨාන ශක්තියට මං ගැස්සිලා ගියා. ඇත්තටම මට කියන්න දෙයක් තිබ්බෙ නෑ. අනික එයා ඒ වගේ දෙයක් කියාවි කියල මං හීනෙකින්වත් හිතුවෙ නෑ. මහී ඒ වචන ටික වුණත් කිව්වෙ හොඳට හිතල කියල මට තේරුණා.

"ගල් ගුබ්බා වගේ ඉන්නැතුව කතා කරපං රාජ්.."

සද්දයක් බද්දයක් නැතුව ඉන්න රාජ්ගෙ අතින් මං ඇද්දා.

"අපි දෙන්න අතරෙ තියෙන කතාවට එයා පනින්නෑ ඊහඟ අයියා.. රාජ් මැනර්ස් දන්නවා.."

මහනාස් ඒක කියපු තාලෙ මට ඇල්ලුවෙ නෑ.

"එතකොට මැනර්ස් දන්නෙ නැත්තෙ මම ද මහී...?"

"මගෙත් එක්ක රණ්ඩු වෙන්න හදන්න එපා අයියෙ.. මං එහෙම දෙයක් නොවෙයි කිව්වෙ.. මට ඕන ඔයත් එක්ක කතා කරන්න.. රාජ් අයියත් එක්ක මට ඕන වෙලාවක කතා කරන්න පුළුවන්.. මට කතා කරන්න හම්බවෙන්නැත්තෙ ඔයත් එක්ක.."

මහනාස්ට ඒ ටික විතරයි කියන්න හම්බවුණේ.. රාජ්ගෙ අම්මයි අක්කයි සාලෙට ආවා. ඊට පස්සෙ එයාලා දෙන්නා මහනාස්ව කතාවට අල්ලා ගත්තා. මායි රාජුයි පැත්තකට වුණා. රාජ්ගෙ

අම්මයි අක්කයි එක්ක කතා කරන ගමනුත් ඉබි සැරින් සැරේ මගේ දිහා බලනව මං දැක්කා. ටිකකින් උදේට කාල ඉවරවෙලා හෙම ආයෙත් මායි රාජුයි කාමරේට රිංග ගත්තා.

"පිස්සු හැදෙනවා රාජ්.. ඉබීට මොනව වෙලාද මංදා.."

"මටත් තේරෙන්නැති දේ ඒක තමයි විහඟ... ඒකි නාම පිළිගන්නෙ නෑ උඹ අංජලිගෙ කියලා.."

"ඒකට මට කරන්න දෙයක් නෑනෙ බං.."

"උඹට කරන්න දෙයක් නැති විත්තිය ඇත්ත.. ඒත් මට තියෙන දුක ඒකි මැරෙනකන් වුණත් උඹ ගැන හිත හිතා ඉදීවි කියනෙකයි. ඒත් ඉතිං එහෙම වුණා කියලා මොනවා කරන්නද..?"

"ඒකනෙ බං මටත් තේරෙන්නෙ නැත්තෙ.. උඹ මය නිවාඩු පාඩු වෙලාවක දෙයියනේ කියලා ඉබීට තේරුම් කරල දීපංකො කවක් මං ගැන හිතල වැඩක් නෑ කියලා. දැන් මගේ ලෝකෙ ඉන්නෙ අංජලි විතරයි රාජ්.."

"කරන්න බැරි වැඩ බාර ගන්න මට බෑ මචං.. ඔය ඔහොම හෙමේ ඔලුවෙන් හිටගෙන කිව්වත් ඒකි ඒකිගෙ අදහස් හිතෙන් අයින් කරන්නැති විත්තිය මං දන්නවා.. මොකද පුංචි කාලෙ ඉඳලම ළඟින් ආශ්‍රය කරලා තියෙන හන්ද ඒකිගෙ හිත කොයි වගේද කියල මං දන්නවා.."

"එහෙනම් ඉතිං වෙන කරන්න දෙයක් නෑ.. බම්බු ගහගන්න කියපං.."

මගේ හිතට ආවෙ පුංචි කේන්තියක්. සහනාප් වුණත් දැනගන්න

ඕන මගේ ලෝකෙ දෙන්නෙකුට කිරුළු පළඳින්න බෑ කියල. ඒක තාමත් තේරුම් ගන්න බැරි නම් ඒක ෂබ්ගෙ මෝඩකම. මට එහෙම හිතුණත් මං රාජ්ට ඒක කියන්න ගියේ නෑ.

"ඒක නෙමේ බං... දැන් නියාස් නිකමටවත් මේ පැත්තෙ එන්නැද්ද..?"

ඒගාවට මගේ හිතට ආවෙ නියාස්ව. ඇයි අප්පා ඌනෙ ෂබ්ව බඳින්න ඉන්නෙ.. ඌ ගැනත් හොයල බලන්න ඕනනේ.

"ඌ රත්නපුරේ පැත්තෙ ජෙම් බිස්නස්වලට බැහැලා.. ඌට දැන් කෙල්ලො ගැන හිතන්න වෙලාවක් නෑ.."

"හිටපු ගමන් මොකද බං ඒ..?"

"හිටපු ගමන් කියන්නෙ..? උඹයි ෂබ්යි එදා ගෝල්ෆේස් එකේදි ඇට් කරපු පිචර් කෑලි දැකලත් ඌ තාම ජීවත්වෙන එකනෙ පුදුමෙ.. මං වගේ එකෙක් නම් එල්ලිලයි මැරෙන්නෙ.."

සමහර වෙලාවට මූත් මහ මැටි මෝල් කතා කියන්නෙ.. අමතක කරන්න බැරි තරමට හිත ඇතුලෙ දාන් ඉන්න අතීතෙ මූ අවුස්සනවා. තවත් ඒ ගැන මූත් එක්ක කතා කරලා වැඩක් නෑ.

"මොකෝ උඹට තද වුණාද..?"

"තද වෙන කතානෙ උඹ කියන්නෙ..?"

"ඉතිං තද නොවී ඉඳපන්කො.."

හින්.. මූත් එක්ක කතා කරනවට මං මටම ගහගන්න ඕන. මූත් අර කුණු මද්දුව වගේ තමයි. කොයි තරම් හොඳට කතා

කරත් අන්තිමට කුණු කතාවක් කියනවමයි. බලන් ගියාම මුටයි මද්දුවටයි පුදුම සමාන ගති පැවතුම්නෙ තියෙන්නෙ.

"අද මොකද කරන්නෙ..?"

විකසින් උං ඇහුවා. කරන්න මින මොනවද කියල මගේ ඔලුවටත් ආවෙ නෑ.

"කරන්න දෙයක් නෑ බං.. අද දවසම එකබ්ලාස් දවසක්.. මිහා කුණු වැඩමයි වෙන්නෙ.."

"මොනා කුණු වැඩද බං.. අද ඇවිල්ලා සිරා දවසක්.."

රාජ් ඒක කියපු තාලෙ මට ඇල්ලුවෙ නෑ. උගේ මූණ හිනාවෙන් පිරිලා.

"අක්කා.. අපිට ඩ්‍රින්ක් එකක් එවන්න.."

හිටපු ගමන් උං මුළු ගේම දෙවනත් වෙන්න කෑගහල මං දිහා බැලුවා.

"උඹ මොනවද ඉස්සෙල්ල කියන්න ගියේ..?"

මං ආයෙත් උගෙන් ඇහුවා.

"උඹ ඇහුවනෙ පහුගිය දවස්වල මං මොකද කරේ කියලා..?"

"ඔව්.."

මං උගේ මූණට එබුණා.

"මං වීඩියෝ සෙන්ටර් එකක් දාන්න ලෑස්තිවෙනවා බං.."

"න්.. නෑන්.. කො.. කොහෙද බං.."

රාජ්ගෙ මූණ හිනාවෙන් පිරිලා. මගේ හිතටත් ආවෙ මාරම පිට් එකක්. බලන් ගියාම මූණෙ යකෝ පොර.

"අමර එකට ඩිංගක් එහායින්.. පීස් එහෙම ඔක්කොම ගෙනැල්ල තියෙන්නෙ. ඇතුලෙ වැඩට මං කොල්ලො දෙන්නෙකුත් බැලුවා. තව පොඩි වැඩ ටිකක් තියෙනව එච්චරයි.."

"යකෝ ඔච්චර හරියක් කරලත් උඹ මට කිව්වෙ නෑනෙ.."

"කිව්වෙ නෑ නෙමෙයි බං.. උඹව පුදුම කරන්නයි මං හිටියෙ.. ඔක්කොම සෙට් කරලා.. අඩු ගානෙ තව දවස් තුන හතරක් උඹ ආවෙ නැත්නං උඹව හොල්මන් කරවන්න මට තිබුණා. ඒත් ඊට කලින් උඹ ආවනෙ බං.. උඹේ මූණ දිහා බලන් මං කොහොමද ඔය වගේ දෙයක් නොකිය ඉන්නෙ..?"

මට ආවෙ පුදුම සන්තෝෂයක්. ඒ සන්තෝෂය පිට කරන්න මං දෙපාරක් හිතුවෙ නෑ.

"කියල වැඩක් නෑ රාජ්.. මට හුඟාක් සන්තෝෂයි බං.."

මං උගේ අත බදාගත්තා. උගේ මූණ හිනාවෙන් පිරිලා.

"මං දන්නවා බං.. මං දන්නවා.. හැමෝටම වැඩිය සතුටු වෙන්නෙ උඹ කියලා.. ඒකනෙ මං උඹව පුදුම කරවන්න හැදුවෙ. පිට් තමයි බං.."

උගෙයි මගෙයි සන්තෝසෙ අස්සෙ කාමරේ දොර ගාවින් පුංචි සද්දයක් ආවා. මායි රාජුයි ඒ දිහා බැලුවෙ එක පාරටම. බීම දෙකකුත් ට්‍රේ එකක් තියාගෙන දොර ගාවට වෙලා හිටියෙ වෙන කවුරුවත් නෙමෙයි ෂහනාස්.

"මං ඇතුළට ආවට කමක් නැද්ද..?"

මූණ පැත්තකට ඇල කරලා ෂහනාස් ඇහුවා. එයාගෙ ඇස් දෙක තිබ්බෙ මගෙ මූණෙ.

"වෙනදත් ඔයා ආවහම ඔහොම අහන්නෑනෙ ෂබ්.."

රාජ් ඒක කිව්වෙ කැපිල්ලට වගේ. ෂහනාස් හිනාවුණා.

"ඒ වුණාට අද විහඟ අයියා ඉන්නවනෙ..."

එයා ඒ හිනාවෙන්ම කිව්වා.

"එතකොට අර මූංගෙ ගෙදරදි කවුරුවත් නැති වෙලාවෙ දොරවල් වහගෙන ගේ ඇතුලෙ හිටියෙ.. ඒවට කවුද උත්තර දෙන්නෙ..?"

රාජ්ගෙ කතාවට ෂහනාස්ගෙ හිනාව තවත් වැඩිවුණා.

"හපොයි උඹේ හට්ටි කට.. ඇන්ටිටත් ඇහෙයි යකෝ.. මං මේ ගෙදර ඇවිල්ලත් ඉවරයි.."

උගේ පිටට පාරක් ගහන ගමන් මං කිව්වා.

"ඇන්ටි නානවා.. අමානි අක්කා තමයි මිට කිව්වෙ මේක ගිහින් දෙන්න කියලා.."

ෂහනාස් මං ඉස්සරහට ඇවිත් ට්‍රේ එක ඇල්ලුවා.

"තෑන්ක්ස්.."

මං බීම එක අතට ගත්තා. රාජ්ට පුංචි හිනාවක් ගියා.

"රාජ් අයියා මට හිනාවෙනවා.."

"නෑ ෂබී.. අපේ අක්කා මගුල් කාපුකම තාම අහැරලා නෑ වගේ.. කමක් නෑ ඔහොම යං.. ඔහොම යං.."

"ඇයි හොඳ නැද්ද..?"

මූං දෙන්නා මොනාව කියනාවද මංදා. මං හනි හනිකට බීම එක බිගෙන බිගෙන ගියා. පපුවත් සීතල වෙලා ගියාද කොහෙද..?

"විහඟ අයියා කොහොමද ජීවිතේ..?"

ෂහනාස් එහෙම ඇහුවෙ හුගාක් සන්සුන් ඉරියව්වක ඉඳලා. හරියට කලින් කතා කරපුව අමතක කරලා දාල වගේ.

"අවුලක් නෑ ෂබී.. සිරාවට දුවනවා.."

"ඒ විත්තිය නම් මූණෙන්ම පේනවා.. හිනාව පිරිලා.."

"ඇයි මං හිනාවෙනවට ෂබී කැමති නැද්ද..?"

මං අහපු දෙයින් ෂබීගෙ මූණ අමුතුවෙලා ගියා. ඒ අමුත්ත ඉක්මනට හංගගෙන එයා කතා කරා.

"ඔයාගෙ හිනාවක් දකින්න මේ ලෝකෙ වැඩියෙන්ම කැමති මම තමයි විහඟ අයියා. ඒක ඔයාට කවදාම හරි තේරේවි. ඒක ඔයා තේරුම් ගන්නෙ නෑ කියල මට තේරුණුදාකට මං ආයෙ ඔයා ඉස්සරහට එන්නෙ නෑ.."

එයා එහෙම කිව්වෙ හුගාක් හිතල මතල කියල මට තේරුණා. හිත පතුලටම දැනෙන්න තරම් දේවල් ලස්සනට කියන්න ෂහනාස්ට පුළුවන් කියල මං දැනන් හිටියා. රාජ්ගෙ බීම එක තාම අතේ. උං ඒක තාම බීලත් නෑ. මට පේන්නෙ උං හොල්මන් වෙලා ඉන්නෙ ෂබීගෙ කතාවට.

"එහෙනම් ඉතිං පටන් ගත්තු දේවල් ඉස්සරහටත් හොඳින් කරගෙන යන්න පුළුවන් වෙන්න කියලා මාත් විෂ් කරන්නම්.."

ෂහනාස් මගේ දිහාට එයාගෙ දකුණු අත දික් කරා. රෝස පාට ඇඟිලි තුඩු තීන් සිරුවෙ මිරිකා ගන්න ගමන් මං ෂබීගෙ මූණ දිහා බැලුවා. අතේ තිබ්බ බීම වීදුරුව පැත්තකින් තියල රාජ් අත් දෙකෙන්ම මූණ වහගත්තා.

"අනේ රාජ් අයියා.. මෙතන මූණ වහගන්න තරම් දෙයක් වුණේ නෑ.. ඔයා නම් හරිම නරකයි.."

මගෙන් අත අයින් කරගන්න ගමන් ෂහනාස් කිව්වා.

"නරකයි තමයි. මං දන්නවනෙ දෙන්නගෙ තරම කොහොමද කියලා. අන්තිමට දෙන්නාත්එක්ක එකතුවෙලා මාව කාමරෙන් එළියට ඇදලා දාලා දොරත් වහගනියි එතකොට..?"

මං ගාව තිබ්බ කොට්ටෙන් අරගෙන ෂහනාස් රාජ්ට ගහන්න හැන්නා. එතකොට තමයි අමානි අක්කා දොරෙන් එබුණේ.

"ෂබී.. අම්මා නාලා ඉවරයි.."

රාජ්ට රවලා, අතේ තිබ්බ කොට්ටෙ මගේ උකුළට දාලා. ෂහනාස් අමානිත්එක්ක කාමරෙන් පිටවුණා.

"හුහ්.. බලපංකො අපේ අක්කගෙ තියෙන ගාඩ් එක.. ඒත් ඉතිං ඇත්ත තත්වෙ දන්නව නම් අක්කා අඬනවා. ඒක බුදු හුවර්.. එතකොට ඉතිං උඹ කදයා වගේ ගෙදර ගිහින් ඉදියි.. අපේ අක්කා ගෙ ඉදන් මටයි අඬන්න වෙන්නෙ.."

වෙලාවකට මුගෙත් මොලේ හොද නෑ. පිස්සු බල්ලෙක්වත් හපලද මංදා.

"ඒකනෙ උඹට සුද්ද සිංහලෙන් මං කිව්වෙ.. උඹලගෙ අක්කට ඇත්ත තත්වෙ කියපං කියලා.. නැත්තං කවද හරි මංනෙ බිං බොරුකාරයා වෙන්නෙ.."

"ඉතිං උඹට ඒ ගැන මය තරම් කැක්කුමක් තියෙනව නම් උඹම කියපංකෝ.."

හිතේ මූ ඒක කියපු කැත. කටේ දිවේ නොගෑවී මූ පිනා වගේ ඒක කිව්ව හැටි. කොහොම හරි එක විතර වෙද්දි ෂහනාස් අපිටත් කියල යන්න ගියා. ඕපන් කරන්න යන වීඩියෝ සෙන්ටර් එකේ ඉතුරු වැඩ කටයුතු ගැන මායි, රංජුයි හවස් වෙනකන්ම කතා බහ කරා. මූ නිකං ඉන්නවට වැඩිය මෙහෙම දෙයක් හරි කරනෙක හොඳයි. මුළු දවසම රාජ් එක්ක ඉඳලා, මං අපේ ගෙදරට සම්ප්‍රාප්ත වෙනකොට හත විතර වෙලා.

"ආ.. පාට්නර් උඹ ආවද..?"

මං ගෙට ඇතුල්වෙනකොටම මද්දු අයියගෙ කටහඬ ඇහුණා. මේ දවස්වල ලයිට් කපන නින්දා ගේ පළාතම කට්ට කරුවලයි. ඒත් කුස්සිය පැත්තෙන් පොඩි එළියක් මං දැක්කා. අම්මා කුස්සියට වෙලා වැඩ කරනව ඇති. මද්දු අයියා ඉටිපන්දමක්වත් පත්තු කරලා නෑ.

"ඕම්.. මං ආවා.."

"ආවා නම් මූණ කට හෝදගනිං.. මේ කුන්කාලක් ගෙවිච්ච දවසත් මස්ත බාල්දු කරන්නද උඹ හදන්නෙ..?"

මද්දුවා මහා කුණු කතාවක් කිව්වා. ඌට උත්තර දීල ලේ කෝප කරගන්නෙ මොකටද..? මං කළුවරේම කාමරේට ගිහින් ටී

ෂර්ට් එක ගැලෙව්වා. එතකොටම ආයෙත් මට මද්දුගෙ කටහඬ ඇහුණා. මේ පව්ට කරුවලේ උඹ සිංදු කියනවා.

"මං ඉන්නෙ අන්ධකාරෙ දැන්... ඉවසන්න බෑ මේ විඳුම්.."

ඔව් ඉතිං උඹ විතරක් නෙමෙයි. මාත් ඉන්නෙ අන්ධකාරෙකනෙ.. ඇයි අප්පා ලයිට් ගියාට පස්සෙ ඉතිං අන්ධකාරෙ නැතුව වෙන මොනවද..? ඩිංගකින් උගේ සද්දෙ නැවතුණා. ජුවර් එකටම එළ මෝලා වගේ කියවන්න ගත්තට සිංදුවෙ ඉතුරු කෑල්ල දන්නෙ නැතුව ඇති. ටී ෂර්ට් එක රැක් එක හරියට විසි කරලා මං කුස්සියට ගියා අම්මව බලන්න. වෙලාව කියන්නෙ මන්න එතකොටම ලයිට් ආවා. හප්පේ.. මුළු ගේම එළියයි.

"ආලෝකේ.. ආලෝකේ ඔබද ප්‍රියේ..
ආලෝකේ... ආලෝකේ.. ඔබද ප්‍රියේ.."

ආයෙත් කුණු මද්දුවගෙ අදෝනාව ඇහුණා. ඔව් ඉතිං ලයිට් ආවහම ආලෝකෙ තෝන්නාම්.. අම්මප අද මුට මොනාට වෙලාද..? විසබීජයක්වත් පැඟිලාද මංදා. මං අලියා වගේ පෙරළගෙන කුස්සියට ආපු සද්දෙට අම්මා මගේ දිහාට හැරුණා.

"මද්දු ගීතයෙන් ගීතය කරනව වගේ... නේද පොඩී..?"

බත් බෙදන ලොකු හැන්ද අතේ තියාගෙන ඉඳපු අම්මා මං දිහා බලල හිනාවුණා.

"ඔව් අම්මා.. හඳ මෝරන කාලෙට පිස්සු තද වෙනවලුනෙ.."

මද්දූ අයියට කැපිල්ලක් දාන්න ලේසියෙන් හම්බවෙන්නෑ.. ඉතිං අතට ආපු චාන්ස් එක මිස් කරන්නෙ කොහොමද අප්පා..

පංඩිතයා වගේ මං එහෙම කියලා හැරිල බලද්දි මෙන්න මද්දුව මගේ පිටිපස්සෙ.

"මොනවද පොඩී උඹ කිව්වෙ..? හඳ මෝරනකොට.. නේ.. එතකොට අද උඹ මුළු දවසෙම ගෙදර හිටියෙ නැත්තෙ මොනව මෝරලද..? මට හිතෙන්නෙ නම් හඳ මෝරල නෙමේ.."

ෂිසේ.. අම්මත් ඉස්සරහ මද්දූ කිව්ව කුණු කතාවෙ හැටි.. මූට නම් මොලේ කියල බිම් අහලක්වත් නැද්ද කොහෙද..?

"දවල්ට කොහෙන්ද මද්දු හඳවල්..?"

ෂේප් වෙන්න හිතාගෙන මං ඇහුවා.

"මාත් මේ අහන්න හිටියෙ.. ඇක්කට පොඩී.. අද කොහෙද ගියේ..? දවසෙම ගෙදර හිටියෙ නෑ.."

අම්මා මගෙන් ඇහුවා. ඕං දැන් දීපන්කො උත්තර.

"මං රාජ්ලහ ගියා අම්මා.. රාජ් වීඩියෝ සෙන්ටර් එකක් ඕපන් කරන්නයි යන්නෙ.. ඒකෙ වැඩ ගැන අපි කතා කර කර හිටියෙ.."

හැරෙන හැපෑලෙන් මම උත්තරේ ගැට ගහගත්තා. ඒක අහලා මද්දුගෙ කට ඇරුණා.

"අඩෙ.. එහෙනම් අපිට නොමිලෙම වීඩියෝ පීස් ටිකක් බලනැහැකිනෙ පොඩී.. උඹ උංට කිව්වෙ නැද්ද මාත් උංට බොක්කෙන්ම සපෝර්ට් කියලා.."

මගේ අයියා නොවේ නම් මං මූට මෙතනම ගහනවා. අර මනුස්සයා මහන්සි වෙලා දාන වීඩියෝ කඩේ, මූ නොමිලෙ පීස්

බලන්නයි හිතාගෙන ඉන්නෙ.. අනේ ඇත්තට මුගේ මොලේට මේවා කොහෙන් එන අදහස්ද මං දා මේවා.

"ලොකුත් හුඟ දවසකින් ආවෙ නෑ.. මුකුත් කරදරයක්වත්ද දන්නෑ. ඒ පැත්තෙ ගිහින් එන්න ඕන හෙට අනිද්දා දිහාට.."

මගෙයි මද්දුගෙයි මුණු දිහා බල බලා අම්මා කිව්වා. ඇත්ත තේන්නම්.. අම්මා කිව්වහමයි මටත් මතක් වුණේ.. ලොකු අයියා හුඟ දවසකින් ආවෙ නෑ කියල. වෙනදට මාසෙකට සැරයක් කොහොම හරි එන මනුස්සයා.. ඒත් ඉතිං දැන් පොර ඉන්නෙ පළාත තමයි මට දිරවන්නෙම නැත්තෙ. හැටන් කියල කිව්වහම දෙසිය ගානට හිතලයි කියල නොදන්නෙ මොකාද..?

"අම්මා යන්නෙපා.."

හිටපු ගමන් හෙන ගහන්න වගේ මද්දු කිව්වා. අම්මගෙ මූණත් එක පාරටම වෙනස් වෙලා ගියා. ඇත්ත තේන්නම් අම්මගෙ මූණ අප්සට් නොගිහින් තියේවිද මූ ඒක කියපු කාලෙට. හරියට නිකං පුජනීට හැටන් යන්න එපා කියල වගේනෙ මූ කිව්වෙ.

"ඇයි මද්දු එහෙම කිව්වෙ..?"

ටිකක් වෙලා ඉඳලා අම්මා ඇහුවා. මං මද්දුගෙ මූණ දිහා බලන් හිටියෙ උගේ අර කුණු හිනාව කොයි වෙලේ මූණ මැදට එයිද කියලා. ඒත් ඒ කුණු හිනාව ආවෙ නෑ. උගේ මූණ මං හිතුවෙ නැති විදියට හැඟීම්බර වුණා.

"මේ දවස්වල එහේ හොඳටම සීතල ඇති අම්මා. එහේ ගියොත් අම්මගෙ පීනස් අමාරුවයි තියෙන අනිත් ලෙඩයි ඔක්කොම වැඩිවේවි.. අම්මා අසනීප වෙනවට මායි පොඩියි දෙන්නම බයයිනෙ අම්මා.."

හෙනම හෙන සිරා විදියට මද්දු ඒක කිව්වෙ. මද්දුගෙ කටහඬත් මොකක්දෝ වෙලා. මගේ ඇස් දෙකට ලාවට කඳුළු බිංදු දෙකකුත් ආවා.

"එහෙනම් මොකද කරන්නෙ මද්දු..?"

අම්මා ආයෙත් ඇහුවා. ගෙදර පොඩි එකා හන්දා ඔය වගේ වැදගත් ප්‍රශ්න මැද්දට පැනලා කතා කරන පුරුද්දක් එදා ඉඳලම මට තිබ්බෙ නෑ. තිබ්බෙ නෑ නෙමෙයි එහෙම කතා කරලා කුණු මද්දුවගෙන් ටොක්කක් කන්න බැරි අසනීපෙයි තිබුණෙ.

"මං කියන්නද අම්මා.. හෙට අනිද්දා දිහාට මායි පොඩියි දවස් දෙක තුනකට හැටන් ගිහිල්ලා එන්නම්.. අම්මගෙ නඟියට පල්ලෙහා ඉස්කෝලෙ නෝනලගෙ මේරිව ගෙන්න ගන්න පුළුවන්නෙ.."

අඩේ.. මද්දුව කියපු කතාට නම් ඉස්තරම්. ෆැන්ටාස්ටික්.. මේ වගේ සිරා අදහසක් මට නිකංවත් පහල වුණේ නෑනෙ..

"ඒක නම් හොඳයි තමයි මද්දු.. ඔයාටත් ගිහිල්ලා ලොකුලව බලල එන්න කියන්නයි මං හිටියෙ. ඒත් ඉතිං ඔයාගෙ නිවාඩුත් ඉවර වගේ හින්දයි මං යන්න බැලුවෙ.."

එහෙම කියාගෙන අම්මා රෑට උයන්න ලෑස්ති වුණා. ලයිට් ගියපු වෙලාවෙ කරගන්න බැරිවුණ දේවල් දැන් හරි කරගන්න එපායැ. යකෝ බලන් ගියාම මද්දුගෙ මොලේ තමයි මොලේ. ඔය හැටන් පැත්තෙ යනකොට අංජලීවත් එක්කහු කරගෙන සීතලට ගුලිවෙලා ඉන්නකොට කොහොම ගතියක් තියේවිද..? ඒ ගැන හිතෙන කොටත් මට ආවෙ අමුතුම හැඟීමක්.

"මොකෝ පාට්නර් කල්පනා කරන්නෙ..?"

සාලෙ හරියෙදි මද්දු අයියා මගෙන් ඇහුවා.

"නෑ මං මේ බැලුවෙ රාජ්වත් එක්කං ගියා නම් හොඳයි කියලා.."

මං ඔහේ කටට ආවට කියල දැම්මා. කොහොමටත් රාජ්වත් ඇදගෙන යන්න ඕන කියල මගේ ඔලුවට ආවෙ කලින් ඉඳලමයි. ඌ නැතුව කිසිම ගතියක් නෑ.

"උඹ කිව්වත් නැතත් ඌව එක්ක යන්න ඕන.. හැබැයි පුතේ.. උඹට වදින්නම්.. ගෑනු පරාණ නම් මේ ගමනට ජොයින්ට් කරගන්නෙපා.. ගන්න තියෙන ආතල් එකටත් කෙලවෙලා යාවි.."

ඕකේ.. කුණු මද්දුව ඒක කියනු කැත.. ඌ මගේ ආතල් එක, අමුතුම හැඟීම කත්පර දෙක තුනකින් ඉවරටම ඉවර කරලා දැම්මා.

"ඔය.. ඔය බලපං ඉතිං.. ඒ පාර මූණ හතරැස් කරගත්තා.. උඹ හැරෙනකොට මං දන්නවා පොඩ්ඩි උඹේ හිතේ තියෙන්නෙ මොනාවද කියලා.. ඇත්ත කියපං.. උඹට අංජලීවත් එක්කන් යන්න හිතුණා නේද..?"

මද්දූ මගේ මූණට එබීල ඇහුවා. බලන් ගියාම මද්දුගෙ තියෙන්නෙ මාර මීටරයක්නෙ අප්පා. ඇත්තටම මූ කොහොමද මං ගැන මෙච්චර දේවල් දන්නෙ..?

"ඔව්.."

"ඒකනෙ.. මං දන්නවා උඹේ හැටි.. ඒත් පොඩි අදම ගිහිල්ල අදම එනව නම් අංජලීව එක්කන් යන්න පුළුවන්.. අනිත්නෙක උඹ

දන්නවනෙ ලොකු අයියගෙ හැටි. මිනිහ එක ජාතියක පොරක්නෙ. අපි ආපහු එනකොට මිනිහ හැමදේම අම්මගෙ කනේ තියල තියේවි..."

මද්දූ කියවන් ගිය කතාවෙ ලොකු ඇත්තක් තිබුණා. මාත් මහ හොල්මන් දේවල්නෙ හිතන්නෙ.. අංජලීව එක්කන් ගිහින් කොහේ තියාගන්නද..? මිකට මිකේ. ඒ විත්තියක් කලින් කල්පනා වුණේම නෑනෙ.

"හැබැයි මද්දූ අයියා.. රාජ් එන එකනම් මට ෂුවර් නෑ.. මොකද ඌ වීඩියෝ සෙන්ටර් එකේ වැඩේ බැහැල වැඩ.."

"ඒක මොකක්ද පොඩි.. හැටන් ගිහිල්ලා අපිත් බැහැල වැඩ කරමුකෝ.. මතක් කරලා ඌට මැසේජ් එක ඇරපන්.. අපි අනිද්දා දිහාටවත් ගිහින් එමු.. නැත්නං අපි යන්න කලින් ලොකු අයියල මෙහේ ඒවි.."

කිසි අවුලක් නැතිවම මද්දූ අයියා හැටන් යන එක අනිද්දට දැම්මා. මච්.. අර කවුදත් කියල තියෙනවනෙ 'ගන්න ආතල් එකක් අමාරුවෙන් හරි අදම ගන්න හෙට්ට කල් දමා පසුතැවිලි නොවන්න..' කියලා. ඒක හින්දා ආතල් එක අනිද්දටම ගමුකෝ.. මං එක හිතින් එක පයින් හිතාගත්තා.

* * * * *




පහුවෙනිදා මට ඇහැරෙනකොට හුඟාක් දවල්වෙලා. මං ඇස් දෙක පිහිදාලා මේසෙ උඩ තිබ්බ එලාම් වොච් එක දිහා බැලුවා. එච්චරම අවුලක් නෑ. තාම දහයට පහයි. කම්මැලිකමේම ඇඳෙන් නැගිට්ටලා මේසෙ උඩ තිබ්බ වතුර වීදුරුව මං එක හුස්මට බීගෙන බීගෙන ගියා. ඊට පස්සෙ සිරාවට ඇනුමක් එහෙම ඇරලා ජනෙල් පලු දෙක ඇරියා. උදේම කවුරු හරි හොඳ කෙනෙක් දැක්කහම දවසම සිරියාවන්ත වෙනවලුනෙ. මං ජනෙල්කූරු අස්සෙන් පාර දිහා බැලුවා. හප්පොච්චියේ.. මොන සිරියාවන්තකමක්ද..? මං දැක්කෙ පල්ලෙහා ගෙදර පැන්ෂන් ගියපු ඉස්කෝලෙ හාමිනේව. මූණෙන් භාගයක් විතර වැහෙන්න දාලා තිබ්බ කළු පාට කණ්නාඩි කුට්ටම දැක්කහම මට ජීවත්වෙලා වැඩක් නෑ කියලා හිතුණා. බුදු දෙයි හාමුදුරුවනේ.. ඇයි මටම මේව වෙන්නෙ..? ඇයි මද්දුවට ඕක දකින්න තිබුණෙ නැද්ද..? දැන් ඉතින් මේකෙන් අද දවසම මට අත්තිම අපල වෙන එක වලක්වන්න කාටවත් බෑ. කොහොමටත් අද දවසම ගේ ඇතුළට වෙලා ඉන්න

වෙනවා. මදැයි උදේ පාන්දරම දැක්ක දේ. මූණත් අම්බානක හකුළුස් කරන් මම කාමරෙන් එළියට ආවා. අර කලින් දවසකත් ඔය ඉස්කෝලෙ හාමිනේව දැකල තමයි පූජනීගෙ හස්බන්ඩ්ගෙ තගාල මද්දු අයිය කියල හිතාගෙන මගේ බෙල්ලෙන් අල්ල ගත්තෙ. ගිය ආත්මෙ කරපු කුසල කර්මයක් හන්දද කොහෙද මං යන්තං එදා බේරුණා. ඒ වුණාට උන්ගෙන් බේරෙන්න යෑමුත් එකට රිංගලා කොණ්ඩෙත් හේට් එකටම ගාගන්න වුණා. හපොයි ඒ කියන්නෙ අපල එකක් නෙමෙයි දෙක තුනක්ම. ඒ කාපු පරිප්පුව ගැන හිත හිතා මං හීන් සැරේ කෑම කාමරේ පැත්තට ආවා. අම්මා කෑම මේසෙ උඩ කිරි ටොෆි වගයක් ලෑල්ලකට දාලා කෑලිවලට කපනවා. මං සං ගාලා කිරිටොෆි කෑලි දෙකක් අරන් කටේ ඔබා ගත්තා.

"පොඩී.. තාම කටවත් හේදුවෙ නෑ නේද..?"

අම්මා කිරි ටොෆි කපන ගමන්ම මගෙන් ඇහුවා. ඒ කියන්නෙ අර තරම් සූක්ෂමව හොර රහසෙ උස්සපු කිරි ටොෆි කෑලි දෙක කනවා අම්මා දැකලා.

"ඊයෙ හේදුවනෙ අම්මා.. ඒක නෙමේ කාටද මේ කිරි ටොෆි.."

"හෙට ලොකු අයියලඟ යනකොට අරන් යන්න.. ම්.. තව අල දෝසි ටිකකුත් හදන්නෝන.."

අඩේ.. උහට තියෙන පැලකිලි.. කමක් නෑ.. කමක් නෑ.. ඕව ඉතින් ගෙනියන්නෙ මමනේ. අනිත්තෙක ලොකු අයියයි, අවිනි අක්කයි වැඩිය කන්නෙ නැහෙ.. ඕව කාලා එයාලගෙ බඩ අප්සට් වුණොත්.. ඒක හන්ද වැඩි හරිය මද්දුටයි, මටයි රාජ්ටයි බස් එකේදි හරි කන්න බැරියැ. ඒත් දෙයියනේ කිරි ටොෆිවල සුවඳ

එනාකොට බස්සෙකේදි කනකත් මට ඉවසන්න බෑ.. කෝම හරි කිරි ටොපියි අල දෝසියි ගැන හිත හිතා ඉන්නකොට තමයි ෆෝන් එක රිංග් වෙනවා ඇහුණේ.

"අම්මෙ.. ෆෝන් එක රිංග් වෙනවා.."

මං අම්මගෙ මූණට එබිල කිව්වා. අම්මා ෆෝන් එක ළඟට යවා ගත්තොත් තව කිරි ටොපි කෑලි තුන හතරකට වැඩේ දෙනෑකිනේ.

"මට ඇහුණා පොඩී.."

කිසිම ගානක් නැතුව අම්මා කියලා දැම්මා.

"පව් අම්මා.. ෆෝන් එක.. හරි නෑනේ.. ඉක්මනට ගිහින් ගන්න.."

මං කිව්වෙ අමුතුම කතන්දරයක්.

"හරි නැත්තෙ ඇයි පොඩී.. මං හරි ආසයි ෆෝන් එක රින්ග්ස් වෙන සද්දෙ අහන්න.. ඔන්න මගේ රින්ග්ස් ගියාවෙ.. හරි ෂෝක් මියුසික් එක..."

හිතට හිතේ.. අම්මා ඒක කියපු කැත. මං කොහොමද අම්මට තම්බන්නෙ.. උදේ පාන්දරම දැකපු ඉස්කෝලෙ හාමිනේට හිතෙන් බැන බැන මං ෆෝන් එක ළඟට ඇවිත් රිසීවරේ අතට ගත්තා.

"හෙලෝ.."

"හෙලෝ.. මට විහඟට කතා කරන්නෝන.."

එහා පැත්තෙන් ආවෙ ලාමක ටිං ටිං එකේ කෙල්ලෙක්ගෙ වොයිස් එකක්. කවුද මංදා.. මට අඳුනගන්න බැරිවුණා.

"ඔව්.. විහඟ තමයි කතා කරන්නෙ..?"

"මාව අඳුනගන්න බෑ නේද..?"

ඒවිට වොයිස් එක මගෙන් ඇහුවා. කවුද අප්පේ මේ..?

"ම්.. බෑනෙ.."

"කටහඬත් අඳුනගන්න බැරිවෙන තරමට මාව අමතක වුණාද විහඟ අයියෙ.."

හෙණම හෙණ දුක හිතෙන විදියට ඒ වොයිස් එක ටෙලිෆෝන් කම්බි දිගේ ගලාගෙන ආවා. ඒත් මගේ මැන්ටල් මීටරේට මෙයා කවුද කියල වැටහුණෙම නෑ. ගිය ආත්මෙ මං ලව් කරල බූට් තිබ්බ කෙල්ලෙක්වත්ද මංදා. මේ ආත්මෙ ගැන නම් බියවෙන්න දෙයක් නෑ. මොකද මං ලව් කරන්න ගත්ත විතරයෙ තාම. ඒත් ඇත්තටම කවුද මේ..? අංජලීවත්ද..? ඒත් කුසිං අංජලිගෙ වොයිස් එක අඳුනගන්න බැරිවෙන්න තරම් මං මැන්ටල් වෙලා නෑනෙ. එක්කො අපේ ෆෝන් එකේ මොකක් හරි හෙණ අවුලක්.

"ඇත්තටම සොරි.. ම.. මට ඔයාව අඳුනගන්න බෑ.."

"ඔයාට ඔයාගෙ උංගිව අඳුනගන්න බැරිවුණාද විහඟ අයියෙ..?"

හත්තිලව්වෙ.. මේ උංගිද..? යකෝ උංගිගෙ කටහඬට මොකද වෙලා තියෙන්නෙ.. බිල්ලො කාලද..?

"ආ.. ආයෙත් පාරක් සොරි උංගි.. ඔ.. ඔයාගෙ වොයිස් එක හරි අමුතුයි.. ඒකයි මට අප්සෙට් ගියේ.."

"මට හෙම්බිරිස්සාව හැදිලා අයියෙ.. අනිත්තෙක මං කතා

kan e-community

කරන්නෙ හැන්ඩ් ෆෝන් එකකින්.. මට ඔයාගෙ වොයිස් එකත් අඳුන ගන්න අමාරුයි.."

පව් අප්පා.. උංගි හෙම්බිරිස්සාව හදාගෙන.

"හෙම්බිරිස්සාව හැදෙන්න ළඟදි වැස්සෙත් නැනෙ උංගි.."

වැස්සෙයි හෙම්බිරිස්සාවෙයි තියෙන තද සම්බන්ධෙ දන්න හින්දා මං එහෙම ඇහුවා. ඒත් එහා පැත්තෙන් මෙලෝ සද්දයක් ආවෙ නෑ. මං අහපු එකෙන් උංගිට තදවෙලා ෆෝන් එක තියලද මංදා. මගෙත් මොළේ කොලොප්පම්නෙ.

"ඒක නෙමේ විහඟ අයියෙ.. ඔයා හැටන් යනවා කියලා ආරංචි වුණා. ඔයා මට නිකමටවත් කිව්වෙ නෑ නේද..?"

අප්පට ඩෙන යකෝ.. උංගි දන්නෙ කොහොමද මං හැටන් යන විත්තිය. උංගිගෙ රහස් ඔත්තු සේවෙ මේ තරම් ප්‍රබලද..? නැත්නම් කුණු මද්දුව තකහනියක් උංගිට ෆෝන් කරලා කියලද..?

"මං කියන්න තමයි හිටියෙ උංගි.. කියන්න විතරක් නෙමෙයි.. ඔයාව එක්කන් යන්නත් හිටියෙ.. ඒත් කොහෙද අප්පා.. අපේ මද්දුවා බකට් එක ඇද්දනෙ.. වැඩේ සම්පූර්ණයෙන්ම ස්ලෝප්.."

"ඒ වුණාට මද්දු අයියා නම් පූජනී අක්කව එක්කන් යනව නේද..?"

හප්පට සිරි ඒකත් එහෙමද..? දැන් නම් මගෙ ඔලුව ඇට්ටි හැලෙන්නම කොලොප්පං වෙලා. උංගි කොහොමද දන්නෙ මද්දුවත් හැටන් යනව කියලා. මේක මහ අමනුස්ස රටක්නෙ. ප්‍රජාතන්ත්‍රවාදීව ගමනක් යන්න හැදුවත් ඒ ගැන පෝස්ටර් ගහල වගේ හැම එකාම දන්නවා.

"එහෙම එක්කන් යන්න දෙන්නෙ කොහොමද උංගි.. පූර්නීව එක්කන් ගියොත් මද්දුවට ඉස්සෙල්ලම බකට් එක අදින්නෙ මම. පූර්නීත් හීන දකිනව ඇති මද්දුවට කුරුළුවෙලා හැටන් යන්න.. ඒවා කොහෙද..?"

මං බක පණ්ඩිතයා වගේ කියවන් ගියා. ඇත්තනෙ.. නද වෙන්නැද්ද අප්පා.. මේ වගේ සමාජ අසාධාරණකම් සිද්ධ වෙනකොට.

"ආ.. ඇත්තට විහඟ අයියා මෙච්චර වෙලා හිතන් හිටියෙ මං උංගි කියල නේද..?"

"ඔව්.."

ඒ පාර මොකක්ද යකෝ මේ ගිනි ගෙඩිය.

"ලව් කරාට මදි විහඟ.. වොයිස් එකත් අඳුනගන්න ඕන. මං උංගි නෙමේ.. මං පූජනී.. ඔයාගෙ චූටි ඩොක්ටර්.. එහෙනම් මස්සිනා බායි..."

හන්තිලව්වෙ.. මං මෙච්චර වෙලා පූරනිත් එක්කද ආතල් එකේ ලව් කෙරුවෙ. අනේ අම්මපා මට එන කේන්තියක්. මූට මොලේ උනාද මං දා මාවම බයිට් කරන්නෙ. හැබැයි චූටි ඩොක්ටරේ, ඔයා එහෙ කැවා කියලා හිතා ගන්න හොදේ. මේ දීපු ආදර ගින්නට ඔයාට පාන් කියාගන්න බැරිවෙන්න පරිප්පුවක් දෙනවා. ඒක බුදු මුවර්. හපොයි අර ඉස්කෝලෙ හාමිනේව දැකලා සිද්ධ වෙච්ච විනාශයක්. ඔන්න ඉතිං අවුලක් නැතුව උඳේ ඉඳන්ම කන්න පටන් ගත්තා. ඇයි ඉස්කෝලෙ හාමිනේ.. ඔයා මගේ ඇස් දෙකට පාන්දරම පේන්න ආවෙ.. ඔයාට තිබ්බෙ නැද්ද තව ටිංගක් පරක්කු වෙලා නැගිටින්න. ඇයි මාවම කන්න ඕය මූණම පෙන්නුවෙ.

"කවුද පොඩී කතා කෙරුවෙ..?"

"රෝන් නම්බර් එකක් අම්මා.."

"රෝන් නම්බර් එකක් නම් ඔය තරම් වෙලා කතා කෙරුවෙ..?"

"හරි නම්බරේ හොයාගන්න හැටි කියල දුන්නා අම්මා.."

මං කියපු දේට අම්මගෙ මූණට හිනාවක් ආවා. තව කිරි ටොපි කෑල්ලක් කන්න හිතුණත් හිතට ඒ තරම් පිට් එකක් තිබුණෙ නැති හින්දා මං මිදුලට ආවා. එහෙනම් චූටි ඩොක්ටරුත් මාව බයිට් කරා. ෆුවර් එකට ඔය ගේම දෙන්න ඇත්තෙ මද්දුවගෙ අනුදැනුම පිට තමයි. ෂියෝ.. මං අහුවුණ එකනෙ වැඩේ. මූං දෙන්න හදන්නෙ මගේ ලේ කෝප කරවල අර්ෂස් වැඩි කරවන්න. අර කලින් දවසකත් දේවානම්පියතිස්ස ගැන අහල මට දවසක් දෙකක් යනකල් කන්නත් බැරිවුණා. එහෙත් මගේ ෂෝට නෑ. මගේ නම් මේ දවස් අන්තිම නරකයි. ඒ ගැන දහ අතේ කල්පනා කර කර මං ගේට්ටුව ළඟටත් ආවා. කම්බි වැට ගානටම වවල තිබ්බ මල් අතු ටිකත් එක ගානකට කපල දාන්න ඕන කියල මට හිතුනෙ ඒ වෙලාවෙ. ඒත් එකටත් කම්මැලියි. කම්මැලිකමමත් නෙමෙයි ඕක හරි කෙලින් කපාගන්න බැරි වුණොත් කුණු මද්දුවගෙ අඳෝනාව අහන්න බෑ. වැඩියම ඒකයි. මල් වැට දිහා බලන් ඉඳල ඉඳල මං පාර දිහා බැලුවා. තාම උදේට කාලත් නෑ. අම්මා කිරි ටොපියක් බදාගෙන. උදේට කන්න හම්බවෙන්න නැතුවද මංදා. පාර දිහා බලන් ඉඳපු මං දැක්කෙ හොඳට දැකල පුරුදු කපල් එකක්. කොහේදි හරි හොඳට දැකල තියෙනවා. මං අම්බානක කල්පනා කෙරුවා. කවුද මේ..? හත්පිලව්වේ.. මේ අපේ ලොකු අයියයි අවිනි අක්කයිනෙ.

"ආනේ.. පොඩි මල්ලි පාරටම වෙලා.."

මාව දැක්ක ගමන් හිනාවක් මූණෙ පුරවගෙන අවිනි අක්කා කිව්වා. හිනා තමයි.. මං හිතපුව මේ දෙන්න දන්නව නම් මට ගූටි කාලයි මැරෙන්න වෙන්නෙ.. හොඳ වෙලාවට මූං දෙන්නට පරචිත්ත විඤ්ඤාණෙ නැත්තෙ.

"ඔයාලව පිළිගන්නත් එපැයි.. ඒක හන්ද මං පාරටම වෙලා හිටියා.."

"මේ.. මේක ගනිං පොඩ්ඩො.. හරි මහන්සියි.. උස්සගෙන ඇවිත්. බස්කාරයා හෝල්ට්වෙකෝ නැවැත්තුවෙ නෑනෙ.."

ලොකු අයියා අර මටත් වැඩිය ලොකු පෑවලින් බෑග් එක දෙන ගමන් කියවන් ගියා. එතකොටයි මට මතක් වුණේ, යකෝ අපිත් හැටන් යන්න හෝද හිටියෙ කියලා. ඕප්.. අපිටමයි වෙන්නෙ..

"ඔයාල හුඟ දවසකින් ආවෙ නැති හින්දා අපි හෙට එහේ යන්නයි හිටියෙ.. අන්න අම්මා ඔයාලට ගෙනියන්න කෑම ජාති හදනවා.."

මං කියනකොට අයියයි අවිනි අක්කයි ගෙට ගිහිල්ලත් ඉවරයි. දැන් ඉතින් පුරුදු විදිහට තව කවේ පටන් ගනියි. අපෙ අම්මයි, අවිනි අක්කයි බරට බරේ කඩයක් දාගනියි. ඕකේ මදැයි හැටන් ගිහින් පිස්සු කෙලින්න හැදුවා. ඇයි දෙයියනේ අපිටම මෙහෙම වෙන්නෙ..? නෑ ඉතිං මෙහෙම වුණ එකත් හොඳයි එක අතකට. නැත්නම් අපි හැටන් ගියපු දවසෙ ලොකු අයියල මෙහේ ආව නම් මොන දෙයියන්ට කියන්නද..? සීතල හැදිල හොඳ පරිප්පුවක් කන්න තිබ්බා.

ටිකක් දවල් වෙද්දි අර උදේ පාන්දර තිබ්බ මුස්පේන්තු ගතිය නැතිවෙලා ගියා. හවස් වෙද්දි විස්තර හෙම කතා කරලා ඉවර වුණාට පස්සෙ මං අචිනි අක්කා ගාවට කිට්ටු වුණා. ලොකු අයියා දවල්ට කාලා ගොරව ගොරව නිදි. පොර මගේ කාමරේ බඩු අරගෙන. උගේ බරට ඇඳ ඔරොත්තු දේවිද මංදා. අද මටයි මද්දුටයි එක කාමරේ තමයි නිදාගන්න වෙන්නෙ.

"මොකෝ පොඩී හොර ගල් අහුලන්නෙ..?"

අචිනි අක්කා මං දිහාට හැරුණා.

"ම.. මට පොඩි ප්‍රශ්නයක් තියෙනවා අක්කෙ.."

"මොකක්ද පොඩී..?"

"මාව ඉක්මනට බාප්පෙක් කරනවකෝ හලෝ.."

"කවුරු..?"

අචිනි අක්කගෙ ඇස් දෙක ලොකු වුණා. ඒ මූණ මැදට ආවෙ සිරා හිනාවක්. ඒ හිනාවත්තෙක්කම අචිනි අක්කා මට ගහන්න පැන්නා. 'දුවපං' කියල කකුල් දෙකට ගට අරන් මං සාලෙට දුවල ආවා.

"පොඩි එකෙක් නැතුව මේ ගෙදර කිසි ගතියක් නෑ අක්කෙ.."

ආයෙත් දුවන්න බලාගෙන මං කිව්වා. ඒත් මං හිතුව විදියට අචිනි අක්කා මාව එළවගෙන ආවෙ නෑ. අර මුලින් හිනාවම මූණෙ තියාගෙන එයා නැවතුණා.

"පොඩි කැමති දුවෙකුට බාප්පා වෙන්නද..? පුතෙකුට බාප්පා වෙන්නද..?"

"මං කැමතියි නිල් ඇස් තියෙන දුවෙක් ඔයාලට ඉන්නව නම්.."

මහත්තයගෙ නිල් ඇස් දෙක එක පාරටම මට මතක් වුණු හින්ද මං කිව්වා.

"පොඩි ඇයොන්ගෙ ඇස් කොහොමටත් ලස්සනයි විහඟ.. ඔයා ආස දේ ලඟදිම ඉටුවේවි.."

"ත්.. නෑ.. පිස්සු හැදෙනවනේ.. දාන්න අක්කෙ අත.. පිටි තමයි.."

මං අවිනි අක්කට අත දික් කරා.

"මය තියෙන්නෙ.. එහෙනම් මං ලඟදිම බාප්පෙක්.."

මට ආවෙ මාර පිටි එකක්. ඒත් ඒ පිටි එක එහෙමම තියෙද්දි නව දෙයක් මට මතක් වුණා. අනේ එතකොට මද්දුවත් බාප්පෙක් වෙනවනෙ.. ෂික්.. ඕකනෙ කාල ඉන්න බැරි. මං අවිනි අක්කගෙ මූණ දිහා බැලුවා. එයා ඒ තරම් සුදු නෑ. ඒත් හිතක් ඇදල ගන්න පුළුවන් තරමේ ආකර්ශනයක් ඒ මූණෙ තිබ්බා. ඒකනෙ අපේ ලොකු අයියා අහුවුණේ.

"පොඩීට නැද්ද කෙල්ලෙක්..?"

අවිනි අක්කා එකපාරටම අහපු ප්‍රශ්නෙට මාව කරකවල අතෑරල ආයෙත් කරකැව්ව වගේ වුණා.

"එකෙක් කියල නම් නෑ අක්කෙ.. මේ ඒරියා එකේ ඔක්කොම සිරා කෙල්ලො මගේ තමයි.."

"හප්පේ.. මෙහෙ කටක් නෙමේ.. ලොකු අයියට ඇහුණා නම් හෙම.."

"එහෙම ඇහෙන්නෙ නැතිවෙන්න නේද මීනිහා නිදාගෙන ඉන්නෙ.. ඇයි පොරට නින්ද ගියහමත් කතා කරන ඒවා ඇහෙනවද..?"

"මං අහපු එකට ඔයා උත්තරයක් දුන්නෙ නෑ.."

"ඔව් අක්කා.. අම්මත් ටිකක් විතර දන්නවා.. එයා හුඟාක් අහිංසක කෙල්ලෙක්.."

"අහිංසකකම කොහොම වුණත් හුඟාක් ලස්සන නම් ඇති නේද..? ඔයා කැමති ලස්සන අයටනෙ.."

මගේ මූණට එබිල අචිනි අක්කා ඇහුවා. මං ඒකට මුකුත් කිව්වෙ නෑ. මොකද අංජලී කොයි තරම් ලස්සනද කියල දෙපාරක් කියන්න ඕන වුණේ නෑ.

"හල්ලෝ.. ගුඩ් මෝර්නිං.."

මේ ඇට්ටි හැලෙන්න හවස් වෙලා තියෙද්දි තාමත් පාන්දර කියල හිතන් ඉන්න එකා මොකාද කියල මං හැරිල බැලුවෙ නෑ. කුණු මද්දුවගෙ කටහඬ අඳුනගන්න බැරිවෙන්න නම් මං මැරිල උපදින්න ඕන.

"ආනේ.. මද්දූ ඔයාට තාමත් මෝර්නිංද..?"

නෝනඩියට වගේ අචිනි අක්කා මද්දුගෙන් ඇහුවා. හොඳ වැඩේ ඕකට. මද්දූ ඔෆිස් බෑග් එකත් වන වනා මගේ මූණ දිහා බැලුවා. මං පටාස් ගාලා අහක බලා ගත්තා.

"මේකනෙ අවිනි අක්කෙ.. මය පොඩිට වගේ උදේට එකයි, දවල්ට එකයි, රෑට එකයි කියන සිරිතක් මගේ නැහේ.. මං එක වචනෙ මිනිහෙක්. මං වචන වෙනස් කරන්නෑ.. උදේටත් මෝනිං නම් රෑටත් මෝනිං.."

හිත්.. දැක්කද මද්දුව ඒක කියපු හැටි.. ඇයි දෙයියනේ මූට බැරි මගේ ලේ කෝප කරවන්නෙ නැතුව ඉන්න.. මං මද්දුවගෙ පස්සෙන් උගේ කාමරේට ගියා.

"මද්දූ ඔයා අද උදේ මහ බලු වැඩේ කෙරුවෙ.."

"ඇයි මිදුලෙ බල්ලො ජරා කරල තිබුණද..?"

ඌ ඇහුවෙ මං හතරැස් වෙන ප්‍රශ්නයක්. උගේ ඒ ඇහිල්ලට මං අහන්න ගිය එකත් අමතක උනා. ටිකක් වෙලා කල්පනා කරල තමයි මං මුලින් අහන්න ගිය එක මතක් කර ගත්තෙ.

"බල්ලො ජරා කරපු එකක් නෙමේ මද්දූ.. ඔයා චූටි ඩොක්ටර්ට කියල මට ෆෝන් කෙරෙව්වෙ ඇයි..?"

"මොකක්..?"

"පූජනි මට කතා කරල හොඳ ලනුවක් දුන්නා මද්දූ.. ඔයා පූජනීට කිව්වද අපි හැටන් යනවා කියලා.."

"ඔව්.."

මද්දුවගෙ මූණ කල්පනාවෙන් පිරිලා.

"පූජනී මට ඇංජලී වගේ කතා කරලා මාව ඇන්දුවනෙ මද්දූ.."

මං එහෙම කිව්වහම මද්දුට බකස් ගාලා හිනා ගියා. ඌ බුකු බුකු ගගා හිනාවෙන්න ගත්තා.

"පූජනිත් කරන්නෙ මාර වැඩ. මං දන්නෙත් නෑ.. හැබැයි ඉතින් උඹට මතකද පොඩී උඹ අර දවසක් පූජනීට ලණුවක් දුන්නා. මං බැන්ක් එකේ නෑ කියලා. ඒකෙ රිටර්න් එක වෙන්නැති ඔය. දැන් ඉතිං මූණ බේරි කර ගන්නැතුව හිනාවෙලා ඉඳපං.. උඹට පූජනිගෙයි, අංජලීගෙයි වොයිස් එක අඳුනගන්න බැරුව කොහොමද බං ලව් කරන්නෙ..?"

කුණු මද්දුවා අන්තිමට කුණු ප්‍රශ්නයක් ඇහුවා. ඒත් ඉතිං මූට බැනලා වැඩක් නෑ.. වැඩක් නැතුව තොගෙ මුත්තෙක්ක අද වලියක් දාගත්තොත් මට අද නිදාගන්න වෙන්නෙ සාලෙ. කමක් නෑ.. ඔහොම යංකෝ..

"ෂිත්.. ඒකෙන් මේකෙන් අපිට හැටන් යන්න වෙන්නෑනේ පාට්නර්.."

දැන් තමයි මද්දුගෙ මීටරේට ඒක වැටුණේ. ඌ මෙච්චර වෙලා මොනවා කල්පනා කරාද මංදා.

"ඕනෙ නං ඉතිං යන්න පුළුවන්.."

"ඒ කොහොමද පොඩී..?"

මද්දු මං දිහා බැලුවා.

"කොටුවට ගිහින්.. හැටන් බස්එකක නැග්ග නම් ඉතිං හැටන් එකට යනෑකි.."

මං නෝන්ඩියට වගේ කිව්වා. මං හිතුවෙ මද්දු මොනව හරි

කියාවී කියලා. ඒත් මිනිහ මුකුත් කිව්වෙ නෑ. මද්දුගෙ මූණෙ තිබ්බෙ හිනාවක්.

"වෙන වෙලාවක නම් මං උඹට හොඳ උත්තරයක් දෙනව පොඩී.. ඒත් මං මේ බැලුවෙ හෙට ඉඳන් නිවාඩුත් දාපු එකේ මොකද කරන්නෙ කියලා.. ෂිත්.. ලොකු අයියල එනව කියල කලින් දන්නව නම් හෙට පූජනිත් එක්ක කොහේ හරි යන්නවත් තිබුණා.."

පෙනේද මද්දුවගෙ කතාව.. හෙට නිවාඩු දවසෙ මූ රවුම් ගහන්නයි යන්නෙ.

"හැබැයි ඉතිං නිවාඩුත් දාපු එයේ කරන්න නම් වැඩක් තියෙනව මද්දූ.."

"ඒ මොකක්ද..?"

"ඔයා හුඟ දවසකින් නෑවෙත් නැතෙ.. දෙයියනේ කියල කුණු අතුල්ලලා හොඳට නාගන්න.."

කාමරෙන් එළියට දුවන ගමන් මං කිව්වා. ඒත් වෙනද වගේ මද්දූ මාව එලවගෙන ආවෙ නෑ. උගේ හිනාව නම් මහා සද්දෙට ගේ ඇතුළෙන් ඇහුණා.

* * * * *

ඊගාව දවස් ටික ගෙවිල ගියේ පුදුම තරම් ඉක්මනට. ලොකු අයියයි, අචිනි අක්කයි ඉඳපු හන්ද පාලුවක් කියල දෙයක් මට දැනුණෙ නෑ. නිවාඩු දාපු දවස් දෙක තුනේ මද්දූ වැඩිය කොහේවත් ගියෙත් නෑ. පූජනිත් එක්ක අවුලක් දාගෙනද කොහෙද කියල මට

හිතුණත් මං මද්දුගෙන් අහන්න ගියේ නෑ. ඔය අතරෙ තමයි රාජ්ගෙ වීඩියෝ සෙන්ටර් එක ඕපන් කරන දවස ආවෙ. මං උදේ පාන්දරම නුගේගොඩට ගිහින් රාජ්ව හම්බවුණා. රාක්කවල පේලියට ලස්සනට පැක් කරල තියෙන වීඩියෝ පීස් තොගේ දැක්කම හිතට දැනෙන්නෙ අමුතුම ගතියක්. කොහොම වුණත් දවල් වෙද්දි මුස්ලිම් අයගෙන් කඩේ පිරිලා ගියා. ඉස්සෙල්ලම රාජ්ව උගේ අම්මයි තාත්තයි අක්කයි සුභ පැතුවා. ඊට පස්සෙ තමයි මං ඌ ළඟට ගියේ.

"මට හුඟාක් සන්තෝසයි රාජ්.. ඇත්තටම මට මාර ෆීට්.. උඹ මේ හැම දෙයක්ම තනියම කරා.."

මං රාජ්ගෙ අතින් අල්ල ගත්තා. ඌ මාවත් ඇදගෙන කඩේ ඉස්සරහට ආවා.

"ම.. මං උඹට කිසි දෙයක් දුන්නෑ රාජ්.. ඒක මගේ හිතට හරි නෑ.."

"උඹ මං ගාව ඉන්නෙක මට හැමදේටම වැඩිය වටිනවා විහඟ.."

රාජ් එහෙම කියල කඩේ ඇතුළට යන්න හැදුවා.

"ඩිංගක් ඉඳපං.. මං දැන් දෙන දේ උඹ එපා කියන්නෙපා. මං මේක මගේ බොක්කෙන්ම දෙන දෙයක්. මේ වෙලාවෙ හැටියට මං ගාව මෙච්චරයි තියෙන්නෙ.."

මං සාක්කුවෙන් ගත්තු රුපියල් දහ දාහ රාජ්ගෙ අතේ තිබ්බා. ලෝකෙ නමවෙනි පුදුමේ දැක්කා වගේ උගේ ඇස් ලොකු වුණා.

"මේ මොනවද උඹ කරන්නෙ..?"

"මේව කාගෙවත් සල්ලි නෙමේ රාජ්.. මං මහන්සියෙන් හම්බ කරපුවා.. උඹට දෙන්නැති දෙයක් මං ගාව නෑ.. මගේ හිත රිද්දන්නැතුව මේක ගනිං.."

"හරි.. හරි.. ම.. මං ගන්නම්.. ඒ.. ඒත් ඇයි උඹ අඬන්නෙ..?"

"සංතෝසෙට මචං.. සන්තෝසෙට.."

මං උගේ අත මිරිකගත්තා. උගේ මූණෙ ඒ වෙලාවෙ තිබ්බ හැඟීම් මට තේරුම් ගන්න බැරිවුණා.

"උඹ වගේ එකෙක් මං ගාව ඉන්නව කියනෙක.. මට මාර හයියක් විහත.. මට කිසි බයක් දැනෙන්නෙ නෑ.. ඒත් මොනම දෙයක් හින්දවත් උඹ මගෙන් ඈත්වෙන්නෙපා.."

"මට තේරුන් නෑ.."

ඇත්තටම රාජ් එච්චර් වෙන්න හදන මාතෘකාව මට තේරුණේ නෑ. මූ මොනවද කියන්න යන්නෙ..?

"ආදරේ වගේ දේකදි උඹ හුඟාක් සංවේදියි. මගේ එක බයක් තියෙන්නෙ ඒකයි. මොකද ආදරේ වගේ දේකදි උඹ මොන වගේ තීරණයක් ගනීද කියල මට හිතාගන්න අමාරුයි. මාව දාලා යන්න පුළුවන් තරමේ දෙයක් වුණත්.. නේද..?"

"ඇති.. ඇති.. ඕක ගැන කතාව නවත්තල දාමු.. මේ හොඳ දවසෙක් අපි ඕන්නැති දේවල්නෙ කතා කරන්නෙ.."

මං උඑත් ඇදගෙන ආයෙත් කඩේ ඇතුළට ආවා. තවත් දවල් වෙද්දි රාජ් ඉන්වයිට් කරපු හුඟක් අය ඇවිත් ගිහින් තිබුණා. කඩේ

වැඩට අරන් තිබ්බ කොල්ලො දෙන්නා වීඩියෝ පීස් වගයකට ඕපෙන කරන කාඩ් සෙට් කරන්න පටන් ගත්තා.

"අංජලීගෙ කත්වෙ කොහොමද..?"

හුභාක් දුරට වැඩ ඉවර වෙද්දි රාජ් මගෙන් ඇහුවා.

"අවුලක් නැ රාජ්.. ඒත් මට ළඟදි හම්බවෙන්න නම් බැරිවුණා..."

"වලියක් ගිහිල්ලා හෙම නොමේනේ.."

"නෑ බං.. පහුගිය දවස් ටිකේ ගෙදරිත් හෙල්ලෙන්න හම්බවුණේ නෑ. අවිනි අක්කව මාර්කට් එක්ක යන්නයි, ලයිබ්රි එක්ක යන්නයි, කඩේට යන්නයි හැම ලඩේටම මමනෙ පංගාර්තු වෙලා හිටියෙ.."

"උඹ අංජලීට ෆෝන් කෙරුවෙවත් නැද්ද..?"

"දෙපාරක් ට්‍රයි කරා බං.. දෙපාරම ඉස්සුවේ අංජලීගෙ තාත්තා.. පොරත් එක්ක ලව් කරන්න බැහැනේ.. මං ෆෝන් එක තිබ්බා.."

"තව දෙයක් තියෙනවා විහඟ.. දැන් වීඩියෝ ෂොප් එක දාපු හින්ද කලින්ට වැඩිය මං නිදහස්.. ගෙදර ඉන්නකොට කොහේ යන්න ගියත් බර බරේනෙ බං.. ඒක නෙමේ.. ක්‍රිකට් කාරය ගැන මුකුත් ආරංචියක් නැද්ද..?"

රාජ් ඇහුවෙ ලේ කෝපවෙන ප්‍රශ්නයක්.

"මේ ලෝකෙ ආරංචියක් නෑ බං.. ඒකනෙ මං මේ පුල් ආකල් එකේ ඉන්නෙ.. කෝ බං මහනාප් අද ආවෙ නැනෙ.."

එච්චර වෙලා මගේ හිතේ කැරකි කැරකී තිබ්බ ප්‍රශ්නෙ මං ඇහුවා. අනේ මංදා.. කොයි තරම් සබී ගැන හොයන් නැතුව

ඉන්න හැදුවත් ඒක මට කරන්න බෑ. රාජ් එක පාරටම මං දිහා බැලුවා.

"උඹල දෙන්නටම තියෙන්නෙ එකම අමාරුව.."

"ඒ කිව්වෙ..?"

"ඒ කිව්වෙද..? මගේ කන් දෙකම සවුත්තුවෙලා බං.. ඔබ්ට මාව හම්බවුණු ගමන්ම කොයි වෙලාවෙත් අහන්නෙ උඹ ගැන.. ඒක පැත්තකින් තියමුකෝ.. උඹත් කැරකි කැරකි ඉඳල අහන්නෙත් ඒකී ගැන.. ඒකනෙ වැඩේ.."

උං හිනාවෙවී කියනවා. මටත් හිනා ගියා. ඒත් එක පාරටම රාජ්ගෙ හිනාව මග නතරවුණා. උං බලන් හිටියෙ කඩේ ඉස්සරහ පැත්ත. මූට මොකද වුණේ කියල බලන්න මාත් ඒ දිහා බැලුවා. එතැන හිටපු කෙනා දැක්කහම මං ඊතල වෙලා ගියා. අංජලී.. හත්තිලව්වෙ.. එයා කොහොමද දන්නෙ මං අද මෙහේ කියල. මාව දැක්ක ගමන් අංජලීගෙ රෝස පාට මූණට ආවෙ ලොකු හිනාවක්.

"මෙකි නම් කොහේ හරි සී.අයි.ඩී. බ්‍රාන්ච් එකක වැඩ කරලා තියෙනවා. ලේසි වෙන්නෑ පුතෝ.. හොරෙන් ටොයිලට් එකටවත් යන්න බැරිවෙයි වගේ.."

රාජ් මගේ කණට කරලා කිව්වා.

"මොනාද දෙන්නත් එක්ක කුටු කුටු ගාන්නෙ..? අපිටත් නොකියා දියුණු වෙන්නයි හදන්නෙ නේද..?"

"වාඩිවෙන්න අංජලී. රෆීක්.. ඔය ස්ටූල් එක මෙහෙන්ට දෙන්න.."

රාජ් කඩේ වැඩ කරන ළමයෙකුට කතා කරා. අඩු තුනේ ස්ටූල් එකක අපි අංජලීව වාඩි කෙරෙව්වා.

"ඇත්තටම හරි ලස්සනයි රාජ් අයියා.. මගේ සුභ පැතුම්.."

අංජලී රාජ් දිහාට අත දික් කරා. ඒත් උඹ අතට අත දුන්නෙ නෑ.

"තරහ වෙන්න එපා නංගි.. මං ඔයාගෙ විෂ් එක පිළිගන්නම්.. ඒත් ඔයා ගියාට පස්සෙ මෙතන මිළ ගෙයක් වෙයි.."

"ඒ ඇයි රාජ් අයියා..?"

"ඇයි අහන්නෙ..? ඔයාගෙ අතින් ඇල්ලුවා කියලා මූ මට දෙන්න පුරවන් දස වඩ ඔක්කොම ටික දේවිනෙ.."

රාජ් කිව්ව දේට අංජලීගෙ මූණට ආවෙ ලස්සන හිනාවක්. ඒ හිනාවත්තෙක්කම එයා මගේ මූණ දිහා හෙලීන් බැලුවා.

"මං අල්ල ගන්න හිටියෙ හොර තෙඩියව. අනේ.. අනේ.. මාව අමතක කරලම දැම්ම නේද..? ෆෝන් කෙරුවෙත් නෑ. පියුමක්වත් නෑ.. කිසිම විස්තරයක් නෑ.. ඔයාට මොකක් හරි ට්‍රබල් එකක්ද අයියා..?"

අංජලී මගේ අතින් අල්ල ගත්තා. කඩේ ටිකක් පොඩි හන්ද මායි උංගියි මෙතන කතා කරන්න ගත්තොත් රාජ්ට බිස්නස් නෙමේ කරන්න වෙන්නෙ. ඒක හින්ද මං අංජලීවත් ඇදගෙන කඩේ ඉස්සරහට ආවා.

"දෙපාරක් විතර මං ඔයාට ෆෝන් කරා උංගි.. දෙපාරම ගත්තෙ තාත්තා.. තාත්තත් එක්ක මොනව කතා කරන්නද අප්පා.."

"මං හරි දුකෙන් හිටියෙ විහඟ අයියා.. ඔයාගෙන් තොරතුරක් නැති හන්ද.. මං බැලුවා මාව අමතක කරල වත්ද කියලා.."

මහා නෝක්කාඩු විදියට අංජලී මං දිහා බලන් හිටියෙ. ඒ මූඩ් එකේ තිබ්බෙ පුදුම තරම් සුන්දර බවක්. කැමරාවක් ළඟ තිබ්බ නම් එළවටම ෆොටෝ එකක් ගන්න තිබුණා.

"ඔයාව අමතක කරන්න නම් මම මැරිල උපදින්න ඕන.. අනිත්තෙක අමාරුවෙන් හිමි කරගත්තු දෙයක් මං ලේසියෙන් නැති කරගන්නෙ නෑ උංගි.."

උංගිගෙ කතා කරන ඇස් දිහා බලාගෙන මං කිව්වා. ඒ සුදු මූණ ආයෙමත් හිනාවකින් පිරිලා ගියා. ඒ පිරිසිදු හිනාව ඉස්සරහ මට හැමදේම අමතක වෙලා ගියා.

"රාජ් අයියෙ.."

හිටපු ගමන් අංජලී කෑවෙ ඈතුළට එබිල රාජ්ට කෑගැහුවා. ව්.සී.ඩී පීස් තොගයකුත් උස්සගෙන ලූ රාක්ෂයක් ගාව්න් එබුණා.

"මං විහඟව අරන් යනවා.. ඔයාට එයාව ඕනද..?"

අංජලී අහපු එකට රාජ්ගෙ මූණට ලොකු හිනාවක් ආවා.

"ඔයා ගෙනියනව නම් මට ඕන වුණත් මූව තියාගන්න බෑනෙ.. ගෙනිච්චට කමක් නෑ.. හැබැයි මූව පරිස්සම් සහිතව ගෙනැල්ල දාලා යන්න හොඳේ.."

තවත් මොනවාදෝ රාජ් කියවනවා මට යාන්තමට ඇහුණා. ඒත් ඒ ගැන වැඩිය හිතන්නැතුව මායි, අංජලියි පාරට බැස්සා.

"අද ප්‍රෝග්‍රෑම් මොනවද උංගි..?"

හෙමි හෙමිහිට නුගේගොඩට සුපර් මාර්කට් එක ගාවට එද්දි මං ඇහුවා.

"මට ඔයත්තෙක්ක ටිකක් නිදහසේ කතා කරන්නෝන විහඟ අයියේ.. දන්නවද ඔයා ළඟ නැති වුණාම මට හුඟාක් පාලුයි.."

අංජලී මාවත් ඇදගෙන 119 මහරගම බස්සෙකක නැග්ගා. ඒක මහ ලොන්ත පොල් බස්සෙකක්. හැම තැනම මලකඩ කාපු ලඳරමක්. පන බයේ බෑ පිටගැස්ම හැදේවිද කියලා.

"මේ පාරෙ කොහෙද යන්නෙ උංගි..?"

ජුබිලි කණුව පාස්වෙද්දි මං ඇහුවා. මේ ගමනත් අපි එදා වැලියෙ ගියපු එක වගේද දන්නෙත් නෑනෙ.

"මගේ යාලුවෙක් ඉන්නවා. උඩහමුල්ලෙ ඩිපෝව ළඟ.. නිරෝෂි කියලා.. මං උදේ නිරෝෂිට ෆෝන් කරල කිව්වා, මං ඔයත්තෙක්ක එනවා කියලා.."

"මං රාජිලත කියලා ඔයා දැනගත්තෙ කොහොමද..?"

අද දවසම මට තිබ්බෙ ප්‍රශ්න.

"අනේ අයියා ඇයි මේ අප්සට් වෙලා වගේ. මං උදේ ඔයාලගෙට ෆෝන් කරා. කවුද පිරිමි කෙනෙක් ගත්තෙ. එයා තමයි විස්තරේ කිව්වෙ.."

සුවර් එකටම ෆෝන් එක ගන්න ඇත්තෙ ලොකු අයියා.. හප්පේ.. අතක් පයක් නොකැඩී ඔයින් ගියා ඇති.. ටිකකින් උඩහමුල්ල ඩිපෝව ගාවින් මායි අංජලියි බැහැ ගත්තා.

"ඔයා මේ පාරෙ ඇවිල්ල නැද්ද..?"

උදේනිවත්ත පාරට හැරිලා ටිකක් දුර එද්දි අංජලී ඇහුවා.

"මෙහෙම පාරක් තියෙනව කියල දන්නෙත් අදයි.. තවත් දුරද උංගී..?"

"අර තියෙනව නේද සුදු පාට ගෙයක්.. ඒකට එහා පැත්තෙ තියෙන තට්ටු දෙකේ ගේ.."

හෙණ සිරා ගෙයක් පෙන්නල අංජලී කිව්වා. මගේ උසට වගේ තිබ්බ ගේට්ටුවෙ යකඩ කොක්ක පන්නාගෙන මායි අංජලියි වත්තට ඇතුල් වුණා. ගේට්ටුවෙන් ඇතුලෙ තිබ්බෙ පුදුම තරම් නිස්කලංක පරිසරයක්. මං වත්තෙ සිරි නරඹ නරඹ ඉන්දෙද්දි අංජලී බිත්තියෙ තිබ්බ බෙල් එක එබුවා.

"හායි අංජු.. උඹලව දකින්න තියෙන අමාරුවක්.."

වලේකට ගහනව වගේ සද්දයක් ඇහුණ හන්ද මං හැරිල බැලුවා. හප්පේ.. දණහිසටත් අහල් ගානක් උඩට වෙන්න ෂෝට්කුයි, කොළ පාට ස්කිනියකුයි ඇඳන් හිටපු සුදු කෙල්ලෙක් අංජලිව බදාගෙන. තවත් බලන් හිටියොත් මට උංගියෙක් ඉතුරුවෙන එකක් නෑ. ඒත් මං කට ඉස්සර කරන්න කලින් අංජලී ඉස්සර වුණා.

"මේ තමයි මං උඹට නිතරම කියන විහඟ අයියා.. හොඳද මගේ සිලෙක්ෂන් එක.."

"ෆැන්ටාස්ටික්.. හොඳටම හොඳයි.."

"විහඟ අයියා.. මේ තමයි නිරෝෂි.."

මං ඉක්මනට හලෝ කියලා බේරුණා. වැරදිලාවත් ඒකි මාවත් බදා ගත්තොත් හෙම හෙණ අවුලක් වෙනවනෙ.

"යං.. අපි ගේ ඇතුළට ගිහිල්ලා කතා කරමු.."

නිරෝෂි අංජලීගෙ අතින් ඇදගෙන ගේ ඇතුළට ගියා.

"උඹත් එන්නෙ මාරම දවස්වල අංජු.. අද අම්මිල එයාර්පෝට් ගියා. අපේ කසින් කෙනෙක්ව ඩ්‍රොප් කරන්න.. එනකොට දවල් වෙයි.. කිසි ප්‍රශ්නයක් නැතුව ඔයාලා දෙන්නට නිදහසේ කතා කරන්න පුළුවන්.."

නිරෝෂි කතාවෙ අන්තිම හරිය කිව්වෙ මං දිහා බලාගෙන. ඒකිගෙ මහ අමුතු ලුක් එකක් තියෙන්නෙ.. කළු කවේ නැත්නම් ඒකි ලස්සනයි.. නැතුව වෙන වැරද්දක් නෑ.. මේකි ෆොටෝ ජෙනික්ද දන්නෑ..

"ඒ පාර මොකෝ කල්පනා කරන්නෙ..? නිරෝෂිගෙ ෆොටෝ එකක් ගන්නද..?"

නිරෝෂි එහාට මෙහාට වෙනකල් ඉඳලා අංජලී මගෙන් ඇහුවා. උංගිට නම් තියෙන්නෙ මාර ඇඟක්.

"නෑ උංගි.. මං මේ බැලුවෙ අපි දෙන්නට මේ සාලෙට වෙලා කතා කරන්නද වෙන්නෙ කියලා.."

"ඇයි අයියා..?"

"නෑ ඉතිං.. මේ ගෙදර තව ඉඩ තියෙන තැන් නැතුවද මංදා. ඔය කාමරයක් හෙම.."

මං හීනියට ඇහැක් පුංචි කරලා අංජලීට කිව්වා.

"ඇත්තමයි ඔයා හරියට වල් වෙලා.. එන්න එන්නම ළමයා නරක් වෙනව වගේ.."

"ඔයා ගාව ඉන්නකොට එහෙම වෙනව උංගි.."

"ඇත්තද ආ..?"

උංගි මගේ අතක් ඇදල වගේ අරගෙන කොනිත්තන්න ගත්තා. ඒ එක්කමයි නිරෝෂි කොහේදෝ ඉඳල ආවෙ.

"මොකද ඔයාලා දෙන්නා රංඩු වෙනවද..? මං අන්න මගේ කාමරේ සෙට්ල් කරා ඔයාලට කතා කර කර ඉන්න.."

නිරෝෂි එහෙම කිව්වහම උංගි මං දිහා බැලුවා. ඒ ඇස් දෙක බයවෙලා වගේ.. පව්.. මගෙ හිතට මොකක්දෝ වෙලා ගියා.

"ඕනෙ නෑ නිරෝෂි අපි මෙතන ඉන්නම්.."

මං පංඩිතයා වගේ කිව්වහම නිරෝෂිට හිනා ගියා.

"බොරු කරන්නැතුව දෙන්නම එනවලා.."

මගෙයි, අංජලීගෙයි අත්වලින් ඇදගෙන සාලෙ කොනටම වගේ වෙන්න තිබ්බ කාමරේකට එයා අපිව තල්ලු කරා.

"අංජු හැමදාමත් කියනවනෙ ඔයාගෙ අයියත්තෙක්ක නිදහසේ කතා කරන්න හම්බවෙන්නෑ කියලා. ඕන්න උපරිම නිදහස.. හදිසියක් නම් කතා කරපන්.."

නිරෝෂි කාමරෙන් ගියා. අංජලී හිටියෙ මගේ අතකින් අල්ලගෙන.

"ඇයි උංගි බයවෙලා වගේ.."

අංජලීගෙ ඉණ වටේ අතක් දාලා මගේ ළඟට ළං කර ගන්න ගමන් මං ඇහුවා. එයාගෙ අර බයවෙලා වගේ තිබ්බ මූණට පුංචි

හිනාවක් ආවා. එයා මගෙන් ඈත්වෙලා කාමරේ මැද්දෙ තිබ්බ ඇඳ උඩින් වාඩිවුණා.

"ඒ පාර මොකද..? ආයෙමත් කිති හැදුනද..?"

අංජලී ළඟින් වාඩිවෙන ගමන් මං ඇහුවා. අංජලිගෙ මූණෙ අර කලින් ආපු හිනාවම තිබුණ මිසක මුකුත් කිව්වෙ නෑ. අපි දෙන්නම හුඟාක් වෙලා යනකන් මූණෙන් මූණ බලන් හිටිය මිසක වචනයක්වත් කතා කෙරුවෙ නෑ. ඇත්තටම ඒක කියාගන්න බැරි තරම් ආදරණීය විනාඩි ගානක්. මේ ලෝකෙ කිසිම දෙයක් ගැන හිතන්නෙ නැතුව අපි දෙන්න විතරක් තනිවෙච්ච පුංචි කාලයක්.

"ඔයා ළඟ ඉන්නකොට මට හැමදේම අමතක කරලා දාලා හිත සන්තෝසෙන් තියාගන්න පුළුවන් විහඟ අයියෙ.."

"හැමදේම කියල කිව්වෙ උංගි..?"

උත්තරේ දැනගෙන වුණත් මං ඒ ප්‍රශ්නෙ ඇහුවා. මං හිතපු විදියටම අංජලී උත්තරයක් දුන්නෙ නෑ.

"හැම දෙයක්ම මං දන්නව උංගි.. ඔයාට තියෙන හැම ප්‍රශ්නයක්ම මං දන්නවා.. සන්තෝසෙන් හිනාවෙලා හිටියට මං ඔයා ගැන නිතරම හිතනවා.. ඔයාගෙ හිතට උහුලගන්න අමාරු දේවල් වෙනව ඇති කියලත් මට හිතෙනවා.. ඒත් මේ හැම දේකම අන්තිම මොකක්ද කියල මං සමහර වෙලාවට කල්පනා කරනවා.."

"ඒ... ඒ.. කිව්වෙ..?"

"අපි දෙන්නගෙ අනාගතේ කොහොම වෙයිද කියල මං ජේන කියන්න දන්නෑ උංගි.. ඒත් ඔයාගෙ තාත්තා, පවුලෙ කට්ටිය සුභාත්, අපි දෙන්න මැද්දට මහා පවුරක් වගේ පනින විත්තිය මට

පේරෙනවා.. මට හිතාගන්න බැරි දේකට තියෙන්නෙ ඔයා ගන්න තීරණේ මොකක් වේවිද කියලා..'

මං කියාගෙන කියාගෙන ගියා. අංජලී එයාගෙ අතින් මගේ කට වැහුවා. ඒ ඇස් දෙකේ කඳුළු පිරිල තියෙනව මං දැක්කෙ එතකොටයි. දෙයියනේ මාත් පිස්ය වගේ ඕනෙ එකයි, එපා එකයි හැමදේම කියවනවා.. දැන් උංගිත් එක්ක මටත් අඩන්න වෙනවා.

අංජලිගෙ කඳුළු පිරුණු ඇස් දෙකත් එක්කම ඒ හඳක් වගේ මූණ මගේ දිහාට මං ළං කර ගත්තා. කාන්දමක් ඇදිල එනව වගේ අංජලී මං දිහාට ඇදිල ආවා.

"කඳුළු පුරව ගන්න තරමෙ දෙයක් මං ඔයාට කිව්වෙ නෑනෙ රත්තරං.. මගේ ආදරේ ඔයාට කියාගන්න බැරුව මං මුලින් මහ හුඟාක් දුක් වින්දා. මට නිතරම මතක් වෙන්නෙ මං ඔයාලගෙ ගෙදරට මුලින්ම ආව දවස.. ඔයා මාව අඳුනන්නෑ කියපු වෙලාව ඔයා දන්නවද.. ඔයා දන්නවද උංගී මං කොයි තරම ඇඬුවද කියලා.."

මං කියාගෙන කියාගෙන යද්දි අංජලී මගේ පපුවට තුරුල් වුණා. එයා හුල්ලනවා කියලා මට තේරුණා.

"පහුවෙච්ච දේවල් ගැන මං ආයෙත් මතක් කරන්නෙ ඇයි කියලා ඔයා බලනව ඇති.. තව ඉස්සරහදි මං බලාගෙන ඉන්දැද්දිම ඔයාලගෙ ගෙදරින් ක්‍රිශාන්ට ඔයාට බන්දලා දුන්නොත් කියන ප්‍රශ්නෙ නිතරම මං වටේ කැරකෙනවා. මොකද ඔයාලගෙ ගෙදර අය තවම මං ගැන දන්නෑ. මටත් හිතාගන්න බෑ මං මොනවද කරන්න ඕන කියලා.."

"හැමදේම දිහාම අසුබ විදියට බලන්නෙපා රත්තරං අයියෙ.. ඔයාට කවදාවත් දුකක් දෙන්නෑ කියල මං මීන තැතක දිවුරල කියන්නම්.. මං ගැන අහිතක් හිතන්නෙපා.. ක්‍රිෂාන්ටවත් අපේ ගෙදර අයටවත් බෑ මගෙ හිත වෙනස් කරන්න.. ආදරේ කියන්නෙ මොකක්ද... ආදරේ වේදනාව කියන්නෙ මොකක්ද කියල, අළුත්වල දුන්නු ඔයාව අමතක කරන්න මට කවදාවත් බෑ අයියෙ.. එහෙම කරොත් මට සහගහයි.."

"මං මීතෙ තරම් කෙල්ලොන්ගෙ ෆොටෝස් අරගෙන පත්තරවල මුල් කවරෙට දාලා ඇති.. ඒ හුඟක් අය මගෙත් එක්ක යාලුවෙන්න කැමැත්තෙන් හිටියා.. ඒත් ඒ කා ගැනවත් මගෙ හිතේ ආදරයක් ඇතිවුණේ නෑ. මගෙ ජීවිතේටම කෙල්ලෙක් ගැන ඉස් ඉස්සෙල්ලාම ආදරයක් ඇතිවුණේ ඔයා ගැන උංගි.. ඒ ආදරේ හැමදාටම එහෙමයි. ඔයා දන්නවා මං හුඟාක් සැහැල්ලුවෙන් ඉන්න කොල්ලෙක්. ඒත් මගේ ආදරේ සැහැල්ලුයි කියල නිකංවත් හිතන්නෙපා.. මොකද මං මගේ ජීවිතේටත් වැඩියෙන් ආදරේ කරන ඔයා මාව ප්‍රතික්ශේප කරොත් ඒ වෙනුවෙන් මං මගේ ජීවිතෙන් ගෙවන වන්දිය හුඟාක් වැඩිවේවි.."

කවදාවත් නැති විදියට මං කියවන් ගියා. ඇත්තටම ඒ වචන ආවෙ මගේ හිත ඇතුලෙන්මයි. ඒ හැමදේම කියල ඉවර වුණාට පස්සෙ මගෙ හිතට පුදුම සැහැල්ලුවක් දැනුණා. මෙච්චර දවසක් හිත ඇතුලෙ හිරවෙලා තිබ්බ මොකක්දෝ දෙයක් පිටවෙලා ගියා කියලා මට තේරුණා.

"මං දන්නවා.. මං දන්නවා.. ඔයා කියන හැමදේම ඇත්ත.. මං මුලින්ම ආස වුණේ ඔයාගෙ දහකමට.. ඒ දහකම යටින් තියෙන ඔයාගෙ අහිංසකකම මං ඊට පස්සෙ දැක්කා. ඒ හැමදේටම

යටින් තිබ්බ ඔයාගෙ ලස්සන හිත මං දැක්කා. මගේ ජීවිතේට අහම්බෙන් හම්බවුණු ඔයා වගේ වටිනා වස්තුවක් මොනම හේතුවක් හින්දවත් මං නැති කරගන්නෑ විපාන අයියෙ.."

අංජලී ලොකුම ලොකු හුස්මක් හෙලුවා. ඒක හරිම උණුසුම් සුසුමක්. මගේ කම්මුල්වල ඒ සුසුම තැවරිලා මුළු හිතම සිහිල් කවල දැම්මා.

"මං ඇතුළට එන්නදෝ.."

දොර ගාව ඉඳන් නිරෝෂි කෑගහනවා මට හීනෙන් වගේ ඇහුණා. මායි අංජලියි එකපාරටම ඈත් වුණේ කරන්ට් වැදිලා වගේ.

"එ.. එන්න නිරෝෂි.. එන්න.."

මං යන්තන් කියාගත්තා. පුංචි හිනාවක් මූණට අරන් අංජලි මං දිහා බැලුවෙ මටත් හිනාවෙන්න කියනව වගේ. ඒ තත්පරේම නිරෝෂි කාමරේට ආවා. තිකං නොමේ. යෝගට් දෙකකුත් අරන්.

"අංජූ.. උඹට අද සැටිස් නේද..? ඔන්න විහඟ.. අපේ කෙල්ලව හොඳට බලාගන්න ඕන.. මේකි මහ අඬන බබෙක්.."

"එදා යෝගට් කාපු එක මතක් වෙනව විහඟ අයියෙ..?"

වැලියෙන් ගියපු දවස මතක්වෙලා උංගි කිව්වා.

"හා.. උඹල දෙන්න මීට කලිනුත් මේ වගේ ඉඳන් යෝගට් කෑවද..?"

ඇස් දෙක නළලෙ තියාගෙන නිරෝෂි, උංගිගෙන් ඇහුවා.

"අනේ නෑ නිරෝෂි.. ඒ කෑවෙ නම් මහ සෙනගක් මැද්දෙ.."

"මං මෙහෙන ඉඳන් උදැල්ල දානව වගේ.. මං යනවා.."

කාර්ටන් එකත් හදාගෙන නිරෝෂි කාමරෙන් පිටවුණා.

"ඊකි ගිය එක නම් කියලවත් කරගන්න බැරි වැඩක් නේද උංගී..?"

"අනේ පව් විහඟ අයියා.. නිරෝෂි හරි හොඳ කෙල්ල.. ජිණා වුනත් දෙයි.. ඒක නෙමේ අයියා ඔයාගෙ අලුත් විස්තර.. මට මුකුත් කිව්වෙ නෑනේ.."

ආයෙත් මගේ අතක් අරන් උකුලෙ තියාගන්න ගමන් උංගි ඇහුවා.

"ම්.. දැනට නම් විශේෂ විස්තරයක් නෑ.. රාජුත් එක්ක රවුම් ගහන එක නම් ටිකක් අඩුවෙච්චි.. වීඩියෝ සෙන්ටර් එන හන්ද.. ඉතිං.. ඔයාලගෙ ගෙදර තත්වෙ කොහොමද..?"

මං අහපු දෙයින් ඒ සුදු මූණ මැලවෙලා ගියා. ඕන්නැති ප්‍රශ්නයක් ඇහුවා කියල මගේ හිත මට කිව්වා. ඒත් ඉතිං අංජලීගෙ ගෙදර තත්වෙ ගැන අහන්නැතුව ඉන්නෙ කොහොමද..?

"ඒ ගැන ඔයාට කියල ඔය අහිංසක හිත රිද්දන්න මං කැමති නෑ අයියෙ.. ඔයා ළඟට හැමදාටම එනකන් මං මේ හැමදේම ඉවසගෙන ඉන්නම්.."

හුඟාක්ම අහිංසක විදියට අංජලී කියද්දි මගේ පපුව පිච්චිල වගේ ගියා. දෙයියනේ.. මං දන්නෙ නැතුවට මේ පුංචි කෙල්ලට ගෙදරින් හුඟාක් කරදර තියෙනව කියලා මට ඒ වෙලාවෙ තේරුම් ගියා. ක්‍රිෂාන්කාරයා අපතයා වගේ හිටියට බාල්දියක්වත් පෙරලලාද දන්නෑ.. ඒ කියන්නෙ මේ ගැන අංජලීගෙන් අහන්නම වෙනවා.

ඒත් ඒ ගැන අහල අංජලිගෙ හිත රිදේවිද දන්නැ කියන ප්‍රශ්නෙත් මගේ ඔලුවෙ තිබ්බා. ඒත් තවත් වෙලා යනකන් මගේ ඔලුවෙ ඒ ප්‍රශ්නෙ මං තියාගත්තෙ නැ.

"ඌංගි.. මට කියන්න, ක්‍රිෂාන් මොනවද කියන්නෙ කියලා.."

අර ලොකු ඇස් දෙක පුංචි කරල අංජලී මං දිහා බැලුවෙ හුහාක් අසරණ විදියට. මගේ මුළු හිත පුරවල තිබ්බ ආදරණීය හැඟීම් ඔක්කොම එකතුවෙලා ඒ තත්පරේ මගේ හිතෙන් එළියට පැන්නා. දෙපාරක් තියා එකපාරක්වත් හිතන්නැතුව මං අංජලිව මගේ ළඟට ඇදල අරගෙන ඉඹගෙන ඉඹගෙන ගියා. හා පැටියෙක් වගේ මට තුරුළු වෙලා උන්න මිසක එයා මගෙන් ඈත්වෙන්න හැදුවෙ නැ. මගේ දිහා බලල එයා යාංතමට හිනාවුණා.

"ක්‍රිෂාන් මොනව කියන්නද අයියෙ.. මගේ හිත ඔයා ළඟ තියෙද්දි.."

අංජලී ඇහුවෙ හොඳ ප්‍රශ්නයක්. මගේ ප්‍රශ්නෙට උත්තරේ ප්‍රශ්නෙකින්ම මට හම්බවුණා.

"තරහද..?"

"මොකටද අයියෙ..?"

"දමාගෙන ඉම්බට.."

"අනේ ඇත්තට අද නම් දෙකක් ගහන්නම ඕන.. මට ලැජ්ජාවෙ බැ.. හැමදේම කියවනවා.. කොහෙන් වචන එනවද මංදා.."

මට රිදෙන්නැති වෙන්න අංජලී හෙමින් පාරක් ගැහුවා.

"අපි දැන් යමුද ඌංගි..?"

"හදිසියෙම..?"

"කාපු බීපු තැන්වල සතා සර්පයොවත් ඉන්නෙ නෑනේ.."

"අපි සත්තු නෙමේනෙ.."

අනේ අම්මප වෙලාවකට උංගිත් කියන්නෙ අදහගන්න බැරිදේවල්.. ඕවට ඕන නම් උත්තර දෙනෑකි ජල ගීතිකාව හැදෙන්න.. ඒත් මං සද්ද වහගත්තා. කොහොම හරි දවල්ටත් කාලා යන්න කියල නිරෝෂි වද කරද්දි මායි අංජලියි ආපහු එන්න ආවා.

"දැන් නම් හිතෙනවා නිරෝෂි අච්චර කියපු එකේ කාලම ආව නම් හොඳයි කියලා.."

නුගේගොඩ ළංවෙද්දි මං කිව්වා.

"ඒ ඇයි විහඟ අයියේ.."

"එහෙනම් ඒකි රෑටත් කන්න ඉන්න කියනවනෙ.. ඊට පස්සෙ හෙටම යන්න කියල කියයි. එතකොට ඔයාටයි, මටයි සන්තෝසෙන් සාමදානෙන් පවුලක් පන්සලක් වෙන්න තිබ්බා එකම කාමරයට වෙලා.."

"මේක පාර නෙමේ නම් මං රිදෙන්න දෙකක් දෙනවා.. අනේ ඇත්තටම විහඟ අයියේ ඔයා මහ නරකයෙක් වෙලා.."

රාජ්ගෙ කඩේ ගාවට එද්දි අංජලී කිව්වා. අංජලිගෙ මූඩ් එක ටිකක් අප්සට් ගිහින් තිබුණා. ඒත් ඒ ඇයි කියලා නම් මට හිතාගන්න පුළුවන් වුණේ නෑ.

"අනේ උංගි මං විහිළුවටනෙ කිව්වෙ.. ඔයා ඒක ඇත්තට ගත්තද..?"

"ඇත්තටම නෙමේ අයියා.. ඔයා ඒ වගේ දේවල් කියනවට මං ආසම නෑ.. ඔයා දඟයෙක් වුණාට මං කැමතියි, මං ගාවදී අහිංසක විදියට ඉන්නාට නම්.."

"මට ඩබල් ඇක්ටින් කරන්න බෑනෙ උංගි.."

ඒත් මං කියපු දේට උත්තරයක් දෙන්න අංජලීට හම්බවුණේ නෑ. අලුත්ම ට්‍රේල් බයිසිකල් දෙකක් මාවයි අංජලීවයි පහු කරන් ගිහින් අපිට පාර හරස් කෙරුවා. හවසට ග්‍රවුන්ඩ් එකේ පුට් බෝල් ගහන කොල්ලො, ගැන්සියවත්ද කියල මං හිතුවත් එතන කවුරුත් මං අඳුනගත්තෙ නෑ. එක බයික් එකක් ස්ටාට් එකේ තියෙද්දි අනිත් බයික් එකේ ස්ටාර්ට් එක නවත්තල කෙට්ටු කොල්ලෙක් මං ළඟට ආවා.

"වැඩේ කැතයි නේද ලොක්කා..?"

මගේ දිහාට ඇඟිල්ල දික් කරල ඌ එහෙම අහද්දි අනිත් බයික් එකත් ස්ටාර්ට් එක නැවැත්තුවා. අංජලී හොඳටම බයවෙලා මගේ අතේ එල්ලුණා. කතාවට යන්නෙපා කියල එයා හීන් සීරුවෙ කියනවත් මට ඇහුණා. මේ කොහෙන් පාත්වෙච්ච මරාලයක්ද කියල මං කල්පනා කරත් හරි හමන් අදහසක් මගේ ඔලුවට ආවෙ නෑ.

"ලැජ්ජ නැද්ද බෝ.. අපේ එකෙකුට කතා කරපු කෙල්ලෙක් පදින්න.."

"ම.. මට තේරෙන්නෙ නෑ.."

"තේරෙන්නෙ නැත්තෙ උඹ බබානෙ.. අඩෝ මේ නිකං බබා හුකං පාට් දාන්නෙපා.. අරිද..? මිය උඹ ගාව කුරුල්වෙලා ඉන්නෙ

අපේ ශ්‍රීමාන් ලොක්කගෙ කෙල්ල.. හරිනේ.. දැන් මාර්ගෙ ඉඩදීල, මාර්ග බාධකයක් වෙන්නැතුව අයින් වෙයන්.."

කලු ඊ එකක් දාන් හිටපු එකා කියවද්දි මට එතෙයිය ගානට මල පැන්නා. ඒක තේරිලාද කොහෙද අංජලී මගේ අත තවත් හයියෙන් අල්ලා ගත්තා.

"මාර්ග බාධකේ වගේ ඉඳන් උඹලනෙ ඩෝ අපිව වෙක් කෙරුව.. කොට්ටම්ම කාරණේ මේකායි.. උඹලගෙ ශ්‍රීමාන්කාරයට කොන්දක් නෑ.. කොන්දක් තිබ්බ නම් උඹල වගේ හෝතයො එවන්නැතුව ඌම ඉස්සරහට එනවනෙ.."

"අ.. අනේ විහඟ අයියා අපි රංඩුවෙන්නැතුව ඉඳිමු.. ප්ලීස්.. අර බලන්නකො මිනිස්සුත් බලනවා.."

"නිකං ඉන්න ඌගී.. සද්ද වහල හිටියොත් මුං හිතාවෙ මුංට බයෙ කියලා.."

"අඩෝ.. මේ.. තොගේ සද්දෙ වැඩියි.. අරී.. අනිත්තෙක මෙතන ජනාකීර්ණ වැඩියි.. නැත්තං තොගේ කටුවක් ඉතුරු කරන්නෑ.. ඒක දැනගනින්.."

පත උඩු රවුලක් තිබ්බ පොරක් මං ඉස්සරහට ඇවිය තිබ්බා. අංජලී මගේ අතින් අදිනට මයැරල යමු කියලා.

"බොසා.. එච්චට නම් ටිකක් වෙලා යයි.. වැඩිම උනොත් තාල කාල පස්සෙත් හෝදන් ඉන්න වෙයි.."

ඒ කටහඬ ආවෙ මගේ පස්සෙන්ම.. මං හැරිලා බලද්දි දාර පයිප් මිටියකුයි පරාල ඇණ වගයකුයි අතේ තියාගෙන හිටියෙ වෙන කවුරුවත් නෙමෙයි ශ්‍රී රාජ්. උංව දැක්ක ගමන් මගෙ හිතට

ආවෙ මාර ටිව් එකක්. දෙයියෝ මුදුන් එව්ව වගේ. කඩේ ඇතුලෙ ඉඳපු මූ කොහොම එළියට ආවද මං-දා. වටපිටේ මිනිස්සු හරියට හින්දි පිල්ම් එකක් බලනව වගෙයි බලන් ඉන්නෙ.

"අඩෝ මේ.. පණ්ඩිත වැකි මින්නෑ.. බොකු බඩවැල් ඇදල දාන්න කලින් මේ කෙල්ලත් එක්ක තියෙන සම්බන්ධෙ නවත්තල දාපං... ආයෙ අපි කියන්නෙ නෑ.."

මරුමුස් පාට් එකක් දාලා එකෙක් කිව්වා. ඒත් මගේ හිතට බයක් දැනුණෙම නෑ. අංජලී ළඟ ඉන්දෙද්දී බයවෙලා කොහොමද..?

"අනේ රාජ් අයියා.. මේ විහාගට අරන් යමුකො.. නිකං පැටලෙන්න හදනවා.."

ඒ පාර අංජලී, රාජ්ට කෑගැහුවා.

"බොකු බඩවැල් අදින්න.. උඹල මාලු මාර්කට් එකේද වැඩ කරන්නෙ.. නිකං ෂෝ දාන්නෙ නැතුව උඹලගෙ ක්‍රිෂාන්ට කියපං මෙහෙන්ට ඇවිත් ඔය ටික කියන්න කියලා.."

"එයි.. මුලිස් කාරයො දෙන්නෙක් මේ පැත්තට එනවා.. වහෙල්ලා මාරුව දාමු.."

නුගේගොඩ හන්දිය දිහා බලලා එකෙක් කෑගැහුවා. වැඩේ ඇත්ත. පණ්ඩිතයො වගේ මුං කෑගැහුවට පොලීසියට පුදුම බයක්නෙ තියෙන්නෙ.. ගේමක් වත් දීපු ඇයොද දන්නෑ.. මාත් තියෙව්වට.

"අඩෝ කෙල්ල ඉස්සරහ උඹ විරයා උනාමනේ.. ආයෙ උඹට වෝනිං නෑ සහා.. ගේමම තමයි.."

එහෙම කියාගෙන උං මාරු උනා. මුලිස් සාජන්ල අපි ළඟට

එන්න කලින් රාජ්, මාවයි අංජලීවයි කඩේ ඇතුළට තල්ලු කරගෙන ගියා.

"මොකක්ද බං උනේ..? කවුද ඒ යමදූතයො ටික.."

කඩේ ඇතුළට ගිය ගමන් රාජ් ඇහුවා.

"මං දන්නෑ බං.. ක්‍රිෂාන් තාරයගෙ ගෝත්‍ර ගැන්ඩියද කොහෙද..? හැබැයි මචං උන් තව කියෙව්ව නම් පොලිසි යන්න හරි කමක් නෑ මං ගේම අතාරින්නෑ.."

"ඔය බලන්න.. අ.. අනේ රාජ් අයියා විහඟට කියන්නකො බොරුවට රංඩුවලට යන්නෙපා කියලා.. නිකං බලෙන් පැටලෙන්න යනවා.."

අංජලීගෙ ඇස් දෙකත් රතුවෙලා. මූණත් එක්ක මැලවෙලා ගිහින්. ඒත් අංජලී කියපු එකට මට තදවුණා.

"ඔව්.. මමනෙ බලෙන් රණ්ඩුවට ගියේ.. මම තමයි අත දික් කරලා උංගෙ මෝටර් බයික් නවත්තල අඩෝ පඩෝ කියල වලිය දාගත්තෙ.."

"ම.. මං කිව්වෙ අයියා ඔයා කතා නොකර හිටිය නම් හරි කියලා.. ඔයා මොකටද ඒ රස්තියාදුකාරයොත් එක්ක කතාවට ගියේ.. බලන්න එතනදි රංඩුවක් ගියා නම් එහෙම..?"

"රංඩු වුණා නම් එහෙම මං ගුටි කාවි කියලද ඔයා හිතන්නෙ උංගි.. ඔව් ඉතින්.. ඔයාට නම් මොකද..? උං කියපුව දිරවගන්න නැතුව ගියේ මටනෙ.. උං කිව්වෙ මං උංගෙ එකත් පදිනවා කියලා. අනුන්ගෙ ඒව පදින්න මට ඕනකමක් නෑ.."

"දෙ.. දෙයියනේ විහඟ.. ම.. ඔයා මොනවද මේ කියන්නෙ..?"

අංජලීගෙ ඇස්වලට කඳුළු උනාගෙන ආවා. කඩේ වැටට ඉන්න කොල්ලො දෙන්නා දෙමළ පිචර් එකක් බලනව වගේ බලන් ඉන්නෙ. උං හින්දි බලන්නෑ කියල රාජ් කිව්වනෙ.

"විහඟ.. මොකද බං උඹට වෙලා තියෙන්නෙ..? මෙහෙනින් උදේ යනකොට උඹ මොන තරම් සන්තෝසෙන්ද ගියේ.. ඩිංගක් කූල් වෙයං මචං.. උඹල දෙන්න රංඩු වෙලා වැඩක් නෑනෙ.. උඹල රණ්ඩු වෙනව කියල දන්නව නම් ත්‍රිෂාන්කාරයා උඩ පැන පැන නටාවි.."

ඒ පාර රාජුත් බර බරේ දාන්න ගත්තා.

"වෙලා තියෙන්නෙ මොකක්ද කියල මටත් තේරෙන්නෑ රාජ්.. වැඩේ කියන්නෙ අංජලීටත් පේන්නෙ මගේ වැරද්දනෙ බං.. අරුන් අච්චර පල් වාක්‍යය දාද්දි මං මුකුත් නැති එකා වගේ දෙකේ කොළේට වැටිල ඉන්නද ඕන.. ඒක හොඳ උංගි ඔයා කියන්නෙ..? ඊට වැඩිය හොඳයි ඔයාවත් උන්ටම බාරදීලා මං ගෑනි වගේ ගෙදර ගියා නම්.."

මට නැට්ටටම මල පැනල තැට්ටෙනුත් එහාට ගිහිනුයි තිබුණේ.

"දෙ.. දෙයියනේ.. ම.. මං එහෙම දෙයක් කිව්වද අයියා.. ඒ අය රස්සියාදුකාරයො.. ඒ වගේ අය එක්ක කතා කරන්නවත් යන්න ඕන්නෑ. අපි එතනින් එන්න ආව නම් ඉවරනෙ.. ඒකයි මං කියන්නෙ.. කී දෙනෙක් නම් බල බලා ගියාද..? අපිටමනෙ ලැජ්ජාව අයියා.."

"ඔ.. ඔය බලපං රාජ්.. උංගිගෙ කතාව.. අනේ කියන තැනකට

වදින්නම් උංගි.. තවත් ඕක ගැන කතා නොකර ඉඳිමු.. නැත්තං මට ඔයත් එක්කත් රංඩු කරන්න වෙනවා.."

මං එහෙම කිව්වහම අංජලී එක පාරටම මගේ දිහා බැලුවා. ඒ සුදු මූණ තත්පරෙන් තත්පරේ රතු පාට වෙන හැටි මං දැක්කා.

"ඔ.. ඔයා හොඳම නෑ විහඟ අයියා.. ඔයා හොඳම නෑ. මගේ හිත රිද්දනවා.. අනේ රාජ් අයියා මං වැරැද්දක්ද විහඟට කිව්වෙ.. මිනිස්සු මොනව කිව්වත් ඇයි අපි එල්ලි එල්ලි රණ්ඩු වෙන්නෙ..?"

"දැන් ඕක ගැන කතා කරා ඇති අංජලී.. විහඟත් අප්සට් එකේනෙ ඉන්නෙ.."

"සිංහල තේරෙන්නැතෙ බං.. ඔය කතාව අදින්න එපා කියද්දිම ඒක අදිනවා.. හරි.. මගේ තමයි වැරැද්ද.. මං ආයෙ එහෙම රණ්ඩුවෙන්නෑ.. මොකෙක් හරි ඇවිල්ල මට ගහනකොට මං උඩ බලන් ඉන්නම්.. ඌ උඩ බලන්න නොදී මට ගැහුවොත් මං බිම බලාගෙන හරි ගුටි කන්නම්.. ඉවරනේ.."

මහා සද්දෙට මං කියවන් ගියා. අංජලීගෙ මූණ දිගේ ගලාගෙන යන කඳුළු පුංචි ලේන්සුවෙන් පිහදාගන්න ගමන් එයා ජවුල් එකෙන් නැගිට්ටා.

"ම.. මං.. ය.. යනවා.."

එකපාරටම එහෙම කියල අංජලී කඩෙන් එළියට බැස්සා. රාජ් මගේ මූණ දිහා බැලුවත් මං බිම බලාගත්තා. පස්සෙන් ගිහින් අංජලීට කතා කරන්න තරම් උවමනාවක් නැති විදියට

මගේ හිත කරහෙන් මුරංඩු වෙලා තිබුණා. මොකද මං අංජලීට වැරැද්දක් කරල තිබුණෙ නැති හින්දා.

"යකෝ.. අරකිව එක්කත් වරෙන්.."

අංජලි යන දිහාට අත දික්කරලා රාජ් කෑගැහුවා. කේන්තිය වැඩිකමට මං මෙලෝ දෙයක් කතා කෙරුවේ නෑ.

"විහඟ.. මං කියන දේ උඹට ඇහෙනවද..?"

"උඹ කැමති නැද්ද මං කඩේ ඉන්නවට.."

රාජ් අහපු දේට මාත් ඇහුවෙ ප්‍රශ්නයක්.

"අම්මප උඹ නම් අද ඇඳේ විච්චටම පැත්තෙන් බැහැලද මංදා.. මොකද බං මගෙත් එක්කත් ඇරගන්න එන්නෙ..?"

"හරි.. උඹ දැන් කියන්නෙ මට මොනව කරන්න කියලද..?"

"මං කියන දේ උඹ කරනවද..?"

"මැරෙන්න කියනව නම් මැරෙන්නම්.."

"එච්චර හරියක් ඕන්නෑ.. උඹ හොඳටම අවුල්වෙලා විහඟ.. අංජලි කොහේ ගියාද දන්නෑ.. වරෙන් ඒකිව හොයමු.."

වැඩට ගත්තු කොල්ලො දෙන්න කඩේ ඉන්දෙද්දි රාජ් මගේ අතිනුත් ඇදගෙන කඩෙන් එළියට බැස්සා. රාජ් කියන එකත් හරි.. මගේ ඔලුව හොඳටම අප්සට් වෙලා.. රිදෙනවත් එක්ක.

"හජ්ජේ අර ඉන්නෙ.. යමං යමං.. වෙලාව හොඳටම හොඳයි.. අපොයි හත්තිලව්වේ.. බස්සෙකට නැග්ගා නේද..?"

අංජලී 138 බස්සෙකකට නගිනව දැකල රාජ් කෑගැහුවා.

"කැනොගහ ඉඳපන් බං.. කලර්ස් ලයිට් ගාව ෂුවර් එකට බස්සෙක නවත්තනවා.. දුවල බලමු.."

රතුපාට ලයිට් එක ඉස්සරහ වාහන පෝලිමක්ම නවත්තලා. බලන් ගියාම රතු පාටටත් කොයි තරම් දේවල් කරන්න පුළුවන්ද..? අවුල්වෙලා ඉන්න වෙලාවෙත් මට ආවෙ මැංවල් අදහස්ම තමයි.

"තවත් බලන් ඉන්නැතුව වරෙන්.."

මංයි, රාජුයි දුවල ගිහින් අංජලී නැගපු බස්සෙකට නැගගත්තා. ඒ තරම් සෙනගත් නෑ. සීට් ඇඳි දෙකත් අත්වලින් අල්ලගෙන ජනේලෙන් එළිය බලන් ඉන්න අංජලීව දැක්කහම මගෙ හිතට ආවෙ ලොකු දුකක්. අර හිතේ තිබ්බ සෝන්තිය ඩිංගෙන් ඩිංග අඩුවෙලා දුක ඩිංගෙන් ඩිංග වැඩිවෙන්න ගත්තා.

"හොඳටම පව් යකෝ.. ගිහින් කතා කරපං.."

රාජ් මාව ඉස්සරහට තල්ලු කරා. මං හිමින් සීරුවෙ අංජලීට ළංවුණා. ඒ මූණ මහා දුකකින් වැහිල ගිහින් තිබුණා.

"උං.. උංගි.."

මගේ කටහඬට එයා එකපාරටම හැරිලා මං දිහා බලල ආයෙත් කලින් බලන් ඉඳපු දිහාම බලාගත්තා.

"උංගි මගෙත්තෙක්ක තරහද..?"

ඒත් අංජලී මං දිහා බැලුවෙ නෑ. බලන් ගියාම කෙල්ලොන්ගෙත් පුදුම ආඩම්බරයක්නෙ තියෙන්නෙ.

"ප්ලීස් උංහි.. මගෙත් එක්ක කතා කරන්න.. බස්සෙකේ අයත් බලනව ඇති මං තනියම කතා කරන පිස්සෙක් කියලා. මං මේ [illegible]නක්කයි කතා කරන්නෙ. මෙතන මං අඳුනන වෙන කවුරුත් [illegible]

ඒ පා[illegible]ම් අංජලී මං දිහාට හැරුණා. ඒත් ඒ මූණෙ කිසිම හැඟීමක් [illegible] තිබ්බෙ නෑ. මොකක්දෝ විරාගික ලස්සනක් විතරක් මං ඒ [illegible] මූණෙ දැක්කා.

"රාජ් අයියගෙ කඩේ ඇතුළෙදි ඔයා මට කතා කරපු හැටි හර[illegible] නැතයි අයියා.. මං හිතුවෙ නෑ ඔයාට ඔය තරම් නපුරු වෙන්න පුළුවන් කියලා.."

මමත් කේන්තිය වැඩිකමට මොනව කිව්වද මංදා. ඒත් මට නම් බුදු අවර් මං අංජලීගෙ හිත රිදෙන්න මුකුත් කිව්වෙ නෑ කියලා. ඒක එහෙම වුණත් මේ කෙල්ලව මෙහෙම ගෙදර යවන්නෙ කොහොමද කියලයි මං කල්පනා කෙරුවෙ.

"හරි.. වැරැද්ද මගේ කියල පිළිගන්නම්.. දැන්වත් ඩිංගක් හිනාවෙන්න උංහි.."

"ඔයා වැරැද්දක් කරහම මට නව හිනාවෙන්නත් කියනවද විහන අයියා.."

"අංජලී.. දෙයියනේ මට ඔයත්තෙක්ක රංඩුවෙන්න බෑ නංගි.. මෙක බස්එකක්. මිනිස්සුත් බලනවා. මේ කොහේදෝ යන මුසලයො ටිකක් ඇවිත් අපේ සංතෝසෙ කාලම දැම්මා.."

"ඔයා ඒ වෙලාවෙ කතා නොකර හිටිය නම් හරි රත්තරන්.."

"ආයෙත් ඒ දේම ඇදල ගත්තා. දෙයියන්ගෙ නාමෙට මීක

අමතක කරන්න බැරිද උංගි.. ඒ වෙලාවෙ වෙච්ච කතාබහ ගැන ඔයාට ඔය තරම් තියෙන උවමනාව මොකක්ද..? ඌ ගැන්සිය ගිහිල්ලා ඔයාලගෙ ගෙදරට කේලම් කියයි කියල බයයිද..?"

මෙච්චර වෙලා මගේ හිතේ කරකැවි කරකැවි තිබ්බ ප්‍රශ්නෙ මං ඇහුවා. අංජලීගෙ මූණ අවුල්වෙලා ගියේ බලන් ඉන්දෙද්දිම වගේ. ඒත් එයා කතා කරේ නෑ. එහෙනම් ඒක තමයි මේ අවුල.

"අපි දෙන්නා උදේ මොන තරම් සන්තෝසෙන්ද හිටියෙ නංගි.. ඒත් ඒ සන්තෝසෙ දැන් විනාශ වෙලා ගිහින්. තවත් මේ ගැන කතා කරන්න ගිහින් හිත රිද්දගන්න මං කැමති නෑ. ඔයා පරිස්සමින් ගෙදර යන්න නංගි.. මං බහිනවා.."

මං කියපු දේට අංජලී මොනවදෝ කියන්න හැදුවත් මං රාජ්ටත් ඇදගෙන බස්සෙකෙන් බැහැගත්තා.

"මොකද වුණේ..?"

"තවත් මොනව වෙන්නද යාලු.. අංජලී එයාගෙ ආඩම්බරේත් තියාගෙන යන්න ගියා. නිකං කතා කරන්න ගිහින් මං දෙකේ කොලේට වැටුණා. වැඩි ආදරෙත් රංඩුවට තියල කතාවකුත් තියෙනවනෙ බං.."

ඒ එක්කම තමයි සුදු පාට ට්‍රේල් බයික් එකක් රාජ්ගෙයි මගෙයි පාර හරස් කරලා නැවැත්තුවෙ. බයික් එක රයිඩ් කරපු එකාව ෆුල් ෆේස් හෙල්මට් එක ගලවන්නත් කලින් මං අඳුන ගත්තා. ක්‍රිෂාන්. ඒ කියන්නෙ ගේම හැරෙන තැපෑලෙන් ඇවිත්. කමක් නෑ.. වරෙන් යාලු.. උඹ හින්ද තමයි මේ ඔක්කොම. අදම මේක ඉවරයක් කරගම්මු. මං එක හිතින් එක පයින් හිතාගත්තා. ඒත් මට කලින් රාජ් ඉස්සර වුණා.

"ඔය දර වාට්ටුව පැත්තකට ගනිං. පාර තියෙන්නෙ අර පැත්තෙ. හරියට පාරෙ පදින්න බැරි නම් පදින්න පුළුවන් එකෙකුට දීපං.."

ක්‍රිෂාන් දිහාට ඇඟිල්ල දික් කරලා රාජ් කිව්වා.

"මට උඹත් එක්ක කතාවක් නෑ. මට කතාව තියෙන්නෙ මුත්තෙක්ක. පැහැල දෙන්නැතුව පැත්තකට වෙලා ඉඳපං චෝ.."

"ඌ කතා කරන් එකයි මං කතා කරන් එකයි. ඒ ගැන උඹ කැක්කුමක් ඇති කරගන්න ඕන නෑ.. මහ පාර මැද්දෙ පව් ෂෝ දාන්නැතුව ආපු කාරණේට බැහැපං..."

මං උඹව දෙකේ කොළේටම දාලා කතා කරා. ඇත්තටම උගේ කොල්ලො ඇවිල්ල අංජලී ඉස්සරහ පණ්ඩිත වාක්‍ය දාපු එක ගැන මට පුදුම තිතේ අමාරුවක් තිබ්බෙ. 'දැන් නම් මූ වැඩිය කියෙව්වොත් ගහන එක ගහනවා' මං හිතාගත්තා.

"කොන්දක් තියෙනව නම් උඹ ඉස්සරහට ඇවිල්ල හම්බවෙන්න කියල තිබ්බනෙ. ඔන්න දැන් ඇවිල්ල ඉන්නවා. මොකද කියන්නෙ..?"

"කියන්න නම් දෙයක් නෑ. ඒත් මෙහෙම හරි මං ඉස්සරහට එන්න උඹට ගටක් තිබුණ නම් ඒක ලොකු දෙයක්.."

"විහත මේ..? පල් වාක්‍යය දාන්නෙපා.. මගේ ඉවසීම විහිළුවකට ගන්නත් එපා. උඹ ඉස්සරහට එන්න මං බයක් වෙන්න ඕන්නෑ.. අනිත් එක තමයි අංජලී කියන්නෙ මට අයිති වස්තුවක්. තිකං අනුන්ගෙ දේවල් වලට ආස කරන්නැතුව පැත්තකට උනා නං හොඳයි.."

"උඹ කියන දේවල් අපේ අම්මටත් මට කියල නෑ. බලන්

ගියාම උඹ මට ඇඩ්වයිස් හිටන් දෙන්නක් අරගෙන.. අර ඉස්සෙල්ලා කිව්වට මොකක්ද..? අංජලී උඹේ කවුරු කියල කිව්වා.. උඹ දන්නැත්තං දැනගනිං ක්‍රිෂාන්.. මං තමයි අංජලී දාගෙන ඉන්නෙ.. මං අංජලීට ආදරෙයි.. අංජලීත් මට ආදරෙයි.. කතාව එච්චරයි.."

මං කිව්ව දේට ක්‍රිෂාන්ගෙ ඇස් දෙක නළලටම ගියා. උගේ මූණ තොටළඟ තොරණේ බල්බ් දැම්මා වගේ දිලිසෙන්න ගත්තා. මං කියපු දේ මිනිහට දිරවගන්න සෑහෙන්න අමාරු වුණා කියල මට තේරුණා.

"විහඟ කියපු දේ ඇහුණනෙ ලොක්කා.. අපි උඹට එන්න කිව්වෙ ඕය ටික කියන්න.. දැන් ඉතිං අහගත්තනෙ. හොඳ එකා වගේ බයික් එකත් අරගෙන ගෙදර පලයන්. අංජලී උඹව දකින්නවත් කැමති නෑ කියල අදත් කිව්වා.."

රාජ් දෙන්නෙ අමුඅමු කතන්දර. ක්‍රිෂාන්ගෙ පපුවට පිහියෙන් ඇන්නා වගේ. ඌ බයික් එක ස්ටාර්ට් කර ගත්තා.

"උඹ කිව්වනෙ අංජලීව දාගෙන ඉන්නෙ උඹ කියලා. මං ඒක පිළිගන්නම්.. කෙල්ලෙක් හින්ද කොල්ලොත් එක්ක වලියක් දාගන්න තරම් මං නපුංසකයෙක් නෙමෙයි. හැබැයි ලොක්කා එක දෙයක් තියෙනවා.. උඹ අංජලීව දාගෙන හිටියට ඒකිව බඳින්නෙ මං. ඒක හොඳට මතක තියාගනිං.. එහෙනම් දෙන්නටම බායි කිව්වා.."

පුළුවන් තරම් හයියෙන් බයික් එක රේස් කරල ඌ අපි ගාවින් තත්පරේට ඉගිලිලා ගියා. අපි හිතුවට වැඩිය ඌට හොඳට බයික් පදින්න පුළුවන් වගේ.

"මොකක්ද විහඟ ඌ අර අන්තිමට දාපු අමන වැකිය..?"

"ගණන් ගන්නෙපා බං.. ඌ ඒ දූකට කියන කතා.. ඌ අංජලීව බදින්නෙ.. අංජලී ,ඌට කැමති වුණොත්නෙ.."

"හැබැයි මචං බලන් ගියාම ඌත් යාන්තන් හරි හොඳ එකෙක් වගේ. ඌටත් හිතට අමාරු ඇති. අංජලී වගේ කෙල්ලෙක්ව සෙට් කරගන්න බැරිවුණ එකට.."

"දැන් උඹ කොහේද යන්නෙ..?"

"මං නැවේට යනවා විහඟ.. ඒක නෙමේ අංජලීගෙ ප්‍රශ්නෙට මොකද කරන්නෙ..? ඒකී අම්බානක මරොජ්ජු වෙලා නේද ගියේ.. ක්‍රිෂානුත් අද අංජලීලඟ ගිහින් ඒක දෙක කරාවි.."

"මං මොනව කරන්නද බං.. කොයි තරම් පහදල දෙන්න හැදුවත් අර ගෝනයෝ එක්ක කියව ගත්තු එකමයි ඇදල ගන්නෙ.. ලස්සන කෙල්ලො මේ තරම් නපුරු ඇයි මචං.."

"උඹ ඕක කාගෙන්ද ඇහුවෙ.. මගෙන්ද..?"

"නැත්තං යකෝ.. උඹ ඇරෙන්න මෙතන වෙන කවුද ඉන්නෙ..?"

"කෙල්ලො දහයකට හරි දොලහකට හරි ලව් කරල තිබ්බ නම් ඕකට පට්ටර් ගාල උත්තරයක් දෙන්න තිබ්බා. අනිත්තෙක මචං ලස්සන කෙල්ලො නපුරුයි කියල කොහේවත් පොතක් වෙනමම ගහලත් නැනෙ. එහෙමවත් වුණා නම් කියවල ඉවර වෙලා උඹට උත්තරයක් දෙන්න තිබ්බා..."

හත් දෙයියනේ.. මං මූටනෙ මේව කියන්නෙ.. මූත් ඇත්තටම අර කුණු මද්දුව ඉපදුන නැකතෙම ඉපදිච්ච එකෙක්. මෙච්චර අවුල්වෙලා ඉන්දෙද්දි මූ පිස්සු කෙළින එකනෙ වැඩේ.

"විහඟ.. මෙලහකට කඩේ ඇයො වැඩේ අනාගෙනද දන්නෑ.. කඩේ දැම්මෙත් අද.. දැන් උඹ දෙයියනේ කියල ගෙදර පලයං.. මං කඩේට යන්නත් ඕන.. නැත්තං අරුත් දෙන්න පීස් ටිකත් විකුණල කඩෙත් විකුණල කොහේ හරි යයි.. මං යනවා.. පරිස්සමින් පලයං.."

ඌ බස්සෙකක එල්ලුනා. දැන් මොනව කරන්නද කියල හිත හිතා මං ඉනට අත් දෙක ගහගෙන බලන් හිටියා. තවත් ටිකක් වෙලා රාජ් මගෙත් එක්ක හිටිය නම් හොඳයි තමයි. ඒත් ඉතිං ඌ කඩේ ඕපන් කරපු දවසෙම කාඩ් පැක්කක තියෙද්දි මාත් එක්ක ආවනෙ. බලන් ගියාම ඌ තරම් පිට් බුවෙක් මේ තුන්ලෝකෙ කොහේ හෙව්වත් මට හම්බවෙන්නෑ.. ඌ මටම හම්බ වෙච්ච එකනෙ වැඩේ. දැන් අංජලී ගෙදර ගිහින් අඬනවද.. මට බැන බැන පිඟන් පොලේ ගහනවද දන්නෑ. ඒත් ඉතිං මං කියල මොනවා කරන්නද..? හිත පුරවල ආදරයක් අංජලී ගැන තිබ්බ වුණත්.. පස්සෙන් වැඳ වැඳ යන්න මට බෑනෙ. කොහොම වුණත් ගෙදර ගිහින් අංජලීට ෆෝන් කරනව කියල මං හිතාගත්තා.

❋ ❋ ❋ ❋ ❋

The Spirit of Sri La




මං ගෙදරට ගොඩවුණේ මුළු ලෝකෙම එපා වෙලා වගේ. බලන් ගියහම කෙල්ලොන්ව තේරුම් ගන්න මට තියා මහ බ්‍රහ්මයාටවත් පුළුවන්කමක් නැතුව ඇති. ඒත් ඉතිං කෙල්ලො ඇවිල්ලා හිතා ගන්න බැරි තරම් සංවේදී, කාලගුණය වගේ සැරින් සැරේ වෙනස් වෙන, නැටි ගානට ආදරේ කරන්න දන්න ජාතියක්. එහෙම කියලා අපි උන්නරම් සංවේදී නැද්ද..? අපි ආදරේ කරන්න දන්නෙ නැද්ද..? අපි ආදරේ ඉස්සරහ පොඩි ළමයි වගේ වෙන්නැද්ද..? කොහොම හරි කමක් නෑ.. අංජලි බැන්නත් කමක් නෑ. ෆෝන් කරල බලනවා. එයා දැන් ගෙදර ගිහින් ඇතිනේ.. ආදරේ ඉස්සරහ මලුව නැමුවට අවුලක් වෙන්නෑ.. මං ගිහින් රිසීවර් එක ඉස්සුවා.

"ටෙලිෆෝන් එක කැඩිල පොඩී.."

අම්මා මගේ මූණ දිහා බලාගෙන ඉන්නවා. මදෑයි.. දැන් ඉතිං අංජලිට කතා කරන්නෙ කොහොමද..? අම්මප මේ ටෙලිෆෝන් එකටත් මේ වෙලාවෙම කැඩෙන්න ඕන වුණානේ. ඇයි හත්තිලව්වෙ

මේකට වෙන වෙලාවක කැඩෙන්න බැරිවුණේ. හිතේ අමාරුවවක් එක්ක මං කාමරේට ඇවිත් ඇඳට පැන්නා. හරියට ෆිට් වෙලා තිබ්බෙ නැති ඇඳ පොලු දෙකක් ද තුනක්ද මහා සද්දෙට බිමට වැටුණා. ඒත් මට ඒක එච්චර ගානක් වුණේ නෑ. හිතේ තියෙන මේ තේරුම් ගන්න බැරි අන්ටිට් එක බෝම්බයක් ගැහුවත් නැතිවෙන එකක් නෑයි කියල මට හිතුණා.

"පොඩී.."

"ඇයි අම්මා..?"

"මොකක්ද ඒ සද්දෙ..?"

හත්තිලව්වේ.. ඇඳ පොලු බිමට වැටෙනව අම්මට දැන් ඇහිල තියෙන්නෙ.. මගේ කාමරේ ඉඳන් සැම කාමරේට ශබ්දය ගමන් කරන්න එච්චර වෙලා ගියාද...? ෂිකේ.. සද්දෙ වුණත් දැන් පරක්කු වෙලාද මංදා වැඩ කරන්නෙ..?

"අල්ලපු ගෙදරින් වගේ ඇහුණේ. මං හිතන්නෙ කවුරු හරි ගහකින් වැටෙන්න ඇති.. නැත්නං ඉස්සරහ මිදට වැටෙන්න ඇති.."

මං සිවිලිම දිහා බලාගෙන කියවන් ගියා.

"පොඩී.. තව ටිකකින් කඩේට ගිහින් මට බිත්තර විස්සක් විතර ගෙනැල්ල ඕන.."

"ඇයි අම්මා..?"

"කේක් එකක් හදන්න.."

"ඒ මොකටද..?"

"කන්නනෙ ළමයො.."

කන්න විත්තිය නම් මාත් දන්නවා. ඒත් ඉතිං මේ විශේෂත්වය මොකක්ද..? නැත්තං අහස උසට වෙන වැඩ තියෙද්දි අම්මා කේක් හදාවියැ. අපේ කාගෙ හරි උපන් දිනයක්වත් එනවද මංදා. සුවර් එකටම අවිනි අක්කගෙ උපන්දිනේ වෙන්නැති.

"හුරේ.. මං දන්නවා.. අම්මා කේක් හදන්නෙ ඇයි කියලා..?"

කාමරේ ඉඳන් මං කෑගැහුවා. සද්දෙ වැඩිකමටද කොහෙද අම්මා දොර රෙද්ද අයිනෙන් එබුණා.

"අවිනි අක්කගෙ බර්ත්ඩේ එක ළඟ එනව නේද..? ඒකනෙ, මං දන්නවනෙ අම්මා කේක් හදන්න හැරෙනකොට මොකටද කියලා. ඕකට තමයි අම්මෙ මව සහ පුතා අතර සම්බන්ධෙ කියන්නෙ.. ඕකට තමයි අන්‍යෝන්‍ය වටහා ගැනීම කියන්නෙ.."

"ඔයාට නම් පිස්සු පොඩී.. අවිනිගෙ බර්ත්ඩේ එක පහුවුණා. ඔක්ක නොවැම්බර් මාසෙ.. නොවැම්බර් තියෙන බර්ත්ඩේ එක ගැන කියන්න වටහා ගැනීමක් ඕන්නෑ.. මහත් නරල මට බිත්තර ටික ගෙනැල්ල දෙන්න.."

හත්තිලව්වෙ.. මේ නොවැම්බර් මාසෙ නේන්නම්.. යකඩෙට් එනකොට බර්ත්ඩේ එක මගේනෙ. අප්පොච්චියේ මට මේ තරම් මං ඉපදුන දවසක් අමතක වුණානෙ.. ෂිකේ.. මගේ බර්ත්ඩේ එක මටම ඔය තරම් අමතක වුණා නම්, අනික් ඇයොන්ට මගේ උපන්දිනයක් තියෙනවද කියලත් අමතක වේවි.

* * * * *

හත්වෙනිදටත් ඉර පෑව්වා. උපන් දිනේ අද කියල මං කලින්

නැගිටින්න ඕන නෑනෙ. මං තව ටිකක් මිට් එක පොරව ගත්තා. මද්දු අයියා උදේම නැගිටල. මූ විහිලු කරනවද මංදා. මේ තරම් උදේම නැගිටගෙන.

"ඒයි පාට්නර්.. නැගිටපං.. කරන්න දෙයක් නෑ.. වෙන දවස් වලට වැඩිය අද දවස නම් වාටර් තමයි.."

මද්දු ඇවිත් බෙඩ් ෂීට් එකෙන් ඇද්දා.

"ඇයි ඒ..?"

"ඇයි අහන්නෙ.. අද උඹ ඉපදුන දවසනෙ... අද ඉතිං මොකෙකුටවත් වගකුවක් නෑ.."

පොන්ද මූගේ කපාට. අම්මප මගේ අයිය නෙමෙයි නම් මං මූට මෙතනම මැරෙන්න ගහනවා. එතකොට බැනර් එකක්වත් ගහතැහැකි මගේ උපන් දවස ඔබගේ විපත් දවස කියල.

"මනෝ ගහන්නැතුව නැගිටපං පොඩී.. අද පිං පිං ගාලා කට්ටිය එනවා.."

"ඒ මොකටද..?"

"උඹට විෂ් කරන්න.. අද පූජනීත් එයි මගෙ හිතේ. එයා ලොකු අයියයි, අච්චි අක්කයි දැකලත් නැනෙ.."

හා..! මූට හැදිල තියෙන කඩිගායට හේතුව ඒකයි. අද පූජනීත් එනවලු.. හොඳයි වරෙන්කො.. එදා මිට උංගි වගේ කතා කරල අන්දපු ඇන්දිල්ලට මයාටත් අන්දන්නම්කො කැපි හැලෙන්න.

"හැබැයි ඔයා මහ සවුත්තු මිනිහෙක් මද්දු.."

"ඇයි..?"

"විහිලුවට හරි මටත් විෂ් කරනවනෙකො මියි.. මාත් ආසයිනෙ මිවට.."

මං කියපු එකට මද්දුවට හිනා ගියා. පොර මාව බදාගත්තා.

"සුභ උපන්දිනයක් පොඩී.. හැමදාම සන්තෝසෙන් ඉදපං.."

මද්දු කාමරෙන් ගියා. ඊගාවට අම්මා ඇවිත් මගේ කම්මුල් දෙක ඉඹල මට විෂ් කරා. අම්මට පස්සෙන් අවිනි අක්කයි, ලොකු අයියයි ආවා.

"බලාගෙන අවිනි අක්කෙ.. පොඩී නාම කුණු කෙල පිටින් ඉන්නෙ.."

මද්දු සාලෙ ඉදන් කෑගහනවා. මගේ හිත ඩිංගෙන් ඩිංග සංතෝසෙන් පිරෙන්න ගත්තා. අද අංජලී ආවොත් කොයි තරම් හොඳද..? ඒත් එදා වෙච්ච දේවල් එයාගෙ හිතේ තියෙනවද දන්නෑ.. එහෙම උනොත් එයා නැවිල්ල ඉදීවි කියල මගේ හිත මට කිව්වා. බලමුකෝ.

උදේම බඩ පැලෙන්න කිරිබත් කාල මං ආයෙමත් නිදාගන්න සෙට වුණා. බර්ත්ඩේ එක කියල මැරෙන්නද..? කට කපල නිදිමත එන එකේ. ඒත් බරට බුරේ ලොකු පෙට්ටියකුත් උස්සගෙන ගෙට ඇතුල්වුණු රාජ්ව දැකල මගේ නිදිමත ගියා. නිදිමත හොඳටම නැතිවෙලා ගියේ රාජ්ට පිටිපස්සෙන් ආව ෂහනාස්ව දැකලා. ෂකී එන්න එන්නම ලස්සන වෙනවද මංදා.

"පොඩී.. කවුද බං ඒ..?"

ෂහනාස්ව දැකපු ගමන් මද්දු මගෙන් ඇහුවා.

"විස්තර පස්සෙ කියන්නම්.. දැනට කෑනොගහ හිටපං.."

"උඹ කියනව නම් ඉන්නම්.. හැබැයි පුතෝ.. ඔය අල්ලන්න යන අඩවිට නම් මට ඒ කරම් දිරවන්නෑ.."

"ඇයි මද්දු..?"

"අරකිට බූට් එකද..?"

"උඹට පිස්සුද මද්දු..?"

මද්දුව රවල මං ෂහනාස් ඉස්සරහින් වාඩිවුණා.

"ඉතිං ෂනී.. මං හිතුව අපිව අමතක වෙලත් ඇති කියලා.."

කලාතුරකින් මුස්ලිම් කෙල්ලෙකුට පිහිටන ඒ නිල් ඇස් දිහා බලාගෙන මං ඇහුවා.

"මං මැරුණත් එහෙම වෙන්නෑ විහඟ.."

මං කතාව පටන් ගත්තෙම වරද්දගෙන. ආයෙත් අපි දෙන්නා ඉස්සරම පටන් ගත්තු තැනට යනවා.

"ඔයා කොහොමද දන්නෙ අද මගේ බර්ත්ඩේ එක කියලා.."

"ඒ වගේ ප්‍රශ්නයක් ඇහුවෙ ඇයි විහඟ..?"

"මං හිතුවෙ ඔයා දන්නෑ කියලා.."

"බර්ත්ඩේ එක විතරක් නෙමෙ ඔයාගෙ හැම දෙයක්ම මං දන්නවා. මං දන්නැත්තෙ ඔයාව මට හම්බවුණේ නැත්තෙ ඇයි කියල විතරයි.."

එහෙම කියනකොට ෂහනාස්ගෙ ඇස් දෙක දිලිසුණා. ඒ

ඇස්වලට කඳුළු උනලද කියනෙක මට හිතාගන්න බැරිවුණා. 'ඔයාව මට හම්බවුනේ නැත්තෙ ඇයි' කියලා, කියපු වචන ටික එයා හුඟාක් හෙමීටයි කිව්වෙ. හැමදාමත් මගෙ හිත අතරමං කරල දාන විදියටම එයා හිනාවුණා. ඒ මූණ දිහා බලන් ඉන්නකොට තමයි මද්දුයි, ලොකු අයියයි, රාජුයි අපි ළඟට ආවෙ.

"පාට්නර්.. මායි ලොකුයි ටවුන් ගිහින් එන්නම්.. පූජනී ආවොත් යන්න දෙන්න එපා.."

"මද්දු එනකොට මං.."

මද්දුලත් එක්ක එළියට යන්න හිටපු රාජ් හොල්මං වෙලා ඇහුවා.

"උඹ අම්මටයි, අචිනි අක්කටයි ටිකක් උදව් කරපං.. දවල්ට කන්නත් ඕනනෙ.. උඹත් මය දන්න කියන තම්බි කෑමක් හදපන්.."

මද්දුයි, ලොකු අයියයි යන්න ගියා. මූණේ තිබ්බ ලොකු කුරුලෑවක් මිරික මිරික රාජ් කුස්සිය පැත්තට ගියා.

"ඉතිං පාට්නර්..?"

කටත් උල් කරගෙන අහනායේ හිනාවුණා. ඒ හිනාවෙ තිබ්බ ලස්සන.

"ඔබ බඳින්නැද්ද..?"

"විහඟ බැන්දට පස්සෙ තමයි මං බඳින්නෙ.."

"ඇයි ඒ..?"

"එතකොට මට හිත හදාගන්න පුළුවන්. මං ඔයා වෙනුවෙන් අන්තිම තත්පරේ වෙනකන් හරි හිටිය කියලා.."

"ඒක තේරුමක් නැති කතාවක්නෙ මකී.."

"ඒ වුණාට මට තේරුමක් තියෙනවා විහඟ..."

ෂහනාස් වාඩිවෙලා හිටපු තැනින් නැගිටලා යන්න හැදුවත් මං එයාගෙ අතින් අල්ලලා වාඩි කෙරෙව්වා. ඒ එක්කම වගේ තමයි සාලෙට කවුදෝ එනව ඇහුණෙ. මං ෂහනාස්ගෙ අත අතෑරියා. සාලෙට ආවෙ රාජ්.

"උඹල කොයි තරම් හෙමිට කතා කරනවද කියනව නම් කුස්සියටත් ඇහෙනවා. දෙයියනේ අදවත් ටිකක් වැදගත් විදියට ඉඳපල්ලා.. මට පේන විදියට උඹල දෙන්නම කාන්දම් කෑලි දෙකක්ද කොහෙද.. එලෝ මෙලෝ නැතිව ජලගේ වෙන්නමයි හදන්නෙ.."

කැසට් එකේ ජලේ බටන් එක ඔබන ගමන් ඌ කියවන් ගියා. ෂහනාස් මුත්දානියෙන් මූණ වහගෙන හිනාවෙනවා. මටත් හිනා ගියා. ඌ කියන්නෙත් ඇත්තමයි. මුලු තුන් හිතෙන්ම, බොක්කෙන්ම අංජලීට ආදරේ කරත්, ෂහනාස්ගෙ ඇස් ඉස්සරහ මගේ හිත කැලඹෙනවා.

"......අත්වැල් බැඳගෙන මං මාවත් දිග
ඔබේ ඇවිද ගිය කාලය මතකද...
පුංචි ළදැරියක් වගේ පුරහාලෙන්
ඔබ හිනැහුණ ඒ කාලය මතකද......"

සිංදුව පටන් ගත්තෙ මග ඉඳල. ෂහනාස් මගේ මූණ දිහා බැලුවා.

"හරි ලස්සන සිංදුවක් විහඟ.. ඒකෙ අදහස් හිත ඇතුළටම ගිහින් නවතිනවා.."

"මාත් ඔය සිංදුවට ආසයි ෂබී.."

"ඒක නෙමේ විහඟ.. ඔයා අර එදා පොටෝ එකේ හිටපු ගර්ල්ට හුඟාක් ආදරේද..?"

එක පාරටම ෂහනාස් කතාව වෙනස් කරා. ඒ ඇයිද කියල මට තේරුම් ගන්න බැරිවුණා.

"ඔව් ෂබී.."

"ඒක තමයි.. මං ඒක දැනගෙන ඉන්න තිබුණා. ඒත් ඒ දේ මට විශ්වාස කරන්න බැරි එකනෙ තියෙන්නෙ.."

අපි දෙන්නාට ඊට වැඩිය වචනයක්වත් කතා කරන්න හම්බවුනේ නෑ. ලොකු අයියයි මද්දු අයියයි ඉස්සරහ දොරෙන් ගෙට ඇතුල්වුණා.

"ඔන්න පාට්නර්.. මගෙනුයි ලොකු අයියගෙනුයි ඔයාට දෙන ප්‍රසන්ට් එක එළියෙ තියෙනවා. ගිහින් බලමු නේද..?"

මගේ අතින් අදින ගමන් මද්දු කිව්වා. අංජලීවත් එක්කගෙන ඇවිත් ද දන්නෑ. එහෙම වැඩනෙ මද්දු කරන්නෙ. ෂහනාසුත් මගේ පිටිපස්සෙන්ම ආවා. තේරුම් ගන්න බැරි මොකක්දෝ හේතුවකින් හිත නෙරපෙද්දි මං ඉස්සරහට ඇවිත් මිදුල දිහා බැලුවා. දෙයියනේ.. මිදුලෙ තිබ්බ දේ දැකල මට ඇස් අදහගන්න බැරිවුණා. මිදුල මැද්දෙ රතු පාටට දිලිසි දිලිසි තිබ්බෙ අලුතින්ම පේන්ට් කරපු ට්‍රේල් බයිසිකල් එක. ඉස්සරම දවසක අංජලීව බේරන්න ගිහින් පාර මැද්දෙ ඇදගෙන වැටුණට පස්සෙ මටත් වැඩිය ඩැමේජ් වෙලා

තිබ්බෙ බයික් එකට. මං බයික් එක ළඟට ගිහින් අතගාල බැලුවා. ඡේන්ට් සුවදේ බෑ.

"පිස්සු හැදෙනවා මද්දූ.. දෙකට තුනට ඇඹරිලා අර ගරාජ් එකට දාලා තිබ්බට මං හිතුවෙ නෑ ආයෙ මේක මෙහෙම දකින්න.. මේ දේ නම් රටක් වටිනවා ලොකු අයියා.."

මං ලොකුගෙයි මද්දුගෙයි අත් දෙකින්ම අල්ල ගත්ත.

"පොඩී.. අම්මගෙන් නම් බර බරයක් සුවර්.. ඒක හින්දා අම්මව ෂේප් කරගන්න එක ඔයාටම භාරයි. අතින්තෙක වැඩිය හයියෙන් යන්න බෑ හොඳද.. අම්මා මට හැටන් ඒකට ෆෝන් කරල බනීවි.."

ගෙට ඇතුල්වෙද්දි ලොකු අයියා කිව්වා. මගේ හිත පිරිලා තිබ්බෙ ලොකුම ලොකු සංතෝෂයකින්. මට හිතුණෙ මං මේ තරම් සන්තෝසයෙකින් කවදාවත් හිටියෙ නෑ කියලයි. බයික් එක තැලිලා ඇඹරිලා ගරාජ් එකේ දාල තියෙන එක ගැන මං කී දවසක් මද්දූ එක්ක කිව්වද..? ඒත් මෙච්චර සිරා විදියට බයික් එක හදල දේවි කියල මං හීනෙකින්වත් හිතුවෙ නෑ.

"ඔයා අද හුඟාක් සන්තෝසෙකින් විහඟ.."

හැමෝම ඩිංගක් එහාට මෙහාට වෙනකං ඉඳල ෂනී කිව්වා.

"ඒත් ඒ සංතෝසෙ මැද්දෙ ලොකු අඩුවක් තියෙනවා ෂනී.."

"මං දන්නවා.. මං දන්නවා ඔයාගෙ හිතේ තියෙන දේ.. එයා ඒවි කියල ඔයා කී පාරක් නම් ප්‍රාර දිහා බැලුවද..? එයා ඒවි විහඟ.. හිත දුක් කර ගන්න එපා.."

මං ෂනහාස් දිහා බැලුවා. 'ඔයා මාව පුදුම තරම් ඉක්මනට

පෝරුම් ගන්නවා ෂබී.. ඔයාට ඒ දේ කරන්න පුළුවන් කොහොමද කියල මට නම් තේරෙන්නෙ නෑ' කියල කියන්න හිතුණත් මං මුකුත් කිව්වෙ නෑ.

"විහඟ.. මම දැන් යන්නද..? හුඟ වෙලා හිටියත්නෙ.. රාජ් අයියත් හවස කඩේ ඉන්න ඕන කිව්වා.."

"එහෙම බෑ ෂබී.. මාව බලන්න ඇවිදින්, කොහොමද නිකං යන්න දෙන්නෙ.. දවල්ට කාලම යන්න ඕන.."

ෂහනාස් මුලින් මුලින් කෑමට ඉන්න අදිමදි කරත් පස්සෙ කෑම මේසෙට වාඩිවුණා. ලොකු අයියා, අචිනි අක්කා, මද්දු, රාජ්, මම, අම්මා, ෂහනාස් අපි හැමෝම ඉස් ඉස්සෙල්ලම වතාවට එක මේසෙක වාඩිවෙලා කෑම ගත්තා.

"මද්දු.. මොකෝ මූඩ් එක අමුතු වෙලා..?"

මද්දු අයියා කෑම අත ගගා හිටපු හින්දා මං ඇහුවා.

"අර ළමයා ආවෙ නෑ.. ඒකද මද්දූ..?"

අම්මා අහපු දේට මද්දුගෙ මූණට පුංචි හිනාවක් ආවා. එහෙනම් ඒකයි මේ හිතේ අමාරුව. ඕක ඔය තරම් ගණන් ගන්න දෙයක්ද..? බර්ත්ඩේ එක තියෙන මට ඔයිට වඩා කොයි තරම් හිතේ අමාරුව තියෙන්න ඕනද..? අංජලී තාම නැනෙ.. ඒත් එයා කොයි වෙලාවෙ හරි ඒවි කියනෙක මගෙ හිතේ තිබ්බා. එකහමාර විතර වෙද්දි රාජ් එක්ක ෂහනාස් යන්න ගියා. ෂහනාස්ගෙ සුදු මූණෙ මොකක්දෝ කියාගන්න බැරි ලොකු දුකක් තියෙනවා මං දැක්කා. ඒත් ඒක මොකක් හින්ද ආපු දෙයක්ද කියල මට හිතාගන්න බැරිවුණා. කොහොම උනත් ෂහනාස්ගෙ මූණ දුකින් තියෙනකොට අමුතුම ලස්සනක් තියෙනව කියල මට හිතුණා.

"රාජ්.. අද වැඩිය කතා කරේ නෑ.. මොකද මංදා...?"

රාජුයි, ෂහනාසුයි දීපු තෑගි දෙක අරන් මද්දුගෙ කාමරේට යන ගමන් මං මද්දුට කිව්වා.

"ඌ නම් කතා නොකරපු එකමයි හොඳ. දැන් අර සුදු, ලස්සන, චාම්, අහිංසක ගෑනු ළමයා ගෙනාවෙ මොකක්ද බලමු.."

මද්දු, ෂහනාස්ට දීපු චරිත සහතිකේට මට හිනාවක් ආවා. ෂහනාස් දීපු පාර්සලේ මං මුලින්ම දිග හැරියා. ඒකෙ තිබ්බ දේවල් දැකලා මගේ හිත නාතර වුණා.

"අප්පච සිරි.. බ්‍රේස්ලට් එකකුයි, සිරා ටී ෂර්ට් එකකුයි.."

මද්දුගෙ ඇස් දෙක නළලටම ගියා. ඔමත් හිටියෙ හුස්ම ගන්න අමතක වෙලා වගේ. ෂහනාස් දීපු ප්‍රසන්ට් එක මොකක් හරි ඇඳුමක් වෙන්න ඇති කියල මං හිතුවත්, ඒ දේ මේ තරම් ලොකු දෙයක් වෙයි කියල මං හීනෙකින්වත් හිතුවෙ නෑ.

"පොඩී.. මට ඇත්ත කියපං.. මෙච්චර වටින එකක්..? අඩුගානෙ තිහක්වත් වෙනවා.."

"මටත් හිතාගන්න බෑ මද්දු.."

ඇත්තටම ෂහනාස් ගැන මගෙ හිතට ආවෙ ලොකුම ලොකු දුකක්. මගේ පපුව හිරවෙලා ගියා. මාව අහිමියි කියල හොඳටම දැන දැනම මේ තරම් වදයක් කරන්න ඔයාට පුළුවන් වුණේ කොහොමද ෂබී..?

"දැන් බලමු අපේ තම්බි ලොක්කා ගෙනැල්ල තියෙන්නෙ මොනවද කියලා..?"

SL-Online E-Books The Spirit of Sri Lanka

රාජ් ගෙනාපු පෙට්ටියෙ රිබනුයි බ්‍රවුන් පේපරුයි ගලවන ගමන් මද්දු කියවනවා. බ්‍රවුන් පේපර් තුන හතරක්ම ඉරුවට පස්සෙ තිබුණෙ රෝස පාට කඩදාසියකින් ඔතපු පාර්සලයක්.

"මූ බෝම්බයක් ගෙනැල්ලද මංදා.. මෙච්චර ඔතල තියෙන්නෙ..?"

රෝස පාට කොලෙත් ගලවල දාලා මායි මද්දුයි පෙට්ටිය ඇතුළට ඇස් යැව්වෙ එකම තත්පරේට. හත්තිලව්වේ.. මූව මරාගෙන බෙදාගෙන කෑවත් මදිනෙ යකෝ.. පෙට්ටිය ඇතුලෙ තිබ්බෙ මගේ නැතිවෙච්ච ෂෝට්. අනේ දෙයියනේ.. මං මේක කොයි තරම් හෙව්වද..? මූ කවදද හප්පොච්චියේ මේක අරන් ගියේ. හොඳ වෙලාවට ළං වුන්නා වෙලාවෙ මං මේක නොඩැලූවෙ. බැලුව නම් හෙම, කන්න වෙන තෝන්ඩිය ආතම් ගානක්වත් ගිහින් මකන්න බෑ.

"හූත්.. ශ්.. හූ.. ඔන්න බර්ත්ඩේ එකට හම්බවෙච්ච සිරාම තෑග්ග.."

මද්දු තහය වහගෙන ෂෝට්එක මගේ මූණට ගහල කාමරෙන් ගියා. කමක් නෑ.. මෙහෙම හරි ෂෝට් හම්බවුණානෙ.. මං හිත හදාගත්තා.

* * * * *

ඉදල ඉදල රාජ් කරන්නෙත් මාරම වැඩ තමයි. මායි මද්දුයි පූරුවෙ පිනකටද කොහෙද කාමරේදි ප්‍රසන්ට් එක බැලුවෙ. අච්චි අක්කල ඉස්සරහ කැඩුව නම් හෙම.. හපොයි හතුරෙකුටවත් එහෙම වෙන්නෙපා. හවස තේ බීල ඉවරවෙලා මං මිදුලට ආවා. හෙන්දිරික්කා මල් පිපිලා හැම තැනම සුවඳයි. ඒ සුවඳත් හිතට තුරුලු කරගෙන මං පාර දිහා බලන් හිටියා. ඒත් මගේ හිත

ප්‍රාර්ථනා කරන් ඉඳපු රූපෙ මං දැක්කෙ නෑ. අංජලී.. ඔයාට මේ තරම් තදුරු වෙන්න පුර්වන්ද රත්තරං..

"පාට්නර්.. මොකද එළියෙ..?"

පාර දිහා බලාගෙන මද්දූ ඇහුවා. පොරගෙත් ඇහැ තියෙන්නෙම දවල් ඉඳලම පාරෙ. පූජනී එනව කියල තිබුණානෙ. ඒක වෙන්නැති මං හිතාගත්තා.

"අංජලී එන්නෑ වගෙයි මද්දූ.."

"මටත් එහෙම හිතෙනවා පොඩී.. අංජලී විතරක් නෙමෙයි.. පූජනීත් නෑ වගේ. ටෙලිෆෝන් නැතිල හින්ද මේ ලෝකෙ දෙයක් කරන්න බෑ.. ටෙලිකොම් එකටත් දැන් දෙපාරක් මැසේජ් එක දුන්නා. මිහ්.. ඒත් තාම තදල නෑ.."

"අංජලී මාව මිස් කරා මද්දූ.."

මගේ හිත ඇතුළෙන්ම ආපු දේ මං කිව්වා. මගේ කටහඬේ තිබිබ දුක අඳුනගෙනද කොහෙද මද්දූ මං ළඟට ආවා.

"මට තේරුන් නෑ.. කියන දෙයක් තේරෙන්න කියපං.. උඹයි අංජලීයි අවුලක්ද..?"

එදා රාජ්ගෙ කඩේ ඕපන් කරපු දවසෙ සිද්ධවුණ දේවල් අකුරක් නෑරම මං මද්දූත් එක්ක කිව්වා. ඩිංගක් වෙලා යනකන් මද්දූ මොකුත් කිව්වෙ නෑ.

"උඹ එහෙම කතා කරපු එක හොඳයි පොඩී.. උඹ හැසිරිච්ච විදියත් හොඳයි.. මං එහෙම කියන්නෙ හේතුවක් ඇතුව.. අපි ආදරේ කරනකොට ඒ ආදරේට අවංක වෙන්න ඕන. අපි ආදරේ

කරන කෙල්ලට බොක්කෙන්ම ආදරේ කරන්න ඕන. ඒත් වැඩේ තියෙන්නෙ මෙකයි. අපි බොක්කෙන්ම ආදරේ කරනව කියල කෙල්ල දැනගත්තම ඒකි අපේ කරේ නගින්න එනවා. අපෙන් පුංචිම හරි වැරැද්දක් වෙන්න බෑ. ඒ දේ මහ හුඟාක් ලොකුවට ගණන් ගන්නවා. විකාගෙන ආදරේ කරත් පිරිමිකම ඇතුව උඹ ආදරේ කරා කියනෙක මං දන්නවා. ගණන් ගන්නෙපා.. ආදරේකදි ඔය වගේ ගැටලු සාමාන්‍යයි. ඔව ප්‍රායෝගික දේවල්. ඒත් අපේ පැවැත්ම, අපේ ආදරේ පැවැත්ම තියෙන්නෙ අපි හැසිරෙන විදිය අනුව කියනෙක අපි හොඳට දැනගෙන තියෙන්න ඕන.."

මහා දාර්ශනික විදියට මද්දු කිව්වා.

"ඔයා කියන ඒවා මට තේරෙන්නෙ නෑ මද්දු.."

"උං.. උඹ ආදරේ ඉස්සරහ බොළඳ වෙනව වැඩියි.."

"ආදරේ ඉස්සරහ බොළඳ වෙන්නැත්තෙ කවුද මද්දු..?"

"හැමෝම බොළඳවෙනව තමයි.. ඒත්..? හප්පේ.. ඒ.. එනව ඇති යාන්තං.."

මද්දුගෙ සද්දෙට මං හැරුණෙ ආලෝකෙ ගමන් කරන වේගෙටත් වැඩිය ඉක්මනට. අංජලීගෙ රෝස පාට මූණ දකින්න හිතාගෙන මගේ ඇස් පාර දිගේ දිව්වත් මගේ ඇස්වලට හිමිවෙලා තිබ්බෙ අන්ත පරාජයක්. දුරින් දුරට අඩි තිය තියා ආවෙ චූටි ඩොක්ටර්. මගෙ හිතට ආවෙ කියාගන්න බැරි මොකක්දෝ කලකිරීමක්. ඒත් මද්දුගෙ මූණෙ තිබ්බ ලොකු හිනාව දැකල ඒ හැඟීම හිතෙන් අයින් කර ගන්න මං ලොකු උත්සාහයක් ගත්තා.

"හැපි බර්ත්ඩේ මල්ලි.."

"එසේම වේවා..!"

පූජනීට බකස් ගාලා හිනා ගියා. හිනා වෙනකොට වල ගැහෙන ඒ මූණ හරි සිරියාවන්තයි. ඒකනෙ අපේ කුණු මද්දුව අහුවුණේ.

"මං විකරයි වගේ අඩුවෙලා තියෙන්නෙ නේද..? අනේ සොරි විහඟ.. මගේ කා එක හෝමාගමට ඩිංගක් එහා තියෙන ගරාජ් එක ගාව. වැඩේ කියන්නෙ ඒක අදම ලෙඩ දුන්නනෙ.. මං මේ ටික බස්සෙකේ ආවෙ.."

"ගණන් ගන්න එපා පූජා.. අද දවසෙ සිරියාවන්තකමට සිද්ධවෙන දේවල් තමයි ඔය.. අපි යමු ගේ ඇතුළට.."

කුණු මද්දුව මට කැපිල්ලක් දාගෙන පූජනීත් එක්ක ගේ ඇතුළට ගියා. මං මිදුලෙම නතර වුණා. තවත් කෝටි තරම් බලන් හිටියත් අංජලී එන්නෑ කියල මගේ හිතට තේරුණා. ඒත් තේරුම් ගත්තට ඒ දේ පිළිගන්න මගේ හිත සූදානම් වෙලා තිබ්බෙ නෑ. මගෙ හිතට ඩිංගෙන් ඩිංග මහ විශාල දුකක පටනැලි ඇදෙන්න ගත්තා. ඔයාට මාව මේ තරම්ම අමතක වුණාද අංජලී.. හිතට දුක පුරවගෙන මං කොයි තරම් වෙලා මිදුලෙ හිටියද කියල මටම ගානක් වුණේ නෑ. මොකක්දෝ අමුත්තක් දැනිල මං එකපාරටම ආපස්සට හැරුණා. මගෙ පිටිපස්සෙ හිටියෙ අම්මා.

"ඇයි පොඩී එළියට වෙලා.. මේ.. මේ මොකද මේ.. කඳුළුත් පෙරාගෙන.. මොකද වුණේ ළමයො.. කවුරු හරි හිත රිදෙන්න දෙයක් කිව්වද..?"

අම්මා මගේ අතින් අල්ල ගන්න ගමන් ඇහුවා.

"නෑ.. අ.. අම්මා.."

"එහෙනම් බර්ත්ඩේ එකට මං මුකුත් දුන්නෙ නැති හින්දද..? අනේ පොඩී.. මට එළියට යන්නවත් වෙලාවක් තිබ්බෙ නෑ..."

"නෑ.. නෑ අම්මා.. ඔයා මේ කරපුව හොඳටම ඇති.."

ඒ එක්කම තමයි ගේ ඇතුළෙ හිටපු ඔක්කොම අය එළියට ආවෙ. මගේ මූඩ් එක දැකලද කොහෙද එයාලගෙ මූණු ටිකත් අප්සෙට් ගියා.

"අපි සන්තෝසෙන් හිටියට පොඩී ඉන්නෙ දුකෙන්.. ඇහුවට කියන්නෑ.."

අම්මා හැමෝටම නඩුව කිව්වා. ඒත් කවුරුවත් මගෙන් මුකුත් ඇහුවෙ නෑ. අන්තිමේදි අම්මටත් තේරුණා.

"ඒ ළමයට මොනව හරි වැඩක් යෙදෙන්න ඇති පොඩී.. ඉඩක් ලැබිච්ච වෙලාවක එයා ඒවි.. හ්ම්.. දැන් ඉතිං ගෙට යමු.. පූජා දුවට මුකුත් බොන්නවත් දුන්නෑ.."

හැමෝමත් එක්ක ගේ ඇතුළට යන එක ඇරෙන්න මට කරන්න දෙයක් තිබුනෙ නෑ. ඒත් මගේ හිත සම්පූර්ණයෙන්ම පිරිලා තිබ්බෙ දුකෙන්. හත විතර වෙද්දි වගේ පූජනී යන්න ගියා. ගෙදර හැමෝම එකතුවෙලා පූජනීගෙ ඩිවෝස් කේස් එක ගැන කතා කරද්දි මං පැත්තකට වෙලා ඔහේ බලාගෙන හිටියා. දැන් නම් මේ පම්මකපේ කීයටවත් අංජලී එන්නෑ කියල තත්පරෙන් තත්පරේ මගේ හිතට හිතෙද්දි දැනුණ දුක නම් කියල නිම කරන්න බෑ. පූජනී යන්න ගිහින් විනාඩි පහක්වත් ගියේ නෑ. හෙල්මට් දෙකක් අතට අරන් මද්දු මං ළඟට ආවා.

"පොඩී.. යමු ගමනක් ගිහින් එන්න.."

මං මද්දු දිහා බැලුවා. ඒ මූණ මැද්දෙ තිබ්බ හැඟීම් මට තේරුම් ගන්න බැරිවුණා.

"මේ රෑ වෙච්ච වෙලාවෙ කොහේද මද්දු යන්නෙ..?"

මගේ හිතේ තිබ්බ ප්‍රශ්නෙම අම්මා ඇහුවා.

"සුජනීගෙ කාර් එක පොඩ්ඩක් බලල එන්නම් අම්මා.. ඒ ගරාජ්කාරයව මං අඳුනනවා.. හදල ඉවරද දන්නෙත් නැහෙ.. අදම අරන් ආවොත් ලේසියි.."

හෙල්මට් එක ඔලුවට දාගන්න ගමන් මද්දු කියවන් ගියා. මද්දුත් එක්ක මේ වෙලාවෙ කොහේවත් යන්න තරම් මගේ හිතට කිසිම පිට් එකක් තිබුණෙ නෑ. ලෝකෙම එපාවෙලා වගේ හැඟීමක් මගෙ හිතට දැනුණෙ. ඒත් මද්දුගෙ මූණ දිහා බලාගෙන බෑ කියන්න බැරිකමට මං සැටියෙන් නැඟිට්ටා.

"මොකක්ද පොඩී.. කම්මැලිකම නැතුව වරෙන්කො.. බලන්න අම්මා.. පොඩී මට නිකංවත් සපෝට්වෙයක් දෙන්නෑ.. මේ අවුරුද්දටම මං ඉල්ලපු එකම උදව්ව මෙකා.."

මගේ අකමැත්ත දැකල ගණන් නිලව් එක්කම මද්දු කෑගැහුවා. බලන් ගියාම මම විතරනෙ මද්දුවගෙන් උදව් අරගෙන තියෙන්නෙ.

"පොඩීට යන්න බැරි නම් මං හරි එන්නම්.."

ඒ පාර කොහේදෝ ඉඳල ලොකු අයියා කතාවට පැන්නා. මද්දුගෙ මූණ හෙණ ගහපු වැල හෙඩිය වගේ වෙනව මං දැක්කා. මූ වෙන මගඩි නැටුමක් නටන්න වගේ යන්නෙ.. ලොකු අයියා ගියොත් නම් පොර අනාතයි. මං එහාම ක්‍රියාත්මක වුණා.

"කමක් නෑ ලොකු අයියා.. ඔයා ඉන්න.. මං මද්දුත් එක්ක ගිහින් එන්නම්.."

බයික් එකට නගින ගමන් මං කිව්වා. මුකුත්ම කියන්නැතුව මද්දු බයික් එක ස්ටාර්ට් කරල තාර පාරට ගත්තා. හෝමාගමට එනකන් මද්දු වචනයක්වත් කතා කරේ නෑ. මූ තරහවෙලාද මංදා.

"මද්දූ මොකෝ කතා නැත්තෙ..? කාර් එක කොහෙද තියෙනවයි කිව්වෙ..?"

"ඒක ඔය කොහේ හරි තියේවි පාට්නර්.."

මාව විසිවෙලා යන උත්තරයක් දීපු මද්දු බයික් එක කහතුඩුව පාරට දැම්මා. මේ කොහෙද මේ යන්නෙ..?

"මද්දූ මේ පාරෙ ගරාජ් තියෙනවද..?"

තවත් ඉවසන් ඉන්න බැරිව මං ඇහුවා.

"ගරාජ් මොකට හොයනවද පාට්නර්.. අපි මේ යන්නෙ අංජලීව බලන්න.."

මද්දු කියපු දේ මට විශ්වාස කරන්නත් බැරිවුණා. දෙයියනේ මං හිතුවෙවත් නැති දෙයක්නෙ.. එහෙනම් ඒකයි අර ලොකු අයියා එන්න හැදුවම මද්දු අප්සට් ගියේ.

"ඔයා නම් බුදුවෙන්නෝන මද්දූ අයියා.."

මගේ හිතේ තිබ්බ දුක නැතිවෙලා ගියේ තත්පරෙත් දෙකෙන්. මගේ හිතට එබෙන හැම සිතුවිල්ලක්ම තේරුම් ගන්න පුළුවන් සහෝදරයෙක් ඉන්නෙක කොයි තරම් ලොකු වාසනාවක්ද..? අංජලීගෙ ගෙදර පේන හරියට ඇවිල්ල මද්දූ බයික් එකේ ස්ටාර්ට් එක

නැවැත්තුවා. මගේ පපුවේ ස්පීඩ් එක ඩිංග ඩිංග වැඩිවෙද්දි මං මද්දූ දිහා බැලුවා.

"දැන් මොකද කරන්නෙ..?"

වීරයා වගේ ආවට ගේ ඇතුළට කඩන් පිඳන් යන්න බැරි හින්දා මං ඇහුවා.

"අද උදේ ඉඳල උඹ නාහෙන් අඬ අඬා හේද හිටියෙ අංජලී ආවෙ නෑ කියල. ඉතින් ඕන්න දැන් චාන්ස් එක තියෙනවා.. ගෙදර උංට නෝන්ඩි නොවී ඕන දෙයක් කර ගනිං.. හැබැයි පාට්නර් මොකක් හරි කරදරයක් නම් කෑගහපං.. මං තත්පරේට එනවා.."

මද්දූ කියන ඒවට මගේ පපුව ගැහෙන වේගෙ ඩබල් වුණා. ඒත් ඉතිං එහෙම උනා කියලා මැරෙන්නයැ. තවත් බලන් ඉඳල බෑ.. ඕන මගුලක් දෙකයි පණහයි කියල පපුවත් ඉස්සරහට දාගෙන අංජලීගෙ ගෙදර ගේට්ටුව ඇරගෙන මං වත්තට ඇතුල් වුණා. වත්තෙ පිටියෙ නම් කිසිම හැල හොල්මනක් නෑ. අංජලීගෙ කාමරේ තියෙන්නෙ කොහෙද කියල හොයාගන්න බැරිව මං කරුවලේම ජේමන්ට් එක ළඟ නතර වුණා. ගේ වටේටම දාල තිබ්බෙ ලයිට් දෙකක් විතරයි. මීට කලින් දවසක රාත්‍රී එක්ක ආවත් ගේ හරියට බලාගන්නෙ නැති එක ගැන මං මටම බැන ගත්තා. කොහොම වුණත් තවත් ප්‍රමාද වෙන එකෙන් වෙන්නෙ මටම අවාසියක් කියල මට තේරුණා. ඉස්සරහ කාමරේ ජනේලය උඩින් තිබ්බ ලැටිස් පටි අතරින් කාමරේ ඇතුල මං බැලුවා. මගේ වෙලාව එච්චරම නරක වෙලා තිබුණෙ නෑ. රෝසම රෝස පාට නයිට්ඩ්‍රස් එකක් ඇඳගෙන පැනකුත් කටේ ගහගෙන පුංචි ස්ටූල් එකක් උඩ ඉඳගෙන අංජලී කල්පනා කරනව මං දැක්කා. ගෙදර කට්ටිය ඔක්කොම හිටියත් අවුලක් නෑ. ජනේලෙට තට්ටුවක් දානවා

කියලා මං හිතාගත්තා. ජනේලෙ පඩියෙ ඉඳල පේමන්ට් එකට බැහැල මං නියපොත්තෙන් හෙමීට ජනේලෙට තට්ටු කරා. ඒත් කාමරේ ඇතුළෙන් කිසි සද්දයක් ඇහුණෙ නෑ. ඒ පාර මං ඊට වැඩිය ටිකක් හයියෙන් සද්දෙට තට්ටු කරා. මගේ පපුව ගැහෙන සද්දෙ එළියටත් ඇහෙන තරම් වගේ. තවත් පාරක් නියපොත්තෙන් තට්ටු කරන්න හදනකොටම ජනේලෙ ළඟින්ම කාමරේ ඇතුළෙන් කවුද කියල අහන අංජලීගෙ කටහඬ මට ඇහුණා.

"ම.. මං විහඟ.."

රහසින් වගේ මං කිව්වා. මගේ ඉහින් කනින් දාඩිය දාන්නත් පටන් අරන් තිබුණා. ජනේලෙ අගුල හීන් සීරුවෙ පන්නන සද්දෙ ටිගාවට මට ඇහුණා. බාගෙට ඇරුණු ජනේලෙ කර්ටන් එක පැත්තකට කරල අංජලීගෙ මූණ එළියට එබුණා.

"දෙ.. දෙයියනේ.. ඇ.. ඇයි රත්තරං මේ මහ රෑ..?"

අංජලීගෙ කටහඬ වෙව්ලනව කියල මට තේරුණා. එයා හොඳටම බයවෙලා.

"ඔ.. ඔයා දෙන දුක්වලට මගෙ හිතට මීට වඩා විඳවන්න බෑ ළංගි.. ඒකයි ඕන දෙයක් කියල මං ආවෙ.. ඇයි ළංගි.. ම.. මට මෙහෙම කරන්නෙ..?"

හිතේ හිරවෙලා තිබ්බ ගොඩක් දේවල් තෝරල බේරල එළියට ගන්න තරම් සුදුසු නිස්කලංකකමක් මගේ හිතේ තිබ්බෙ නෑ. හිතට ආපු දේ මං ඔහේ කියවං ගියා.

"අ.. අනේ.. ම.. මං ඔයාව හම්බවෙන්න එන්නම් අයියා.."

ජනේල කූරුවලට මූණ තද කරන් අංජලී කෙඳිරුවා.

"ඒ.. ඒ කියන්නෙ මට මෙතනින් යන්න කියලනේ.. කමක් නෑ උංගි.. මං යන්නම්.. ඒත් මං මෙහෙම හරි ඔයාගෙ මූණ දැකගන්න ට්‍රයි එකක් දුන්නා. අධුගානෙ මට ඒ ෆිට් එක හරි තියෙනවා.. ඒත් එදා ආවට පස්සෙ ඔයා නිකංවත් මං ගැන බැලුවෙ නෑ උංගි.."

කතා කරන්න ආපු හැම දේම පැත්තකින් තියල යන්න වෙන එක ගැන නම් මගෙ හිතේ තිබ්බෙ ලොකු දුකක්. ඒත් ඉතිං වෙන කරන්න දෙයක් නෑ. මෙහෙම හරි අංජලීව දැක ගත්තනේ.

"ම.. මං ඔයාට යන්න කිව්වෙ නෑ වි.. විහඟ අයියේ.. ඔ.. ඔයාගෙ හිත හොඳටම අප්සට් වෙලා.. මහොම ඔයාව යැව්වොත් හෙම මටම සාපවෙයි. ඉ.. ඉන්න.. මීනෙ දෙයක් වෙන්න කියලා මං ඔයාව ඇතුළට ගන්නවා.."

අංජලී කියපු දේ මට අදහගන්නත් බැරිවුණා. හීනෙකින්වත් හිතපු දෙයක්ද මේ වෙන්න යන්නෙ.

"මං ගිහිල්ලා සයිඩ් එකේ දොර අරින්නම්.. මේ වෙලාවෙ අම්මියි, සර්වන්ට් ගර්ල්යි ඉන්නෙ කුස්සියෙ. ඔයා කොහෙවවත් හැරෙන්නෙ නැතුව කෙළින්ම කොරිඩෝ එක දිගේ එන්න.. මේ කාමරේ තමයි ඉස්සරහම තියෙන්නෙ.."

එක පාරටම ලොකු ශක්තියක් ඇවිල්ල වගේ අංජලී කියවන් ගියා. තත්පරයක්වත් යන්න කලින් ජනේලෙ ආයෙමත් ඇතුලෙන් අගුල් දාන සද්දෙ මට ඇහුණා. ඒ වෙලාවෙ මගෙ හිතේ තිබ්බෙ ප්‍රශ්න දෙකයි. ආපහු ගෙදර යනවද නැත්තං අංජලීගෙ ගේ ඇතුළට යනවද කියනෙකයි. ඒත් මං කෙරුවෙ ඊට හාත්පසින්ම වෙනස් දෙයක්. මං හීන් සීරුවෙ ආපහු මිද්දු ළඟට ගියා.

"මොකෝ පාට්නර්.. වැඩේ අවුල්ද..?"

"එළකිරි වගේ.. මං අංජලීලගෙ ගේ ඇතුළට යනවා. මං එන්න පරක්කුයි වගේ දැනුණොත් ඒ කියන්නෙ අවුලක්.. එතකොට මට එළියට එන්න බාල්දියක් පෙරළපං.. හරිනේ.."

මං කියපු එකට මද්දු හිනාවුණා.

"මං කවදත් හරි පාට්නර්.. උඹ වැඩේ අනාගන්නැතුව කතාබහ කරල වරෙන්.. දන්නවනේ මට වැඩිය පිණි බාන්න හොඳ නෑ.."

"පිණි බානව නම් ඔය හෙල්මට් එක දාගත්ත නම් අවුලක් නෑ මද්දු.."

"ඒ පාර මගුලක් කියනවා.. මගෙත් කුණුහරුප අහගන්නැතුව ඉක්මනට ගිහින් වරෙන්.. ගෙදර යන්නත් ඕනෙ.."

අංජලී මුලින් දුන්නු උපදෙස් කල්පනා කර කර මං ඒ දොර ළඟට ආවා. කිසිම හැල හොල්මනක් නෑ. දොර අඩවල් කරල වගේ තිබුණා. මං හීන් සීරුවෙ දොරත් තල්ලු කරගෙන කොරිඩෝ එකට ආවා. ඊට පස්සෙ සද්ද නැතුව දොරේ අගුල දැම්මා. දැන් මම අංජලීගෙ ගේ ඇතුළෙ. මට ඉස්සරහින්ම තිබ්බ කාමරේට මං සං ගාල වටපිටවත් බලන්නැතුව ඇතුල් වුණා. මගේ පපුව ගැහෙන්නෙ දෙමෝලෙන් පිටි කොටනව වගේ. ඇයි හත්තිලව්වේ කාට හරි අහුවුණොත් හෙම නැව් ගානට කන්න වෙනවනේ.. මං කාමරේට ඇතුල් වුණ ගමන් අංජලී දොර වහලා දැම්මා. ඊට පස්සෙ එයා මේසෙ උඩ තිබ්බ පුංචි සෙටප් එක යාන්තන් සවුන්ඩ් එන්න ඔන් කරා. එයා ඒ වැඩ ටික කරන අතරෙ මං එයාගෙ ඇඳ උඩින් වාඩිවුණා. පුංචි ස්ටූල් එක මගේ ඉස්සරහටම අරන් ඇවිත් අංජලී ඒකෙ උඩ වාඩිවුණා.

"ඉ.. ඉතිං විහඟ.. අ.. අයියා.."

කාමරේ තිබ්බ ලයිට් එළියට අංජලීගෙ මූණ රෝසපාට වෙලා තිබුණා. එයා ඇඳලා හිටියෙත් රෝස පාට නයිට්ඩ්‍රස් එකක්. ඒකෙත් එයා තවත් රෝස පාටයි.

"ඉතිං මෙන්න මං ඇවිත් ඉන්නවා.. මම නම් හිතුවෙ දැකපු ගමන් මාව එලව ගනී කියලා.."

"ම.. මං එහෙම ක.. කරනවද විහඟ අයියේ.."

"එහෙනම් එදා මාව දාලා ආවෙ.."

"අනේ රත්තරං අයියේ.. දැන්වත් එදා වෙච්ච දේ අමතක කරලා දාන්නකො.. කෝ ඩිංගක් මං ගාවට එන්න අයියා.."

අංජලී එහෙම කියල එයාගෙ අත්වදෙක මගේ දිහාට දික් කරා. මං අංජලීව ලංවුණේ කාන්දමකට ඇදිල යනව වගේ.

"හැපි බර්ත්ඩේ මගේ රත්තරං අයියේ.."

මගේ කම්මුල්වල දෙපැත්තම ඉඹලා ඉවරවෙලා අංජලී කිව්වා. හිත මටත් හොරා අකීකරු වෙද්දි මං අංජලීව තුරුලු කර ගත්තා. ඊට පස්සෙ මං ඒ රෝසපාට මූණ ඉඹගෙන ඉඹගෙන ගියා. වෙලාව යනව අපි දෙන්නටම තේරුණේ නෑ. මට තුරුලුවෙලා හිටපු අංජලී ඔලුව උස්සල මං දිහා බැලුවා. ඒ ඇස්වල කඳුලු පිරිලා.

"ඈ.. ඇයි.. ඇයි උංගි මේ..?"

ඒත් එයා ඒ කඳුළු පිටින්ම ආයෙත් මගේ පපුවට තුරුලු

උනා. විසර්ට් එක ඇතුලෙන් පසුව සීතල වෙද්දි අංජලී අඩනව කියල මට තේරුණා.

"මගෙන් හිත රිදෙන්න මොනා හරි කියවුණාද උංගි.. මට කියන්නකො අඩන්නෙ ඇයි කියලා.. මං දැනුවත්ව නම් ඔයාට වැරදි දෙයක් කිව්වෙ නෑ.."

"අ..' අනේ ඔයාගෙ වැරැද්දක් නෙමේ රත්තරං අයියෙ.. අද ඔයාව බලන්න මමයි එන්න ඕන.. ඒත් ඔයා මාව බලන්න ආවා.. ඒ ගැන හිතෙනකොට මගෙ හිතට හුඟාක් දුකයි අයියා.."

මං අංජලීව මගේ පපුවෙන් ඈත් කරලා ඒ ඇස් දෙක දිහා කෙලින්ම බැලුවා. රෝස පාට කම්මුල් තෙමාගෙන ගින්දර වගේ කඳුලු අංජලිගෙ ඇස්වලින් ගලන් ගියා. හිතේ තිබුණු හැම බැඳීමක්ම හැම හැඟීමක්ම එකට එක්කහු වෙලා අංජලීට තියෙන ආදරේ වෙනුවෙන් මාව පිස්සු වැටෙව්වා. ඒ වෙලාවෙ අංජලී ඇරෙන්න වෙන කවුරුත් මගේ ලෝකෙ හිටියෙ නෑ.

"ඇත්තම කියනව නම් මගෙ හිතටත් දුකයි උංගි.. මං හවස් වෙනකන්ම බලන් හිටියා.. මගේ ඇස් දෙකත් රිදුනා. හැමෝම ආව වුණත් ඔයා ආවෙ නැති එකෙන් මහා ලොකු අඩුවක් තිබ්බා.."

"මං එන්නම තමයි හිටියෙ.. ඔයාව පුසන්ට් එකකුත් අරගෙන තුනහමාරට විතර ගෙදරින් එළියට බහිනකොටම ත්‍රිෂාන් අයියා ආවා. මගෙන් ඇහුවා මඟුල් ගෙදරක යන්න වගේ කොහෙද මේ යන්නෙ කියලා. මං කිව්වා විහඟගෙ බර්ත්ඩේ එක අද.. එතෙ යනවා කියලා. එහෙම කියල වැඩිම උනොත් විනාඩි දෙකක් යන්නැති. මං ගේට්ටුව හරියට එනකොට තාත්ති ඇවිත් කිව්වා කොහේවත් යන්නෙපා කියලා.."

අංජලීගෙ ඇස් දෙක ආයෙත් කඳුළුවලින් පිරිලා. මට ක්‍රිෂාන් ගැන ආවෙ පුදුම තරහක්. යකෝ මූ තරම් ආදරේකට බාල්දි පෙරලන එකෙක් මේ තුන්ලෝකෙ කොහේවත් නැතුව ඇති.

"එහෙනම් ක්‍රිෂාන්කාරයා වැඩර් වුණානේ.. ඇත්තමයි ටංගි ඔය යකාව මට ආයෙ හම්බවෙච්ච දවසට උගේ අඩු දෙකම කඩනවා.."

"අ.. අනේ.. ඔය බලන්න විහඟ අයියා.. ඕකනෙ ඔයාට මුකුත් කියන්න බැරි.. දෙයියන්ගෙ නාමෙට රංඩුවෙන්න නම් එපා.."

"ක්‍රිශාන් එක්ක මං රංඩු උනොත් ඔයාගෙ හිතට හුඟාක් අමාරුද ටංගි...?"

"ඕ.. ඔයා නම් රංඩු කොක්කක් රත්තරං.. ඇයි කියන්න මේ..? මං ගැන අහිතක් හිතන්නෙපා.. මාව ඔයාට නැතිවෙන්නෙ නෑ.. එහෙම නැතිවෙන්න නම් මං මැරෙන්න ඕන.. ඒක හින්ද කා එක්කවත් රංඩුවෙලා වැඩක් නෑ.. විහඟ අයියා.. මාව අයිති ඔයාට.. ඔයා අයිති මටනේ.. අපි සන්තෝසෙන් ඉඳිමු.."

"ඒ උනාට ටංගි.. ක්‍රිෂාන්කාරයා ඉන්නෙ හරියට නිකං ඔයා බැඳල වගේනෙ.."

අංජලීගෙ මූණට කඳුළු අතරින්ම ලස්සන හිනාවක් ආවා.

"ඒක එයාගෙ මෝඩකම.."

ඊට පස්සෙ ටිකක් වෙලා යනකන් අංජලීයි මායි මූණට මූණ බලන් හිටියා මිසක අපි දෙන්නම කතා කරේ නෑ.

"ඒත් ඉතිං ඒ මෝඩකමම මාත් කරනවනෙ ටංගි.."

"ම.. මට තේරුන් නෑ.."

"නෑ ඉතිං.. මාත් හැසිරෙන්නෙ එහෙමනෙ.. ඒකත් මෝඩකමක්ද මංදා.."

අංජලී මගේ කට වැහුවා. මං එයාගෙ අල්ල එයාට නොරිදෙන්න හීන් සීරුවට හැපුවා. අංජලී ළඟින් ඒ වෙලාවෙ ආවෙ මගේ හිත පිස්සු වට්ටවන සුවඳක්. ඒ සුවඳට මත්වෙලා හිටපු මට අංජලී ළඟින් ඈත්වෙන්න හිත දුන්නෑ.

"මගේ හිත රිදෙන කතා කියන්නෙපා විහඟ අයියේ.. අපේ ගෙදර තියෙන මේ ප්‍රශ්න ටික විසඳුනාම හැම දෙයක්ම හරියාවි. එතකං ඩිංගක් ඉවසන්න අයියෙ.."

"හොඳයි උංගි.. ආයෙ මං ඒ ගැන ඔයාගෙන් අහන්නෑ.. මං කලින් දවසකත් කිව්වා. මං මේ ලෝකෙ හැමදේටම වැඩිය ඔයාව විශ්වාස කරනව කියලා.. ඒ විශ්වාසෙ තියන් මං ජීවත්වෙන්නම්.."

මං අංජලීගෙන් ඈත්වෙලා ආයෙත් ඇඳෙත් වාඩිවුණං.

"ඔයාට ගත්තු ප්‍රසන්ට් එක සාලෙ තියෙන්නෙ.. දැන් ඒක ගන්න බෑ.. ඒත් මං ඔයාට මොනව හරි දෙන්න ඕන.."

එහෙම කියල අංජලී එයාගෙ කරේ තිබ්බ මාලෙ ගලවල මගේ අතට දුන්නා.

"මේක මං ගත්තොත් මට පව් පිරෙයි උංගි.. අද දවසෙ ඔයාව හම්බවුණානෙ.. ඒකම මට ඇති. තරහවෙන්නෙපා මට මේක ගන්න බෑ.."

මං මාලෙ ආපහු අංජලීගෙ අතට දුන්නා.

"මේක නොගත්තොත් මං තරහම කරහයි විහඟ අයියා.. අනේ

ඉතිං මං ආදරෙන් දෙන දේනෙ.. කෝ.. ඉතිං හොඳ ළමයා වගේ පහත් වෙන්න.. මගේ අතින්ම මේක දාන්නම්කො.."

අංජලී එයාගෙ මාලෙ මගේ කරට දැම්මා. රංඩුවෙන්න බැරි හන්දම මං සද්ද නැතුව හිටියා. ඒත්තෙක්කම තමයි කාමරේ දොරට ගහනවා ඇහුණෙ. මගේ පපුවෙ බීට් එක වැඩිවුණා. අංජලිත් බයවෙලා වගේ දොර දිහා බලන් හිටියා.

"උංගී බබා.. උංගී බබා.."

"අ.. අයියෝ..! අම්මී කතා කරන්නෙ.. ප්ලීස්.. ඔ.. ඔයා ඔය කොහේ හරි හැංගෙන්න.. අ.. අනේ ඉ.. ඉක්මනට.."

අංජලී වෙව්ලනවා. මං තත්පරයකින් කාලකට්වත් පරක්කු උනේ නෑ. ඇඳ යටටම රිංගුවා. මගේ පපුවෙ තිබ්බෙ බිත්තර සීයක් උනත් තම්බගන්න පුළුවන් තරමෙ ගින්දරක්. හප්පේ මොනවයින් මොනව වෙයිද මංදා. අංජලී ගිහින් දොර අරිනව මට ඇහුණා.

"ඕ.. ඔයාට නින්ද ගිහින්ද තිබුණෙ උංගී.. මට ඔයත්තෙක්ක ටිකක් කතා කරන්න ඕන.."

එහෙම කියල අංජලීගෙ අම්මා ඇඳ උඩින් වාඩිවුණා. මං ඇඳ යට. අනේ දෙයියනේ.. මේ මොකක්ද වුණේ.. මද්දු හිටිය නම් කියයි ඔහොම යා ඔහොම යං කියල.

"අනේ අම්මා.. මට දැන් හොඳටම නිදිමතයි.. අපි හෙට උදේට කතා කරමුකො.."

අංජලී ඒ ටික කිව්වෙ නිදිමත පෙරෙන සයිස් එකෙන්. ඇත්තටම අංජලීව වගේම ඇඳ යට හිටපු මටත් ඕනවෙලා තිබ්බෙ අම්මව එලියට යවා ගන්න. ඒත් මට තේරුණ විදියට අංජලීගෙ අම්මට

කාමරෙන් එළියට යන අදහසක් තිබුණෙ නෑ. එයා ඇඳ උඩ හොඳට හරිබරි ගැහිලා වාඩිවුණා කියල මට තේරුණා. හප්පේ.. [illegible] වෙනකන් මෙහෙම ඉන්න වෙයිද මංදා. එක පැත්තකින් අ[illegible] අම්මා ඇඳ යටට එබෙයිද කියන බය.. අනිත්තෙක මට ඇඳ යටම නින්ද යයිද කියන බය. ඒ මදිවට අංජලීගෙ අම්මගෙ බරට ඇඳ [illegible]ක්වත් මගේ ඇඟ උඩට වැටේවිද මංදා. ඇට්ටි හැලෙන්න නා[illegible]නත්කාර වෙලා හිටපු වෙලාවෙත් මට ආවෙ ඔය වගේ මැංටල් අදහස්ම තමයි.

"හෙට උදේට හෙමෙයි උංගි.. දැන් කතා කරමු.. මොකද තාත්ති ඉස්සරහ මේව කතා කරන්න ගියොත් ලොකු ප්‍රශ්නයක් වේවි.."

"මො.. මොනව ගැනද අම්මි කතා කරන්න හදන්නෙ..?"

තප්පරේට දෙකට අංජලීගෙ කටහඬ ප්‍රාණවත් වුණා. එයා කලින් පෙන්නුව නිදිමත හොයන්න, බින් ලාඩින්ව හොයනවටත් වැඩිය අමාරුවෙයි වගේ.

"ඔයා ක්‍රිෂාන් එක්ක රංඩු කළේ ඇයි උංගි..? ඇයි එයාගෙ හිත රිද්දන්නෙ..? ක්‍රිෂාන් කියන්නෙ ඔයා බඳින්න ඉන්න කෙනා.."

අංජලීගෙ අම්මා එහෙම කියද්දි යීතලවෙලා තිබ්බ සිමෙන්තියට වැඩිය මගේ හිත සීතල වෙලා ගියා.

"ක්‍රිෂාන්ලගෙ පැත්තෙනුයි, අපේ පැත්තෙනුයි හැම දෙයක්ම කතාබහ කරලත් ඉවරයි.. ඒ ළමයට ඔය තරම් නපුරුකම් කරන්න, ඒ ළමයා ඔයාට කරපු වරද මොකක්ද උංගි..?"

"එයා මගේ ජීවිතේට එබෙනව වැඩියි අම්මි.. එයා හදන්නෙ මාව පාලනය කරන්න.."

"ඉතිං එහෙම නැතුව බෑනෙ උංගි.. ඔයත් එක්ක ජීවත්වෙන්න එයත් පුරුදුවෙන්න ඕනනෙ.."

අංජලීගෙ අම්මගෙ කටින් පිටවෙන වචනයක් වචනයක් ගානෙ මගේ හිත වේදනාවෙන් පිරුණා. 'එතකොට මේ ඇඳ යටට වෙලා ඉන්න මට මොකක්ද වෙන්නෙ ඇන්ටි' කියල මට අහන්න හිතුණා. අඩුම ගානෙ මේ වෙලාවෙවත් අංජලිට එයාගෙ අම්මිත් එක්ක කියන්න බැරි ඇයි මාත් එක්ක යාලුයි කියලා. ඉස්සරවෙලා ඇවිත් තිබුණු වේදනාව මැද්දට මගේ හිතට අලුතින් කෝන්තියකුත් ඇවිල්ල තිබුණා.

"ම.. මං මෙච්චර දවසක් අම්මිට කිව්වෙ නෑ.. ක්‍රිශාන් මගේ හිත රිද්දනව වැඩියි.. මට එයත්තෙක්ක ගිහින් සංතෝසෙන් ඉන්න බැරිවෙයි අම්මි.. අනික මං තාම පුංචි කෙල්ලෙක්.. ඇයි මාව දැම්මම ගෙයින් එළියට දාන්න හදන්නෙ..?"

ඒ පාර නම් අංජලී සිරා වෝකක් දුන්නා. දැන් නම් මගේ කකුලුත් හිරිවැටිලා. හිකංචත් හැරෙන්න බෑ. මේ මනුස්සයා යන්නැද්ද මංදා. මාවම කන්න මෙතන ඉන්නෙ. වැරදිලාවත් ඇඳ යටවත් හෙම බැලුවොත් සදා යොක්කි හවන්තුනේ තමයි..

"තාත්තිගෙ තීරණේනෙ උංගි හැමදාම අන්තිම තීරණේ වෙන්නෙ.. තාත්ති හැමදෙයක්ම කරන්නෙ ඔයා වෙනුවෙන්. ඔයාට වැරද්දක් වෙනව දකින්න තාත්ති කැමති නෑ. දැන් තාත්තියි මායි ගාව ඉන්නෙ ඔයා විතරයි. ඔයාට කරදරයක් වෙන්න අපි ඉඩ තියන්නෑ.."

ආයෙත් ඇඳ ජර බර ගානවා මට ඇහුණා. අමාරුවෙන් බෙල්ල හරවල මං කාමරේ දොර දිහා බැලුවා. කකුල් විතරයි මට පේන්නෙ. අංජලී අම්මට ළංවෙලා ඉන්නව ඇති කියල මට හිතුණා.

මද්දූ අයියා මේ වෙනකොට පාරට වෙලා පිණි බබා ඇති. දැන් මං ඇවිදිනුත් පැය දෙක හමාරක් විතර ගිහින්. ගෙදරිනුත් කලබලවෙලා ඇති කියල හිතෙද්දි මාව පිස්සු වැටුණා.

"වැඩිය කල්පනා කරන්න එපා උංගී බබා.. හැමදේම හරියයි.. අපිට තව කල් තියෙනවනේ.. ක්‍රිශාන් කැමති විදියට ඔයාව හැඩගැහෙන්න පුළුවන් වේවි එතකොට. ඔයාටත් පුළුවන් වේවි ක්‍රිශාන්ව ඔයා කැමති විදියට නම්මා ගන්න.."

"ම.. මට නිදිමතයි අම්මී.."

මට දැන් උංගීත් එක්ක තදවෙගෙනත් ආවා. ඇයි සීවරත් දෙවියනේ අම්මත් එක්ක ඩිංගක් සාලෙ දිහාට ගියා නම් හෙවෙනවද..? මේකෙ යට ඉඳල කන කට්ට ගැන මමනෙ දන්නෙ. නිදිමතක් ගැන කියනව ඇරෙන්න වෙන දෙයක් කියන්නෙත් නැනෙ. මගේ වෙලාවෙ කියන්නෙ මද්දූවවත් මේ වෙලාවෙ බාල්දියක් පෙරලන්නෙ නැති හැටි.. මට නම් දැන් බුදු පුවර් අංජලීගෙ අම්මා තව පැය ගානකට කාමරෙන් යන්නෑ කියලා. අම්මා මදිවට තාත්තත් තව ඊ වුණොත් මේ කාමරේට ඒවි කියල මට හිතෙද්දි ආදරය කරනෙකත් කොයි තරම් කට්ටක්ද කියල මට හිතුණා. ඒත් ඉතිං සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළුවෙන්නෙ මද්දූවටත් එළියෙ නින්ද ගිහින් තිබුණොත් තමයි.

"එහෙනම් උංගී ඔයාට නිදිමත නම් නිදාගන්න.. මං තාත්ති එනකන් තව ටිකක් වෙලා බලන්නම්.. අනිත්තෙක මේ දවස්වල හොරුත් වැඩියි.. දවල්ට ගෙවල් අස්සට රිංගලා හැංගිලා ඉන්නව රෑවෙනකන්. ඇඳන් යට හෙම බලලා නිදාගන්න කියලා මං ඔයාට හැමදාම කියනවනේ.. ඔයා හරි කම්මැලි ළමයෙක් වෙලා උංගී.. ඉන්නකො මමම බලන්න.."

අංජලීගෙ අම්මා ඊගාවට කිව්ව දෙයින් මගේ යටි පතුල්වල ඉඳලම සීතල වෙලා ගියා. හත්තිලව්වේ.. දැන් නම් ගෙඩිය පිරිත්ම මං අහුවෙනවා. ඒක ඉතිං දේවදත්තයා පොළොව පලාගෙන ගියාටත් වැඩිය මට ෂුවර්.. මේ දේ වෙන්නද දෙයියනේ මං මෙච්චර කට්ටක් කාගෙන ආවෙ. අංජලීගෙ අම්මා දැන් බලයි දැන් බලයි කියල හිතෙන පැය ගානක් වගේ තත්පර දෙක තුනක් ගෙවිල ගියා. ඒක දණ හිසක් බිමට නමල ඇඳ යට බලන්න ලෑස්තිවෙන අංජලීගෙ අම්මව මං දැක්කා. මුළු ලෝකෙම ඉන්න තිස්තුන් කෝටියක් දෙවි දේවතාවරු මතක් කරගෙන මං හැම බලාපොරොත්තුවක්ම අත ඇරලා දැම්මා.

මුළු ලෝකෙම නිහඬවෙලා වගේ තිබ්බ ඒ තත්පරේදි තමයි මහා සද්දෙට ගෙයින් එළියෙ මොනවදෝ පෙරලුණේ. කවුරු හරි හතර ගාතෙ දාල වැටෙනව මට හොඳටම ඇහුණා. අංජලීගෙ අම්මා ඇඳ යටට එබෙන්න ගිය එක නවත්තල එහෙමම ගැස්සිලා නතර වුණා. ඒ ඩිංග වෙලාවෙදි අංජලී එයාගෙ අම්මව බදාගෙන නැගිට්ටව ගන්නව මං දැක්කා. මගේ හෘදය වස්තුව හරියට වැඩ කරන්න ගත්තෙ ඊට පස්සෙ තමයි. හප්පොච්චියේ.. මට කලන්තෙ වගේ.

"මො.. මොකක්ද උංගී ඒ සද්දෙ..?"

"ම.. මං දන්නෑ අම්මි... අ.. අපි සා.. සාලෙට ගිහිල්ලා ටිකක් බලමු.."

අංජලී අම්මවත් ඇදගෙන කාමරෙන් පිටවුණා. මීට වැඩිය වෙන කිසිම චාන්ස් එකක් දෙයියො දෙන්නෑ කියල මුදු ෂුවර්.. තත්පරේට දෙකට ඇඳ යටින් ඇවිල්ල ඇතුල්වුණු දොර ළඟට මං දිව්වෙ පිස්සු හැදිලා වගේ. කොහොමහරි ගෙයින් පිටවුණා නම්

කියන අදහස විතරයි මගෙ ඔලුවෙ තිබ්බෙ. හීන් සීරුවෙම දොරේ ලොක් එක පන්නගෙන මං එත්තට පැන ගත්තා. අංජලී ඇතුලෙන් අගුල දාගනියිනෙ. මුළු ගේ වටේටම ලයිට් දාලා. අර ආපු සද්දෙ හින්ද වෙන්නැති. මං වත්ත කොනටම ගිහින් උඩ පැනල තාප්පෙ එල්ලුණා. පපුව ගැහෙන එක තාම අඩුවෙලා නෑ. මද්දුව දකින්න කියල හිතාගෙන පාර දිහා බැලුවත් මද්දූ තියා බයික් එකවත් පේන්න තිබුණෙ නෑ. තාප්පෙ උඩ ඉඳල තාර පාරට පැනල මං වටපිට බල බලා පාර දිගේ ආවා. මද්දුගෙ කැල්ලක්වත් නෑ. මූට මොනව උනාද යකෝ.. එනකොට තමයි අංජලිලගෙ ගේට්ටුව උඩින්ම පැනගෙන කවුදෝ මං දිහාට දුවන් එනව දැක්කෙ. හත්තිලව්වේ.. හැඩරුව අනුව නම් ක්‍රිශාන්කාරයා වගේ. තවත් හිතන්න දෙයක් නෑ. කකුල් දෙකට පුළුවන් තරම් ගට අරගෙන මං පාර දිගේ දිව්වා. ක්‍රිශාන් කාරයට මෙහෙන්දි මං අහුවුණොත් අංජලීටනෙ බර බරේ වැටෙන්නෙ. සුවර් එකටම මං එන්න පරක්කු හින්ද මද්දුව ගෙදර යන්න ඇති. ඡිප්.. මූ වගේ කුණු මද්දුවෙකුට මං මල්ලි වෙලා ඉපදුණානෙ. පණ කඩාගෙන දුවන ගමනුත් මං මද්දුවට බැන බැනයි දිව්වෙ. ඒත් මගේ පස්සෙන් එළවන් ආපු ක්‍රිශාන්කාරයා එකසිය ගානට මට කිට්ටු කරනව කියල මට දැනුණා. හති වැඩිකමට තවත් දුවන්න බෑ. කරන්න දේකුත් නෑ. අංජලිලගෙ ගේත් පහුවුණානේ. දැන් උඹට දෙන්නම් පුතෝ කියලා මං පාර මැදම නතර වුණා. ක්‍රිශාන්කාරයත් මට ඩිංගක් එහායින් නතර වුණා.

"උඹට සන්නිය හැදිලද මැට්ටො.. පණ කඩාගෙන දුවන්නෙ..? හ්..ග්.. හම්.. මේහ්.. අම්මේ..හ්... හෝ.. හොඳටම හති.."

දිව්‍ය ලෝකෙ ඉඳල ආව වගේ මද්දූ අයියගෙ කටහඬ මට ඇහුණා. යකෝ මේ ක්‍රිශාන් නෙමෙයිද..? මගේ ඇස් දෙක මටත්

හොරු කරනවද..? මං දැක්කෙ ත්‍රිශාන්කාරය එළවගෙන එනව වගේනෙ. මං තවත් ලංවුණා.

"උඹට නම් ගහල මැරුවත් මදි පොඩී.. පිස්සු බල්ලො වගේ ඔහොමත් පණ කඩාගෙන දුවනවද යකෝ.."

"ම.. මං හිතුවෙ ගෙදර එකෙක් මාව එළවං එනව කියලා.. බයික් එකත් තිබුණෙ නැති හින්ද මං හිතුව ඔයා යන්න ඇති කියලා.."

"ගෙදර එකෙක් නම් ගේට්ටුව උඩින් පැනල එනවද පොඩී.. බයික් එක තව ඉස්සරහා ඇති. උඹ එන්න පරක්කු හින්ද මං ඒක වංගුවෙ පොල් අතු කඩේ ගාවට ගෙනැල්ල දැම්මා. ඒක නෙමේ.. මොකද උනේ කියපං.."

"උනේ..? තව ටිංගෙන් මහ කෙළියම වෙනව මද්දූ.. මායි අංජලියි කාමරේ කතා කර කර ඉන්නකොට අංජලීගෙ අම්මා කාමරේට ඇවිත් එතන පැළවුණා. පස්සෙ ඊ. වුණාම ගෙවල්වලට හොරු එනවයි කියල ඇඳ යට බලන්න හැදුවා.."

"අවුලක් නැහෙ.. උඹ හිටියෙ අල්මාරිය ඇතුලෙනෙ.."

මද්දුවට පිස්සු.. ඒ කාමරේ අල්මාරියක් නෑ.

"මගුලක් කියනවා.. මං හිටියෙ ඇඳ යට.."

"අම්මට හුඩු සෝමසිරි.. කාපංකො, කුණුකෙළ.. ඉහිං.. ඉහිං.. උඹ නැට්ටටම අහුවුණා.."

"නෑ මද්දූ.. දෙයියො බැලුව වගේ එළියෙ ලොකු සද්දයක් ආවා.. ඒක බලන්න අම්මා යද්දි මං එළියට පැනගත්තා.."

මං කතාව කියල ඉවරවෙනකොට මද්දුවගෙ මූණෙ තිබ්බෙ ලොකු හිනාවක්. මූ මොකද ඒ පාර හිනාවෙන්නෙ.

"උඹට හපන් වැඩක් මට වුණේ.. උඹ පරක්කු මොකද කියල බලන්න මං ගේ ළඟට ආවා. ලයිට් දාලා තිබුන්නැති පැත්තෙන් පේමන්ට් එක දිගේ යනකොට පත මල් පෝච්චියක මාව හැප්පුණානෙ පොඩි.. පෙරේතයා පොලේ ගැහුව වගේ මං ඇදන් වැටුණා. නැගිට ගන්නත් ටිකක් අමාරු වුණා. අමාරුවෙන් නැගිටල දුවන් එනකොට තමයි උඹ පණ කඩන් දුවනව දැක්කෙ.."

උනේ මොකක්ද කියල තේරුම් ගියාට පස්සෙ මායි මද්දුයි හොඳටම හිනාවුණා. බයික් එකට නැගල ගෙදරට එනකම්ම අපි කතා කර කර ආවෙ බේරුණු බේරිල්ල ගැන. ගෙදර ඇවිල්ල පුප්නිගෙ කාර් එක තාම හදල ඉවර නෑ කියල අම්මගෙනුත් බේරිල මායි මද්දුයි කාමරේට රිංග ගත්තා.

"බලපං ඉතිං.. අද දවසෙ සුන්දරකමට සිද්ධ වෙච්ච දේවල්.. කමක් නෑ.. හිතට සැනසීමක් තියෙන්නෙ ආයෙ උඹ ඉපදුණු කුප්ප දවස එන්නෙ තව අවුරුද්දකින් හින්ද.."

අන්තිමට නිදාගන්න ගිහින් වැලමිටත් අත ගගා කුණු මද්දුවා කුණු කතාවක් කිව්වා. නිදාගන්න වෙලාවෙ හිත පාරක් කරගන්න බැරි හන්ද මං සද්දෙ වහගත්තා.

* * * * *




"නැගිටිනවා.. නැගිටිනවා..
කුම්භකරණයා වගේ තාමත් නිදි.. අනේ මෙගෙමත්
කම්මැලි කොල්ලෙක්.."

කණ ළඟින්ම ආපු හොරණෑ සද්දෙයි හිතක් පපුවක් නැතුව වගේ මාව හොල්ලපු එකාවයි කවුද කියල බලන්න මං ඇස් ඇරියා. උදේ කිරි එකත් අතේ තියන් හිටියෙ අච්චි අක්කා. අද දවස නම් එච්චර අවුලක් වෙන එකක් නෑ වගේ. ඇයි කුණු මද්දුවා නොමේනෙ උදේට දැක්කෙ.

"මොනව කරන්නද අක්කෙ.. ඔයාට වගේ පවුලක් පන්සලක් මට නෑ.. උදේ නැගිට්ටා කියල ගතියකුත් නැත්තෙ ඒකයි.. මාත් බැඳල හෙම හිටිය නම්, අක්කා වගේම එයත් මට කිරි එක අතටම ගෙනත් දේවි නේද..? අනේ අම්මේ.. ජීවිතේ මොන තරම් සුන්දරද..?"

කුණු කෙළ පිටින්ම මං කිරි එක ඇදල අරින ගමන් කියවන් ගියා. අම්මා දැක්ක නම් කුණු බැනුමක් බුදු ජුවර්. බැනුම කෙළේ

වෙනත් මං හොල්මං වුණේ කාමරේ කර්ටන් එක අතින් අල්ලන් ඉන්න ලොකු අයියව දැක්කහම. හත්තිලව්වේ මේ මල යකා දේවදත්තයා වගේ කොහෙන් පාත් වුණාද මංදා. මං කියවපු ඒව මූ හොඳට අහන් ඉන්න ඇති.

"පොඩී.. ඔයාට මෙහේ ඉන්න කැමැලි නම් අපිත් එක්ක හැටන් යමු. මාසයක් දෙකක් විතර ඉඳල එන්න බැරියැ.."

මං දිහා බලාගෙන ලොකු අයියා කිව්වා. අචිනි අක්කත් මං දිහා බැලුවෙ ඒක අනුමත කරල වගේ. පිස්සුද මංදා.. එතකොට මගේ රාජකාරී කටයුතු කවුද කරන්නෙ..? ඒව කුණු මද්දුවට බාරදීල යන්නද වෙන්නෙ.

"මොකද පොඩි මල්ලි කතා නැත්තෙ..? ඔයා අකමැතිද අපිත් එක්ක එහේ යන්න.."

හිස් කෝප්පෙ මගේ අතින් ගන්න ගමන් අචිනි අක්කා ඇහුවා. දැන් මොනවද කියන්නෙ..?

"අකමැත්තක් නම් නෑ අක්කෙ.. මාත් ආසයි ඔයාලත් එක්ක එහේ ඉන්න.. ඒත් ඉතිං මද්දුයි අම්මයි දාලා මට යන්න බෑ.. ඒ දෙන්නා ළඟ නෑ කියලා හිතෙනකොට මට නිකං කන්නත් බෑ වගේ.."

මං කිව්ව එකට අචිනි අක්කගෙ මූණට පුංචි හිනාවක් ආවා. ඇඩේ ඇත්තනෙ.. මොනා වුණත් මං කොහොමද අම්මවයි කුණු මද්දුවයි දාලා ගිහින් මාසයක් දෙකක් ඉන්නෙ.. ටිකකින් එළකිරි වගේ ටී ෂර්ට් එකක් ඇඳන් මද්දු කාමරේට එබුණා. මූ මේ දවස්වල බැංකුවෙ කැෂියර් එකේද මංදා.. ගිය සුමානෙත් ටී ෂර්ට් දෙකක් අරන් තිබුණනෙ.

"මොකක්ද පාට්නර්.. හැමදාම කියනවනේ උදේ නැගිට්ටහම ටිකක් මනුස්සයෙක් වගේ ඉඳපං කියලා.. මූණ කට එහෙම හෝදලා.. බාත්රූම් එහෙම ගිහින්.. ෂිත්.. මූ මගේ මල්ලි වෙලා ඉපදුණානෙ.."

පාන්දරම මද්දූ අඳෝනාව පටන් ගත්තා. ඌ හදන්නෙ පුපුරුදු විදියට මාව අවුස්සන්න.. උගේ දවසට තියමින වැඩ සටහනේ පළවෙනි එක ඒකනෙ. මං අහුවෙයි ඕවට. ඇරත් මේ දවස්වල මද්දූ ගාව සල්ලි තියෙනව වගේ.

"මද්දූ.."

"ඇයි..?"

"මේ.. මේ ඔයා ළඟ නැද්ද මාරුකාසි රුපියල් පන්සියක විතර.."

මං කිව්ව එකෙන් පොරගෙ ඇස් උඩ ගියා.

"මොකටද යකෝ රුපියල් පන්සියක්.."

"ඇයි ඉතින්.. බයික් එක ගෙනැල්ල දුන්න නම් පෙට්‍රල් ගහන්නත් සල්ලි දෙන්නකො.."

මද්දූ ඔලුවෙ අත ගහගත්තා.

"ෂිත්.. උඹට බයික් එක ගෙනැල්ල දුන්නට මං මටම ගහගන්න ඕන.. අනේ උඹ වගේ පාප කර්ම සහෝදරයෙක්.."

පර්ස් එකෙන් රුපියල් පන්සියක් අරගෙන මට දෙන ගමන් මද්දූ කිව්වා. උගේ මූණ දැන්නෙ බලන්න ලස්සන. අඹ ඇටේ වගේ ඇදවෙලා.

The Spirit of Sri Lan

"පොඩි මල්ලී.. ඔයාට කෝල්.."

අචිනි අක්කගෙ කටහඬ මට සාලෙන් ඇහුණා. අඩේ.. එතකොට ෆෝන් හදලද..? කොයි වෙලාවෙද දන්නෑ හැදුවෙ.. ඇයි මීක ඊයෙ හදන්න බැරිවුණේ.. මං ටිකක් වෙලා කල්පනා කරා..

"පාට්නර්.. උඹට උදේ පාන්දරම වයක් විසක්වත් කැවුණද..?"

හිටපු ගමන් මද්දු ඇහුවෙ අප්සට් ප්‍රශ්නයක්. මං උගේ මූණ දිහා බැලුවා.

"ඇයි බං.. උඹ මෝදක ගහලද.. අන්න අරහෙ කෝල් එකක් ඇවිත්.."

"කෝල් එක ආවෙ මටනෙ.. උඹ ඔය තරම් තටමන්නෙ ඇයි..?"

මද්දුට නෝන්ඩි හිනාවක් දාලා මං රිසීවර් එක ඉස්සුවා. එහා පැත්තෙ හිටියෙ රාජ්.

"මොන අල හෙඩියක් කරාද යකෝ මෙච්චර වෙලා..? මෙන්න අංජලී මෙතන ඉන්නවා.. සං සං ගාල මගෙ කඩේට වරෙන්.."

හත්තිලව්වේ.. ශුවර් එකටම මොකක් හරි අවුලක්. ඊයෙ රෑ මායි මද්දුයි පෙරලපු බාල්දිය කෙලින් කරල වගේ. දැන් මොකේද හප්පේ දන් වළදන්නෙ..?

"කවුද පාට්නර්..?"

"අංජලී..! රාජ්ගෙ කඩේට ඇවිල්ල මද්දු.. ඊයෙ රෑ සීන් එක දිගෑරල වගේ. කෝකටත් මං ගිහින් බලල එන්නම්.."

මං කිව්ව එකට මද්දුගෙ මූණත් වෙනස් වෙලා ගියා. මූ මොනාවට බයවෙනවද මංදා.. එහෙම අවුලක් වෙලා තිබ්බොත් පරිප්පුව මටනෙ. ඒත් ඉතිං අර කඩපු මල් පෝච්චිය අරන් දෙන්න වෙච්චි කියල මද්දු හිතනවද දන්නෙත් නෑ. කරන්න දෙයක් නෑ.. හිසිල්ලම බලමුකෝ.

බයිස් එක විඩියෝ සෙන්ටර් එක ගාව පේමන්ට් එකට දාලා මං කඩේට ඇතුල් වුණා. රාජ් හිටියෙ අංජලිත් එක්ක ලොකු කතාබහක. මාව දැක්ක ගමන් රාජ් කටින් පැන්නා.

"මොනාද බං.. උඹ මේ පෙරලල තියෙන බාල්දිය..?"

"ඇයි..?"

අංජලි දිහා බලන ගමන් මං ඇහුවා.

"ඇයි අහන්නෙ..? මහ රෑට ඕහොම ගෙවල්වලට යන සිරිතක් තියෙනවද විහඟ... බලපං අහුවුණා නම් එහෙම ලෝක විනාසයක්නෙ බං.."

සප්පෙ ඇති යාන්තං.. මගේ පපුවට හුස්ම ඩිංගක් වැටෙන්න ගත්තා. ඒ කියන්නෙ තාම මුකුත් වෙලා නෑ.

"හරි.. හරි.. උඹ වැද්දා වගේ කෑගහන්නැතුව මට කියපං මොකද වෙලා තියෙන්නෙ කියලා.. මං තාම උදේට කාලත් නෑ.. කිරි එක බිව්වා විතරයි. අංජලි මයත් උදේට කාල නෑ නේද..?"

මං අහපු එකට අංජලිගෙ මූණට හිනාවක් ආවා. ඒ අස්සෙ රාජ් විඩියෝ පෝස්ටර් වගයක් අරන් කඩේ ඇතුළට ගියා.

"රාජ් අයියා.. මායි විහඟයි ඩිංගක් එළියට යනවා.. දවල් වෙලා මං පිහාව එවන්නම් හොඳේ.."

අංජලී කියපු එක රාජ්ට ඇහුණද මංදා. කතාව පිටින්ම ඌ හෝ ගාල වැඩ. බලන් ගියාම මූ දියුණුවෙන එකෙක් වගේ. බයික් එක කඩේ ගාව තියෙද්දිම මායි අංජලියි පයින්ම කොහුවල පැත්තට එන්න හැරුණා.

"ඊයෙ මං ආවට පස්සෙ මොකද වුණේ උංහී..?"

"ගෙදර ඩිංගක් විතර කලබල තිබුණා අයියා.. තාත්ති එනකොට නම් හුඟාක් රෑ වෙලා.. ඒත් මොකද වුණේ කියල කාටවත් හිතාගන්න බෑ. ඔයාත් ඉඳල ඉඳල කරන්නෙ පුදුම වැඩනෙ.."

මගේ අතින් අල්ලන ගමන් අංජලී කිව්වා.

"ඇයි.. මං මොනවද කරේ..?"

"ඔය නැතුව රෑ වෙලා ඔහොම එන්න හොඳ නෑ අයියා.. ගෙදර කාට හරි අහුවුණා නම් තෙම.."

"ඉතිං ඔයානෙ මාව ඇතුළට ගත්තෙ.."

"ඇයි විහඟ අයියේ.. ඔයා එච්චර ළඟට ආවහමත් මං කොහොමද ඔයා ලංකර ගන්නැතුව ඉන්නෙ..? කෝම හරි අම්මිගෙ ලොකුම මල්වාස් එක පෙරළලා බිඳල දාලා.. අම්මි කියනවා අලියෙක්වත් ආවද දන්නෑල්ලු.. මිනිහෙකුට නම් මේක පෙරළන්න බැරිලු.. ඒත් ඉතිං ඒක පෙරළුන හින්දනෙ අපි දෙන්නම බේරුණේ නේද..?"

මද්දූ මල් පෝච්චිය පෙරළගෙන වැටුණ කතාව මං අංජලීට කිව්වෙ නෑ. මායි මද්දූයි තරගෙට දුවපු කතාව වුණත් මං කියන්න ගියේ නෑ. අංජලීට වුණත් හෝන්ඩ් වෙන්න බෑනෙ.

"මම නම් හොඳටම බයවුණා අයියා.. අම්මී ඇඳ යට බලන්න හදපු වෙලාවෙ.. අනේ.. මට ඒ වෙලාවෙ හැමදේම අමතක වෙලා ගියා. පුදුම බයක් මට දැනුණෙ. ඔයාට මොනාවද හිතුණෙ අම්මී ඇඳ යට බලන්න හදපු වෙලාවෙ.."

පපුවෙ ස්පීඩ් එක එකසිය ගානට වැඩිවෙන ප්‍රශ්නයක් අංජලි ඇහුවා. ඒ වෙලාවෙ හිතුණ දේවල්නම් මැරිච්ච එකෙකුටවත් කියන්න හොඳ නෑ. ඒ තරමට මාව හෝන්ඩි වෙනවා. ඕන දෙයක් වෙන්න කියලා තලප්පා වගේ හතරගාතෙ දාලා ඇඳ යට ගැහි ගැහී හිටිය කියල අංජලිට කියන්න බෑනෙ.

"ඒක එච්චර ගානක් නෑ ළංගි.. වැඩිම උනොත් එහෙම ඉඳල අහුවුණා නම් මාව ඔයාට බන්දලා දෙයිනේ.. මට තරගන්නත් ඕන ඒකනේ.."

මං වීරයා වගේ කිව්වා.

"ආ.. ආස ඇති.."

"ආස හින්දනෙ කියන්නෙ.."

කොහුවල හංදියට ඇවිත් මං අංජලි දිහා බැලුවා. සුදු පාට මූණ අච්චට රතුපාට වෙලා ගිහින්. තීරණයක් නැතුවම අපි දෙන්න පිළියන්දල පාරට හැරුණා.

"ලොකු අයියා මට හැටන් යන්න කතා කරනවා ළංගි.. මාස දෙක තුනක් එහේ ඉඳිමු කියලා.."

"අ.. අනේ ඔයා යන්නෙපා විහඟ අයියෙ.. කියන්න.. ඔයා යන්නෑ නේද..? මට ඔයා දකින්නෙ නැතුව ඉන්න බෑ.. ඊයෙ රෑ

හම්බවෙලා කතා කරලත් මං අද ආවෙ ඒකයි.. මට ඔයාව හැමදාම දකින්න ඕනා.. මගේ ඇස් ඉස්සරහ ඔයා ඉන්න ඕනා.."

අංජලීගෙ මූඩ් එක එහෙම පිටින්ම අවුල්වෙලා ගියා. පව්.. මෙච්චර වෙලා හිනාවෙවී හිටපු සුදු මූණ මැලවෙලා ගිහින්. 'ඔයාව දාලා මං කොහේවත් යන්නෑ ලැගී' කියල කියන්න හිතාගෙන මං අංජලීගෙ අතින් අල්ල ගත්තා. ඒ වෙලාවෙදි තමයි රතු පාට හොන්ඩා සිවික් කාර් එකක් අපි දෙන්නව පහු කරන් ගිහින් ආයෙත් ආපස්සට ඇවිත් පාර අයිනට කරල නැවැත්තුවෙ. කවුද කියල බලන්න කියනාව වගේ අංජලී මගෙන් අත මුදවගත්තා. කාර් එකෙන් බැහැල අපි දෙන්න දිහාට ආපු කෙනා දැක්කහම මට හින්දාඩිය විකරක් නෙමෙයි මහ දාඩියක් දැම්මා. අරුන්දි.. එදා ගෝල්ෆේස් එකේදි එයා ක්‍රිශාන්ගෙනුයි නියාස්ගෙනුයි, මාවයි ෂබ්වයි බේරගෙන කාර් එකේ දාන් ආපු එක මට මතක් වුණේ තත්පරේට දෙකට. අරුන්දි කියන්නෙ අංජලීගෙත් හද යාලුවෙක් කියල මට මතක් වුණේ තුන්වෙනි තත්පරේදි. මගේ පපුව හීතල වෙලා ගියා.

"හ..ල්ලෝ.. විහඟ.. කොහොමද ඉතිං.. මං උඹව දැකල නැවැත්තුවෙ.. උඹේ ලව් එක, අර මුස්ලිම් බේබි කෝ..? එදා දැක්කට පස්සෙ උඹයි ඒකියි දැක්කෙවත් නෑ. මොකද උඹත් මුස්ලිම් ආගමට ගියාද..? ඕ.. මයිගෝඩ් මේ.. මේ.. අංජලී නේද..? මගෙ දෙයියනේ.. වෙනස්වෙලා තියෙන තරමක්.."

කියවන්න ඕන හොඳම හරිය කියවල ඉවරවුණාට පස්සෙ තමයි ඒකි අංජලීව දැක්කෙ. දැන් ඉතින් මොනවයින් මොනව වෙයිද දෙයියනේ.. මීට වැඩිය හොඳයි මාව මරාගෙන උයාගෙන

කතාත් එක්ක හරි බෙදාගෙන කෑව නම්. ඒත් ඉතිං අරුන්දිට බැනල වැඩක් නෑ.. මොකද ඒකි දන්නෑනෙ මායි අංජලියි යාලුයි කියලා.

"ඔයා හුඟාක් ලස්සන වෙලා අංජු.. කෝ අක්කි එහෙම සනීපෙන් ඉන්නවද..? අපිට හොරෙන්ම උඹ බැන්දෙ හෙම නෑනේ.."

මං පැත්තක ඉන්දෙද්දි අරුන්දි අංජලිගෙන් ඇහුවා. ටිකක් කලින් අරුන්දි කියපුව උංගිට තේරුණේ නැත්නම් හොඳයි කියල මට හිතුණා.

"බඳින්න නම් තව කොච්චර කල් තියෙනවද අරුන්දි.. කෝ අජය හෙම..?"

"එයා ඔෆිස් ගියා බං.. මං මේ අම්මලාත යන ගමන්. ඒක නෙමේ උඹ කොහොමද අපේ මේ පිස්සු පූසව දන්නෙ..?"

මාව පෙන්නන ගමන් අරුන්දි ඇහුවා. දැන් ඉතිං කාපංකෝ රට කණංකොළ. අංජලී මොනව කියයිද මංදා.

"කොහොම හරි දන්නවනේ.. උඹ මොකක්ද අර ඉස්සෙල්ල කියපු මුස්ලිම් කතාව.. විහඟ මට නිකංවත් කියල නෑනෙ.."

අරුන්දි අහපු ප්‍රශ්නෙ පැත්තකින් තියල අංජලී අහපු ප්‍රශ්නෙන් මාව සීතල වෙලා ගියා. මුස්ලිම් කතාව උංගිගෙ හිතේ තදටම වැදිල කියනෙක මට තේරුණා. දැන් ඉතිං කරන්න දෙයක් නෑ.. අද කන්න වෙන්නෙ ඇට ලොකු මයිසූර් පරිප්පුම තමයි.

"උඹ දන්නෙ නැද්ද..? මූ මෙච්චර සිංහල කෙල්ලො ඉන්න රටේ යාලුවෙලා තියෙන්නෙ මුස්ලිම් කෙල්ලෙක් එක්කනෙ අංජු.. හැබැයි ඉතිං මූ ඒ කෙල්ලට වහ වැටෙන එකෙත් වරදක් නෑ. මට

උනත් ආස හිතෙනවා බං.. රෝස පාටයි.. ඇස් දෙක, නිල්ම නිල් පාටයි.. බෝනික්කියෙක් වගේ.."

අනේ තුවක්කුවක් තිබ්බ නම් මං මේකිට මෙතනම වෙඩි තියල මරනවා. අංජලීගෙ මූඩ් එක කොහොමද කියල බලන්න මං එයා දිහා බැලුවා. දෙයියනේ.. කවදාවත් නැති විදියට ඒ මූණ සුදුමැලි වෙලා ගිහින්. මං තවත් කතා නොකර හිටියොත් ඇංගීගෙයි, මගෙයි ලව් එකේ මරණේ වැඩ කරලා දානෙත් දීලා තමයි එන්න වෙන්නෙ.

"මේ.. බොරු පිඹින්නෙ නැතුව ඉඳපං අරුන්දි.. මං කවදද බං මුස්ලිම් කෙල්ලෙක් එක්ක යාලුවුණේ.. උඹත් නිකං අර රොයිටර් සේවෙ වගේනෙ. මගේ හිතේ බීම් අඟලකවත් නැති දෙයක් ගැනනෙ උඹ කතා හදන්නෙ.."

මං අංජලී හිටපු දිහාට හැරෙන ගමන් කිව්වා. ඒත් අංජලීගෙ මූණ නම් යථා තත්වයෙ නෑ කියනෙක මට හොඳටම තේරුණා. කොහොම හරි අරුන්දිගෙ කට වැහුවෙ නැත්නම් මගේ ලව් එකටත් බබා හම්බවෙනවා. එතකොට රැවුල වවාගෙන පොඩි වෙච්ච ෂර්ට් එකක් ඇඳගෙන කොන්ඩෙ පීරන්නැතුව අසනයා වගේ විරහ ගී කියන්න වෙනවා. බුදු අම්මේ.. ඒක නම් කරන්න බෑ.. ඒත් මට කලින් අරුන්දි ඉස්සර වුණා. එකී මගෙයි ඇංගීගෙයි ලව් එකේ හත් දවසෙ දානෙ දීල තුන්මාසෙ දානෙත් නැත නැතුව දුන්නා.

"එහෙමද..? එතකොට ගෝල්ෆේස් එකේදි අර මුස්ලිම් බේබිගෙ අතින් අල්ලගෙන කුරුල් කරන් හිටියෙ මමද..? කමක් නෑ.. කමක් නෑ.. අපිට කොළේ වහල හරි කෙල්ලව බැඳපංකො.. නේද ඇංජු..?"

"ඒක තමයි.. බලන්න අරුන්දි.. විහඟ මාව මෙච්චර ළඟින් ආශ්‍රය කරලත් ඔය ගැන කිව්වෙවත් නැහැනෙ.."

අප්සට් මූඩ් එක තියාගෙනම් අංජලී කියපු දෙයින් මං හොල්මන් වුණා. හත් දෙයියනේ.. මොනවද මේ වෙන්න යන්නෙ..?

"උඹට විතරක් නෙමේ බං.. විහඟ ගෙදරට කියන්නත් බයේ ඉන්නෙ..? මුස්ලිම් නිසා අම්මල විරුද්ධ වේවි කියලා.. ඒ කොහොම උනත් ඒ කෙල්ල මූට හුඟාක් ආදරෙයි අංජු.."

ඉන්ටවල් නැතුව අරුන්දි කියවන් ගියා. මේ හැම දෙයක්ම කාගෙන අංජලී යන්ත්‍රනුවට ඉන්න හැටි දැක්කහම මට දැනුණේ මහ පුදුමයක්.

"විහඟ.. පොඩි වැඩකට මට බොරලැස්ගමුවටත් යන්න තියෙ.. මං අරුන්දි එක්ක යන්නම්.. ගිහින් ඇවිත් ඔයාට ෆෝන් කරන්නම්.. බායි.."

මං හිතුවෙවත් නැති විදියට එකපාරටම අංජලී එහෙම කිව්වා. ඇත්තටම කරන්න තියෙ මොනවද කියල මට තේරුනේ නෑ. වේව් එකකුත් දාගෙන හොන්ඩා සිවික් කාර් එක මං ගාවින් ඈත්වෙලා ගියාට පස්සෙ ඇස් දෙක හොඳට පිහදාල මං වටපිට බැලුවා. මං ගාව මෙච්චර වෙලා ඉඳපු අංජලීත් ගිහිල්ලා. බොරලැස්ගමුවට යන්න තරම් වුවමනාවක් අංජලීට තිබ්බෙ නෑ කියල මං දන්නවා. එයා ගියේ අරුන්දිගෙන් මුස්ලිම් කතාවෙ ඉතුරු ටික අහගන්න කියනෙක පොල්ලෙන් ගැහුව වගේ මට තේරුණා. මොනවද යකෝ මේ උදේ පාන්දර වුණේ..? මිලුව යකාගෙ කම්මල වගේ වැඩ කරද්දි මං හෙමිට හෙමිට රාජ්ගෙ වීඩියෝ සෙන්ටර් එකට

ගොඩවුණා. ඌ යමරෙට වැඩ. කොනේම තිබ්බ ස්ටූල් එකක් ඇදල අරන් මං වාඩිවුණා. දැන් නම් කඩේ ඉඩ තියෙනව වගේ.

"මොකෝ බං මේ..? ගිය පයින්ම..? කෝ අංජලී..?"

මගේ මූඩ් එක දැකල රාජ් ඇහුවා.

"වෙන්න තියෙන ඒවා ඔක්කොම වුණා බං.."

අරුන්දි ඇවිල්ලා කියවපු නාන්ස්ටොප් කියවිල්ල මං රාජ් එක්ක කිව්වා. උගේ මූණට මහා බැරෑරුම් පෙනුමක් ආවා.

"අංජලී අරුන්දිත් එක්ක යන්න ඇත්තේ ඒ සීන් එක දශමෙටම අහගන්න නමයි. වැඩේ තියෙන්නෙ එදා එතන ක්‍රිශානුත් හිටියනෙ. අරුන්දිට ක්‍රිශාන්ගෙ නම් මතක් වෙලා අංජලිත් එක්ක කිව්වොත් වැඩේ මදල් විහාණයෝ.. අංජලී හුවර් එකටම ක්‍රිශාන්ගෙන් එදා වලිය ගැන අහනවා.."

"ම.. මං මොනද රාජ් ක.. කරන්නෙ..? ඇයි බං මටම මෙහෙම වෙන්නෙ..?"

"පැණි වරකෙටත් හෙණ ගහන්නෙ.. උඹ අවුලක් ගන්නෙපා.. අංජලී හැසිරෙන්නෙ කොහොමද කියල බලල අපි උත්තර දෙමු.. අනිත්තෙක බයවෙන්න දෙයක් නෑනෙ උඹ වැරැද්දක් කරන්නැතුව.."

රාජ් කියන දේත් ඇත්තක් තියෙනව කියල මට හිතුණා.

* * * * *

ඒත් පැයෙන් පැය ගෙවිල යද්දි රාජ් කිව්ව දේ වැරදියි කියල මට හිතෙන්න ගත්තා. අරුන්දි, අංජලීට මොන වගේ දෙයක් කියාවිද, අංජලී ඒ දේ කොහොම පිළිගනීවිද කියන එක ගැන නම් මගෙ

හිතේ තිබ්බෙ ලොකු දෙගිඩියාවක්. ඒත් ෂහනාස් ගැන මොන තරම් දේවල් අරුන්දි කිව්වත් අංජලී මාව විශ්වාස කරයි කියනෙක මගේ හිත පතුලෙම තිබ්බා. අනිත්තෙක අංජලීගෙයි මගෙයි ආදරේ මං අපවිත්‍ර කරල තිබ්බෙ නෑ කොයි වෙලාවකදිවත්.

"මොකෝ පාට්නර්.."

කල්පනා ලෝකෙ එහා කෙළවරේම ඉඳපු මං මද්දු අයියගෙ සද්දෙට ගැස්සුණා.

"මුකුත් නෑ මද්දූ.."

ෂහනාස් ගැන මෙලෝ දෙයක් මද්දු අයියට කියල නැති හන්ද මට කියන්න දෙයක් තිබ්බෙ නෑ. නැත්තං මේ හොම්බ බිම ඇනිල තියෙන වෙලාවෙ පොරගෙන් උපදේශයක්වත් ගන්න තිබුණා.

"මුකුත් නැත්තං කමක් නෑ.. ඒත් උඹ ලාවලු කාපු රිලවා වගේ ඉන්න හැටියෙන් පේනවා ටිංකිරි බාල්දියක්ම පාල විත්තිය. මොකද ඊයෙ ඊ සීන් එකෙන් අංජලීලහ කවල්ද..?"

"ඒක නම් ෂේප් මද්දූ.."

මේ වෙච්ච දේ කොහොම මද්දුට කියන්නද කියල ඇඹරෙන කොට තමයි ෆෝන් එක රිංග් වෙනව ඇහුණෙ. මං රිසීවර් එක ගන්න අත උස්සනකොටම මද්දු රිසීවර් එක ඉස්සුවා. හලෝ ගාපු ගමන් මද්දුගෙ මූණට ආවෙ ලොකු පැණි හිනාවක්. හෝදන්න දෙයක් නෑ පූජනී තමයි.

"හප්පේ.. ඉතිං.. ඉතිං.. නෑ.. හත්තිලව්වේ.. ඊට පස්සෙ.."

මුලින් මුලින් මද්දුගෙ කටහඬේ තිබ්බ පිටි එක දියවෙලා

ගියා කියනෙක ටිකක් වෙලා යද්දි මට තේරුණා. මොකක්ද දන්නෑ අවුල. පූජනී බඳින්නවත් කියනවද දන්නෑ.. කතා කරල ඉවර වෙලා මද්දු රිසීවර් එක තිබ්බා. ඒ මූණෙ තිබ්බෙ පරාජිත බවක්. පූජනී බූට් එකටත් කියලද දන්නෑ.. පව් හප්පේ.

"කවුද මද්දු කතා කෙරුවෙ.."

ඒත් මං අහපු ප්‍රශ්නෙට උත්තරයක් මද්දුගෙන් හම්බවුණේ නෑ. ලොකු කල්පනාවකින් මූණ පුරවගෙන මද්දු සැටියෙ වාඩිවුණා.

"උඹේ ජීවිතේ උඹ මට නොකිව්ව තවත් පැත්තක් තියෙනව කියල මං අදයි දැනගත්තෙ පාවිතර්.."

ඉඳල ඉඳල එකපාරටම මද්දු එහෙම කිව්වහම මං හොල්මං වෙලා ගියා. මූ මොනවද මේ කියන්නෙ..? මූට පිස්සුද..?

"පුංචි කාලෙ ඉඳන්ම උඹයි මායි හිටියෙ එකට.. ජංගි කොටේ ගහගෙන ඉඳපු දවස්වල ඉඳලා අද වෙනකම්ම උඹෙයි මගෙයි කිසිම රහසක් තිබ්බෙ නෑ.. මගේ හිත අවුල්වෙලා තියෙන වෙලාවක උනත් උඹට විහිලුවක් කරල, උඹට කුලප්පු කරල, අඩන්න වගේ ඇඳවෙන උඹේ මූණ දිහා බලන්න මා ආසා කෙරුවා. එතකොට.. එතකොට මගේ හිතේ තියෙන අවුල් ගතිය ටිංගක් හරි අඩුවෙනව කියනෙක මං දැනන් හිටියා. ඒක හරි පුදුම දෙයක්.. ඒත්.. ඒත්.."

කියාගෙන කියාගෙන ගිහින් අන්තිමේදි මද්දුගෙ කටහඬ බිඳිල ගියා. හිටපු ගමන් පාත්වුණු මේ හෙණගෙඩිය මොකක්ද කියල මට හිතාගන්න බැරිවුණා. හරියට හින්දි ෆිල්ම් එකක හොඳම හරිම බලනකොට ලයිට් ගියා වගේ.

"ඒත්.. උඹට පණ වගේ ආදරේ කරන කෙල්ල පැත්තක

ඉන්දෙද්දී වෙන කෙල්ලෙකුත් එක්ක පෙම් කෙලින්න පුළුවන් විත්තියක් මං දැනන් හිටියෙ නෑ පොඩී.. උඹ හරිම හැත වැඩක් කරල තියෙන්නෙ.."

මද්දු එකසිය ගානට කියවගෙන යනවා. මූ මොනවද දෙඩියතේ මේ කියවන්නෙ..? මූ කියවන ඒවා අහන් ඉඳල මට පිස්සු වගේ..

"මද්දු කියන්නෙ මොනවද කියල මට තේරෙන්නෑ.."

"උඹට තේරෙන්නැති එකත් හොඳයි.. තේරුමක් තියෙනව නම් මේ වගේ වැඩක් කරාවිද..?"

එහෙම කියල මද්දු සැටියෙන් නැගිට්ටා. මාව ඇට්ටි හැලෙන්න නන්නත්තාර කරල මූ යන්නයි හදන්නෙ.

"මද්දු අයියා.. කියන දෙයක් කෙලින් කියනවකො.. මගෙ ඔලුවත් රිදෙනවා.."

"එදා අර මුස්ලිම් කෙල්ල ආපු දවසෙ ඒකි ගැන මං උඹෙන් ඇහුවා. උඹ ලස්සනට කතන්දරේ මග ඇරියා. උඹේ බර්ත්ඩේ එකට අර තරම් වටින බ්‍රේස්ලට් එකක් ඒකි දුන්නෙ මොකද කියල මට දැනුයි තේරෙන්නෙ. දෙන්නෙකුට ආදරේ කරල කවදාවත් දිනන්න බෑ පොඩී.. පරාද වෙන එකම කෙනා උඹ.."

"මද්දු ඔයා මාව මිස්අන්ඩස්ටෑන්ඩ් කරලා.."

"මිස් අන්ඩස්ටෑන්ඩ් කරන්න දෙයක් නෑ.. දැන් ෆෝන් කෙරුවෙ අංජලී.. මටත් හොඳටම බැන්නා.. විහඟගෙ මූණ ලස්සන වුණාට හිත ඒ තරම් ලස්සන නෑ කියල කියන්න කිව්වා.."

මද්දු කිව්ව ඒ වචන විසාට මගේ ඇස්වලට කඳුළු ආවා. දෙ..

දෙයියනේ.. ඇයි ලංගී.. ම.. ඔයා ඒ වගේ දෙයක් කිව්වෙ.. මගේ ආදරේ වෙනසක් වුණේ නෑනෙ රත්තරං.. ඇයි ඔයා එක පැත්තකින් විතරක් හැමදේම දිහා බලන්නෙ.

"ම.. මද්දූ..?"

හිතට ආපු වේදනාව වැඩිකමට මගේ වචන හිරවුණා. ඒ වෙලාවෙදීමයි මද්දූ මගේ අතින් අල්ල ගත්තෙ.

"මට තේරෙනවා පාට්නර්.. උඹේ ජීවිතේ මට කියපු නැති ඇත්ත කියන්නනෙ උඹ හදන්නෙ..? මෙච්චර දවසක් නොකිව්ව කියල මගේ තරහක් නෑ.. හිතට ඩිංගක් දුකයි.. කමක් නෑ.. හැමදේම කියපං.. මං අහන් ඉන්නම්.."

මගේ හිත අන්තිම දශමෙට තේරුම් අරගෙන මද්දූ කිව්වා. ඒකෙන් මගේ හිතට පුංචි සහනයක් දැනුණා. ඒක හන්දම මං ෂහනාස් ගැන හැම විස්තරයක්ම මද්දූත් එක්ක කිව්වා. රාජ්ලගෙ මාමලගෙ ගෙදර තිබ්බ වෙඩින් එකේදි ෂබී බීම ට්‍රේ එකක්ම මගේ ඇගේ හලපු හැටි, ෂබී ගෙදරින් තරහා වෙලා රාජ්ලහ ආව හැටි, ෂබීලගෙ ෆැමිලි එකම නුගේගොඩ පදිංචි වුණු හැටි, ෂබීත් එක්ක පිටකොටු ගියපු හැටි, ගෝල්ෆේස් පිට්ටනියෙදි ෂබී මට ආදරෙයි කියපු හැටි, ක්‍රිෂානුයි නියාසුයි වලියට ආවහම අරුන්දි මාවයි ෂබීවයි බේරගත්තු හැටි, ඊයෙ අංජලිට අරුන්දිව හම්බවෙලා වෙච්ච දේවල් ඔක්කොම මං කියවන් ගියා.

"ඔය මං කියපු හැම දෙයක්ම ඇත්ත මද්දූ අයියෙ.. මං ඔයාට බොරු කියන්නෙ නෑ.. ෂබී ගැන ලොකු බැඳීමක් මගේ හිතේ තියෙනවා. අංජලිව හම්බවෙලා තිබ්බෙ නැත්නං මං ඒ කෙල්ලවයි ජීවිතේට ලංකර ගන්නෙ. ඒත් අංජලී මං ගාව ඉන්දෙද්දී මට ආදරේ

කරද්දි ඒ වගේ දෙයක් කරන්න තරම් බල්ලෙක් නෙමෙයි මද්දු.. අංජලී ඔයාට කිව්වෙ මොනවද කියල මට කියන්නෙ.."

හිතේ තිබ්බ දුකෙන් හිත හිරවෙලා යද්දි කතා කරන්න ඕන වචන හොයාගන්න මං ලොකු උත්සාහයක් ගත්තා.

"අංජලී කතා කරද්දි මං මුලින් හිතුවෙ ජෝක් එකට කියලා. ඒත් පස්සෙ තමයි තේරුණේ ලොකු අවුලක් කියලා.."

මද්දුව ඊට එහා කතා කරන්න හම්බවුණේ නෑ. එකපාරටම ඉස්සරහ දොරෙන් මතුවුණේ රාජ්. කඩේ වැඩත් තියෙද්දි මූ මොකද මෙහේ..? මායි මද්දුයි උගේ මූණ දිහා බැලුවෙ තරහෙට වගේ. ඒත් වෙනද තියෙන හිනාව ඒ මූණේ තිබ්බෙ නෑ.

"මොකෝ තම්බියො මේ..?"

හැමදේම අමතක කරලා වගේ මද්දු, රාජ්ගෙන් ඇහුවා.

"හරි හත්තිලව්වනෙ මද්දූ.. මෙන්න මූගේ වැඩ නින්ද මටත් කෙලවෙලා.."

ඌ මගේ දිහාට ඇඟිල්ල දික්කරා. ඒ පාර මොකක්ද දන්නෑ බාල්දිය.. දැන් එක බාල්දියක් පෙරලිලා තාම කෙලින් කර ගත්තෙවත් නෑ. මූ මාව නැති කරන්න වගෙයි හදන්නෙ..

"හරි.. හරි.. කලබල නැතුව වාඩිවෙයන්.. මොකෝ පොලීසියෙන් පැනල උඹේ වීඩියෝ සීඩී ටික සීල් තිබ්බද..?"

"එහෙම නම් හිතට දුකක් නෑ.. බලපං.. අංජලී මට ෆෝන් කරල කුණුවෙන්න බැන්නනෙ.."

රාජ් එහෙම කිව්වහම මං ගැස්සිලා ගියා. මේ මොනවද දෙයියනේ වෙන්න යන්නෙ..? හීනෙකින්වත් හිතපු දෙයක්ද මේ..?

"උ.. උඹට මොකවද අංජලී බනින්නෙ..?"

"බ.. බනින්නෙ..? උඹයි සහනාසුයි යාලු කෙරුවෙ මමලු.. ෂිහ්.. මට මාර අප්සෙට්.. උඹ කියන්නෙ මද්දුවෝ.. ඒකි මට දෙමළෙනුත් බැන්නා බං.. ෂිකෝ කවදාවත් කෙල්ලෙක් මට එහෙම කතා කරලා නෑ.. මගේ ලව් එකක් නම් අම්මපා මං ටෙලිෆෝන් එක පොලේ ගහනවා.. ආයෙ දෙකක් නෑ.."

"පල්ලිවල ලවුඩ්ස්පීකර් දානවා වගේ සද්දෙට කෑගහන්නෙපා බං.. මේක ගෙයක්.. සාමකාමී නිවසක්.. ප්ලීස්.. ටිකක් සන්සුන් වෙලා වෙච්ච දේ කියපං.."

රාජ්ගෙ අතකින් ඇදල මගේ ළඟින්ම වාඩි කරවන ගමන් මද්දු කිව්වා.

"දවසක් හරි කතා කරලා තියෙන හන්දා මං ඉවසුවා. බලපං ම.. මං මුට ෂබ්බ සෙට් කරාලු.. ජාතියට මං ඇද්දලු.. මංලු සපෝටර්.. ඒකි කියපුව කියන්න බෑ මචං.. හිතට දුකයි.. මං.. මං මෙන්න මේ මෝල් වගන්සේට කිව්වා අන්තිමට මය ටික වෙයි කියලා.."

"ඒ ටික වෙනව කියල මං මැරෙන්නද රාජ්.. අංජලී නැව්ට පාගගෙන දැඟලුවට උඹ මගෙන්නෙන්න ෂරොප්පුවෙලා හරියන්නෙ නෑනෙ බං.."

"මේ.. උඹල දෙන්නා මෙතන පුත්තලං බූරුවෝ දෙන්න වගේ

ඇරගෙන වැඩක් නෑ.. කතාව නවත්තලා මේ අවුල විදාන්න බලපියව්.."

"උඹ නම් මෙහන ඉඳගෙන කියයි.. මට වචනයක්වත් කතා කරන්න නොදී තමයි ඒකි බැනගෙන බැනගෙන ගියේ. අඩුගානෙ මට හලෝ කියන්නත් හම්බවුණේ නෑ බං.."

"අංජලීට බය තරම් උඩ පනින්න දෙයක් වුණේ නෑ රාජ්.. හරියට ඒකිට තරහ ගිහිල්ලා තියෙන්නෙ මායි ෂබ්යි එකට ඇඳේ හිටිය දැකල වගේනෙ. මටත් මල පනිනව බං මේවට.. බොක්සෙන් ලව් කරා කියලා ඒකිට වටින්නෑ උඹට බනින්න.. හරි නම් බනින්න ඕන මටනෙ.."

"උඹයි ෂබ්යි එකට හිටියද නැද්ද කියනෙක මං දන්නෑ.. ඒව දන්නව ඇත්තෙ උඹලමනෙ.. කරුණාකරලා අංජලීට දැන්මම ෆෝන් කරපං.. කරල ඉවීරවෙලා මේ හරුපෙ තේරුම මොකක්ද අහපං.."

මූණත් හොඳටම හකරුස් කරගෙන අන්තිමට රාජ් කිව්වා. ඌට ඇව්වි හැලෙන්න මල පැනල කියනෙක මට තේරුණා. බොක්සෙන් කරන ලව් එක හන්ද ජංගි කොටේ ගහන කාලෙ ඉඳල තිබ්බ ෆ්‍රෙන්ඩ් ෂිප් එකටත් බතා හම්බවෙයිද දන්නෑ.. පරක්කු වෙලා බෑ.. මිං දඩබඩ ගාල අංජලීගෙ ෆෝන් නම්බර් එක ඩයල් කරා..

"හෙලෝ.."

ඒහා පැත්තෙන් අංජලීගෙ කටහඬ මට ඇහුණා.

"ඌංහි.. මං මේ විහඟ කතා කරන්නෙ.. පුළුවන් තරම් ඉක්මනට මට ඔයාව හම්බවෙන්න ඕන.."

"අ.. අපිට තවත් හම්බවෙන්න තරම් දෙයක් ඉතුරුවෙලා තියෙනවද අයියා..?"

"ෂු.. ඔයාට මොනවද උංගි මේ වෙලා තියෙන්නෙ..? මෙච්චර හොඳට ඉඳල එකපාරටම ඇයි මේ..? මොකක් හරි ප්‍රශ්නයක් තියෙනව නම් කතා කරල විසඳගම්මු.. ඔයා රාජ්ටත් ෆෝන් කරල බැනලා.. මද්දුටත් එක එක ඒවා කියලා. ඇයි මේ..? හිටපු ගමන්.. අනිත්තෙක මද්දුවත් රාජ්වත් අපේ ප්‍රශ්න වලට පලි නෑ.. පිස්සු නටන්නැතුව හොඳ ළමයා වගේ මාව හම්බවෙන්න.."

කියන්න මහ හුඟාක් දේවල් තිබ්බත් මං කතා කෙරුවෙ හුඟාක් වචන තෝරල බේරල.

"අරුන්දි හම්බ වෙනකන් මාත් මුකුත් දන්නෑ තමයි අයියා.. ඔයිට හුඟාක් කලින් ක්‍රිෂාන් ඔය ගැන කියද්දි මං ගණන් ගත්තෙවත් නෑ.. අඩුම ගානෙ ඔයා මට නිසංචිත් ෂහනාස් කෙනෙක් ගැන කියල තිබ්බෙ නෑ.. ඒ ඔයාගෙ අවංකකමද අයියා..?"

"හොඳ ප්‍රශ්නයක් ඔයා ඇහුවෙ..? ඒ ළමය ගැන කියන්න තරම් දෙයක් නෑ උංගි.. ඔයා හිතන විදියෙ සම්බන්ධයක් මායි එයයි අතර නෑ.. ඔයා ඇයි මාව තේරුම් ගන්නෙ නැත්තෙ.. මෙච්චර කාලයක් මං ළඟ ඉඳපු ඔයාට මගේ අවංකකම ගැනත් ප්‍රශ්නයක් අන්තිමට ඇවිල්ලා.."

"අන්තිමට ආවෙ ඇයි කියනෙකට උත්තර තියෙනව අයියේ.. මේ මුළු ලෝකෙ හැමෝටම වැඩිය මං ඔයාව විශ්වාස කරා. ඒත් ඔයාම ඒ විශ්වාසෙ බිඳල තියෙද්දි මට තවත් ඉවසන්න බෑ.. මං.. මං මැරෙනවා.. සත්තයි.. විහඟ අයියේ මං මැරෙනවා.."

"උංගි.. ප්ලීස්.. ම.. මං කියන දේ අහන්න ළමයො.. මෝඩ වැඩ නම් කරගන්නෙපා.. මැරෙන්න තරම් දෙයක් මෙතන වෙලා නෑ.. මං ඒ ළමය එක්ක යාලු නෑ.. මං මේ ඇත්ත කියන්නෙ.. මට මීට වැඩිය ඔයාට පහදන්න තේරෙන්නෙ නෑ.. මං.. මං මොනවද කරන්න ඕන උංගි.. ප්ලීස්.."

"ඔයාට තවත් කරන්න දෙයක් නෑ අයියා.. ඔයා පුදුම තරම් දක්ෂ කෙනෙක්.. අපි දෙන්නටම ආදරේ කරන්න තරම් ශක්තියක් ඔයාට තිබ්බා. මට දුක මං මෝඩියක් වගේ හැසිරිච්ච එකටයි. ඊට වැඩි දෙයක් නෑ.."

අංජලී එහෙම කියද්දි නම් මගේ හිතට ලොකු කෝන්තියක් ආවා. ඒ කෝන්තිය පිටින්ම මං කතා කරන්න ගත්තා.

"උංගි.. මට තවත් මේ ගැන පහදන්න බෑ.. ඔයාට මොනවද කරන්න ඕන.. මාව ටෙස්ට් කරන්නද..? මං මෙච්චර නෑ කියල කියද්දි ඔයා මං තව කෙල්ලෙක් එක්ක යාලුයි කියලා කියන්නෙ, ඔයා මොනවද මගෙන් බලාපොරොත්තු වෙන්නෙ..?"

"බලාපොරොත්තුවලට වුණු දේ නම් අහන්න එපා අයියා.. ඔයා දන්නෑ.. මං සහනාස්ව හම්බවෙන්න ගියා.. ඔයාගෙ ලොකු ෆොටෝ එකක් එයා ළඟ තියෙනව මං දැක්කා. ඔයාගෙ බර්ත්ඩේ එකට එයා බ්‍රේස්ලට් එකක් දුන්නා කියලත් මං දන්නවා.. ඔයාලා රාජ්ගෙ ගෙදරදි හම්බවුණා කියලත් මං දන්නවා.. රාජ්ගෙ අක්කා ඔයාලට උදව්කරා කියලත් මං දන්නවා.. ඔව් අයියා.. මං මෝඩ කෙල්ලෙක් වගේ ඔයාගෙ අතේ එල්ලිලා හුඟාක් දුර ඇවිද්දා. ඒත් මං දන්නැත්තෙ ඔයාලා දෙන්න මැරී කරන දවස විතරයි. දෙයියනේ..

ඇයි..? ඇයි මට මෙහෙම කරේ.. අනේ රත්තරං.. විහඟ අයියේ.. ඇයි මට මෙහෙම කෙරුවෙ..?"

අන්තිමට අංජලී එහා පැත්තෙන් ෆෝන් එක තියන සද්දෙ මට ඇහුණා. රාජ්ගෙයි මද්දුගෙයි මූණුවල් දිහා බලන්නෙ නැතුවම මං අත් දෙකෙන් මූණ වහගත්තා.

"මොකෝ විහඟ..?"

"හැමදේම ඉවරයි රාජ්..? හැම සතුටක්ම ඉවරයි.. තවත් අංජලීට පහදල දෙන්න බෑ.. මගේ පුංචි ලෝකෙ ආයෙත් බිඳිල ගියා බං.. කමක් නෑ.. සුද්දත් කියල තියෙනවනෙ ට්‍රයි කරන්න කියලා.. ඕන දෙයක් වෙච්චාවෙ තවත් පාරක් මං ට්‍රයි කරනවා.."

මං එහෙම කියල රාජ්ගෙන් යතුර අරගෙන මිදුලට ඇවිත් බයික් එක ස්ටාර්ට් කර ගත්තා.

"ඒ.. ඒ.. කොහෙද පොඩි යන්නෙ..?"

මද්දු අයියගෙ කටහඬ මට යාන්තමට ඇහුණත් මං හැරිල බැලුවෙ නෑ. බයික් එකේ ඇක්සලේටරය කරකවන ගමන් මං ඉගිලෙන්න ගත්තා. ඒ අංජලීව හම්බවෙලා මේ ප්‍රශ්නෙ ඉවරයක් කරගන්න. මට ඇහුණෙ සුළං කපාගෙන යන සර සර සද්දෙ විතරයි. දාහත් කල්පනා වලින් මුළු හිතම පිරිල යද්දි මගේ මූණටම ආපු තෙල් බවුසරේ මං දැක්කෙ යාන්තමට වගේ. ඒත් ඒ වෙනකොට මං හුඟාක් පරක්කු වෙලා තිබුණා. තත්පරයකටත් අඩු කාලයකදී මාව තෙල් බවුසරයෙ ඉස්සරහ වදිනවා මගේ මතකයෙ අන්තිමට ඉතුරු වෙලා තිබුණා.

* * * * *

සුදු පාට, දම්පාට, රතු පාට වගේ නොතේරෙන මහා හුඟක් රූප හිත ඉස්සරහ මැවෙද්දි මං ඇස් ඇරියා. සුදු මීදුමක් වගේ මොකක්දෝ එකක් මැද්දෙන් මිනිස්සු හරි හරියට එහෙම මෙහෙට වෙනව මං දැක්කා. කවුරු හරි මගේ අතක් තද කරල අල්ලන් ඉන්නවා කියල මට දැනුණත් ඒ කවුද කියල මට පැහැදිලි වුණේ නෑ. මුළු ඇඟම පණ නැතිවෙලා යද්දි මං ඒ අඳුරු ලෝකෙ නැතිවුණා.

"එයාට දැන් කොහොමද..?"

කවුදෝ එහෙම අහනවා මට හීනෙන් වගේ ඇහුණා.

"කලින් පාරක් සිහිය ආවා. එච්චරම සීරියස් ඩැමේජ් නෑ.. කම්පනයට සිහිය නැතිවෙලා.."

ඒ බිද්දිට කටහඬ කාගෙද කියලවත් මට තෝරගන්න බැරිවුණා.

"එයාට කරදර කරන්න එපා.."

තවත් කවුදෝ කිව්වා. ඒ එක්කම වගේ ලොකු නිදිමතකින් මගේ ඇස් පියවෙන්න ගත්තා. ආයෙමත් මං ඇස් ඇරල බලනකොට මගේ ඉස්සරහ ඉන්න අම්මව මං දැක්කා. අම්මගෙ ඇස්වල කඳුළු.

"පොඩී.. බයාට කොහොමද මගෙ පුතේ..?"

අම්මා මගේ අතින් අල්ල ගත්තා. අම්මට පිටිපස්සෙන් මද්දු අයියා, ලොකු අයියා, අචිනි අක්කා, ශ්‍රී රාජ්, මහනාස් ඉන්නවා මං දැක්කා.

"දැ.. දැන් නම් ඒ තරම් අමාරුවක් නෑ අම්මා.. ඉ.. ඉස්සරහින් ආපු වාහනේ මං දැක්කෙම නෑ.."

"දෙයියො බලලා.. මයින් ගියා ඇති පොඩ්.. කොහෙද.. පිස්සු වගේ පාර පුරාම පැදලනෙ.. මේ දවස් ටිකට මාවයි, ලොකු අයියවයි අම්මට පේන්න බෑ.. මරන් කැවෙ නැති ටික විතරයි.."

මද්දු අයියා සුපුරුදු අදෝනාව පටන් ගත්තා. මූ මේක ඉස්පිරිතාලයක්වත් කියල බලන්නැති එකනෙ වැඩේ.

"මං එපා කියද්දිනෙ ඔය බයිසිකල් කටුව ගෙනැල්ල දුන්නෙ.. හැබැයි මද්දු.. ආයෙ ඔය බයිසිකලේ හැදුවොත් හෙම මං ඔයාව ගෙදරින් එලවනවා..."

අම්මා මගේ මූණ දිහා බලල ආදරෙන් කියද්දි මද්දු අයියගෙ මූණ බෙරි වුණා. හොඳ වැඩේ ඕකට. මං මේ අඬු කඩාගෙන ඉන්දෙද්දිත් මූ මට පාට් එක දාන එකනෙ වැඩේ.

"කොහොමටත් තුවාල හොඳ වෙනකල් තව දවස් හත අටක්වත් එක තැනකට වෙලා ඉන්න වෙයි.."

ලොකු අයියා එහෙම කිව්වහම මට හීන්දාඩිය දැම්මා. මගෙ අම්මෙ... දවස් හත අටක්.. එතකොට අංජලිගෙයි මගෙයි ප්‍රශ්න විසඳන්නෙ පොලීසියෙන්ද..? මේවා ලොකු අයියට නොතේරෙන එකනෙ වැඩේ.. ටිකකින් හවසටත් එනව කියල ලොකු අයියයි, අම්මයි අචිනි අක්කයි යන්න ගියා. ඊට පස්සෙ තමයි මට හොඳ සිහිය ආවෙ.

"රාජ්.. අංජලී ආවද මාව බලන්න..?"

මෙච්චර වෙලා පිටිපස්සෙ ඉඳපු රාජ්ගෙන් මං ඇහුවා.

"තුන්පාරක් ආවා. ඒ හැම පාරකම උඹට සිහිය නෑ. අඬල

වැළපිලා මෙතන මළ ගේ කරල ගියේ. පිස්සු හැදෙනවා මචං.. මාර කට්ටක් මේ දවස් ටිකේ අපි කෑවෙ..."

"ඇයි.. ඊට හපන් මෙන්න මේක.."

එහෙම කියල මද්දු ෂහනාස් දිහාට ඇඟිල්ල දික් කරා. ෂහනාස්ගෙ මූණ ලොකු ලැජ්ජාවකින් පිරිල යද්දි එයා බිම බලා ගත්තා.

"අම්මා අහන එලෝ කෝටියක් ප්‍රශ්න වලට උත්තර දෙන්න ඕන මරයි මූයි.. ඒ අස්සෙ උඹේ මේ මුස්ලිම් බේබි අඩනවා මහවැලි ගංගාව වගේ. කොච්චර එපා කිව්වත් අහන්නෑ.. හප්පොච්චියේ.. අපි වින්ද වදයක්.. උඹ නම් අපිවම කන්න ඉපදුන එකෙක් පාට්නර්.."

"ඇයි මද්දූ අයියා..?"

"හැයි අහන්නෙ.. බලපං අර බයිසිකලේ ආයෙත් අටපට්ටං කරා.. දැන් අම්මා උඹටයි මටයි විහිලුවටත් පුස් බයිසිකල් කට්ටක්වත් පදින්න දෙයිද..? උඹ මෙහේ හැම තැනම ප්ලාස්ටර් දාගෙන.. හයියෝ කියල වැඩක් නෑ.."

"වි.. විහගට බනින්නෙපා.. අ.. අයියේ.. එ.. එයා අහිංසකයි.."

මද්දුගෙ පිටිපස්සෙන් ෂහනාස්ගෙ කටහඬ ඇහුණා. මද්දූ පුදුම වෙලා වගේ ෂහනාස් දිහා බැලුවා. පව්.. ෂහනාස්ගෙ නිල් පාට ඇස් දෙකම කඳුළු වලින් පිරිල ගිහිල්ලා. එයා හිත් සිරුවෙ මං ළඟට ආවා. මට ඒ පුදු මූණෙන් ඇස් අහකට ගන්න හිතුණෙම නෑ.

"අ.. අයියා.. ඔ.. ඔයාට වෙච්ච මේ දේවල් වලට මමත්

වගකියන්නෙත දෙයියනේ.. ඇයි.. ඇයි.. ඔයා මේ වගේ දෙයක් කරගන්නෙ.. තව ඩිංගක් ඒහාට මෙහාට උනා නම් හෙම..?"

"ඔයා මේවට පලි නෑ ෂබී..! අංජලී මාව නිකරුනේ මිස් අන්ඩස්ටෑන්ඩ් කරල.. එදා මං ගියේ එයාව හම්බවෙලා මේ හැම දෙයක්ම තේරුම් කරල දෙන්න.. ඒත් ඊට කලින් අර තෙල් බවුසර්කාරයා මට හම්බවුණා.."

"ච්.. විහිලු කරන්නෙපා අයියෙ.. ඔයා දන්නෑ මගෙ හිතේ පත්තු වෙච්ච ගින්දර.. මං දෙයියන්ගෙන් කොයි තරම් ඉල්ලුවද ඔයාට මුකුත් වෙන්නෙපා කියලා.."

ෂහනාස් හෙමින් සැරේ කිව්වා.. මද්දුවයි, රාජුයි මගේ ඇඳට එහා තියෙන කබඩ් එක ගාවට වෙලා අහන් ඉන්නවා.. මුන් දෙන්නා දැන් ෂහනාස් ගියාට පස්සෙ මාව මස්කඩේ කොක්කෙ එල්ලාවි.

"මේකනෙ ෂබී.. එදා ගෝල්ෆේස් එකේදි අරුන්දි අපි දෙන්නව කාර් එකේ දාන් ආපු එක..."

"නෑ.. නෑ අයියෙ.. රාජ් අයියගෙ අක්කා අමානිව හම්බවෙලා අංජලීට.. අමානි හිතන් ඉඳල තියෙන්නෙ මායි ඔයයි යාලුයි කියලනෙ. ඉතිං හැම දෙයක්ම අනිත් පැත්තට තමයි කියවිලා තියෙන්නෙ.. ඔයාට දුන්නු බර්ත්ඩේ ප්‍රසන්ට් එක ගැනත් මං අමානි අක්කත් එක්ක කියලයි තිබ්බෙ.. එයා ඒකත් අංජලීට කියලා.. මං ළඟ තියෙන ඔයාගෙ ෆොටෝ එක ගැනත් කියලා.. අනේ මංදා අයියා.. ඕව ගැන වැඩිය හිතන්නෙපා.. ඉක්මනට සනීප වෙන්නකෝ.."

ෂහනාස් මගේ අතින් අල්ලා ගත්තා. ඒ රෝස පාට ඇඟිලි

අනේ හැවරෙද්දි මගේ මුළු හිතම සීතල වෙලා ගියා. මද්දු අයියයි, රාජුයි සද්ද නැතුවම කාමරෙන් එළියට ගිහින් තිබුණා.

"ඕ.. ඔයා හරි හොඳයි ඝබී.."

"ත්.. තැන්ක්ස් අයියා.. ඔයා ඇක්සිඩන්ට් වෙලා ආසිරි එකට ගෙනාවා කියල ආරංචි උන ගමන් මාත් දුවන් ආවා. එතකොටම කවුද කෙනෙක් 'හී ඉස් ඩෙඩ්' කියනව වගේ මට ඇහුණා. මං කෑගහල ඇඩුවා. පස්සෙ රාජ් ඇවිල්ල කිව්වා ඔයාට එච්චර ඩැමේජ් එකක් නෑ කියලා.."

ඔහේ කතා කරගෙන යද්දි මං ඒ ඇස්දෙක දිහාම බලන් හිටියා. ඒ වෙනකොට අංජලී රිද්දල රිද්දල තුවාල කරපු හිතේ කැළැල් සෑහෙන්න වැඩිවෙලා තිබ්බා. ආයෙමත් අංජලී මාව බලන්න ආවහම ඒ හැම දෙයක්ම නැතිවෙලා යාවි කියල මගේ හිත මට කිව්වා. ඒ එක්කමයි මගේ නළලට උණුසුම් තොල් පෙති දෙකක පහස දැනුණේ. මං ගැස්සිලා ගියා. මගේ මූණ උඩින් තනාෂ්ගෙ සුදු මූණ හඳ පලුවක් වගේ පායල තිබ්බා. ඒ ඇස් දෙක මගෙන් ජීවිතයයි ඉල්ලන්නෙ.. ඒත් මාව අයිති අංජලීටයි ඝබී.

"ඉක්මනට සනීපවෙන්න රත්තරං.."

එහෙම කියල එයා යන්න හැරුණා. මගේ ඇසුත් ඒ එක්කම කාමරේ දොර ළඟට වෙනකන් දුවල ගියා. දෙයියනේ.. කාමරේ දොර ගාව දොඩම් ගෙඩි වගයකුයි ලොකු ප්ලාස්ක් එකකුයි අතේ තියාගෙන අංජලී ඉන්නව මං දැක්කෙ හීනෙන් වගේ. ඒ ඇස්වල කඳුළු පිරිලා, කම්මුල් දිගේ බේරෙන්න පටන් අරන් තිබුණා. ඒ දැකපු දෙයින් මගේ හිත නතර වුණා වගේ. මේ මොකක්ද දෙයියනේ මේ වුණේ.. දැන් අංජලී මාව තවත් වැරදියට තේරුම් ගන්නවා

කියනෙක පොල්ලෙන් ගැහුව වගේ මට තේරුණා. අංජලීගෙ පිටිපස්සෙන්ම රාජුයි මද්දූ අයියයි කාමරේට එබුණා. ඇහට අමාරු වුණත් මං කොට්ටෙ ඇඳ විට්ටමට හේත්තු කරල ඒකෙ හාන්සි වුණා. එහාදේකට මූණ දෙනවා කියල මං හිතාගත්තා.

"මං.. මං වැරදි වෙලාවකද ඇවිත් ති.. තියෙන්නෙ..?"

මං දිහායි ෂහනාස් දිහායි සැරින් සැරේ බලන ගමන් අංජලී ඇහුවා. එයාගෙ අතේ තිබ්බ පාර්සල් එක ඇඟිලි වලට මිරිකිලා. සුදු මූණ රතු පාටට හැරිලා. උඩු තොල උඩ දාඩිය බිංදු පේලියක්ම දාලා. ඒ රේස්පාට තොල් පෙති වෙව්ලනවත් මං දැක්කා.

"උං.. උංහි හිනව් පාස් කරන්නෙපා රත්තරං.. මං ඔයාට කොයි තරම් ආදරේද කියල ඔයාට ඔප්පු කරල පෙන්නන්න ඕනද..?"

"ඔයා මට ඒ තරම් ආදරේ හින්දද අයියා, ෂහනාස් ඔයාව ඉම්බෙ.. එහෙම ඉඹිනකල් ඔයා බලන් හිටියෙ..?"

හෙණ ගහන්න වගේ අංජලී මගෙන් ඇහුවා. ඒ ප්‍රශ්නෙට දෙන්න උත්තරයක් නැතුව මගේ තොල කට වෙලිලා ගියා. ඒත් ෂහනාස්ට එහෙම වෙලා තිබ්බෙ නෑ.

"අංජලී.. මං කරපු දේ වැරදියට හිතන්නෙපා.. අම්මා කෙනෙක් පුතෙකුට සනීප වෙන්න කියල නලල ඉඹල ප්‍රාර්ථනා කරනව වගේ මං විහඟට ඒ දේ කරේ.. එහෙම නැතුව වෙන අදහසකින් නම් නෙමෙයි.. අනිත්තෙක විහඟගෙ ආදරේ ඔයා.. මම නෙමෙයි.. ඒක තේරුම් ගන්න.. විහඟගෙ මුළු ලෝකෙම ඔයා.."

මද්දූයි, රාජුයි තන්නත්තාරවෙලා බලන් ඉන්නවා. හින්දි ෆිල්ම්

එකක හොඳම හරිය යනව වගේ. උන් දෙන්නටම කතා කරගන්න වචන නෑ. උන් නිකම්ම නිකං ප්‍රේක්ෂකයො වෙලා. කොහොම උනත් මට සහනාස් ගැන ආවෙ ලොකු පැහැදීමක්. දැන් කිව්ව වගේ දෙයක් කියන්න එයාට කොයි තරම් ලොකු ආත්ම ශක්තියක් තියෙන්න ඕනෙද..?

"ඔයා ඔය මොන තරම් දේවල් කිව්වත් පහුගිය දේවල් දිහා බලල මං කොහොමද හිතන්නෙ විහඟ මට විතරක් ආදරේ කරා කියලා.. ඒක බොරුවක්.. විහඟ ඔයාටත් ආදරේ කරා. ඔයත් විහඟට ආදරේ කරා. ඒක නෑ කියල කියන්න ඔයාල දෙන්නටම බෑ.. මේ හැමදෙයක්ම අන්තිමට දැනගත්තෙ මමයි.. ඒ කියන්නෙ පැරදිල ඉන්නෙ මමයි.. අ.. අනේ ඇයි විහඟ මට.. මට මෙහෙම කරේ..? මද්දු අයියා.. ඔයාලත් මේවට වග කියන්න ඕන.."

කියවගෙන කියවගෙන ගිහිල්ල අංජලි මද්දු අයියටත් බර බරයක් දැම්මා.. මද්දු අයියගෙ මූණ මහත්වෙනව මං දැක්කා. පොරට කදවුණා වගේ.

"අංජලි.. ඔයාට තේරෙන්නෙ නැත්තං මට කරන්න දෙයක් නෑ.. එදා විහඟ පෝන් එකෙනුත් ඔය ගැන කියනව මං අහගෙන.. දැනුත් කිව්වා. සහනාසුත් කිව්වා.. එයාලා දෙන්න අතරෙ එෆෙයාර් එකක් නෑ කියල එයාලා දෙන්නම කියද්දි මොකක්ද නංගි ඔයා මේ කරන්න හදන විකාර වැඩේ.. මට නම් තේරෙන්නෙ නෑ.. විහඟ ආදරේ කරන්නෙ ඔයාට විතරයි.."

"ඒ.. එයා මට විතරක් ආදරේ කරාට සහනාස්ට ළංවෙලා ඒ ආදරේ හැල්ලු කරා.. ඒකයි මට දුක.. එයාගෙ හිතේ සහනාස් ඉන්නවා.."

"ප්ලීස් අංජලී.. ආයෙත් ඔය කතාව කියන්නෙපා.. මාව බඳින්න අපේ ජාතියෙ කොපමණ ඉන්නවා.. ගෙවල්වලිනුත් දන්නවා.. තව මොනවද ඔයාට ඕන..? ඔයා ඇයි මේ අනවශ්‍ය දෙයක් ගැන හිත හිතා විහඟට වද දෙන්නෙ..? එයාට මානසික විවේකයනෙ දැන් ඕන.. අඩුගානෙ එයා ඇක්සිඩන්ට් වෙලා ඉන්නෙ කියලවත් හිතන්න.."

ෂහනාස් ඒ ටික කිව්වෙ කෙලින්ම මං දිහා බලාගෙන. ඒ කියන්නෙ ඔයා මැරී කරන්න තීරණය කරා.

"විහඟට වද දෙනකොට ඔයාට හුඟාක් දුකයි වගේ නේද ෂහනාස්..? ඔයාට විහඟට ආදරේ නැත්තං ඔයා මොකටද ඒ ගැන වදවෙන්නෙ..?"

අංජලී ඒ ප්‍රශ්නෙ ඇහුවෙ ෂහීගෙන් වුණත් මට යකා නැංගා. ඉවසනව කියල තවත් ඉවසලා වැඩක් නෑ.. බොක්කෙන්ම ආදරේ කරා කියල මගේ මුළු ලෝකෙම අංජලී උනා කියල මං මගේ පිරිමිකම නැතිකර ගන්න ඕනෙ නැනෙ. ඔයාට තවත් තේරුම් කරල දීල වැඩක් නෑ අංජලී..

"අංජලී මේ.. ඔයා දැන් මෙහෙන්ට ආවෙ මාව බලන්නද නැත්තං මාව මරාගෙන කන්නද..? ප්ලීස්.. මට තවත් වද දෙන්නෙ නැතුව මෙතනින් යන මගුලක යනවා, මගේ ඇස්වලට පේන්නැති වෙන්න.."

ඒ වෙනකොට මට උපරිමයෙන් මල පැනල තිබුණා. මං කියපු දේ අදහගන්න බැරුව වගේ අංජලී ටිකක් වෙලා මං දිහා බලන් හිටියා. ඒ ලොකු ඇස්වලට දොඹ ගෙඩි වගේ ලොකු කඳුළු බිංදු එක්කහු වෙන හැටි මං දැක්කා. ඒත් වෙනදට අංජලීගෙ කඳුළු ඉවසරහ උණුවෙන මගේ හිත ඒ වෙලාවෙ උණුවුණේ නෑ. ෂහනාස්

එයාගෙ අතින් අංජලීගෙ කඳුළු පිහදාන්න හැදුවත් මූණ හොඳටම නපුරු කරගෙන එයා ඒ අත ගසල දැම්මා.

"ඔ.. ඔයාගෙ ඇස්වලට පේන්නැති වෙන්න මං යන්නම් අයියෙ.. ඔයා මට එහෙමනේ කිව්වෙ.. මෙච්චර කාලයක් ඔයා ළඟින් ඉඳගෙන ආදරේ කරපු මට අන්තිමට ලැබිච්ච ඒ වචන ටික හොඳටම ඇති රත්තරං.. මං මගේ ජීවිතේ පුරාම ආදරේ කරපු ඔය මූණ ඉස්සරහට මං ආයෙ එන්නෙ නෑ.. ඔයාටයි ෂහනාස්ටයි මං අමාරුවෙන් හරි සුබ පතනවා.."

එහෙම කියල අංජලී කාමරෙන් පිටවුණා. ඒත් ඊට කලින් රාජ් අංජලීගෙ ඉස්සරහට පැන්නා.

"හැමදේයක්ම වැරදියට තේරුම් අරන් ගියාට කමක් නෑ අංජලී.. ඒත් පස්සෙ පසුතැවිලිවෙන්න නම් එපා.. මං අන්තිම වතාවටත් බොහොම වගකීමෙන් කියන්නෙ.. විහඟ ආදරේ කරන්නෙ ඔයාට.. ඔයා ඒ ආදරේ මැද ලොකු කලු පැල්ලමක් තියලයි ඔය යන්නෙ.. අනිත්තෙක ඔයා ෂහනාස්ටයි විහඟටයි විෂ් කරාට ෂහනාස් විහඟව බඳින්නෑ.. අන්න ඒක මතක තියාගන්න.. ඔයා ඔය යන්නෙ රත්තරං වටින ආදරේකට පයින් ගහල. ආපහු හැරෙන්න ඔයාට ඕනෙ තරම් වෙලාව තියෙනව අංජලී.."

අංජලීගෙ උරහිසට අත තියල රාජ් කියවන් ගියා. ඒ කියපු ටික අහන් ඉඳල රාජ්ගෙ අත හෙමිට අයින් කරලා කොරිඩෝර් එක දිගේ අංජලී යන්න ගියා. එයා එක පාරක්වත් හැරිලා බැලුවෙ නෑ. මගෙ හිතේ එච්චර වෙලා තිබ්බ කෝන්තිය දියවෙලා ගිහින් හිත ඇතුල මහා දුකකින් හුහුරු ගහනව කියල මට තේරුණා.

"අනේ.. අනේ මද්දු අයියා.. ප්ලීස්.. එයාව නවත්තන්න.. එයා

ගියොත් විහඟට උහුලගන්න බැරිවේවි.. අනේ රාජ් අයියා අංජලීව නවත්තන්න.."

ෂහනාස් මිද්දුගෙ අතේ එල්ලුණා. මං වෙනුවෙන් මේ තරම් කතා කරන මේ පුංචි කෙල්ල ගැන ලොකු දුකක් හිතේ තියෙන දුකටම එකතු වුණා.

"වැඩක් නෑ නංගි.. අපි එයාට පුළුවන් උපරිමෙන් පැහැදිලි කරා. ඔයිට වැඩිය වෙන කරන්න දෙයක් නෑ.. හැමදෙයක්ම අනාගතේට බාර දීලා අපි බලා ඉමිමු.."

"එ.. එහෙම බෑ අයියේ.. මේ බලන්න විහඟ අඩනවා.. මං මං කොහොමද ඒක ඉවසන් ඉන්නෙ.. මං.. මං මැරුණොත් මේ ප්‍රශ්නෙ විසඳේවිද...? අනේ මට කියන්න මං මැරුණොත් අංජලී විහඟ ළඟට ඒවි නේද.?"

ෂහනාස්ගෙ ඇස්වලින් කඳුළු උතුරන්න ගත්තා. අනේ දෙයියනේ මේ රත්තරං කෙල්ලගෙ මූණේ තියෙන දුක. මේ අහිංසක ඇස්වලින් උතුරල යන කඳුළු බිංදුවක් බිංදුවක් ගානෙ මට වන්දි ගෙවන්න වෙනව කියනෙක මගෙ හිතට දැනුණා.

* * * * *

kan e-community




හොස්පිට්ල් එකේ ඉඳල ගෙදර ඇවිල්ලත් මාසෙකට වැඩියි. අති සාර්ථක දෙවන මාරක රිය අනතුරෙන් පස්සෙ ජීවිතේට අමුතු අමුතු දේවල් සිද්ධ වුණා. පළවෙනි එක්සිඩන්ට් එක වෙලාවෙ හම්බවුණ අංජලී දෙවෙනි එක්සිඩන්ට් එකත්තෙක්කම මගෙන් ඈත්වුණා. ඒක මට විතරක් නෙමෙයි අපේ ගෙදර හැමෝටම හොඳටම දැනිල තිබ්බා. ඒ හින්ද වෙන්නැති කවුරුවත් මාත්තෙක්ක වැඩිය කතා කරේ නැත්තෙ.

"පොඩී.: ලියුමක්.."

ඒ සෙනසුරාදා උදේ මල්ලුවා අතින් ඒ ලියුම් කවරෙ ගන්නකොටම පපුවට මොකක්ද වුණා. ඒක ටිකක් ලොකු ලියුම් කවරයක්. ඒකෙ කොනක Wedding Invitation කියල ඉංග්‍රීසියට ලියල තිබුණා. මෙච්චර කල් කවට අන්දරේ වගේ ඉඳපු මගේ පපුව ටිකක් විතර සං සං ගෑවා. අංජලී තීරණයක් අරගෙනවත්ද..? මං දඩ බඩ ගාලා ලියුම කැඩුවා. ඝහනාස්.

"ෂහනාස් - නියාස්"

ඒ දෙන්නගෙ නම් දෙක රටාවකට ඒ කාඩ් එකේ පෙළ ගැහිලා තිබුණා. හිත රිදුනෙ ෂහනාස් බඳිනාවටද..? නෑ.. නෑ.. ඒත් ෂහනාස් මේ තීරණේ ගත්තෙ මං හින්දද..?

"දැන් සනීපනෙ.."

හැන්දෑවෙ මං බලන්න ආපු රාජ් වෙත මුකුත්ම නොකියා එහෙම ඇහුවෙ සිද්ධිය කලින් දන්න හින්ද වෙන්නැති.. මං මුකුත්ම නොකියා අංජලි මට එදා දුන්නු ශේප පාට ටෙඩියව අතට ගත්තා. අංජලී.. එයා ගියා.. ෂහනාස් බඳිනවා.. ඒ කියන්නෙ විහඟ වික්‍රමසිංහට මුළු ලෝකෙම නැතිවුණා කියනෙකද..? නෑ.. එහෙම වෙන්න දෙන්න බෑ..

"දැන් උඹේ තීරණේ මොකක්ද..?"

රාජ් කෙලින්ම මගේ මූණ දිහා බලාගෙන ඇහුවා.

"මං මොනව තීරණය කරන්නද බං.. අංජලීට ඕන දේ එයා කළා.. ෂබීට ඕන දේ ෂබී කළා.. මට කරන්න පුළුවන් වෙලා තිබ්බෙ උන් දෙන්නා කරන කියන දේවල් දිහාවෙ ඔහේ බලාගෙන ඉන්න විතරයි.."

"මෝඩයා.."

රාජ් අහක බලා ගත්තා. මළ පැහැලද කොහෙද.. කරන්න දෙයක් නෑ.. ඔය ගැන තව කතා කරන්න ගියොත් මටත් මල් සිය දාහක් පතිනවා.

"ෂබී, නියාස්ව බඳින්නෙ උඹ හින්දා. මනකනෙ උඹට ඒ

දවස්වල ෂබී නියාස් එක්ක මොන තරම් තරහකින්ද හිටියෙ කියලා. ඊයෙ ඒකි මාව හම්බවෙන්න ඇවිත් හැමදේම කිය කිය ඇඬුවා. ඊහග සම්පූර්ණ වැරැද්ද උඹ අතේ.."

කතාව ඩිංගකට නවත්තල රාජ් ගේ දිහා බැලුවා. ඊට පස්සෙ වාඩිවෙලා ඉඳපු සිමෙන්ති බංකුවෙම තවත් ටිකක් මං ළඟට කිට්ටු වුණා. මට මුගේ අණ්ඩර දෙමළ තේරෙන්නෙ නෑ.

"ඒ දවස්වල අංජලියි, ෂබියි දෙන්නම එකසිය ගානට උඹට ට්‍රයි කරා.. උඹ උන් දෙන්නවම කඩේ යව යවා හිටියා.."

"උඹට පයිත්තියංද යකෝ.. මං ආදරේ කළේ අංජලීට.."

"හරි.. උඹ අංජලීට ආදරේ කළා.. ෂබීට ආසා කළා.."

"මට තේරෙන්නෑ.."

"තොට කවදද බූරුවො හරියට තේරුණේ.. ඒකනෙ ඔය හැම මගුලටම හේතුව.. දැන්වත් මං කියන දේ අහපං.. ෂබීගෙන් ප්‍රශ්නයක් නෑ.. ඒ ප්‍රශ්නෙ ඉවරයි.. අකමැත්තෙන් හරි ඒකි නියාස් එක්ක පවුල් කයි. ඌ වද දුන්නත්, මැරෙනකන් වද දුන්නත් ඒකි ඉවසයි. උඹ වෙනුවෙන් ඒකිට මැරෙන්නත් පුළුවන්.. හරි.. ඒ ප්‍රශ්නෙ ඉවරයිනෙ.. ඒක ගැන දැන් කතා කරල වැඩක් නෑ.. දැන්වත් අංජලී ගැන හිතපං.. එදා ගියා ගියාමයි ඒකිට මොනව වුණාද කියල උඹ හොයල බැලුවද..? නෑනේ.. මොනව උනත් ඒකිත් උඹට පණ වගේ ආදරේ කළා. ඒක අමතක කරන්න උඹට අයිතියක් නෑ.."

"හරි... දැන් උඹ මොනවද මට කරන්න කියන්නෙ..?"

"ෂබීන් බැන්දට පස්සෙ.. අංජලිවත් අර ක්‍රිශාන්කාරයා ඩැහැගෙන ගියාට පස්සෙ.. තෝ තව පාරක් බවුසර් එකකට යටවෙලා මැරියං.. එච්චරයි මට කියන්න තියෙන්නෙ.. මං යනවා.."

රාජ් නැඟිට්ටා. ගල් ගැහිල වගේ බලාගෙන ඉන්නවා ඇරෙන්න කරන්නෝන මොනවද කියල කියිම දෙයක් මගෙ ඔලුවට ආවෙ නෑ. කොහෙද අපේ මද්දුව හිටිය කියලත් වැඩක් නෑ. හොඳ අයිඩියාස් දෙන්නෙම නෑ. ඌ බය ඇති මං ඌට වඩා තද පොරක් වෙයි කියලා.

"පොඩි කෝල්.."

මද්දුව ගෙයි ඉඳන්ම කෑගැහුවා. මේ වෙලාවෙ කවුද..? රාජ්ගෙ අකාවශ්‍ය කොටසක් එහෙම අපේ දිහා දාලා ගිහින් මගදි මතක් වෙලා කතා කරනවද දන්නෑ.

"කවුද මද්දු..?"

මද්දුවා මොකුත්ම නොකියා කට කොණකට ඇදල අර නොසංඩාල කුණු හිනාව දාලා රිසීවර් එක මගෙ අතට දුන්නා. හොඳකිං මුසලයා.. එහෙම හිත හිතා මං රිසීවර් එක අරන් ඒක මූණටයි උරිස්සටයි හිර කර ගත්තා.

"හෙලෝ.."

"විහඟ අයියා.."

දෙයියනේ අංජලි.. මගේ හාට් බීට් එක නැවතුනා වගේ. මාසෙකට පස්සෙ.. ඒත් ඇයි එයා මට කතා කරන්නෙ..? ලොකු ප්‍රශ්නයක් හිතේ ඉස්සරහම ලොකුවට ඇඳුණා. මගේ මූණ ඉස්සරහට

SL UNLIMITED


ආයෙ ජීවිතේටවත් එන්නෑ කියල කියපු කෙල්ල මාසෙකට පස්සෙ කතා කරනෙක ගැන මගේ පපුවෙ ස්පීඩ් එක ඩබල් එකේ වැඩි කරා.

"වි.. විහඟ අයියා.. ඔ.. ඔයාට අඳුනන්න බැරිද..? මං.. මං අංජලී කතා කරන්නෙ..?"

කටහඬවල් දහස් ගානක් අතරින් වුණත් ඒ කටහඬ අඳුනගන්න පුළුවන්කම තියෙද්දි අංජලී මගෙන් එහෙම ඇහුවා.

"ම.. මං අඳුන ගත්තා උංගි.."

එතනින් එහාට කතා කරන්න දෙයක් නැතුව වගේ මං ගොලු වුණා. එහා පැත්තෙ ඉඳගෙන අංජලී හුල්ලන සද්දෙ මට ඇහුණා.

"මං.. මං මැරි කරන්න තීරණේ කරා විහඟ අයියේ.."

අකුණු දාහක් මගේ පපුව මැද්දෙම කොටද්දි මං වෙව්ලලා ගියා. මොනවද දෙයියනේ මේ වෙන්නෙ..?

"ඔ.. ඔයා.. මැරි කරනවා.. කවදද..? කාවද..? හ්.. හ්.."

"අපේ අම්මලා හිතපු විදියටම ක්‍රිශාන් එක්ක.. ඔ.. ඔයා මට විෂ් කරන්නැද්ද අයියා..?"

මෙච්චර කාලයක් මගේ හිත ඇතුළෙ පරිස්සම් කරන් ඉඳපු රත්තරං ආදරේ අදහාගන්නවත් බැරි විදියට කුඩු පට්ටම් වෙලා ගිහින් තිබුණා. ජීවිතේ ගැන කිසිම බරක් පතලක් නැතුව පුංචි එකෙක් වගේ හිනාවෙලා ඉඳපු මගේ පපුව උඩින් මිනි පෙට්ටි සිය දහස් ගානක බර දැනෙන්න ගත්තා.

"ම.. මං කොහොමද උංගි.. ම.. ඔයාට විශ් කරන්නෙ..? ඔයා ඇයි එහෙම තීරණයක් ගත්තෙ.. අනේ.. නංගි.. මං ඔයාට තාමත් ආදරෙයිනෙ.. මගේ ආදරේ වෙනස් වෙලා නෑ.."

"මං කොහොමද ඕව පිළිගන්නෙ අයියෙ.. එදා හොස්පිට්ල් එකේදි ඔ.. ඔයා කතා කරපු විදියටයි හැසිරිච්ච විදියටයි මං කොහොමද තවත් ඔයා ගැන බලාපොරොත්තු තියාගන්නෙ..? මං මාසයක්ම කල්පනා කරා අයියෙ.. ඒ මාසෙ ඇතුළත ඔයා එක පාරක්වත් මට කතා කරේ නෑ.. ඔයාගෙ හිතේ ඡබිට තියෙන කැන හන්ද මට කවදාම හරි වෙනස්කමක් වෙනව කියනෙක මං තේරුම් ගත්තා. ඒ තේරුම් ගත්ත දේ මගේ හිතට ලොකු බරක්. අකමැත්තෙන් හරි මං මේ තීරණේ ගත්තෙ ඒකයි. එහෙම අරගෙන මං ඉස්සෙල්ලම කිව්වෙත් ඔයාට.. මොකද මං ඔයාට මගේ ජීවිතේටත් වැඩිය ආදරේ කරපු හින්දා.."

"ම.. මට ජීවිතේටත් වැඩියෙන් ආදරේ කරපු හින්දද ඔයා වෙන කෙනෙක් බඳින්න යන්නෙ..? ඔයාට ඔහොම කරන්න පුළුවන් වුණේ කොහොමද උංගි.. මගේ ජීවිතේ මට හිටියෙ ඔයා විතරයි.."

"දැන් ඔය මොන දේ කිව්වත් වැඩක් නෑ විහඟ අයියේ.. මං තීරණයක් අරන් ඉවරයි.. මං දවස් ගානක් හිතල හිතල මේ තීරණේ හුඟාක් අමාරුවෙනුයි ගත්තෙ.. ඒක වෙනස්වෙන විදියට හැසිරෙන්න එපා අයියේ.. මං ගාව හුඟාක් ආදරෙන් ඉඳපු ඔයා මට කරදරයක් කරන්නෑ කියල මං දන්නවා.."

අංජලිගෙන් පිටවෙන වචනයක් වචනයක් ගානෙම ආයෙ කවදාවත් හදන්න බැරි තරමට මගේ හිත පුපුරල යන්න පටන්

අරන් තිබුණා. ඇස් දෙක උඩ මතුවෙච්ච ගින්දර වගේ කඳුළු බිංදුවක් මගේ කම්මුල දිගේ ගලන් ගියා.

"ම.. මං ඔයාට කරදරයක් වෙන්නෑ නංගි.. ඔයා හැමදාටම සන්තෝසෙන් ඉන්න.. ඔයාගෙ හිනාව දිහා මං ඈත ඉඳන් හරි බලන් ඉන්නම්.."

මං ගොඩාහොම අමාරුවෙන් ඒ ටික කියා ගත්තා.. තව කතා කරොත් නම් මට ඇඬෙනවා.. මද්දු මෙතෙන්ට ආවොත් හැමදේම ඉවරයි. ඌ මට හිනාවෙයි.

"එහෙනම් මං තියන්නම් අයියෙ.."

කොහේදෝ ඈත ලෝකෙකින් ආව වගේ අංජලීගෙ කටහඬ මගෙ හිතේ දෝංකාර දුන්නා.

"තව ඩිංගක් ඉන්න උංගි.. අපි ආයෙ කවදාවත් හම්බවෙන්නෑ කියලා ඔයා හොඳට පැහැදිලි කරලම කිව්වා. ඒත්.. ඒත් ඔයා මං ගැන හිතන්න ඉන්න විදිය වැරදියි.. අනේ උංගි.. මං වැරදි නෑ.. මං වැරදි නෑ.. දෙයියම්පල්ලා මං වැරදි නෑ.. ඕ.. ඔයා මට මේ උහුලන්න පුළුවන් ගින්දරක් නෙමේ දුන්නෙ.. මං ෂුවර් එක්ක යාලු නෑ දෙයි......."

ඒත් එහා පැත්තෙන් ෆෝන් එක තියනවා මට ඇහුණා. කමක් නෑ... එහෙනම් අංජලිත් ගියා. ෂබී ඊට කලින් ගියා. පලයල්ලා.. උඹල ඔක්කොම පලයල්ලා.. මට දැන් කවුරුවත් නෑ.. උඹල දෙන්නටම ඕන උනේ මාව සෙල්ලම් බඩුවක් කරගන්නනෙ.. එක හිතකින් ආදරේ කරන හැම එකාටම හම්බවෙන තෑග්ග මටත් අඩුපාඩුවක් නැතුවම හම්බවුණා.

"කාටද පොඩි හයියෙන් හයියෙන් කතා කරනව ඇහුණෙ..? අංජලිට නේද..?

මද්දු අයියා කාමරේ ඉඳන් දුවන් ආවා. ඒත් කතා කරන්න සුදුසු මානසික තත්වයක් මං ගාව තිබ්බෙ නෑ. අනේ දෙයියනේ.. මේ මොකක්ද වුණේ.. අංජලීට මෙහෙම කරන්න පුළුවන්ද..?

"කතා කරපං බං.. සෝමාලියාවෙ බිසි බිල්ලා වගේ ඉන්නැතුව.. මොකද වුණේ.. අංජලි ෂේප් නේද..?"

ඇස් දෙක පුංචි කරල හිනාවෙලා මං දිහා බලන ගමන් මද්දු මගේ කරට අතක් දැම්මා. මට මේ මුළු ලෝකෙම නැතිවුණා කියල මං කොහොමද ඔයාට කියන්නෙ මද්දු අයියෙ.. ඔයාගෙ පාට්නර්ට මේ ලෝකෙ තිබ්බ වටිනාම දේ නැතිවෙලා ගියා කියල මං කොහොමද කටක් ඇරල කියන්නෙ..?

"මොකෝ උඹට අංජලි ෆෝන් එකෙන් ගොලු කසායවත් පෙව්වද..?"

කසාය තියා වසවත් පොවන්න ආයෙ අංජලි එන්නෑ කියල දැනෙද්දි මගේ හිත කඩන් වැටුණා.

"අ... අංජලී බඳිනවා.."

"හැත්.. මොනවා..! ඒකි බඳිනවා..?"

මද්දුගෙ ඇස් දෙක නලලටත් උඩ ගියා.

"ඒකි කොහොමද යකෝ බඳින්නෙ..? උඹ මෙතන ඉන්දැද්දි, යකෝ.. මනමාලයා උඹනෙ.."

මද්දු කතා කරන්නෙ විහිලුවටද ඇත්තටමද කියල හිතාගන්න බැරි වුණත් මං කතා කරා.

"අංජලී ක්‍රිශාන්ව බඳිනවා මද්දූ.. මාව සීන් එකෙන් කැපුනා.. කතාව එච්චරයි.. දැන් ඉතිං උඹට හිනාවෙතැකි.. උඹ ඇතිවෙන්න හිනාවෙයං.. මගේ මූණ දිහා බලල හොඳට හිනාවෙයං.. කැමති නං පූජනීවත් එක්කගනු කරගෙන හිනාවෙයන්.."

"අන්න.. අන්න.. පොඩි.. උඹට වැරදුන තැන.. ඒකි උඹව හැලුවා කියල මාත් එක්ක ඇරගන්න එන්න එපා.. අනිත්තෙක අර රාජ් කිව්වා වගේ උඹ ගල්බිල්ලා වගේ මාසයක් බලන් හිටියා. උඹෙත් ඇමම වැඩියිනේ.. නැත්තං ගිහින් අංජලිත්තෙක්ක කතා කරන්න තිබුණනේ.. නැත්නං අවුම ගානෙ ෂහනාජ් එක්කවත්.. කොහෙද උඹ ලඳ බොළඳ පෙම්වතා වගේ ගේ අස්සට වෙලා බිබික්කම් හොය හොයා හිටියා. දැන් ඉතිං විඳවපංකො.."

"ඔව් මං විඳවනවා මද්දූ.. මං අංජලීට මගේ ජීවිතේටත් වැඩියෙන් ආදරේ කළා. හොස්පිටල් එකේදි වෙච්ච සීන් එක උඹල දන්නවා.. එතන මට කරන්න දෙයක් තිබුණෙ නෑ. අංජලිව එදා රාජුයි, මායි, උඹයි කොයි තරම් තේරුම් කරල දෙන්න හැදුවද..? ඒත් බැරිවුණා.. ඉතිං ඇයි මද්දූ දැන් උඹත් මහොම මට කතා කරන්නෙ..?"

"කතා කරන්නෙ මේකයි පොඩී.. උඹට තාම ජීවිතේ ගැන බරක් පතලක් නෑ.. උඹ ජීවත්වෙන්නෙ යමතාළ ලෝකෙක.. උඹට තිබ්බා ගිහින් අංජලිව හම්බවෙලා ඕය ගැන කතාබහ කරන්න.. ඒත් උඹ මොකද කරේ ගෙදරට වෙලා විරයා වගේ හිටියා.. දැන් ඉතිං කාපංකො කට්ට.."

"ඒ කියන්නෙ දැන් උඹල ඔක්කෝටම පේන්නෙ මං තමයි වැරදිකාරයා කියල. මට තමයි කිසිම දෙයක් තේරෙන්නෙ නැත්තෙ.. උඹල කියන විදියට මට ජීවිතේ ගැන අවබෝධයක් නෑ. ඒත් ඉතිං ඔය හැමදේ ගැනම අවබෝධෙ තියෙන උඹල ඇයි මට මෙහෙම වෙනකන් හිටියෙ. මගේ ජීවිතේ තත්පරෙන් තත්පරේ කඩාගෙන වැටෙනකන් බලන් හිටියෙ ඇයි..? උඹලට ඕනෙ මං විඳව විඳව මැරෙනව බලන්නද..? අා.. කතා කරපං මද්දු අයියේ.. කතා කරපං.."

හැමදේටම වෙඩි වගේ කට තිබ්බ මද්දු වචනයක්වත් කතා කළේ නෑ. මහා ලොකු පුදුමෙකින් උගේ ඇස් ලොකු වෙලා තිබ්බා. ඌ හිටියෙ බයවෙලා වගේ.

"හැබැයි.. උඹ මගේ මද්දු අයියා නිසා මං එක දෙයක් උඹට කියන්නම්.. ආයෙ කවදාවත් අර ඉස්සර ඉඳපු උඹේ පාවනාව මගෙන් බලාපොරොත්තු වෙන්නෙපා.. ඒ අහිංසක කොල්ලා මැරුණා.. මේ විංගකට කලින්.. අර හැමදාම හිනාවෙලා ඉඳපු පුංචි එකා මැරුණා. ඒත් උගේ ආත්මය හැමදාටම තුල්ල තුල්ල ජීවිතේ විඳවන්න ඉතුරුවුණා.."

"පොඩී.. පොඩී.. මොනවද උඹ මේ කියවන්නෙ..?"

"ඔව් මද්දු අයියේ.. මං හැමදේ ගැනම සැහැල්ලුවෙන් හිතුවා. ඒත් මගේ ආදරේ සැහැල්ලු නෑ.. අන්න ඒකයි මට විඳ දරාගන්න අමාරු.. හැබැයි එකක්.. ඔයා බයවෙන්නෙපා.. අංජලීව නැතිවුණා කියල.. ෂහනාස් ඇත්වුණා කියල මං වෙන ඇයො වගේ කෝච්චියට පනින්නෙ නෑ.. බෙල්ලෙ වැල දා ගන්නෙ නෑ.. මං ජීවත්වෙනවා..

මැරි මැරි ජීවත්වෙනවා.. අන්න ඒක විතරක් අංජලි හම්බවුණ දවසක කියපං.."

මං කතාව නැවැත්තුවෙ හති අරින්න.. ඒත් අහන් ඉන්න බැරි කමටද කොහෙද මද්දු කාමරේ ඇතුළට ගියා. ඒ එක්කම මගේ හිතට අලුත් දෙයක් හිතුණා. රාජ් ඇවිල්ලා වීරයා වගේ කියවලා ගියානේ. අංජලී බඳින ආරංචිය ඌට කිව්වහම ඌගේ ප්‍රතිචාරයත් බලාගන්න පුළුවන්නේ.. දඩ බඩ ගාල ටී ෂර්ට් එකයි ඩෙනිමකුයි දාගෙන මං පාරට බැස්සා.

❋ ❋ ❋ ❋ ❋

නුගේගොඩට ආවයින් පස්සෙ රාජ්ව හම්බවෙනා එකේ තේරුමක් නෑ කියල මට හිතුණා. ඇස් ඉස්සරහම පේන්න තිබ්බෙ රෙස්ටුරන්ට් එකක්. දෙපාරක් හිතන්නැතුව මං ඒක ඇතුළට ගියා. පඩිපෙල නැගල උඩ තට්ටුවෙ කොනේම තිබ්බ මේසෙ වාඩිවෙලා කෝක් එකක් බොන්න කල්පනා කරපු මට අලුත් අදහසක් ආවා.

"මේ අයියෙ.. මට ටොප් වෙන්න මොනව හරි දෙනවා.."

එකම දවසෙ අංජලියි, ජනනාපුයි දෙන්නම ඈත්වෙලා ගියාට පස්සෙ හොඳ සිහියෙන් ඉන්න එක ගැන මට තිබ්බෙ ලොකු ප්‍රශ්නයක්.. ජීවිතේ ඉස් ඉස්සෙල්ලාම වතාවට අරක්කු ටිකක් කටේ ගෑවෙන කොට මට දැනුණෙ ලොකු අප්පිරියාවක්. ඒ අප්පිරියාවත්තෙක්කම කඩන් වැටුණ ජීවිතේ කවත් කඩාගෙන වැටෙන්න මං ඉඩ ඇරියා. හැම එකාම කියන්නෙ මට තීරණයක් ගන්න බැරි එකෙක් කියලනෙ.. ඔව් යකෝ.. ඔන්න මං තීරණයක් ගත්තා.. අද ඉඳල මං නන්නත්තාර වෙන්න බොනවා.. අංජලී..

උඹයි ක්‍රිෂානුයි එළකිරි වගේ ජීවත් වෙයල්ලා.. ෂිට්.. උඹ මුස්ලිම් වුණා කියලා නෑ.. උඹල ඔක්කොම එකයි යකෝ.. පලයල්ලා.. උඹල ඔක්කොම මාව දාලා පලයල්ලා.. මං බීල බීල මැරෙන්නම්..

* * * * *

"හ.. හත්සිලව්වේ.. මො.. මොකද යකෝ මේ..?"

නන්නත්තාර වෙන්න ගහල ඉඳපු මාව දැක්ක ගමන් රාජ් හොල්මං වුණා. කතා කර ගන්න බැරුව වගේ උගේ ඇස් දෙක දොඹ ගෙඩි දෙකක් වගේ ලොකු වෙලා තිබුණා. උං මං දිහා බලන් හිටියෙ ලෝකෙ තියෙන ලොකුම පුදුමෙ මේ දැන් ඇස් ඉස්සරහ තියෙනව වගේ.

"වි.. වි.. විහඟ.. ඇ.. ඇයි මචං..?"

විනාඩි ගාණකට පස්සෙ උංට හරියට සිහිය ආවා. ඊට පස්සෙ යං යං ගාල මං ළඟට ආපු රාජ්, උගේ ඇඟට මාව හේත්තු කර ගත්තා. ඉස්සරහ වීදුරු ෂෝකේස් එකේ දාල තියෙන වීඩියෝ පීස් ටික හතර අතේ කැරකෙනවා වගේ මට දැනුණා.

"මචං.. උ.. උම්බ මගේ බොක්කෙ යාලුවා.. උඹ හොඳ එකා.. ඒත් උඹ මේ ලෝකෙ ගැන මොනවද දන්නෙ.. මේ ලෝකෙ කැරකෙනවා කියලා කවුදෝ එකෙක් කියල තියෙනවනෙ.. ඒ.. ඒක හරියට හරි බං.. ඒක විශ්වාස කරන්න නම් බීලම බලන්න ඕන.. එළකිරි මචං.. මුළු ලෝකෙම කැරකෙනවා.."

මගේ හිතට ගලාගෙන ආව හැමදේම මං කියල දැම්මා. ඒව කොයි තරම් සැහැල්ලුද කොයි තරම් බරපතලද කියල මං හිතන්න ගියේ නෑ.

"මෙ.. මේ.. මොනවද විහඟ උඹ මේ කියවන්නෙ..? උඹ හොඳටම බීලත්නෙක්ක.. ව.. වරෙන්.. වරෙන් ෂොප් එක ඇතුළට.."

රාජ් මාව වීඩියෝ සෙන්ටර් එක ඇතුළට ඇදල ගත්තා. ඊට පස්සෙ මුල්ලෙම තිබ්බ ස්ටූල් එක උඩ මාව වාඩි කරවල බිත්තියට හේත්තු කරා.

"උං උඹට අමාරුද විහඟ.. මං දෙහි ගෙඩියක් ගෙනැල්ල ගාන්නද..? කතා කරපංකො.."

"හිතේ තුවාල සනීප කරන්න දෙහිවලට බෑ මචං.. උඹ බයවෙන්නෙපා.. මට අමාරු නෑ.. මට අමාරු වෙන්නෙත් නෑ.."

"කවදාවත් නැතුව ඇයි බං මේ.. උඹ ඉස්සර බොන ඇයොන්ටත් බනින එකා.. අද ඇට්ටි හැලෙන්න ගහලා.. දැන් උඹ කොහොමද ගෙදර යන්නෙ.. අම්මට උඹ මොනවද කියන්නෙ.. අම්මා උඹ ගැන මොනව නොහිතාවිද විහඟ.."

"අම්මත් මාව දාලා ගියා රාජ්.. අම්මා අවනි අක්කලත් එක්ක හැටන් ගියා.. තාම නෑ.. මට දැන් කවුරුවත් නෑ බං.. මං තනියෙන් ඉන්නෙ මචං.."

"ඇයි යකෝ මද්දූ..?"

"ඌ මට හිනාවෙව්ව රාජ්.. ඌට වගේ ලස්සනට ජීවිතේ ගෙනියන්න බැරි එකට ඌ මට හිනාවෙව්ව.. මං කොහොමද බං තුවත් ඉවසන්නෙ.."

"උඹ ඔහොම හිතුවට මද්දූ උඹට හුඟාක් ආදරෙයි බං.."

"ඒව අතෑරල දාපං.. මං බිව්වට උඹ තරහ නෑ නේද..?"

"මගෙ තරහක් නෑ විහඟ.. ෂහනාස් බඳිනව කියල උඹ මිය තරම් අප්සට් යාවි කියල මං හිතුවෙ නෑ.. ෂබී ගැන උඹේ හිතේ සිරාවටම තියෙනව නම් දැන් වුණත් ගිහින් කියපං.. ඒකි මැරෙන්න හරි උඹත්තෙක්ක එයි.."

රාජ් කියන්නෙ වෙන දෙයක්. උෟ හිතන්නෙ මං මේ අවුල් වෙලා ඉන්නෙ ෂහනාස් සින්ද කියලා. උෟ දන්න හැම ශිල්පයක්ම දාලා මාව කූල් කරන්න හදනවා.. කඩේ වැඩට ඉන්න කොල්ලො දෙන්නත් තන්නත්තාර වෙලා. රාජ් උෟ දෙන්නව ෂේප් කරල කඩේ ඉස්සරහට යැව්වා.

"ඒ මොන දෙයක්වත් මට වැඩක් නෑ රාජ්.. මට දැන් කවුරුවත් එපා.. මට ඕනෙ බිල බීල නැතිවෙන්න.. උඹ දන්නෑ.. මේ ඩිංගකට කලින් මට මේ ලෝකෙ තිබ්බ වටිනම දේ නැතිවෙලා ගියා.. අංජලී ක්‍රිශාන්ව බඳිනව මචං.. මේ ලෝකෙ හැමෝටම වැඩිය මට ආදරෙයි කියපු පුංචි කෙල්ල වෙන එකෙක්ව බඳිනවා.. උඹට විශ්වාස කරන්නත් බෑ නේද..? මටත් විශ්වාස කරන්න බෑ.. ඉතිං උඹ මගෙන් අහනවා ඇයි බිව්වෙ කියලා.. ම.. මට දැන් නිදිමතයි රාජ්.. මට නිදිමතයි..."

ඊට පස්සෙ වෙච්ච දේවල් මොකක්වත් මගෙ ඔලුවෙ තිබ්බෙ නෑ. මහා ලොකු නිදිමතකින් ඇස් දෙක පියවිලා යද්දි මං තව තවත් බිත්තියට හේත්තු වුණා.

* * * * *

ආයෙත් ඇහැරෙනකොට මං හිටියෙ ඇඳක. ඇස් දෙක හොඳට පිහිදාල මං වටපිට බැලුවා. හත්තිලව්වෙ.. මේ මගේ කාමරේ නේද..? මං කොහොමද මෙතෙන්ට ආවෙ.. මුලු ඔලුවත්තෙක්කම

ඇනුම් කන්න වගේ රිදෙද්දි මං ඇදෙන් නැගිට්ටා. මේ මොකද යකෝ මුලු කාමරේම වතුර පිරිලා.. කවුරු හරි කාමරේ හෝදල වගේ.

"අා.. උඹ නැගිට්ටද..? ඇයි බං මට මෙච්චර වද දෙන්නෙ..?"

මං ඉස්සරහම හිටියෙ මද්දූ අයියා.. උගේ මූණ ලොකු දුකකින් වැහිල ගිහින් තිබුණා. ටුවර් එකටම මං ඊයෙ ඒ හෝටල් පාරක් දාල.. පොර ඒ තිස්සෙ හෝදන්න ඇති.

"මොකද මද්දූ උනේ..?"

"උඹ ඒක මගෙන්ද අහන්නෙ..?"

"කියපංකො මද්දූ.."

"උඹට මෙහෙම කරන්න බෑ පොඩී.. උඹට මෙහෙම නැතිවෙන්න දෙන්න බෑ.. උඹ අංජලීට පේන්න මීට වැඩිය ලස්සනට ඉන්න ඕන මල්ලි.."

මට මතක ඇති කාලෙකින් මද්දූ අයියා මට මල්ලි කියල කතා කරල තිබ්බෙ නෑ. ඒ වචනවල තිබ්බ ආදරේ වැඩිකමට මගේ පපුව දාලා පිච්චිලා ගියා.

"මට මගේ පුංචි කෙල්ල ඕන මද්දූ අයියෙ.. මට මගේ අංජිව ඕන... ක්‍රිශාන්ව මරල හරි අංජිව මගේ ළඟට මං ගන්නවා. ඔයා කිව්ව වගේ අංජිව බඳින්නෙ මමයි.."

මගේ කටහඬේ තිබ්බ සද්දෙටද මන්දා මද්දූ අයියා ගැස්සිලා ගියා. මං කියපු දේවල් පොරට අදහගන්න බැරිවුණා වගේ.

"උඹ ඊයෙ දවසට හුඟාක් වෙනස්වෙලා පොඩී.. ඉස්සර උඹට ඔහොම කතා කරන්න තියා හිතාගන්නවත් බෑ.."

"ඒක ඇත්ත.. ඕයට දෙසීයක් ඒක ඇත්ත.. මං ඊයෙ මයාට කිව්වනෙ.. අර කලින් හිටපු ඔයාගෙ අහිංසක පාට්නර් මැරුණා කියලා.. ඔයාගෙ පොඩි මල්ලි මැරුණා කියලා.. දැන් මේ ඉන්නෙ වෙන එකෙක්.. ඕන දෙයක් දරාගන්න පුළුවන් එකෙක්.."

"නෑ පොඩී.. නෑ.. උඹට එහෙම වෙන්න බෑ.. ඔය බොන එක උඹ නවත්තලම දාන්න ඕන.. අම්මා ආවහම මං මොනවද කියන්නෙ.. 'උඹට බලාගන්නෙ මෙහෙමද කියල අම්මා මගෙන් ඇහුවම මං මොනවද කියන්නෙ..? උඹ දන්නවද උඹ ඊයේ රාජ්ට කොයි තරම් බැන්නද කියලා.. උං ඇඩුවන්නෙක්ක.. උං වීකරක් නෙමෙයි උඹ කියපු දේවල් අහල මටත් කඳුළු ආවා. උඹ හුඟාක් කියෙව්වා පොඩී.."

මද්දු අයියා කියවගෙන යනවා. ඒ හැමදේම මට අලුත් ආරංචි. ඒව මොනවත් මට මතක නෑ.

"රාජ් ඊයෙ හවස මෙහේ ඇවිත් උඹට කියපුව, උඹ අකුරක් නෑරම ඌ උඹට කියල බැන්නා.. ඔබීත් බැන්දට පස්සෙ තෝ අර බවුසර් එකකට යට වෙයන් කියල ඌ විහිලුවට කියපු එක උඹ දහ දොළොස් පාරේ කියෙව්වා. උගේ කොලර් එකෙන් ඇදල 'උඹ මට මැරෙන්නද කියන්නෙ' කියල ඇහුවා.."

"ඉතිං.."

"ඉතිං තමයි.. ඌ උඹේ අත් දෙක අල්ලගෙන හොඳටම ඇඩුවා. පව් පොඩී.. මේ හැමදෙයක්ම හින්දා අපි හැම එකාම දුක් විඳිනවා.."

"මං හින්දා ඔයාලා දුක් විඳින්නෙපා මද්දු අයියේ.. මං විඳවන්නම්.. මගේ ජීවිතේදි මං ඕනවටත් වැඩිය හිනාවෙලා තියෙනවා.. ඒවටත් එක්ක මං අඬන්නම්.. ඔයාල මේවට ගැවෙන්නෙපා.."

"උඹ අඬද්දි අපිට හිනාවෙන්න බෑ පොඩී.. ඒක තේරුම් ගනිං.. උඹ මගේ පොඩි මල්ලි.. උඹ නාම පුංචි එකෙක්.. උඹ අද වෙනකන් හිතුවද මං උඹට කොයි තරම් ආදරේද කියලා.. උඹට අවිශ්වාස නම් පූජනිගෙන් අහල බලපං.. මං ඒකිට වැඩිය උඹට ආදරෙයි පොඩී.."

"මං ඒක දන්නවා මද්දු අයියෙ.."

"එහෙම දන්නව නම් ඇයි උඹ බීමක් පටන් ගත්තෙ.. අම්මා මේවා දන්නව නම් පපුව පැලිල මැරෙයි පොඩී.. අපි හැමෝම උඹට මෙච්චර ආදරේ කරද්දි ඇයි උඹ උඹට ආදරේ නැති කෙල්ලෙක් පස්සෙන් දුවන්නෙ.."

"ඒක මගේ කරුමෙ.."

එතනින් එහාට මද්දු මුකුත්ම කතා කෙරුවෙ නෑ. කියාගන්න තව දාහක් දේ තියෙද්දි මද්දු කාමරෙන් ගියා.

හවස් වෙද්දි රාජ්ව බලල එන්න ඕන කියල මට හිතුණා. ඌ නාම අඩනවද දන්නෙත් නැනෙ.

* * * * *

"හැබැයි මං පැයකින් කෝල් කරනවා රාජ්ගෙ කඩේට.."

මං ගෙයින් එළියට බහිනකොටම අවිශ්වාසෙන් වගේ මද්දු කිව්වා. මද්දු අයියට කියල ආවෙ රාජ්ව හම්බවෙන්න යනව කියල

වුණත් මං විජේරාම හංදියෙන් බැහැගත්තා. මගේ ආදරේ හම්බවුණේ නැති වුනත් මට පණ වගේ ආදරේ කරපු තව කෙල්ලෙක් මගේ ජීවිතේ පැත්තකින් හිටිය කියල මට මතක් වුණා. මැරී කරන්න කලින් එකම එක පාරක් ෂහනාස්ව හම්බවෙලා ඒ නිල් ඇස් දෙක දිහා බලාගෙන සුබ පතන්න මට ඕන වුණා. මං මෙහෙම හරි සුබ පතන්න එන එක කෙල්ලට ලොකු දෙයක් වේවි කියල මට හිතුණා. ඒත් එගොඩවත්ත පාරට හැරුණහම තිබ්බ තට්ටු දෙකේ ගේ දැක්කහම මගේ හිත වෙනස් වෙලා ගියා.

අංජලීගෙ අක්කාගෙ බබාගෙ ෆොටෝස් ගත්ත අංජලීත්තෙක්ක මං ආපු හැටි චිත්‍රපටියක් වගේ මගේ හිතේ ඇඳුණා. තට්ටු දෙකේ ගේ ගාව නතර කරල තිබ්බෙ අංජලී නිතරම ඩ්‍රයිව් කරන රතු පාට කැබ් එක. ඒ කියන්නෙත එයා අක්කලගෙ ඇවිත්. මගේ ජීවිතේට මහ නුහාක් ආදරෙන් ළංවෙලා හිතා ගන්නත් බැරි තරමට මට නපුරු වෙච්ච පුංචි කෙල්ලව එක පාරක් හරි දකින්න මට ඕන වුණා. ඒකමයි මං ගේට්ටුවෙන් එබුණේ. ඒත් ඇස් දැකපු දෙයින් මගේ පපුව හීතල වෙලා ගියා. මගේ ඇස් ඉස්සරහටම ආවෙ අංජලියි, ක්‍රිශානුයි. මං දිහාට හොණිම හොණ බලු හිනාවක් දාලා ක්‍රිශාන් අංජලීගෙ අතකින් අල්ල ගත්තා. මාව දැක්ක විතරයි අංජලීගෙ මූණ බෙරිංවෙලා ගියා. එයා බිම බලාගෙන ගිහින් කැබ් එකට නැග්ගා. මුළු ලෝකෙම දිනා ගත්තා වගේ පිටි එකකින් කැබ් එකේ යතුර කරකව කරකව ක්‍රිශාන් මගේ ළඟට ආවා. ජීවිතේටත් අමතක කරන්න බැරි තරමෙ නෝන්ඩි හිනාවක් උගේ මූණෙ හැංගිලා තිබුණා.

"විතාන.. උඹ රන්අවුට් කියල ආරංචියි.."

අංජලී දිහා බල බල ඌ මගෙන් ඇහුවා. මුට උත්තරේ දෙන්න

ඔහු අභින්ද කවින්ද කියන එක හිතාගන්න බැරුව ඩිංගක් වෙලා මං සද්ද නැතුව හිටියා. එහෙම ඉඳලයි මං කතා කරන්න ගත්තෙ.

"ඔව්.. අනිත් පැත්තෙ බැට්ස්මන් මාව ඕනකමින්ම අවුට් කරා. එතන රන් එකක් තිබ්බෙ නෑ.."

අංජලී දිහා බලන ගමන් මං කිව්වා. ඒ වෙනකොට මගේ මූණෙ තිබ්බ ඒ ඇස් දෙක බිමට හැරුණා.

"රන් එකක් තිබ්බත් නැතත් උඹ දැන් අවුට් වෙලා පැවිලියන් එකේනේ.. මං දැන් බැට් කරනවා.. උඹෙ අවුලක් නෑනෙ.."

"බැට් කරාට කමක් නෑ ක්‍රිශාන්.. දැන් ටී ටයිම් එක.. මම විතරක් නෙමේ සෙල්ලම් කරන හැමෝම පැවිලියන් එකේ.. අර මාව අවුට් කරපු බැට්ස්මන් එක්ක මං කතා කරනවා.. එතන මුකුත් අවුලක් නෑනෙ.."

"අවුලක් නෑ.. අවුලක් නෑ.. මං කිසිම කතාවක දුෂ්ඨයා වෙන්න කැමති නෑ.. ලොක්කා මං කැමති කොල්ලගෙ රෝල් එක කරන්න.. උඹ දුෂ්ඨයා වෙයන්.. එතකොට තමයි ගති.."

ක්‍රිශාන් කියන දේවල් වලට කියන්න ඕනෙ තරම් දේවල් තිබ්බත් මං කතා නොකරම අංජලී ළඟට ගියා. ඒත් එයාගෙ හිත වෙනස් වෙලා තිබ්බෙ නෑ.

"දැන් ඔයා මේ යන්නෙ ෂහනාස් හම්බ වෙන්නනෙ..? මෙතන වැඩිය ලේට් වෙන්නෙපා විහඟ... ෂහනාස් බලාගෙන ඇති.."

මගේ ඇස් දෙක දිහා බලාගෙනම අංජලී කිව්වා. දෙයියනේ මං ගාව ඉඳගෙන පුංචි එකෙක් වගේ හුරතල් වෙච්චි අහිංසක කෙල්ලමද මේ..?

"ඒ.. ඇංගි..? ශහනාස් එක්ක මගේ එෆෙයාර් එකක් නෑ කියල ඔප්පු කරල පෙන්නන්න විදියක් අද මට නෑ.. මං ඒ තරමටම අසරණ වෙලා.. කමක් නෑ.. ඔයා ඕනා දෙයක් කියන්න.. ඔය හැමදේම තව ටිංග දවසයිනේ.. මං තව වැඩි දවසක් ලංකාවෙ ඉන්නෑ.. ඔයයි මමයි හම්බ වෙච්ච මේ හැම තැනක්ම දාලා මං යනවා.. දැන් තවත් සංතෝස වෙන්න නංගි.. අද ගෙදර ගිහිල්ලා හොඳට හුස්ම අල්ලලා හිනාවෙන්න.. මොකද තව ටික දවසකින් මගේ මේ කාලකණ්නි රූපෙ ඔයාට පේන එකක් නෑ.."

කියාගෙන කියාගෙන ගිහිල්ලා මං නැවැත්තුවා. ඒත් තව කියන්න ඉහාක් දේ තියෙනවා.. ඒවා නොකියා බෑ.

"මගේ පපුව මැද්දටම පිහියකින් ඇන්න වගේ ඔයා ඊයෙ ෆෝන් එක කට් කරා. උසාවියක වුණත් විත්තිකාරයට කතා කරන්න නිදහස තියෙනවා.. මට ඒකවත් ඔයා දීල නෑ. මං මීට වැඩිය ඔයාට පැහැදිලි කරල දෙන්න ආසෙ එන්නෑ ඇංගි.. ඔයා මට කවදාවත් හිමි කරගන්න පුළුවන් වස්තුවක් නෙමෙයි කියල මං දැන් දන්නවා. ඔයා මාව කවද හරි හලල දාවි කියනෙක මං තේරුම් අරන් හිටිය නම් මේ කිසි දුකක් නෑ. කමක් නෑ.. කමක් නෑ.. ක්‍රිෂාන් මට වැඩිය හොඳ කොල්ලෙක්.. මොකද මට මෙහෙම හරි ඔයත් එක්ක කතා කරන්න ඉඩ දුන්නානේ.. මං මෙතන ක්‍රිෂාන් වුණා නම් එහෙම කිසිම චාන්ස් එකක් දෙන්නෑ.."

ඇංජලීගෙ ඇස් දෙකේ ලොකුම ලොකු කඳුළු බිංදු පේලියක් හැංගිලා තිබුණා. ඒ සුදු මූණ දකින්නෙ අන්තිම පාරට කියල හිතාගෙනයි මං ඒ දිහා බැලුවෙ. බිමට වැටෙන්න ඔන්න මෙන්න කියල තිබ්බ ඒ කඳුළු බිංදුවලින් ඇස් අහකට අරන් මං ක්‍රිෂාන් ළඟට ආවා.

"අංජලීව සන්තෝසෙන් තියපං ක්‍රිශාන්.. මං ළඟ ඉන්දෙද්දි එයා හුඟාක් වෙලාවට ඇඬුවා. කෙල්ලෙකුට ආදරේ කරන්න ඕන කොහොමද කියල මං දන්නෙ නෑ.. ඒකට ඉතිං කාටවත් දොස් කියන්න බෑ.. උඹ කවදාවත් අංජලීට දුකක් දෙන්නෙපා.. මං වගේ.. බලපං.. බලපං මං අදත් එයා ඇඬෙව්වා.."

මං කියපුව අදහගන්න බැරුව වගේ ක්‍රිෂාන් බලන් හිටියා. අලුත්ම අලුත් ජීවිතේකට ඒ දෙන්නා පාර හදද්දි මුළු ලෝකෙම නැති වෙලා ගියපු මං ආපහු හැරුණා. මහතාස්ට විෂ් කරන්න ගියත් මට විෂ් කරන්න හම්බවුණේ අංජලීට.. කමක් නෑ.. උඹල සන්තෝසෙන් ඉඳපල්ලා.. අත්තටු දෙකම කැඩිල ගියපු පුංචි කුරුල්ලා මං.. මට ආයෙ පියාඹන්න බෑ.. උඹල පියාඹපල්ලා.. පියාඹන්න බැරි මං විනාස වෙලා යන්නම්..

"ගේනවා මල්ලි තව බාගයක්.."

අරක්කුවල මත ඊයෙටත් වැඩිය දැනෙද්දි අංජලීවයි ක්‍රිෂාන්වයි මහතාස්වයි මගේ ළඟ ඉඳපු හැමෝමවයි අමතක කරල දාන්න මට ඕන වුණා. ඒත් ඒ දේ හිතන තරම් ලේසි දෙයක් වුණේ නෑ. සිහි නැතිවෙනකන් බිව්වත් අංජලීව අමතක කරන්න බෑ කියල මට තේරුණා. හතර අතින් කලුවර වැටෙද්දි වැනි වැනීම මං රෙස්ටුරන්ට් එකෙන් එළියට බැස්සා.

'තවත් ඉතිං විඳවන්න දෙයක් නෑ. කොහොම හිටපු ලස්සන කොල්ලෙක්ද යකෝ මේ විනාස වෙලා යන්නෙ..? උංගි.. උඹ මාව නැති කරා. ඒත්.. ඒත් මං උඹත්තෙක්ක ජාති ජාතිවත් තරහ නෑ.. උඹ සන්තෝසෙන් ඉඳපන්..'

මගේ හිත කෑගැහුවා. ඒ එක්කමයි ඇඟ හිරිවැටිලා යන

සද්දෙට මහා බ්‍රේක් පාරක් මගේ කණ ගාවින්ම ඇහුණා. මගේ ඇහටම වගේ හේත්තු වුණ වාහනේ බොනට් එක උඩ අත තියල මං අමාරුවෙන් ඔලුව ඉස්සුවා.

"මොකාද මේ සනමිදයා වගේ බීල මැරෙන්න හදන එකා.. දෙකක් ඇනල පාරෙන් එහාට දාමු.."

යාන්තමට වගේ හුරු පුරුදු කටහඬක් කණ ගාවින් ඇහුණත් ඒ කවුද කියල මට අඳුනගන්න බැරිවුණා. ඒ එක්කම වාහනේ වම් පැත්තෙන් බැහැල ආපු සුරංගනාවියක් වගේ පුංචි කෙල්ල නම් මගේ ඇස් අඳුන ගත්තා.. ෂහනාස්..

"ම.. මයිගෝඩ්.. මෙ.. මේ විහන නේද..? ම.. මට විශ්වාස කරන්නත් බෑ.."

ෂහනාස් මං ගාවට එද්දි නියාස් එයාගෙ අතින් අල්ල ගත්තා. වැටෙනකන් බීල හිටියත් මං ඒක දැක්කා. ජීවිතේ ඉස් ඉස්සෙල්ලම මට හම්බවෙච්ච උඹල දෙන්නම මට අයිති නෑ. උඹල එකෙක්වත් මං ගාවට එන්නෙපා.. පලයල්ලා.. මාව තවත් විනාශ නොකර පලයල්ලා.. මගේ හිත කෑගැහුවා. එහෙම කෑගහපු හිත පිච්චිලා යන්න ගියේ තත්පර ගානයි. ඇස් දෙකට පෙනි පෙනීම නැතිවෙලා යන රත්තරං ආදරේක හටඹුන් දිහා බලාගෙන මගේ හිත අඬන්න ගත්තා. ෂහනාස්ටයි නියාස්ටයි විෂ් කරන්න මං කොයි තරම් ට්‍රයි කරත් ඒ දේ කරන්න මට බැරිවුණා. මුළු ලෝකෙම මගෙත් එක්ක තරහෙන් වගේ කරකැවෙද්දි කෙලින් හිටගෙන ඉන්න මං ලොකු ට්‍රයි එකක් දුන්නා. ඒ එක්කම තමයි ෂහනාස්ගෙ අතින් අල්ලගෙන නියාස් මං ළඟට ආවේ.

"වි.. විහඟ.. ඔ.. ඔයාට මේ මොකද වෙලා තියෙන්නෙ..? පාටි එකකටවත් ගියාද...?"

සහනාස්ගෙ කටහඬ මගේ කණ ගාවින්ම ඇහුණා. බාගෙට පියවිලා තිබ්බ ඇහිපිල්ලම් දෙක තවත් හොඳට දිගෑරල මං එයා දිහා බැලුවා. ඒ පුදු මූණ පුරාම තිබ්බෙ මහා පුදුමයක ලකුණු. ජීවිතේ කවදාවත් වෙන්න බැරි දෙයක් මේ දැන් ඇස් ඉස්සරහ සිද්ධවුණා වගේ එයා මං දිහා බලන් හිටියා.

"මට පාටි දෙන්න කවුරුවත් නෑ සහී.. ඒත් ඔයාට මාව මතක් වෙලා තිබුණා. ඒකනෙ මට වෙඩින් කාඩ් එකක් එවල තිබුණෙ.. ඔයාගෙ වෙඩින් එකට ඇවිල්ලත් මං මේ වගේම බොන්නම්.. ඔයාලා සංතෝෂෙන් ඉන්නත් ඕනනේ.."

"දෙ.. දෙයියනේ.. ඔ.. මයා මේ වගේ බීල ඉන්නකොට මටද සන්තෝෂෙන් ඉන්න කියන්නෙ විහඟ.. ම.. මං දැන් මොනවද කරන්න ඕන.. අ.. අනේ දෙයියනේ.. මට මුකුත් හිතාගන්න බෑ.."

"මං ගැන කරදර වෙන්න එපා සහී.. ඔයයි නියාසුයි සන්තෝසෙන් ඉන්න.. මං අද ආවෙ ඔයාලට විෂ් කරල යන්න.. නියාස් ඔයාව සන්තෝසෙන් තියාවි.."

එහෙම කියල ඉවර වෙලා මං නියාස් දිහා බැලුවා. එයා කවදාවත් හිතන්නෙ නැතුව ඇති මං එහෙම කතා කරයි කියලා.

"නියාස්.. ප්ලීස්.. විහඟව වෙහිකල් එකට දාගන්න මට හෙල්ප් කරන්න.."

ඩිංගක් වෙලා කල්පනා කරල නියාස් මගේ අතින් අල්ල ගත්තා. ඉස්සරහට වෙන්න යන්නෙ මොනවද කියල හිතාගන්න

බැරි වුණත් මං නියාස්ගෙ උදව්වෙන් එයාල ආපු වාහනේට නැග ගත්තා. මාව අරගෙන යන්න ඕන කොහාටද කියල අහන්න වගේ නියාස්, ෂහනාස්ගෙ මූණට එබුණා. මගේ අතින් අතෑරිල ගියේ කොයි තරම් ලස්සන සුරංගනාවියක්ද කියල හිතට තේරුණත් මට කරන්න දෙයක් තිබ්බෙ නෑ. එක සුරංගනාවියක් මගේ හිත විනාශ කරල දාලා ගිහින් එච්චර වෙලාවක් ගත වෙලා තිබුණෙ නෑ. වාහනේ ස්ටාර්ට් කරගෙන ටික දුරක් ඇවිල්ල පාර අයිනට කරල නියාස් ඇංජිම නැවැත්තුවා. ඊට පස්සෙයි මං දිහාට හැරුණේ.

"කොහේටද යන්න ඕන..?"

නියාස් එහෙම ඇහුවෙ ඕනවට එපාවට වගේ. ෂහනාස්ට බෑ කියන්න බැරිකමට මිනිහ මාව වෑන් එකට දාගන්න ඇති.

"මාව ඔය බාර් එකක් ළඟින් දාපං..."

"ච්.. විහඟ.. ඔයා මොනවද මේ කියවන්නෙ..? ඔයාට මොනාට වෙලාද දෙයියනේ.. මං ඔයාව වෙහිකල් එකට දාගත්තෙ මඟින් බස්සවන්න නෙමේ.."

"එහෙනම් දැන් මට ද මේකෙන් බහින්න වෙන්නෙ.. ආ ෂබී..? ඔයිට වැඩිය හොඳයි මාව මරණවා.. මට දැන් මේ පෙල්ලම එපාවෙලා.."

නියාස් එක පාරටම චයින් වුණා. ඌ හොඳටම අවුල්වෙලා කියනෙක මට තේරුණා. ෂහනාසුත් මොනාව කියනාවද මංදා.

"මං හින්ද ඔයාල දෙන්න රණ්ඩු වෙන්න ඕන නෑ.. මං මෙතනින් බහින්නම්.. ඔයාලා යන්න ආපු ගමන යන්න.. මං වගේ කාලකන්නියෙක් හින්ද නියාස්ගෙ හිත අවුල් කරන්නෙපා ෂබී.."

"විහඟ මේ..? මගේ හිත දැන් අවුල් කරන්න දෙයක් නෑ. ඒක අවුල්වෙලා ඉවරයි.. ෂහනාස්ගෙ හිත පුදුම තරම් අමාරුවකින් මං හරිගස්ස ගත්තෙ.. උඹ මත්තෙම මැරෙන්න ගිය නිසාව මං හුඟාක් මහන්සිවෙලා මැරි කරන්න කැමති කරව ගත්තෙ.. උඹ බීල හින්ද මට දැන් උඹව ගහන්න හිතෙන්නෙ නෑ.. බීල ඉන්න එකෙකුට ගහල වැඩක් නෑ කියල මං දන්නවා.. මං උඹෙන් ඉල්ලන්නෙ එකම එක දෙයයි.. දෙයියන්ගෙ නාමෙට අපිට පව් නොදී මෙතනින් පලයං විහඟ.. මං මේ ඉවසුව හොඳටම වැඩි.."

මගේ මූණටම එබිල නියාස් කිව්වා. ඒ මූණෙ උකුරල තිබිත් තිබ්බෙ මහ විශාල කෝන්තියක්.

"නියාස්.. ඔයා මොනවද මේ කියන්නෙ..? ඔයාට පිස්සුද ආ..? විහඟ දැන් ඉන්න තත්වෙ බලලවත් කතා කරන්න.. මං හිතුවෙ නෑ ඔයා ඔය වගේ පහත් විදියට හිතන මිනිහෙක් කියල. මං ඔයාව මැරි කරන්න කැමති වුණේ හැම පැත්තක් ගැනම හිතල. ඒත් මං ඔයාගෙ මේ පටු අදහස් තියෙන පැත්ත දැක්කෙ නෑ. ඔයා හිතන්නෙ මං විහඟව දකින දකින පාරේට හිත වෙනස් කරගන්න කෙල්ලෙක් කියලද..? ආ.. නියාස්.. ඔයා මං ගැන හිතන්නෙ එහෙම නම් අපි මැරි කරල එකට ජීවත්වෙන්නෙ කොහොමද..?"

"එහෙනම් මෙතනත් මමයි වැරදි.. එහෙමනේ.. ඔයා ඕන ඔබ්බුවක් කරගන්න.. මං ත්‍රීවීල් එකක් අරන් ගෙදර යනවා.."

දඩබඩ ගාල ඒ ටික කියපු නියාස් වාහනෙන් බැහැලා ත්‍රීවීල් පාක් එක පැත්තට ගියා. මේ ජීවිත කාලෙදි කෙල්ලෙක්ගෙ මූණෙ මං දැක්ක ලොකුම අසරණකම මූණෙ තියාගෙන ෂහනාස් මං දිහා බැලුවා. ඊටපස්සෙ එයා අත් දෙකෙන්ම මූණ වහගෙන දණ

හිස් දෙකේ මූණ ඔබා ගත්තා. තත්පරේට දෙකට සිද්ධවෙච්ච දේවල් ටිකයි අහගත්තු කතන්දර පෙට් එකයි හන්ද මගේ වෙරිත් හිඳිලයි තිබුණෙ. මොකක්ද හත්තිලව්වෙ මේ වුණේ.. මං වටපිට බැලුවා. නියාස්ගෙ කැල්ලක්වත් නෑ. ඌ යන්නම ගිහින්. වාහනෙත් මෙතන දාලා.. ඕකට ඕකේ.. ඌ නම් කාලකණ්නිම අශ්වයෙක්. නැත්තං මේ කෙල්ලව මෙතන තනියම දාලා යාවියැ.

"ම.. මට සමාවෙන්න ඝබී.. ම.. මං හින්ද ආයෙමත් ඔයාගෙ ජීවිතේ අවුල්වුණා. අර රාජ් නිතරම කියනව වගේ මං ඔයාට පාඩුවෙ ඉන්න දුන්නෙම නෑ. ඔයාගෙ ජීවිතේ අලුතින් පටන් ගන්න හදපු තැනම මං විනාස කරල දැම්මා. දැන් නියාස් මොනව හිතනවද දන්නෙ නෑ. මං මහ කාලකණ්ණියෙක් ඝබී.. දෙයියන්ගෙ නාමෙට මං මෙතනින් බහින්නම්.. ඔයා ගෙදර යන්න.. ප්ලීස් ඝබී.. මං ගැන හිතන්නෙ නැතුව ගෙදර යන්න.."

මං කියපු දේ ඇහුණේ නෑ වගේ ෂහනාස් ගිහින් ඩ්‍රයිවින් සීට් එකේ වාඩිවුණා. ඝබී මොනවද මේ කරන්න හදන්නෙ..? කොහේද මේ යන්න හදන්නෙ..? තත්පරේට දෙකට ප්‍රශ්න කෝච්චියක් මලුවට එද්දි ෂහනාස් වාහනේ රේස් කරලා ඉස්සරහට ගත්තා.

"ෂකා.. කොහෙද ඝබී.. මේ යන්නෙ..?"

වාහනේ දෙවැනි සීට් එකේ ඉඳගෙන මං කෑගැහුවා. ඒත් මං අහපුව එයාට ඇහුණෙ නෑ වගේ වාහනේ ඩ්‍රයිව් කරන් ගියා. ටිකක් දුර ගිහින් වාහනේ ආයෙමත් පාර අයිනට කරල නවත්තලා ෂහනාස් වාහනෙන් බැස්සා. එයා එක්කම මාත් වාහනෙන් බහින්න හැදුවත් මං හිටපු පැත්තෙ මැද දොර ඇරල මං ගාවින් වාඩිවෙලා ෂහනාස් දොර ලොක් කරා.

"ආ.. ඇයි.. ර.. රත්තරං.. ඔයා.. ඔයා කිව්වෙ..?"

අත් දෙකෙන්ම මගේ මූණ අල්ලගෙන ෂහනාස් මගෙන් ඇහුවා. වෙන්න යන්නෙ මොනවද කියල හිතාගන්න බැරිවුණ නිසා මං වචනයක්වත් කතා කෙරුවෙ නෑ.

"දෙයියන්ගෙ නාමෙට කතා කරන්න රත්තරං.. ඔයා නැති වෙනවා මට බලන් ඉන්න බෑ.. ප්ලීස්.. මට කියන්න මං මොනවද කරන්න ඕන කියලා.. ඔයා වෙනුවෙන් මට කරන්න බැරි දෙයක් නෑ.. අනේ බබා කතා කරන්නකො.."

මගේ මූණ අතෑරල එයාගෙ පපුවට මාව තුරුලු කරගන්න ගමන් ෂහනාස් කිව්වා. එයාගෙ පපුව මහ හයියෙන් ගැහෙන හැටි මගේ කනට පිහරක් නෙමේ හිතටත් ඇහුණා.

"අං.. අංජලී මැරි කරනවා ෂබී.. මං ආදරේ කරපු පූංචි කෙල්ල වෙන එකෙක්ට බඳිනවා.. අනේ ෂබ්.. ම.. මං මොනවද කරන්න ඕන.. එ.. එයා මට නැතිවෙනවා.. එයා මට නැතිවෙනවා.."

පූංචි එකෙක් වගේ ෂහනාස්ගෙ ඇඟේ එල්ලිලා මං කියවන් ගියා. මහ විශාල රැකවරණයක් ලැබෙනව වගේ මං එයාට තවත් තුරුල් වුණා. ඒ දේ බලාපොරොත්තුවෙන් හිටිය වගේ එයා මාව තවත් තද කරල බදාගත්තා.

"ම.. මං ගිහිල්ලා අංජලීව හම්බවෙන්නද..?"

ෂහනාස්ගෙ කටහඬේ තිබ්බෙ පුදුම හිතෙන තරම් ආදරණීය බවක්. එයා මගේ හිත මගෙන් ඇදල එයා ළඟට අරගෙන තිබුණා.

"කියන්නකො බබා.. මට ඔයා මේ වගේ දුකෙන් ඉන්නට බලන්න බෑ.. මං හැම වෙලාවෙම ප්‍රාර්ථනා කෙරුවෙ ඔයාගෙ

සතුට. අඩුම ගානෙ මං නියාස්ව බඳින්න හිතාගත්තෙත් ඔයා වෙනුවෙන්. ඒ මගෙන් ඔයාට කරදරයක් නෑ කියල හැමෝටම පෙන්වන්න.. ඒත් ඒත්.. මේ මොකක්ද දෙයියනේ වෙලා තියෙන්නෙ.? මට දැන් හිතෙනව මං ගත්තු තීරණේ වැරදියි කියලා. මං නියාස්ව බැන්ද වුණත්.. ඔයා සතුටින් නෑ කියල මං දැන් දන්නවා.. අන්තිම මොහොතෙ හරි මං ඒ දේ දැනගත්තු එකත් කොයි තරම් ලොකු දෙයක්ද..?"

ෂහනාස් නැවතිල්ලෙ කියවන් යනවා. ඒ හැමදේම මගේ හිත කඳ කරල බදාගත්තා.

"ඔයා ගිහින් අංජලීට හම්බවුණත් වැඩක් නෑ ෂබී.. අංජලීගෙ හිත දැන් කාටවත් වෙනස් කරන්න බෑ කියල මං හොඳටම දන්නවා.. මමම කොයි තරම් ට්‍රයි කරාද.. ඒත් වැඩක් වුණේ නෑ ෂබී.. අංජලි මගේ ආදරේට පයින් ගහල ක්‍රිෂාන් ළඟට ගියා. මං බල්ලෙක් වගේ මහ පාරට වැටුණා. මං නැතිවුණාම ෂබී.. මට මේ ලෝකෙ තිබ්බ වටිනම දේ නැතිවෙලා ගියා.."

"ඔයා වෙනුවෙන් මං මේ ලෝකෙ එහා කෙළවරට වුණත් යන්නම් බබා.. ඔයා ඔය ඉල්ලන්නෙ අංජලීගෙ ආදරේ.. මට දවසක් දෙකක් කල් දෙන්න.. මං අංජලීව හම්බවෙලා මේක ඉවරයක් කරන්නම්.."

"වැඩක් නෑ ෂබී.. වැඩක් නෑ.. එයා ආයෙත් එන්නෑ.. මගේ හිත කොයි තරම් පුපුරල ගියත් මං ඒක තේරුම් අරන් ඉවරයි.. දැන් මට තියෙන්නෙ මේ හැමදේම විඳවන්න.. විඳව විඳව ජීවත්වෙන්න.. හැමදේම මතක් කර කර මැරි මැරී ජීවත්වෙන්න.. අංජලී මගෙන් බලාපොරොත්තුවෙන දේත් ඒකයි.."

"අ.. අනේ මහොම කතා කරන්නෙපා.. ඔයාට මෙහෙම වෙන්න දෙන්න බෑ.."

"නෑ ෂබී.. මේ හැමදේම වෙන්න තියෙන දේවල්.. මං මෙහෙම අසරණ වෙන්න එන කියල මගේ ජීවිතේ ලියවිලා ඇති.."

"ඔයාව අසරණ කරන්න මං කාටවත් ඉඩ දෙන්නෑ බබා.. මං ඔයාට හැමදාටම සන්තෝසෙන් තියෙනවා.."

එහෙම කියල ෂහනාස් මගේ මූණ ඉඹගෙන ඉඹගෙන ගියා. එයා පිට කරපු හැම හුස්මම බිඳකම රස්නෙ මගේ හිත ඇතුලටම උරාගත්තා. තත්පරේකට දෙකකට මුළු ලෝකෙම අමතක කරල දාලා එයාගෙ රෝස පාට තොල් පෙති මගේ දෙතොල් වලින් පටලව ගත්තා. ලෝකෙ විනාසෙ සිද්ධ වෙන්න අදයි කියල වගේ මායි ෂබියි තව තවත් ළංවුණා.

කවදාවත් හිතපු නැති විදියට උදාවෙච්ච මේ අවස්ථාවෙන් මග ඇරල යන්න මං හිතුවෙ නෑ. ෂහනාස් වුණත් මගෙන් ඈත්වුණේ නෑ. මුළු පළාතම කට්ට කරුවල වෙලා තිබුණා. මුළු හිතම මත් කරන පර්ෆියුම් සුවඳක් ෂහනාස් ළඟ රැඳිල තිබුණා. හිතට ඇති කියල හිතෙනකන්ම ඒ සුදු මූණ ඉඹල ඉවරවෙලා ඒ ඇස් දිහා මං කෙලින්ම බැලුවා. කරුවලේ වුණත් ෂහනාස්ගෙ නිල් ඇස් දෙක දිලිසෙනව මං දැක්කා.

"තරහද..?"

ෂහනාස්ගෙ උකුල උඩින් අතක් තියල ආයෙමත් එයාගෙ පැත්තට බරවෙලා මං ඇහුවා. හයියෙන් හයියෙන් හුස්ම ගන්න මිසක එයා කතා කෙරුවෙ නෑ.

"ආ.. ෂබී.. කියන්නකෝ.."

"ආයෙ බිව්වොත් නම් හරහ වෙනවා.."

"බිව්ව කතාවක් නෙමේ මං ඇහුවේ..?"

"එහෙනම්..?"

"මං ඇහුවෙ ඉඹපු එක ගැන.."

"ඉඹපු කතාව ගැන හෙට කතා කරමුකෝ.."

"බෑ.. බෑ.. අදම කතා කරන්න ඕන.."

ෂහනාස්ගෙ කතා බහේ සංතෝසෙ ඕනවටත් වැඩිය නැවරිල තිබුණා. මගේ හැම දුකකදිම මං ගාවට වෙලා දුක් විඳින මේ පුංචි කෙල්ල ගැන මහ විශාල ආදරයක් හිතේ කොහෙක හැංගුණා.

"ඔයත්තෙක්ක එළිවෙනකන් හරි මට ඉන්න පුළුවන් බබා.. ඒත් දැන් මම ගෙදර යන්න ඕන.. ඒ ගිහිල්ල මක්කොටම හොරෙන් කාමරේට පැන ගන්නත් ඕන.."

ෂහනාස් කිව්වෙ තාලෙට ඇඳල පැදල. ෂබී අද දාන මේ කලර්ස් මෙච්චර දවසක් එයා ගාව හැංගිලා තිබ්බ එකනෙ වැඩේ. ඊටත් වැඩිය මං ඒව දැක්කෙ නැති එකනෙ වැඩේ.

"ඇයි ඒ..?"

"ඇයි ඒ කියන්නෙ බබා.. මගේ මුළු ඇඟ පුරාම ඔයාගෙ සුවඳ පිරිලා. ඊටත් වැඩියෙන් ඔයා බීපු ඒවගෙ සුවඳ.. ගෙදර අය බලයි මාත් බීලද කියලා.."

"එහෙනම් ඉතිං දවසක මාත්තෙක්ක බොමුද..?"

"ඇත්තමයි දෙනව දෙකක්.. ආයෙ ඔය වගේ කතාවක් කිව්වොතින් හෙම.. හොඳ බබා වගේ මට ප්‍රොමිස් වෙන්න ආයෙ බොන්නෑ කියලා.. ප්ලීස්.."

මගේ අතින් තද කරල අල්ලන ගමන් එයා කිව්වා.

"හුඟක් රෑ වුණා ෂබී.. ඔයාව ගෙදරින් හොයනවත් ඇති.."

"ගෙදරින් හෙව්වට කමක් නෑ.. හොඳ බබා වගේ මං අහපු දේට උත්තරයක් ඕන.. කට්ටයා වගේ හොරාට මග අරින්න බෑ.."

"ම්.. හොඳයි.. මං ආයෙ නොබී ඉන්නම්කො.."

ෂහනාස්ගෙ කම්මුලකට හාද්දක් දීල මං පොරොන්දු වුණා.

"අන්න හරි ෂෝක් බබා.. දැන් ඉතින් හොඳ ළමයා වගේ ගෙදර ගිහිල්ලා හොඳට නිදාගන්න ඕන හොඳද..? මං හෙට උදේම ඔයාව හම්බවෙන්න එන්නම්.."

ඒත් මං වාඩිවෙලා හිටපු සීට් එකෙන් හෙලවුණේවත් නෑ.

"ඇයි බබා..?"

"නියාස් ඔයාලහ ගිහින් මොනව කියල්ද දන්නෑනේ.."

"ඔයා ඒ ගැන හිතන්නෙපා.. මං ඒක බලාගන්නම්.. ඒක නෙමේ.. ඔයා දන්නැති දෙයක් කියන්නද..? ඔයාගෙ ඒක හාද්දකට මාව ආත්ම ගානක් සන්තෝසෙන් තියන්න පුළුවන්.."

ෂහනාස්ගෙ කටහඬේ තිබ්බෙ පුදුම තරම් ශක්තිමත් බවක්. ඒත් හුඟාක් රෑ වෙලා හින්ද එයා අකමැත්තෙන් වගේ වෙහිකල් එකෙන් බැස්සා. එයා ඇරපු දොරින්ම මාත් බැහැල පාරට ආවා.

"බලන්න බබා.. දවල්ට මේ හරිය කොයි තරම් ලෑපිත්ද කියලා.. ඒත් දැන් ඔයයි මායි විතරයි.."

"නෑ.. තවත් කෙනෙක් ඉන්නවා.."

ඒ කවුද කියල අහන්න වගේ ෂහනාස් මගේ පැත්තට හැරුණා.

"ඇයි.. ඔයාගෙ වෙහිකල් එක.."

අහස පුරාම පැතිරිලා තිබ්බ හඳ එළියෙන් මං ෂහනාස්ගෙ පිං පාට මූණෙ මතුවෙච්ච ලස්සන හිනාව දැක්කා. මෙච්චර දවසක් වෙච්ච හැම දෙයක්ම අමතක කරල දාලා මං ඒ හිනාව දිහා බලන් හිටියා.

"අනේ ඉතිං.. ඔන්න කල්පනා කරන්න ගත්තා. කෝ යමු.. මං ඔයාව 122 බස්සෙකකට දාන්නම්.. එන්නකො බබා.."

මගේ අතකින් අල්ලගෙන ගිහින් වාහනේ ඉස්සරහ සීට් එකෙන් වාඩි කරවල එයා ඩ්‍රයිවින් සීට් එකේ වාඩිවුණා. විකකින් මාව 122 බස්සෙකකට නග්ගවල ෂහනාස් යන්න ගියා. එයා ගාව තැවරිලා තිබ්බ පර්ෆියුම් සුවඳ හුහක් වෙලා යනකන් මං වටේ තියෙනව මට දැනුණා.

* * * * *




"කොහෙද පොඩී ගියේ..?"

ගෙට ගොඩවෙන්නවත් හම්බවුණේ නෑ.. මද්දු අයියා මං ඉස්සරහට ආවා. මෙච්චර වෙලා මං එතකන් බලන් ඉඳලද කොහෙද..?

"ඇයි මං කියල ගියේ රාණිව හම්බවෙන්න යනව කියලා.."

"බොරු කියන්නෙපා පොඩී.. උඹ ඒ පලාතකවත් ගිහිල්ලා නෑ.. කෝ.. කෝ.. මට ළං වෙයන් බලන්න.."

මද්දු අයියා මාව ළඟට ඇදල ගත්තා. ඇදල අරගෙන මගේ කට ළඟට නහය කිට්ටු කරල පොලිස් බල්ලෙක් වගේ ඉව ඇල්ලුවා.

"මින්.. උඹ අදත් බීල පොඩී.. අරගෙ රාජ් කලබල වෙලා. උඹ මට පොරොන්දු උනා ආයෙ බොන්නෑ කියලා. එහෙම තියෙද්දිත් ඇයි පොඩී මේ.. උඹ හදන්නෙ මගේ හිත කුඩු පට්ටම් කරල දාන්නද..? ආ.. පොඩී මට කියපං.."

ඉන්ට්වල් නැතුව මද්දු කියවගෙන යනවා. කනාමදියා වගේ

බීපු ඒවා ඉස්සෙල්ල තුන් කාලක් විතර ෂබ් ඉස්සරහදි හිඳිලා ගියා. දැන් ඉතුරුවෙලා තිබ්බ කාලත් මද්දු අයියා ගාවදි නැතිවුණා. එහෙම තියෙද්දිත් මද්දු අයියට අරක්කු ගඳ එන එකනෙ වැඩේ. මද්දු අයියව අතෑරල මං ගේ ඇතුළට ආවා.

"ම.. මං කියෙ ඉඳන්ද පොඩී බලන් ඉන්නෙ.. බලපං.. මං උඹටත්තෙක්කා ඉව්වා.. අම්මා මට කියල තියේ උඹව හොඳට බලා ගන්න කියලා. අනේ මං උඹේ කියන තැනකට වඳින්නම් පොඩී.. ඔය බොන එක නවත්තලා දාපං.. .ඕව පුරුදු වෙන්න හොඳ දේවල් නෙමේ.. මේවා දන්නව නම් අම්මා පණුව පැලිලා මැරෙයි.."

මද්දු අයියා අඬනවා. ගහලවත් අඬවන්න බැරි මද්දු අයියා අඬනවා. 'කමක් නෑ.. අදින් පස්සෙ මම බොන්නෑ මද්දු අයියෙ.. ඔයාගෙ ඔය රත්තරං හිතට මං ආයෙ කවදාවත් දුකක් දෙන්නෑ..' මං හිතාගත්තා.

"මල් පුවඳ තියෙන කටකින් අරක්කු බොන්න බෑ පොඩී.. ඒත් උඹ ඒක කරනවා.. උඹ නාස්තිවෙනවා මට බලන් ඉන්න බෑ.. මං කියන දේ උඹ අහන්නෙ නැත්තං හෙට ඉඳල මාත් බීල ගෙදර එන්නම්.. එතකොට හැමදේම හරිනෙ.. නැත්නම් තව බෝතල් දෙකක් විතර දැන් ගෙනැල්ල උඹයි මායි සිහි නැතිවෙනකම් බොමු.."

තවත් කට පියාගෙන හිටියොත් මද්දු මොන වගේ යෝජනා ගෙනේවි කියල මට බය හිතුණා. මුට හිතුණොත් ඒ දේ කරල මිසක් පස්ස බලන්නෑ කියනෙක මං සහසුද්දෙන්ම දැනගෙන හිටියා.

"මං දිව්රලා කියන්නම්.. මීට පස්සෙ මං බොන්නෑ මද්දූ.."

"මං කොහොමද පොඩී උඹ කියන දේවල් විශ්වාස කරන්නෙ..? උඹ දන්නෑ මගෙ හිත කොයි තරම් පිච්චි පිච්චිද තියෙන්නෙ කියලා. මේ දවස් ටිකේ උඹ කියපුව කරපුව ලේසියෙන් අමතක කරන්න පුළුවන් කියලද උඹ හිතන්නෙ..? අා පොඩී..! මේ ඩිංග කාලෙට උඹ අවුරුදු ගානක් හිතන්න තරම් දේවල් කිව්වා.. කරා.. කාටවත් නෙමේ.. උඹ හන්දා මැරෙන්න වුණත් ඉන්න මටයි රාජ්ටයි.. උඹ අපේ හිත් හොඳටම රිද්දුවා පොඩී.."

"නෑ මද්දූ අයියෙ.. මං ඔයාලව හිතල රිද්දුවෙ නෑ. මට එහෙම කරන්න බෑ කියලා ඔයා දන්නවා.."

"බැරි එකක් නෙමේ පොඩී මං කියන්නෙ.. රාජ් කියන්නෙ උඹේ මොන්ටිසෝරි යාලුවා. උඹල දෙන්නම මොන්ටිසෝරි එක්කන් ගියේ මායි ලොකු අයියයි. ඒක හන්දම රාජ්ගෙ හිත මොන වගේද කියල මං හොඳටම දන්නවා. උඹ අදත් උගෙ බලන්න ගිහින් නෑ. ඔයිට වැඩයි හොඳයි උඹ උගේ කම්මුලට හොඳවයින් පාරවල් දෙක තුනක් ගැහුව නම්.. උං තාමත් හිතේ අමාරුවෙන් ඇත්තෙ.."

පපුව මැද්දටම පිහියකින් ඇන්න වගේ ඒ වචන ටික මගේ පපුව පලාගෙන ඇතුළටම ගියා. පුංචි කාලෙ ඉඳළම ළඟින් ඉඳපු මගේ අඹයව මං අතෑරල දැම්ම කියගෙන මගේ හිතට හරියට වද දුන්නා.

"උඹට රිදෙව්වෙ කවුරුවත්.. ඒත් උඹ රිදෙව්වෙ මටයි රාජ්ටයි. උඹ හිනාවෙලා ඉන්නව බලන්න අපි තරම් වෙන කවුරුවත් ආස නෑ මල්ලී.. උඹේ හිනාවක් දකින්න බලන් ඉන්න අපි වගේ කාලකණ්ණින්ට මෙහෙම කරනෙක වැරදියි පොඩී.."

මද්දූ කියවන් යන ඒවට පපුව කඩාගෙන යනවා. තවත්

ඉවසන් හිටියොත් නම් හිතක් කියල දෙයක් ඉතුරු වෙන්නෑ කියල මට තේරුණා. මට තවත් ඉවසන්න බෑ.

"ඇති මද්දු අයියෙ.. ඇති.. මං ආයෙ බොන්නෑ කියල ඔයාගෙ මූණ ඉස්සරහදිම ප්‍රොමිස් කරන්නම්.. මට ආදරේ නැති ඈයො මාව රිද්දල මං ගාවින් ගියාට මං ඔයාලව රිද්දුවෙ ඇයි කියලා මටවත් හිතාගන්න බෑ.. ඔයා ඔයාගෙ පුංචි එකාට සමාව දෙනව නේද..? මද්දු අයියා.. ඔයා මට සමාව දෙනව නේද..?"

මද්දු අයියගෙ අතින් අල්ලගෙන මං කෑගහල ඇඬුවා. හිතට අලුතින් එක්කහු වෙච්ච මේ දුක් කන්දරාව හෝදල දාන්න මට ඕන උනා.

"උඹට දෙන්න බැරි දෙයක් මං ළඟ නෑ පොඩී.. දැන් මට පේන්න එකම එක පාරක් හිනාවෙයන් මල්ලි.."

මද්දු අයියා එහෙම කියල ඉවර වෙනවත්තෙක්කම ගේ ඉස්සරහ මිදුලට ත්‍රීවීල් එකක් එනව මං දැක්කා. මේ රෑ ජාමෙ කවුද දන්නෑ..

"අම්මාවත් ආවද මංදා.."

මද්දු අයියා එහෙම කියද්දි මාව හීතල වෙලා ගියා. හත්තිලව්වේ.. අම්මා ආවොත් හෙම මං ඉවරයි. ඒත් ඉස්සරහ දොරෙන් ගෙට ආපු එකා දැකල පපුව ටිකක් කූල් උනා. රාජී.. උණ ඩිංගක් වෙලා මගේ මූණ දිහා බලන් ඉඳල එකපාරටම මං ළඟට ආවා. ඇවිත් මගේ මැණික් කටුවලින් අල්ලගෙන මගේ අත්වලින් උගේ කම්මුල්වලට මහ හයියෙන් ගහගත්තා.

"රා.. රාජී මේ.. මොකද..? උ... උඹට පිස්සුද..?"

කතා කරගන්න පුළුවන් වෙච්ච පළවෙනි තත්පරේදීම මං උගෙන් ඇහුවා. රාජ්ගෙ ඇස්වල කඳුළු පිරිලා.

"ම.. මං උඹට කරපු වැරැද්දක් නෑ.. උඹ මගේ පණ කියලයි මං තාමත් හිතන්නෙ.. මං ගහගත්තෙ උඹ මට ගහන්න බැරිකමට ඉන්නව කියල හිතුණ හින්දා. කෙල්ලෙක් හින්ද මගේ හිත කඩල දාන්නෙපා.. උඹ මට මෙච්චර දවසක් කියපුව උඹේ හිතේ තියෙනවද නැද්ද කියල මං දන්නෑ.. සමහර විට උඹට අමතකත් ඇති. ආයෙ එහෙම කියන්නෙපා මචං.. මගේ හිත කොයි තරම් හිට් උනත් උඹ කියන ඒවලින් කුඩුපට්ටං වෙලා යන්න ඒ තරම් වෙලා යන්නෑ.. ඒක හොඳට මතක තියාගනින්.."

ඇස් දෙකේම කඳුළු පුරවගෙන රාජ් කියද්දි මං බිම බලාගත්තා. ජීවිතේටත් වැඩියෙන් ආදරේ කරපු කෙල්ල මාව අතෑරල දැම්මහම මට පණ වගේ ආදරේ කරපු රත්තරං යාලුවෙකුගෙයි, ජීවිතේටවත් ආයෙ හම්බවෙන්නැති හොඳ සහෝදරයෙකුගෙයි හිත් රිද්දපු මං කොයි තරම් කාලකන්නියෙක්ද කියල මට හිතුණා.

"ම.. මට සමාවෙයං රාජ්.. දෙයියන්ගෙ නාමෙට මට සමාවෙයං.."

රාජ්ගෙ අත් දෙකම මං මගේ අත් දෙකෙන් බදාගත්තා. අපි තුන්දෙනාගෙම ඇස්වල කඳුළු පිරිලා. අනේ දෙයියනේ අපි කොයි තරම් සන්තෝසෙන් හිටියද..? පහුගිය කාලෙ මේ ගෙදර මොන තරම් සතුටක් පිරිල තිබ්බද..? වෙලා තියෙන මේ හැමදේකටම වග කියන්න ඕන මමයි කියල මගේ හිතට දැනෙද්දි මට කරන්න දෙයක් තිබුණේ නෑ.

"දැ.. දැන් ඒව ඔක්කොම හරි.. අපි ඒ හැමදේම අමතක

කරල දාමු විහඟ.. උඹ බයවෙන්නෙපා.. උඹට කවුරු නැතත් මායි මද්දුයි ඉන්නවා.."

රාජ්ගෙ කටහඬේ තිබ්බ ලොකු අධිෂ්ඨානයක්. මෙච්චර වෙලා මගේ හිතේ තිබ්බ බර ගතියත් අඩුවෙලා ගියා වගේ. මගේ හිත කෑලි කෑලිවලට කඩල දාපු අංජලී නිසාද මං නැති කරගන්න ගියේ මොන තරම් වටින හිත් දෙකක්ද කියල තේරෙද්දි මටම ලැජ්ජා හිතුණා.

"ම.. මං ආයෙ කෙල්ලෙක් දිහාවත් බලන්නෑ මද්දු අයියේ.. මගේ හිත ගැන හොඳටම දැනගෙන හිටපු අංජලීත් වෙනස් වුණා නම්.. අනිත් කෙල්ලො ගැන හිතලා වැඩක් නෑ.."

මගේ හිත උඩම තිබ්බ අදහස මං කිව්වා. මද්දුගෙ මූණට අර සුපුරුදු කුණු හිනාව ආවා. මෙච්චර වෙලා ඔය හිනාව කොහේ තිබ්බද කියන එකනෙ වැඩේ.

"ඕව ගැන අපි හෙට උදේට කතා කරමු.. උඹ දැන් රිලැක්ස් එකේ නිදාගනිං.. මහන්සිත් ඇතිනේ.. හෙට උදේ මේ ප්‍රශ්නෙ මුල ඉඳල අරගෙන සාකච්ඡා වට මේසයක් දාගමු.. වැඩේ ඉවරනේ.."

මද්දු මුකුත් කියන්නත් කලින් රාජ් මැද්දට පැන්නා. එහෙම වෙච්ච එකත් හොඳයි.. බලන් ගියාම අද දවසත් ඇවිල්ලා මාරම දවසක් තමා. කොයි තරම් දේවල් සිද්ධ වුණාද අප්පා. මෙහෙම හරි මලුව බේරගෙන ඉන්න එක නම් ලොකු දෙයක්.. ඒත් ඒ හැමදේම අතරින් අංජලී ක්‍රිශාන් එක්ක එකට ඉඳපු හැටි මතක් වෙද්දි මගේ හිත පිච්චිලා ගියා. ඔයාට ඔහොම කරන්න පුළුවන් වුණේ කොහොමද අංජලී..?

"ඒ පාර ආයෙමත් කල්පනා කරන්න පටන් ගත්තා. මායි

රාජුයි මෙච්චර වෙලා බණ කියනව වගේ කිව්ව ඒව ඇඩක් නැද්ද පොඩී..?"

මද්දු අයියා මගේ මූණට ආයෙත් එබුණා. මං හින්ද මද්දුවයි රාජ්ටයි නිදහසක් නෑ. ඇත්තම කියනව නම් මං දැන් මුං දෙන්නටම ඇණයක් වෙලා කියනෙක මටම තේරුණා. ඒක හින්ද මං ලං දෙන්නටම ගුඩ් නයිට් කියල කාමරේට රිංග ගත්තා. විකකින් රාජුත් ත්‍රීවීල් එකේ නැගල යනව මට හීන් සද්දෙට ඇහුණා. බීපු අරක්කුවල මත නාම මලුවෙ යාංතමට තිබ්බ හින්දද කොහෙද හීන් සීරුවෙ මගේ ඇස් පියවෙනව මට යාංතමට මතක තිබුණා.

❋ ❋ ❋ ❋ ❋

කිසිම හැල හොල්මනක් නැතුව දවස් දෙක තුනක් ගෙවිල ගියා: ලොකු අයියලහ ගියපු අම්මත් ආපහු ගෙදර ආවා. පහුගිය දවස් ටිකේ සිද්ධවෙච්ච කිසිම දෙයක් අම්මගෙ කනට නොඇවෙන්න මායි මද්දු අයියයි හුඟාක් පරිස්සම් වුණා. හැම තිස්සෙම අම්මා ඉස්සරහ හිනා මූණක් පෙන්නන් ඉන්න මං ලොකු උත්සාහයක් ගත්තා. ඒත් හිත ඇතුළෙන් මං කොයි තරම් ඇඬුවද කියල දන්නෙ මං විතරයි. මං ගෙදරින් එළියට බැස්සෙත් එහෙමත් වෙලාවක විතරයි. මගේ පුංචි කාමරේ ඇතුළෙ මං බලෙන්ම සිරකාරයෙක් වෙලා හිටියා. අඩුගානෙ රාජ්ගෙ වීඩියෝ සෙන්ටර් එක පැත්තෙවත් මට යන්න හිතුනෙ නෑ. මද්දු අයියා වුණත් පහුවෙච්ච කාලෙ සිද්ධවෙච්ච කිසිම දෙයක් ගැන මගෙත්එක්ක කතා කරේ නෑ.

"පොඩී.. මේ බලන්න කවුද ඇවිත් තියෙන්නෙ කියලා.."

අම්මගෙ කටහඬ ටිකක් සද්දෙට ඇහුණා. ඒ පාර කවුද දන්නෑ ඇවිල්ල තියෙන්නෙ.. වෙඩින් කාඩ් බෙදන්න අප්ලියි ක්‍රිශානුයි

ඇවිල්ලද දන්නෙත් නෑ. මගේ පපුවෙ ස්පීඩ් එක මහා සද්දෙට වැඩිකරා.

"කවුද අම්මා..?"

මං ඇදේ ඉඳන්ම ඇහුවා. ඇත්තටම අංජලීට මූණ දෙන එක ගැන දෙපාරක් හිතන්න ඕන කියල මගේ හිත මට කිව්වා.

"ඔයා එන්නකො පොඩ්ඩ.. කාමරේ ඇතුළට වෙලා මොනවා කරනවද මංදා.."

ඒ පාර අම්මා ඇවිත් කාමරේ ඇතුළට එබුණා. අම්මගෙ මූණෙ තිබ්බ ලස්සන හිනාවක්.

"කවුද අම්මා..?"

මං ආයෙත් රහසින් වගේ ඇහුවා.

"මංදා.. බෝනික්කියක් වගේ ලස්සන ළමයෙක්.."

අම්මත් රහසින් කිව්වෙ. මට හිනා ගියා. ඒ හිනාව පිටින්ම මං සාලෙට ආවා. ෂහනාස්.. මාව දැක්කහම ඒ සුදු මූණ මැදට අහිංසක හිනාවක් ආවා.

"ඔබ්.. අපේ අම්මා කියනාවා ඔයා බෝනික්කියක් වගේලු.."

දැන් ෂහනාස්ගෙ හිනාව, මොකක්දෝ ලැජ්ජාවකින් වැහිල ගිහින් තිබුණා.

"ඇත්තමයි පොඩී.. මං ගහනවා දෙකක්. ඒ ඩිංගට එකත් කිව්වා.."

අම්මා මට හෙමීට පිටට පාරක් ගහගෙන යන්න ගියා. දිග සැටියෙ මං ෂහනාස් ළඟින් වාඩිවුණා.

"තව ඩිංගෙන් මං හින්ද අම්මගෙනුත් ගුටිකන්න වෙනව නේද විහඟ අයියේ.."

"ඔව් බෝනික්කියෙ.."

"ඔය.. ඉතිං ඒ පාර තවත් එකක් අල්ලගෙන.."

ෂහනාස්ගෙ මූණට අපූරු හිනාවක් ආවා.

"ෂකී.. හිනාවෙනකොට හරි ලස්සනයි.."

"අයිය ගෙත් ඔය වගේ දෙයක් අහන්න මං කොයි තරම් පිං කරල ඇතිද..? නේ.."

උත්තර දීගන්න අමාරු ප්‍රශ්නයක් තමයි ෂහනාස් ඇහුවෙත්. අනේ මංදා. හිත කොයි තරම් සන්සුන් කරල තියාගන්න හැදුවත් මං ෂහනාස් ඉස්සරහ කලබල වෙනවා.

"ඉතිං බෝනික්කියෙ.. ඇයි මේ හදිස්සියෙම.."

හිතේ තිබ්බ හැම දෙයක්ම පැත්තකට දාලා මං සැහැල්ලු වෙන්න ට්‍රයි එකක් දුන්නා. විහඟ වික්‍රමසිංහ කියන්නෙ හැම දුකක් කරදරයක් මැද්දෙත් ඔලුව උස්සන ජාතියෙ කොල්ලෙක්.

"ඔයිය.. ආයිමත් කියනවා.. මට ෂකී කිව්වහම ඇති අයියා.. කෝ ඉතිං ඔයා නිකංවත් ඇහුවෙ නෑ එදා රෑ මාව ඉඹල ගියාට පස්සෙ මොකද වුණේ කියලා.."

ෂහනාස් ඒ ටික නම් කිව්වෙ හුඟාක් හෙමීට. මේ බෝනික්කි කියන්නෙත් ඇත්ත. මගේ ඔලුවෙ තියෙන්නෙ මැටිද මංදා. එදා රෑ තදයා වගේ ඩෝප් මරගාතෙ ෂහනාස්ව ඉඹබට එකනින් එහාට මොනාව වුණද දන්නෙ නෑනෙ.

"අනේ සොරි ෂකී.. ඉතිං කියන්නකෝ මේ දවස් දෙක තුනේ මොනවද උනේ කියලා.."

"ඒ තරම් ලොකු ප්‍රශ්නයක් නම් උනේ නෑ.. අල්ලාට පිං සිද්ධ වෙන්න.. නියාස් ඊයෙ දවල් ආවා මාව හම්බවෙන්න.."

"ඉතිං..?"

ෂහනාස් මොනවදෝ කියන්න කට හදද්දි අම්මා කූල් ඩ්‍රින්ක් එකක් හදාගෙන ආවා.

"ආපු වෙලේ ඉඳන් මේ දරුවව කතාවට අල්ලා ගත්තා මිසක බොන්නවත් මොකුත් දුන්නෑ.. යාලුවොන්ට ඔහොමද පොඩී සලකන්නෙ..?"

"යාලුවොන්ට නෙමේ අම්මා බෝනික්කියන්ට.."

ෂහනාස්ගෙ මූණටයි අම්මගෙ මූණටයි හිනා පිරුණෙ එකම පැරේට වගේ. ඒ හිනාවත්තෙක්කම අම්මා යන්න ගියා.

"පාට්නර්ට බීම නෑ නේද..?"

ෂහනාසුත් මාර ඒව තමයි අල්ල ගන්නෙ. ඒ පාර මද්දු අයියා මට කතා කරන විදිය අල්ලගෙන.

"පාට්නර්ට බීම බෝනික්කි දේවිනෙ.. ඉතිං අර කතාවෙ ඉතුරු ටික.."

"මට නියාස් ගැන හුඟාක් දුකයි විහඟ.. නියාස් මගෙන් කෙලින්ම ඇහුවා. මාව බඳින්න බැරි නම් බෑ කියල කියන්න.. මං තරහ නෑ.. ඔයා විහඟට කැමති නම් විහඟව මැරි කරන්න කියලා.."

බලන් ගියාම නියාස් කියන්නෙත් ත්‍රිශාන්කාරයා වගේ සිරා පොරක්නෙ. අඩේ මගේ කතාවෙ එතකොට දුෂ්ටයො කවුරුවත් නැහෙ. මට තමයි දුෂ්ටයා වෙන්න වෙන්නෙ.

"ඉතිං..?"

"මං නියාස්ට කිව්වා.. ඔයා තාමත් හැමදේම ගැන හිතං ඉන්නෙ වැරදියට කියලා. විහඟ කියන්නෙ මට ලං කරගන්න පුළුවන් කෙනෙක් නෙමෙයි.. එයා කවදාවත් මාව බඳින්නෑ කියලා.. අනික විහඟ කියන්නෙ මගේ ආගමේ නෙමෙයි මගේ ජාතියෙන් නෙමෙයි.. ඒක හින්ද ඔයා හිතන් ඉන්න මොනාවත් වෙන්නෑ කියලා.."

ෂහනාස් කියවන් ගියපු හැම වචනයක්ම හැම අකුරක්ම ඇත්ත. ඒත් මගෙ හිතට මහා වේදනාවක් දැනුණා. 'එයා කවදාවත් මාව බඳින්නෑ' කියල ෂහනාස් කිව්ව දේ මගේ ඔලුවට පොල්ලකින් ගැහුවා වගේ වැදුනා.

"ඇ.. ඇයි ෂබී.. ඔයා එහෙම කිව්වෙ..?"

"ඉතිං විහඟ.. මං නියාස්ට ඇත්ත තත්වෙ පහදන්න ඕනනෙ.. නියාසුත් මට ඔයාව මැරි කරන්න කියද්දි මං කොහොමද මේ හැමදේම දරාගන්නෙ..? මොන දේ උනත් ඔයාගෙ හිතේ ඉන්නෙ අංජලී කියල මං දන්නවා.. ඔයා තාමත් අංජලීට පණ වගේ ආදරෙයි කියලත් මං දන්නවා.. එහෙම තියෙද්දි, එහෙම ඔයා හිතද්දි මං වෙන කොහොම කතා කරන්නද බබා.."

"ඕ.. ඔයා හිතන්නෙ මට ඔයාව මැරි කරන්න බැ කියලද..?"

තවත් මේව ඉවසන්න බෑ.. මං කෙලින්ම ෂහනාස්ගෙන් ඇහුවා.

ඇයි දෙයියනේ මේ එක ප්‍රශ්නෙකට හරි උත්තරයක් තියෙන්න ඕනනෙ. මං අහපු දේට ෂහනාස්ගෙ මං ආසම කරන පුංචි හිනාව තොල්පෙති උඩ පිපුණා.

"බෑ බබා.. ඒ දේ කරන්න ඔයාට බෑ.. ඔයාගෙ මුලු හිතම අංජලී අයිති කරගෙන ඉන්දෙද්දී ඔයාට මුකුත් කරන්න බෑ.. දැන් ඔයා ඔය කලින් අහපු ප්‍රශ්නෙත් මගෙන් ඇහුවෙ හිත ඇතුළෙන්ම නෙමෙයි නේද..? හැබැයි එක දෙයක් තියෙනවා. ඔයාව දැකපු දවසෙ ඉඳල ඔයාට ආදරේ කරපු මට ඔයා වෙනුවෙන් තව ආත්ම හතක් බලන් ඉන්න කියල කිව්වොත් මං ඒකත් කරනවා.."

ෂහනාස්ගෙ කටහඬේ තිබ්බෙ ශක්තියට මගේ හිත දෙදරල ගියා. ඇයි මම තීරණයක් ගන්නැත්තෙ..? ඇයි මට කෙලින්ම ෂහනාස් එක්ක එෆෙයාර් එකක් පටන් අරගෙන එයාව බඳින්න බැරි. මං මගෙන්ම අහගත්තා.

"මං.. මං ඇවිත් ඔයාගෙ ඔළුවත් අවුල් කරා නේද බබා.."

මගේ ඇස් දෙක ඇතුළටම එබිලා ෂහනාස් ඇහුවා. ඒ මූණෙ තිබ්බ ආදරේ දැකල මගේ හිත මොකක්දෝ ආශාවකින් පිරිල ගියා.

"නෑ ෂබී.. ඔයා ආපු එක කොයි තරම් හොඳද..? මං හරි පාලුවෙන් හිටියෙ.."

"එහෙනම් මං ඇවිල්ලා ඔයාගෙ පාලුව නැතිකරල දාම්මා.."

ඔළුව පැත්තකට ඇල කරලා අර පිං පාට මූණ රෝස පාට කරගෙන ෂහනාස් ඇහුවා. පුංචි එකෙක් වගේ ඒක අහපු හැටි.. අපි දෙන්නගෙ කතාබහ ආයෙත් සාමාන්‍ය තත්වෙට ඇවිත් තිබුණා.

"ඔව් ඉබී.. ඔයා මට කරපු උදව්.. ඔයා මට දුන්නු ආදරේ.. මගේ ජීවිතේ ඉවරවෙලා යනකම්ම මට මතක තියේවි. සමහර වෙලාවට ඔයා නැතුව ගෙවිල යන පාලු දවස්වලට ජීවිතේ විඳවන්න ඒ ලස්සන දේවල් හිත ඇතුළට වෙලා ඉඳීවි. ඔයා කිව්ව හරි ඉබී.. අංජලී මහා පවුරක් වගේ මගේ හිත උඩ හිටගෙන ඉන්දෙද්දි ඔයාව බැඳල ඔය රත්තරං හිත විනාශ කරන්න මට බෑ.. ඒත් මොන දේ වුණත් මට ඔයාව දකින්නැතුව ඉන්න බෑ.."

"අ.. අනේ ඔහොම දුකෙන් කතා කරන්නෙපා විහඟ.. මං ආවෙ ඔයාගෙ හිනාව බලල යන්න රත්තරං.. මං.. මං කියපුව හැමදේම අමතක කරල දාන්න දෙයියනේ.."

ඉහනාස් එහෙම කිව්වා වුණත්, මං ඒ අහිංසක හිත විනාශ කරල දැම්මා කියන ලොකු චෝදනාව මගේ හිත ඇතුළෙන්ම ආවා.

"ඔයාව අමතක කරන්න බෑ ඉබී.. ඒකයි මං මේ විඳවන්නෙ.. මගේ ජීවිතේ මට ඉස් ඉස්සෙල්ලාම හම්බවෙච්ච ඔයයි අංජලියි දෙන්නම මට අයිති නෑ.."

"ඒ කතාවට මං කැමති නෑ බබා.. අංජලී කොහොමද කියල මං දන්නෙ නෑ.. ඒත් මං ඔයාගෙ.. ඔයා මගේ නොවුණට මං හිතන්නෙ හැමදාමත් ඔයා මගේ කියලයි.. අනිත්තෙක තමයි මාව ඉඹින්න මං ඉඩ දුන්නෙ ඔයාට විතරයි.. සමහර වෙලාවට ඒක හැමදාටම එහෙමම වේවි.."

"ඔ.. ඔයා මොනවද ඉබී මේ කියන්නෙ..?"

"ම.. මං ඇත්ත කිව්වෙ විහඟ.. ඔයා ඔයාගෙ ජීවිතේ ගැන තීරණයක් ගන්න.. දෙයියන්ගෙ නාමෙට නැත්නම් අපි හැමෝගෙම

ජීවිත විනාශ වෙලා යාවි.. ඔයා එහෙම ඉන්නෙකොත් කාටවත් හොඳ දෙයක් වෙන්නෑ.."

මහනාස් මං ගාවින් ගිහිල්ලා හුඟ වෙලාවක් යනකං එයා කිව්ව ඒ වචන මගේ හිතේ දෝංකාර දුන්නා. මොන දේ වුණත් මහනාස් මට ඇඟිල්ලෙන් ඇනල වගේ කියල ගියෙ ලොකු ඇත්තක්. ඇත්ත.. මං මගේ ජීවිතේ ගැන තීරණයක් ගන්න ඕන.. ඒත් දෙයියනේ මොකක්ද මං ගන්න තීරණේ..?

* * * * *

හවස් වරුවෙ රාජ්ව හම්බවෙන්න යන්න හිතාගෙන හිටියත් ඇට්ටි හැලෙන්න වහින්න ගත්තා. මං ගමන කල් දැම්මෙ දෙපාරක්වත් හිතන්නෙ නැතුව. ඕන්.. මේ වෙලාවෙම වහින්න ගත්තනෙ. අම්මප මේ වැස්ස වළාහක දෙයියොන්ටත් කහ උණද මංදා. මේ වෙලාවෙම වහින්න ගත්තෙ.

"පොඩී..?"

ගේ ඇතුළෙන් අම්මගෙ කටහඬ ඇහුණා. සාලෙ පහුකරන් ඒ හරියට යන්නත් කම්මැලියි. ඒත් මං අම්මා ළඟට ගියා.

"මොකද දරුවො ඔයාට වෙලා තියෙන්නෙ...? මොන ලෝකෙද ඔයා ඉන්නෙ.. මං කීපාරක් නම් කතා කරාද..?"

අම්මගෙ ඇස් දෙක තිබ්බෙ මගේ මූණෙමයි. මමත් මොනව කල්පනා කර කර හිටියද මංදා. ඒත් ඉතිං වැස්ස වළාහක දෙයියො ගැන කල්පනා කෙරුව කියල කියන්නයැ.

"මං මේ අහන්නමයි හිටියෙ.. දැන් හුඟ දවසකින් අර ළමයා ආවෙ නෑ නේද..? මුකුත් අසනීපයක්වත්ද..?"

"මොන ළමයද අම්මෙ..?"

අම්මා ඇහුවෙ අංජලී ගැන කියල මං දන්නවා වුණත් මාත් අම්මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඇරත් අම්මා අංජලී ගැන මේ තරම් දුරට හිතාවි කියල මං හිතුවෙ නෑ. අංජලී මගේ ළඟින් හිටිය නම් මං මොන තරම් සංතෝෂෙන් ඔය ප්‍රශ්නෙට උත්තර දෙනවද..?

"ඔයාට ඇත්තටම මොනව වෙලාද කියල මට තේරෙන්නෑ පොඩී.. මං ඇහුවෙ අර වෙනදට මෙහේ එන පුංචි කෙල්ල ගැන.. එයාව බේරන්න ගිහින්නෙ ඔයා බයික් එකෙන් වැටුණෙත්.. ඒකවත් මතක නැද්ද..?"

"මංදා අම්මෙ.. එයාට වැඩ ඇති.. ඒකනෙ එන්නැතුව ඉන්නෙ.."

එහෙම කියාගෙන මං ආයෙමත් කාමරේට රිංග ගත්තා. මං කිව්ව දේ ගැන අම්මා පොඩ්ඩක්වත් විශ්වාස කරේ නෑ කියල අම්මගෙ මූණෙන්ම මට තේරුණා.

හවස් වෙද්දි මද්දූ අයියයි රාජුයි ආවා. එළියෙ නම් වහිනවා.. මගේ වවුල් එක අරගෙන රාජ් ඔලුව පිහිද පිහිද මං දිහා බැලුවා. මද්දූ අයියා නම් ඒ තරම් හෙමිල නෑ.

"මාර වැඩේනෙ මද්දූ.. අම්මා මගෙන් අංජලී ගැන ඇහුවනෙ.. මට කියන්නවත් දෙයක් තිබුණේ නෑ.."

මං කිව්ව දේ මද්දූ සත පනකටවත් ගණන් ගත්තෙ නෑ. මද්දූ රාජ් දිහා බැලුවා.

"අම්මා අහන්නැතුව ඉඳියිද පොඩී.. උඹ ගෙවල යකා වගේ ගේ අස්සෙ රිංගගෙන ඉන්නකොට.."

මද්දුත් කියන්නෙ මාර කතා තමයි.

"අර පවත්වනවයි කියපු සාකච්ඡා වට මේසෙ අද දාමු.. විංගත් ඉඳපල්ලා.. මං ටේන්ජ් එකක් දාගෙන එන්නම්.."

මද්දු කාමරෙන් ගියාට පස්සෙ මං රාජ් දිහා බැලුවා. එච්චර වෙලා මං දිහා බලන් ඉඳපු රාජ් අහක බලා ගත්තා.. මූට ඒ පාර මොකක්ද වෙලා තියෙන්නෙ..? දවස් දෙක තුනක් මූ හම්බවෙන්න ගියේ නැතුවටද මූ අවුල්වෙලා තියෙන්නෙ..?

"කුණුවෙන්න එහිද්දි එළියටවත් බහින්න බෑ රාජ්.."

හිතින් හිතල, අනුමානෙනේ කරල උපකල්පනේ කරලා වෙලා තියෙන්නෙ ඒක කියලා හිතාගෙන මං කිව්වා.. මේ දවස් දෙක තුනට උගෙ රැවුලත් වැවිලා. මූ දිගටම වවන්න හිතනවද දන්නෙ නෑ.. උත් එක්ක කතාබහ කරලා රැවුල වැවීම ගැන ටිකක් හිතන්න ඕන.. මෙච්චර ඇනිලා ඉන්දෙද්දිත් මට එන්නෙ මාර මැංවල් අදහස් තමයි.

"උං.. උඹ නටන්න හදන නාඩගම මොකක්ද කියල මට තේරෙන්නෙ නෑ විහඟ.."

හෙණ ගහන්න වගේ සං සං ගාල රාජ් කිව්වා. මාව ඩිම්වෙලා ගියා. මොකක්ද යකෝ මේ වෙන්න යන්නෙ..?

"උඹ කියන්න හදන්නෙ මොකක්ද කියල මට තේරෙන්නෙ නෑ.."

"මේ ඊයෙ පෙරේදා ෂබී මෙහේ ආවෙ ඇයි..?"

"මං දන්නෙ කොහොමද බං.. ඒකි ආවා.. කතාබහ කරා.. පස්සෙ යන්න ගියා.. එච්චරයි.."

"ඕන දේකට උඹට උත්තර කියෙයනවා.. ඇත්තමයි මට කියපං උඹල දෙන්න මේ කරන්න හදන්නෙ මොකක්ද කියලා.. උඹටයි ෂබීටයි දෙන්නටම පිස්සුද..?"

රාජ් යකා වෙලා. අප්පට සිරි. මූ දන්නෙ කොහොමද යකෝ ෂහනාස් මෙහේ ආවා කියලා. ෂබීම කිව්වත්ද..? අඩුගානෙ මද්දු අයියවත් දන්නෙ නෑනෙ.. මගේ ඔලුව කකියන්න ගත්තා.

"රාජ්.. උඹ කියන්න යන දේ මට තේරෙන්නෙ නෑ.. ෂබී මෙහේ ආවෙ ගෙදර අම්මත් ඉන්න වෙලාවෙ.. අපි දෙන්නා කතා කර හිටියෙ සාලෙ.. උඹ කියන්නෙ ෂබී මගේ ගෙදරට ආවහම එළවගන්න කියලද..?"

"මං එහෙම දෙයක් කිව්වෙ නෑනෙ විහඟ.. උඹල දෙන්නා මේ හම්බවෙන හම්බවිල්ලෙ තේරුම මොකක්ද කියලයි මං ඇහුවෙ..? ඩිංගක් හිතපං.. අපේ ආගමේ නීති ගැන උඹලට අමුතුවෙන් කියල දෙන්න ඕන නෑනේ.. ඒ හැමදේකටම පයින් ගහල ෂහනාස් උඹව බලන්න උඹලගෙ ගෙදරටම එනවා.."

"හරි රාජ්.. උඹ කියන දේ මට තේරෙනවා.. ඒත් උඹ ඕක ඔහොම තේරුම් කරල දීල මදි.. කරන්න ඕන දේ උඹ මට කියපං.. ඒ දේනෙ මෙතෙන්ට ඕන.. මගේ ඔලුවත් අවුල්වෙලා.. ඇයි හත්තිලව්වෙ හැම එකාම බයිල ගහනාව විතරයි.. කරන්න ඕන දේ මොකක්ද කියල කියන්නෙ නෑ.."

අත් දෙකෙන්ම ඔලුව බදාගෙන මං කෑගැහුවා. ඒ එක්කමයි මද්දු අයියා කාමරේට එබුණෙ. පොරගෙ අතේ මගේ ටවල් එක.. මූ ඒක සින්නක්කරේටම තියා ගත්තා වත්ද..? අනේ දෙයියනේ.. මගේ එකම සහ අවසාන ටවල් එක.. මට ටවල් එක ගැන හෙණ දුකක් දැනුණා.

"කරන්න ඕන මොනවද කියල මායි රාජුයි මුලින්ම උඹට කිව්වා.. ඒ දේ කරන්නෙ නැතුව මෙතන ඇඳගෙන නාලා වැද්දා වගේ කෑගහන්නෙපා.."

මද්දු අයියා ඇවිත් මගේ ඇඳ උඩින් වාඩිවුණා. ඌ මට කොහොම් කොහොම හරි වැද්දා කියලත් කිව්වා. රාජ්ගෙ මූණත් කල්පනාවෙන් පිරිලා.

"මද්දු අයියා කියන්නෙ මට මොනව කරන්න කියලද..?"

මහා ලොකු කතාවක් කියන්න වගේ මද්දු ඇදේම හරිබරි ගැහුණා. රාජ් මේසෙට හේත්තු වුණා.

"දෙන්නෙකුට ආදරේ කරලා උඹට දිනන්න බෑ පාට්නර්.. පරදින එකම එකා උඹ.. තේරුණාද..? තවත් ඉස්සරහට ඔය සෙල්ලම කරන්න උඹ හිතන් ඉන්නව නම් මිනී වලවල් තුනකුත් කපලම ඉඳපං.."

මගේ හිත උඩ අකුණු දාහක් පිපිරුවා වගේ දැනුණා. මද්දු මොනවද මේ කියන්නෙ..?

"මේ.. මේකයි ම.. මද්දූ.."

"මට කතා කරන්න දීපං.. ඊට පස්සෙ ඕනෙ නම් උඹ කතා කරපං.. අංජලී, ක්‍රිශාන්ට බඳින්න යනවා.. එක හරි.. ඒකෙ ආශය හොයන්න දෙයක් නෑ.. එතකොට තරාදියෙ ඒ පැත්තෙ බර හරි.. දැන් අනිත් පැත්තෙ අර මුස්ලිම් බේබි ඉන්නවා.. උඹට තියෙන්නෙ ඒ පැත්තට නගින එක විතරයි.. තේරුණානේ.."

"ම.. මට ඒ දේ කරන්න බෑ මද්දූ.."

මං එකපාරටම එහෙම කිව්වහම මද්දුට තදවුණා. රාජ්ගෙ මූණ වුණත් අවුල් වුණා.

"කරන්න බැරිද පුළුවන්ද කියනෙක උඹේ තීරණේ.. බැරි නම් අංජලීවයි, මුස්ලිම් බේබිවයි දෙන්නම අමතක කරලා දාලා හිනාවෙලා ඉඳපං.. එහෙම නැතුව මෙතන විරෝපට්ටං ගහත් ඉන්න හෙම හැදුවොත් අම්මපල්ලා පාට්නර් මේ හැම දෙයක්ම මං අම්මයි ලොකු අයියයි එක්ක කියනවා. උඹ ඕන දෙයක් කරගනිං.."

මද්දු අයියා කියාගෙන කියාගෙන ගියා. රාජුත් මොනවාදෝ කියන්න කට හදනව කියල මට තේරුණා. කමක් නෑ.. ඌ කියන දේත් අහල කියන්න තියෙන දේවල් මං කියනවා.

"උඹට මං මෙච්චර කාලෙකට මේ දැන් කියන්න යන දේ කිව්වෙ නෑ.. ඒත් අද මට ඒ දේ කියන්න වෙනවා.. මාත් එක්ක තරහා වෙන්නෙපා..."

රාජ් කතාව නැවැත්තුවා. සුරංගනා කතාවක් අහන් ඉන්න පුංචි එකෙක් වගේ හිතේ තිබ්බ හැම සිතුවිල්ලක්ම පැත්තකට දාලා මං රාජ් දිහා බැලුවා.

"උඹ ෂහනාස්ට කැමති නම් ආදරේ නම් දැන්මම කෙලින් තීරණයක් ගනිං.. මද්දුත් ඒ ටික කිව්වා, උඹට ඇහුණනේ. තවත් ඒ කෙල්ලට විඳවන්න දෙන්නෙපා.. හැබැයි උඹේ හිතේ තාමත් ඉන්නෙ අංජලීව නම් ෂහීව මේ වෙලාවෙම අමතක කරලා දාපං.. තවත් ඉස්සරහට අංජලීගෙ පස්සෙන් ගිහින් වෙච්ච දේවල් හරි ගස්සගන්න හිතේ තියෙනව නම් ෂහී ගැන හිතනෙක නවත්තලා දාපං. තේරුණානේ විහඟ.. ෂහනාස් කියන්නෙ හුඟාක් හොඳ කෙල්ලෙක්. ඒකි සිය දිවි හානිකර ගන්නවා මට බලන්න බෑ.

හැබැයි.. අංජලී පස්සෙ ගිහින් අංජලී උඹට කෙයාර් කරන්නැතුව උඹට හලල දැම්මට පස්සෙ උඹ ආයෙත් අහනාස්ට ලංවෙන්න එපා. එහෙම කරොත් උඹ ඒ කරන්නෙ මහා කැත වැඩක්. ඒක හරියට අංජලී හම්බ නොවුණු නිසා ෂනීට ලංවුණා වගේ.."

කියාගෙන කියාගෙන ගිහිල්ලා රාජ් හයි ඇරියා. ඌ කියවගෙන ගියපු ඒවට මගේ ඇස්වලට කඳුළුත් ඇවිල්ල තිබුණා. උඹත් මට මෙහෙම කතා කරානෙ රාජ්.. උඹල හැම එකාටම පේන්නෙ මගේ වැරැද්දමද..?

"රාජ් කියපු ඒවට උඹ අවුල් වෙන්නෙපා පොඩී.. අපි දෙන්නාම උඹට හුඟාක් ආදරෙයි.. මේ පඹගාලෙ තවත් පැටලි පැටලි ඉන්නැතුව උඹ මේකෙන් ගොඩ එනව නම් අපි කොයි තරම් කැමතිද..? අපි ඉස්සර කොයි තරම් සන්තෝසෙන් හිටියද..? අපි කොයි තරම් හිනාවුණාද..? ඒව මතක් කරපං පාටිනර්.. මේ හැමදේම වෙනස් කරන්න පුළුවන් උඹට විතරයි.. ජීවිතේ ගැන ඔයිට වැඩිය ටිට එකකින් හිතපං.. ඇයි උඹ බලෙන් අවුල් වෙන්න හදන්නෙ.. ඕන ප්‍රශ්නෙකට උත්තරයක් තියෙනවා පොඩී.."

"අනිත්තෙක උඹ දන්නාවනෙ විහඟ.. ෂනී, නියාස් මැරී කරන්න හිටියෙ කියලත්.. වෙඩින් කාඩුත් ගහල.. ඒත් උඹ උං දෙන්න මැද්දටත් පැන්නා.. බලපං.. උඹ හින්දා ජීවිත කීයක් නැතිවෙලා යනවද කියලා.."

රාජ් කිව්ව දේ මගේ පපුව ඇතුළටම වැදුනා. හිතට තවත් මේ හැම දෙයක්ම දරාගෙන ඉන්න බෑ කියල මට තේරුණා. මගේ තීරණේ මොකක්ද කියල දැනගන්න වගේ මද්දුයි, රාජුයි මං දිහාම බලන් හිටියා. හිත හුඟාක් අසරණ වෙලා තිබ්බ වෙලාවක උණත් මං එක හිතින් තීරණයක් ගත්තා.

"ඔයාලා දෙන්නම කියපු දේවල් මං හොඳට අහන් හිටියා. ඒ වගේම මං තීරණේකුත් ගත්තා. මං ඒ තීරණේ වෙනස් කරන්නෙත් නෑ.."

මද්දුයි රාජුයි මූණෙන් මූණ බලාගනිද්දි මං කිව්වා.

"ඉස්සර වගේම මං තාමත් අංජලීට ආදරෙයි.. ඒ ආදරේ හින්දම මං ආයෙත් අංජලීව හම්බවෙන්න යනවා මද්දු අයියා.. මට අංජලීව අමතක කරන්න බෑ.. ෂහනාස්වත් හම්බවෙලා මං මගේ තීරණේ ගැන කියනවා.."

"උඹ ඔහොම හරි තීරණයක් ගත්තු එක ලොකු දෙයක් විහන.. ඒත් මං උඹට එක දෙයක් කියන්නම්.. ඇබිට බය ගැන කියන්න යන්න ඕන නෑ.. ඒක අනවශ්‍ය දෙයක්නේ.. ඒකෙන් ප්‍රශ්නෙ තවත් දිග්ගැස්සෙයි.. ෂහනාස්ව අමතකම කරල දාපං.."

රාජ් කියපු දේට මද්දු ඔලුව හෙලෙව්වා. ඔලුවේ තියෙන හැම ප්‍රශ්නයක්ම අතරින් මට ෂහනාස්ගෙ අහිංසක මූණ මැවිල පෙනුනා. ඇස් පුරවලා කඳුළු පුරවගෙන ඉන්න ඒ කෙල්ලව අමතක කරල දාන්න මුං කියන තරම් ලේසි නෑ කියනෙක මං දැනන් හිටියා. අනිත්තෙක ෂහනාස් මට කොයි තරම් ආදරේ කරනවද කියලත් මං දැනන් හිටියා. ඒත්.. ඒත්.. තවත් දුරට මේ දේවල් ඇදගෙන ගියොත් අර මද්දු කිව්ව වගේ කපලා කියන්න වෙන්නෙ මිනී වලවල් තමයි. ඒක හින්ද අමාරුවෙන් වුණත් මේ ගත්තු තීරණේ උඩ ජීවිතේ අරගෙන යනව කියල මං හිතාගත්තා. හැම දෙයක්ම වෙන්නෙ මගේ තීරණේ අනුව කියල මද්දු කිව්වත් අංජලී මං ගැන හිතන විදිය අනුව මේ හැම දෙයක්ම වෙනස් වේවි කියල මට හිතුණා.

* * * * *

"දැන් ප්‍රශ්නෙ තියෙන්නෙ.. උඹ අංජලීව හම්බවෙන්න යන්නෙ කොහෙටද කියලයි.. අනික උඹ හිතනවද උඹත් එක්ක අංජලී කතා කරාවි කියලා.."

හැම දෙයක්ම හිතේගුලි කරගෙන අංජලී හම්බවෙන්න යන්න හදද්දි රාජ් ඇහුවෙ හොඳ ප්‍රශ්නයක්.

"කතා කරන නොකරන එක එයාගෙ වැඩක් රාජ්. මේක මගෙ ජීවිතේ ගැන ප්‍රශ්නයක්. මගේ අනාගතේ ගැන ප්‍රශ්නයක්. ඒක නිසා මං එයාව හම්බවෙන්නම ඕන. මට හරියටම දැනගන්න ඕන අංජලී මාව එයාගෙ ලෝකෙන් ඈත් කරලම දාලද කියලා. එයාට මහ හුහාක් ලංවෙලා ඉඳපු මාව එකපාරටම හලල දාන්න තරම් පිටි එකක් තිබුණද කියල.. මං යනවා රාජ්..."

"උඹත්තෙක්ක මට එන්න එපා කියන හන්ද මං එන්නෙ නෑ.. හැම දෙයක්ම හොඳට විසඳෙන්න කියල මං උඹට විෂ් කරනවා.. හවස එනකොට හිනා මූණත් අරන් වරෙන්.. උඹේ හිනාව අපිට හුඟාක් වටිනවා.."

රාජ්ගෙ වචන හිත ඇතුලෙ තියාගෙන මං ටිකක් වෙලා කල්පනා කරා. පහුගිය කාලෙ වෙච්ච දේවල් එකින් එක මගේ හිතේ චිත්‍රපටියක රූප වගේ මැවෙන්න ගත්තා. අංජලී සුදු පාට සාරියක් ඇඳගෙන මගේ බයික් එක ඉස්සරහට පැනපු තැන ඉඳල මගේ හිත කෑලි කෑලිවලට කඩල දාපු තැනට එනකම් හැම දෙයක්ම මට මතක් වුණා. කහපුඩුව පාර දිගේ ඇවිත් අංජලීගෙ ගෙදර ළංවෙද්දි මගේ පපුව හෙමින් සීරුවෙ ගැස්ම වැඩිකරා. හිත ඇතුලෙ තිබ්බ ප්‍රිටි එකත් ඩිංගෙන් ඩිංග දියවෙන්න පටන් අරන් තිබුණා. ගෙදර කවුරු ඉඳියිද දන්නෙ නෑ.. අම්මල, තාත්තල, නිශාන්ල හිටියොත් හෙම ඇඳගෙන තමයි නාන්න වෙන්නෙ.. ඒත්

කරන්න දෙයක් නෑ.. ජීවිතේ කියන්නෙ අපි ඉල්ලන දේ දෙන දෙයක් නෙමේනේ.. යකඩ ගේට්ටුවෙ කොක්කක් පන්නගෙන මං ඉස්සරහ දොර ළඟට ආවා. කිසිම හැල හොල්මනක් නෑ. ගෙදර කවුරුවත් නැතුවවත්ද..? බෙල් එක ඔබල ටිකක් වෙලා යද්දි ඉස්සරහ දොර හෙමින් සීරුවෙ ඇරුණා. හිතේ තිබ්බ හැම හැඟීමක්ම පැත්තකට දාලා මං ඒ දිහා බලන් හිටියා. ඇරුණු දොරින් එළියට ආවෙ අංජලී.

"ම.. මං කරදරයක් කරන්න නෙමෙයි ආවෙ.. ම.. මට ඔයත් එක්ක ඩිංගක් කතා කරන්න පුළුවන්ද උංගි.."

අංජලීගෙ මූණෙ කිසිම හැඟීමක් තිබුණෙ නෑ. මං මගේ ජීවිතේටත් වැඩිය ආදරේ කරපු පුංචි කෙල්ල මාව අඳුනන්නෙ නෑ වගේ හිටගෙන හිටියා. මගේ අහිංසක ලෝකෙ ඉස්සරහ ආදරය කියන අකුරු හතර ලියපු දඟ මල්ල මං දිහා නොබල බිම බලාගෙන හිටියා. අනේ දෙයියනේ අඳුනන්නෙ නැති ඈයො දෙන්නෙක් වගේ මෙහෙම ඈත්වෙලා ඉන්න තරම් අපිට මොකද වුණේ අංජලී..?

"ඔයා එක වචනයක් හරි කතා කරාවි කියන බලාපොරොත්තුවෙන් මං අද ආවෙ උංගි.. ඒත් මට පේන්නෙ ඒ දේත් වෙන්නෙ නෑ වගේ. ඔයා හිතන තරම් වැරැද්දක් මං ඔයාට කරේ නෑ. ඔයා ඒකවත් තේරුම් ගන්න.."

මං එහෙම කිව්වහම අංජලී එකපාරටම මං දිහා බැලුවා. ඒ ලස්සන ඇස්වල තිබ්බෙ අමුතුම බැල්මක්. ඇත්තමයි.. මගේ ගැන බිංදු මාත්‍රයකවත් ආදරයක් ඒ ඇස්වල තිබ්බෙ නෑ.

"මං හිතන තරම් වැරැද්දක් කරේ නැත්නම් ඔයා කොහොම වැරැද්දක්ද මට කෙරුවෙ.. ආ.. චිහන.."

අංජලි එක පාරටම මගෙන් ඇහුවා. මාව ගැස්සිලා ගියා. අහිංසක හිතක් තිබ්බ ඔයාට මේ තරම් නපුරු වෙන්න බෑ දෙයියනේ..

"කොහොම වැරැද්දක්වත් මං ඔයාට කෙරුවෙ නෑ. ඇත්තමයි.. උංගි.. ම.. මට ඔයාව අමතක කරන්න බෑ.. මං එදා ඔයාටයි ක්‍රිෂාන්ටයි විෂ් කරලත් අදත් ආවෙ ඒකයි.. මට මෙහෙම කරන්නෙපා උංගි.. ඇයි මාව මේ තරම් අසරණ කරන්නෙ..? ම.. මට ඔයා නැතුව බෑ.. මට ඔයා නැතුව බෑ.."

පිස්සෙක් වගේ මං කෑගහගෙන ගියා. අංජලිගෙ මූණත් වෙනස් වුණා. බාගෙට ඇරල තිබ්බ දොර හොඳටම ඇරල එයා මං දිහා බැලුවා.

"එන්න විනත.. ගේ ඇතුළට.. අපි වාඩිවෙලා කතා කරමු.. තවත් මේක ඇදි ඇදී ගෙනියන්න ඕනා නෑනේ.. අද ගෙදර කවුරුවත් ඇත්තෙත් නෑ.. අපි මේක අදින් බේරගනිමු.."

රූකඩයක් වගේ මං අංජලීගෙ පස්සෙන් ගේ ඇතුළට ගිහින් වාඩිවුණා. මගේ ඉස්සරහම පුටුවෙ වාඩිවුණු අංජලි ලොකු හුස්මක් පිට කරල , කතාව පටන් ගත්තා. ඒ හැම සුන්දර ඉරියව්වක්ම වෙව්ලන. හිතෙන් බලන් ඉන්නව ඇරෙන්න මට වෙන කරන්න දෙයක් තිබුණෙ නෑ.

"ම.. මට ඉස්සෙල්ලම කියන්න.. ඔයා මගෙන් මොනවද බලාපොරොත්තුවෙන්නෙ කියලා..?"

අංජලී මගේ මූණටම එබුණා.

"බලාපොරොත්තු වෙන්නෙ මොකක්ද කියල මං ඔයාට කිව්වෙ උංගි.. මට ඕන ඔයාව.. මට ඔයා නැතුව බෑ.. මං කොයි තරම් විඳවනාවද කියල ඔයා දන්නෑ උංගි.."

"ඔයා විතරක් නෙමේ මාත් විඳවනවා විහඟ.. මොකද මං හිතන තරම් ලේසියෙන් මට ඔයාව අමතක කරන්න බෑ.. ඒත් මං කොහොම හරි ඒ දේ කරනවා.."

"ඇං.. ඇංගී.."

"ඔව් විහඟ.. ඔයා ගැන මගෙ හිතේ තිබ්බ විශ්වාසෙ ඔයා සම්පූර්ණයෙන්ම කඩල දැම්මා. මං ඔයාට ආදරේ කරපු හැටි ගැන ආයෙ මතක් කරන්න ඕනෙ නෑ.. මං ඔයාට කොයි තරම් ආදරේ කළාද..? ඔයා ෂහනාස් එක්ක එකතුවෙලා මගේ අහිංසක බලාපොරොත්තුවලට පයින් ගැහුවා. එහෙම නේද විහඟ..?"

"ෂහනාස් එක්ක මගේ අෆෙයාර් එකක් නෑ අංජලී.. දෙයියන්ගෙ නාමෙට මං කියන දේ අහන්න.. ෂහනාසුත් ඔයාට කිව්වා අපි අතරෙ අෆෙයාර් එකක් නෑ කියලා. එහෙම තියෙද්දිත් ඇයි මට මෙහෙම රිද්දන්නෙ..? මං ගැන ඔයාගෙ හිතේ ඩිංගක්වත් ආදරයක් නැද්ද ඇංගී..?"

හිතේ තියෙන දේවල් එක පොකුරකට ගොනු කර ගන්න මං හැදුවත් ඒ දේ හරි ගියේ නෑ. හැමදේම අවුල්වෙලා තිබුණා. මං අහපු ප්‍රශ්නෙට අංජලී දෙන උත්තරේ මොකක්ද කියල දැන ගන්න ලොකු ඕනකමක් මට තිබුණා. ඒකයි මං අංජලීගෙ මූණ දිහාම බලන් හිටියෙ.

"නෑ..."

ඒ තනි වචනෙ තනි අකුරෙ හැඩකාර උත්තරේ අංජලීගෙ කටින් පිටවුණේ හුඟාක් වෙලා ගියාට පස්සෙ. මිනී පෙට්ටි සිය දහස් ගානක බර මගේ පපුව උඩට දැනෙද්දි මං මෙච්චර වෙලා ඉඳගෙන හිටපු ආදර ලෝකෙන් බිමට ඇදගෙන වැටුණා. හරියටම

ඉලක්කෙ බලල පපුව මැද්දටම පිහියකින් ඇන්න වගේ දෙයක් අංජලී කරේ. මගේ හිතේ හුඟක්ම රිදෙන තැනට එයා ඇසිඩ් දාලා තිබුණා. ඒත්.. ඒත්.. වැදිච්ච පාරෙ සැර මං හුඟාක් අමාරුවෙන් ඉවසු ගත්තා.

"ඔයා හොඳ උත්තරයක් මට දුන්නා උංගි.. මට ආදරයක් නෑ කියල කියන්නෙ ඔයා ක්‍රිශාන්ව බඳිනව කියන එක නේද..? එතකොට මට මොනවද වෙන්නෙ උංගි..?"

හිත කොයි තරම් කඩාගෙන වැටුණත් කෙලින් ඉන්න මං උත්සාහ ගත්තා. මිනිහෙකුට විඳින්න මීටත් වැඩිය වේදනාවක් නම් නෑ.

"ඔයාට ෂහනාස් ඉන්නවනෙ විහඟ.."

හිතක් පපුවක් නෑ වගේ අංජලී කිව්වා. මගේ හිත ගැන මීටත් වැඩිය අංජලිට තේරුම් කරල දෙන්න මට පුළුවන්කමක් තිබුණෙ නෑ. ඒ කියන්නෙ මං පරාද වුණා. විහඟ වික්‍රමසිංහ කියන හැමදේටම හිනාවෙලා ඉන්න පුංචි කොල්ලා පැරදුණා.

"ෂහනාස් මගෙ නෙමෙයි අංජලී.. ඔයා දන්නැති හුඟාක් දේවල් තියෙනවා.. සමහරවිට ඔයාටයි ක්‍රිශාන්ටයි කලින් ෂහනාසුයි නියාසුයි මැරි කරාවි.."

මං එහෙම කිව්වහම අංජලීගෙ ඇස් දෙක උඩ ගියා. එයාට ඒක අලුත් ආරංචියක් වගේ.

"ෂහනාසුයි නියාසුයි..?"

"ඔව් උංගි.. ෂහනාස්ගෙ ප්‍රශ්න වලට මං එයාට උදව් කරා.. මායි ෂහනාසුයි හුඟාක් ලංවෙලා හිටියා. ඒක ඇත්ත.. ඒත් ඒ හැම

වෙලාවකදීම මං ඔයා ගැන තමයි කියෙව්වෙ.. සහනාසුත් අපේ ගෙදර ආවා ගියා. ඔයා වගේම. ඒත්, ඒත්.. මගේ අහිංසක අම්මා විතරයි හරියටම දැනන් හිටියෙ මගේ හිතේ ඉන්නෙ කවුද කියලා. ඔයා දන්නෑ උංගී.. අම්මා ඊයෙත් මගෙන් ඇහුවා ඔයා ගැන.. ඇත්තමයි මට කියන්න දෙයක් තිබුණේ නෑ.. හැම පැත්තකින්ම අසරණවෙලා තනිවෙලා ඉන්න මං වගේ කාලකණ්ණියෙකුට කරන්න දේකුත් නෑ උංගී.."

මෙච්චර වෙලා ඇන්ද උඩ තිබ්බ අත් දෙක අරන් අංජලී උකුල ඇතුලෙ ඔබා ගත්තා. ඒ මූණට ලොකු කල්පනාවක් ඇවිල්ලා තිබුණා.

"ම.. මට ආදරේ කරන්නෙ නෑ.. මං ගැන හිතන්නෙ නෑ කියල ඔයා නුහාක් හොඳට මට වටහල දුන්නා. ඇත්තමයි.. මං ආයෙ ඔයාට කරදර කරන්නෙ නෑ. ඒක පොරොන්දුවක්.. මගේ ජීවිතේ නුහාක්ම ලස්සන කාලෙ ගෙවිල ගියේ ඔයත්තෙක්ක.. ආයෙම ඒ වගේ කාලයක් එන්නෑ කියල මං දන්නවා.. අපි නුහාක් සතුටින් හිටියා.. ඒ කාලෙ හරිම ලස්සනයි උංගී.. ඒත්.. ඒත් ඔයා කියන විදියට ඒ හැමදේම වෙනස් කළේ මං.. ඔයාට රිදෙව්වෙට ඔයාට දුකක් දුන්නට මං විඳවන්නත් ඕන නේ උංගී.. ඔයා හිතන විදියට හැමදේම වේවි.."

මං කියවගෙන කියවගෙන ගියත් අංජලී වචනයක්වත් කතා කොරුවෙ නෑ. එයා මං කියන ඒවා ලොකු ඕනෑකමකින් අහන් ඉන්නව කියල මට තේරුණා.

"ඔය හැම දෙයක් වගේම ඔයා මාව දකින්නත් කැමති නෑ කියල මං දන්නවා.. ඔයා ප්‍රාර්ථනා කරනවා වගේම මං ආයෙ අහම්බෙකින්වත් ඔය ඇස් ඉස්සරහට එන්නැතුව ඉන්නම්.. මේ

පව්කාර මූණ පේන්නැතුව තියෙන කොට ඔයාගෙ ජීවිතේ තවත් ලස්සන වෙයි.. මගෙන් වැරදි වුණා නම් මට සමාව දෙන්න උංගි.. මං ඉල්ලන්නෙ එච්චරයි.."

පුටුවෙන් නැගිටල මං අංජලීට ළංවුණා. ඒ ලස්සන ඇස්වල කඳුළු පිරිලා.. ඒත් හැමදේම ඉවර වුණා කියන සිතුවිල්ල මහා මේරු පර්වතේ වගේ මගේ හිත උඩම තිබුණා. කෑල්ලෙන් කෑල්ලට හිත කඩාගෙන වැටෙද්දි මූණට හිනාවක් ගන්න මං උත්සාහ ගත්තා. මැරෙන්න වැටිල හිටියත් විහඟ වික්‍රමසිංහ හිනාවෙලා ඉන්නවා.. ඒක කාටවත් වෙනස් කරන්න බෑ..

"මගෙන්නෙක්ක තරහා වෙන්නෙපා විහඟ.. ම.. මට කරන්න දෙයක් නෑ.. වෙන්න තිබ්බ විදියට මේ හැම දෙයක්ම වුණා කියල අපි හිතමු.. ඉන්න තැනක හොඳින් ඉන්න බලන්න විහඟ.. මාව නැතිවුණා කියල ජීවිතේ විනාශ කරගන්නෙපා.. එහෙම උනොත් ඒ දේ මටත් දරාගන්න බැරිවෙයි.."

අංජලී ඒ කිව්ව දේවල් මට ඇහුනේ හීනෙන් වගේ.

"මං ගැන එහෙම හිතන්නෙපා උංගි.. ඔයා හැමදාම සංතෝසෙන් ඉන්න.. මාත් හිනාවෙලා ඉන්නම්.. වෙච්ච දේවල් අමතක කරල දාල මගෙන්නෙක්ක මෙහෙම හරි ඔයා කතා කරපු එක ලොකු දෙයක්නෙ.. ම.. මං.. ය.. යන්නම්.."

ඇස් දෙක උඩට කඳුළු ගංගාවක් ගලන් එද්දි මං අංජලීට කිව්වා. ජීවිතයෙ අන්තිම පාරටත් මට අහිමිවෙලා යන ඒ ලස්සන මූණ දිහා මං බැලුවා. මොකක්දෝ කියාගන්න බැරි මහා හිස් බවකින් මුළු හිතම දෙදරවද්දි මං අංජලීගෙ ගෙයින් එළියට ආවා. හදවත කෑලි කෑලිවලට කඩල දාන තරම් ලොකු දුකක් පෙරලී

පෙරලි එද්දි මං ආපහු හැරිල බැලුවෙ නෑ. වෙන්න තියෙන ලොකුම දෙයත් උනාට පස්සෙ තවත් මොන දේවල් වෙන්නද කියල මට හිතුණා.

හිත පුරාම ආදරෙන් ඉඳපු පුංචි සුරංගනාවියක් මැරුණා වගේ මහා වේදනාවකින් මගේ හිත හිරි වැටිලා තිබුණා. ආයෙ කවදාවත් පණ දෙන්න බැරි මල් හීනයක් ළඟ හැමදාම අඬ අඬා ඉන්න පුංචි කොල්ලෙක් වගේ මාත් තනිවුණා. ජීවිතයෙ ඉස්සෙල්ලම වතාවට මහා ආදරේකින් ළංකර ගත්තු කෙල්ල හිතාගන්නවත් බැරි විදියට මෙහෙම අතෑරල දාලා ගියහම ජීවිතය කඩාගෙන වැටෙන එක ගැන ආයෙ අමුතුවෙන් කියන්න දෙයක් තිබුණෙ නෑ. අනිත්තෙක අංජලි හම්බවෙන්න යනකොට හිතේ තිබ්බ පුංචි බලාපොරොත්තුවත් මේ වෙනකොට නැත්තටම නැතිවෙලා ගියපු එකත්, මහා බරක් විදියට මට දැනුණා.

"විහඟ.."

අංජලීගෙ ගෙදරින් එළියට බැස්ස විතරයි මගේ ඉස්සරහම හිටපු එකා දැකල මං හොල්මං වුණා.

"උඹ මොකද මෙහේ ආවෙ රාජ්..?"

"මං ආවෙ උඹ හින්දනෙ බං.. අපි යමු.."

රාජ් මගේ කරට අතක් දාගත්තා.. අංජලිත්තෙක්ක ගෙවිල ගියපු ලස්සන යටගියාව හිත ඉස්සරහ හීනාවෙද්දි හිත ඇතුලෙ තියෙන දුක් කන්දරාව හිර කරල තියන් ඉන්න මං උත්සාහ ගත්තා. වෙනද වගේ හිතේ තියෙන දුක ඇස්වලින් පිට කරල දාන්න මං හැදුවෙ නෑ. විදවනවා කියන්නෙ එක නෙමෙයිනේ.. මැරි මැරී ජීවත්වෙනවා කියන එකනේ..

"උනේ මොකක්ද කියලවත් උඹ අහන්නැද්ද රාජ්..?"

"මං දන්නවා විහඟ.. උඹ මෙතන්ට එන්නත් කලින් මං හැමදේම දන්නවා.."

රාජ් කිව්ව කතාවෙන් මං තවත් අවුල් වුණා. මූ කොහොමද ඒක දන්නෙ..?

"උ.. උඹ හැමදේම දන්නවා..?"

"ඔව් බං.. උඹව තනියෙන් අංජලී ගාවට එවන්න තරම් මාඩ් මද්දුයි මෝඩද විහඟ.. උඹ මෙහෙම එද්දි මං අංජලීට ෆෝන් කරා.."

සුරංගනා කතාවක් අහන් ඉන්න පුංචි එකෙක් වගේ මං රාජ් දිහා බලන් හිටියා. එතකොට මෙතන මම නොදන්න දේවලුත් වෙලා තියෙනවා.

"ඉතිං..?"

"මං ඒකිට එක දෙයයි කිව්වෙ.. ඒ උඹගෙ හිත රිද්දන්නෙපා කියල විතරයි. අංජලී මගෙන් ඇහුවා රාජ් කියන්නෙ මට මොනව කරන්නද කියලා.."

අංජලී ඒ ප්‍රශ්නෙම මගෙනුත් ඇහුවා නේද කියනෙක මට මතක් වුණා.

"මං කිව්වා, මං ඔයාට මුකුත් කියන්නෙ නෑ.. ඔයා කැමති තීරණයක් ගන්න.. ඒත් ඒ ගන්න තීරණේ මීට කලින් ඔයා ළඟ ඉඳපු කෙනෙකුට කියනකොට හිත රිදෙන්නැති වෙන්න තියෙන්න කියලා.. අංජලී ඒ වෙලාවෙ තමයි කිව්වෙ මගේ තීරණේ වෙනසක් නෑ කියලා.."

බස්යෙකට නැගල නුගේගොඩට එනකන්ම මායි රාජුයි වචනයක්වත් කතා කෙරුවෙ නෑ. අපි දෙන්නම හිටියෙ වෙන වෙන ලෝකවල තනිවෙලා වගේ. කල්ප කාලයක් හිත ඇතුලෙ රැකගෙන ඉඳපු රත්තරං ආදරයක් හොරු අරගෙන ගියා වගේ හැංගිලා ගිහින් තිබුණා. ඒත් මගේ හිතේ උතුර උතුරා තිබ්බ වේදනාව මං එළියට පෙන්නුවෙ නෑ. රාජ්ගෙ වීඩියෝ ෂොප් එකට ඇතුල් වුණාම මට දැනුණේ අමුතුම ලෝකෙකට ආවා වගේ. ෂොප් එකත් ටිකක් මොඩිෆයි කරල වගේ.

"දැන් නම් ෂොප් එක සීරාවටම තියෙනව රාජ්.."

"උඹ හුඟ දවසකින් ආවෙ නැහැනෙ විහඟ.. ඒකයි..."

"එහෙනම් රාජ් මං ගෙදර යන්නද..? උඹට වැඩත් තියෙනවනේ.."

ගෙදර යන්න කියල හිතාගෙන මං හැරුණා.

"එහෙම බෑ විහඟ.. උඹ අද මගෙත්තෙක්ක ඉන්න ඕන.. මට උඹත්තෙක්ක ටිකක් කතා කරන්නත් ඕන.. අනික උඹව මේ තත්වෙන් තනියම යවන්න මට බෑ.."

"ඇයි..?"

"ඇයි කියන්නෙ..? මීට කලින් උඹ පෙන්නුව ශිල්පීය නැටුම් මට මතකයිනේ.. ඒකයි.."

මං බීල පිස්සු නටපු එකත් රාජ් මතක් කරා. ඒත් බිව්වා කියලා මේ වේදනාවෙන් ගැලවීමක් නෑ කියනෙක මං දැනන් හිටියා. අරක්කු මට ඒ දේ ඔප්පු කරල පෙන්නලත් තිබුණා. ටික වෙලාවක් ගිහින් මායි රාජුයි එළියට ආවා. මේ වෙලාවෙ කඩේට කස්ටමර්ලා ටිකක් අඩුයි වගේ.

"උඹ දැන් මාවයි මද්දු අයියවයි දෙන්නවම මග අරිනව බං.. ඉස්සර වගේ නෙමේ.."

රාජ්ලගෙ ගෙදරට එන පාරට ඇවිත් රාජ් කිව්වා. මූ මේ පරණ තැටියක් ඇයි ආයෙත් අදින්න හදන්නෙ..?

"වෙච්ච දේවල් එක්ක මං හිතාවෙලා ඉන්නෙ කොහොමද රාජ්.. අංජලී මට මෙහෙම කරාවි කියල මං කවදාවත් හිතුවෙ නෑ.. එයා මට ආදරේ නෑ කියල මගේ මූණටම කිව්වා.."

මහා දුකක් ආයෙත් හිතට එබෙද්දි මං කිව්වා.

"ඒක අංජලීගෙ තීරණේනෙ මිහහ.. දැන් උඹේ තීරණේ මොකක්ද කියල මට කියපං.."

"වෙච්ච හැමදේටම වැඩිය මගෙ හිතට දුක දැනෙන එක දෙයක් තියෙනවා බං.. ඒ අංජලී මාව වැරදිකාරයෙක් කියල හිතන් ඉන්න එක.. එයා මට ආදරේ නෑ කිව්ව එක ඉවසගත්තා කියමු.. ඒත් වැරැද්දක් නොකරපු මං වැරදිකාරයෙක් වෙච්ච එක.."

"ඒ ගැන වැඩිය නොහිත ඉදපං.. හැමදේම හරි විදියට සිද්ධවෙයි.."

"නොහිත ඉන්න හිතක් තිබුණෙ නැත්තං හොදයි රාජ්.. මං හින්ද හැම එකාටම කරදරේ.. මෙහෙන් ශහනාසුත් දුක් විදිනවා.."

රාජ්ලගෙ ගෙට ළංවෙද්දි මං කිව්වා.

"ශහනාස් ගැන උඹ මොනවද හිතන්නෙ..?"

"මං මුකුත් හිතන්නෑ රාජ්.. අංජලීව මට නැතිවුණහම ශබී ළගට යන්න මං කැමති නෑ.. ඒක ඒ අහිංසක කෙල්ලට කරන අසාධාරණයක්.."

"උඹ මටද ඒ හින්ට් එක ගැහුවෙ විහඟ.."

රාජ් එක පාරටම මගේ අතකින් අල්ල ගත්තා.

"නෑ.. නෑ.. උඹ එදා කියපු දේවල් හරි.. අංජලී මට නැතිවෙනකොට මං ෂබීට ලංවෙනවා කියන්නෙ ඒක මහ නැහැ වැඩක්. ඒක ඒ කෙල්ලගෙ අහිංසක ආදරේ බාල්දු කිරීමක්. මං ඒ දේ කරන්නෑ රාජ්.. අංජලී කැමති මං විඳවනාවටනේ.. එයා කැමති විදියට ඒ දේවල් වෙයි.."

මං කිව්ව දේට රාජ් මුකුත් කිව්වෙ නෑ. මං ගෙට ඇතුල් වෙද්දිම අමානි අක්කගෙ මූණ හිනාවකින් පිරුණා.

"හාතේ.. විහඟ.. ඔයා මේ පැත්ත අමතක කරලම දාල නේද..? කොයි තරම් කාලෙකින්ද ඔයා මෙහෙට ආවෙ.."

හිතේ තිබ්බ කරදර හැම දෙයක්ම පැත්තකට දාලා මං මූණට හිනාවක් ගත්තා. වෙලා තියෙන දේවල් අමානි අක්කට කියල එයාගෙ හිතත් සවුත්තු කරන්න මට හිතුණෙ නෑ. විහඟ වික්‍රමසිංහ කියන්නෙ අනුන්ගෙ දුකත් බෙදාගන්න කොල්ලෙක්.

"මේ පැත්ත එහෙම ලේසියෙන් අමතක කරන්න බෑ අක්කෙ.. විහඟ කියන්නෙ කිසිම දෙයක් අමතක කරන මිනිහෙක් නොමෙයි.."

"ඒක නම් කිව්වෙ ලොකු තේරුමකට.. ඉන්නකො.. ෂබීයි මායි මුරුක්කු වගයක් හැදුවා. ඔයාටත් ගේන්නම්.."

මං මුකුත් කියන්නෙ නැතුව රාජ්ගෙ කාමරේට ගියා. කාමරෙත් කාලක් විතර විසිඩී පීසුයි, පෝස්ටර්වලිනුයි පිරිලා. මූ මේකෙ කොහොම නිදාගන්නවද මංදා.

"මොකද කාමරේ දැක්කහම උඹ අවුල් වුණේ..?"

රාජ් මං දිහාට හැරුණා.

"හැරෙන්නවත් ඉඩක් නෑනෙ ඩිං.."

මං එහෙම කියල කට ගන්නවත් හම්බවුණේ නෑ. ෂහනාස්ගෙ කටහඬ ඉස්සරහින් ඇහුණා.

"යකෝ මේකිට ඉව තියෙනවද මංදා.. වරෙන්.. වරෙන් සාලෙට.."

රාජ් මාවත් ඇදගෙන සාලෙට ආවා. සුදු පාට සල්වාර් එකක් ඇඳල හිටපු ෂහනාස් හිටියෙ මං දිහා බලාගෙන. මොට්ටුවකුත් නලල මැද්දෙන්ම තියාගෙන එයා හිනාවෙන ලස්සන ගැන කියන්න මං පින් කරල තිබුණෙ නෑ.

"මෙන්න පාට්නර්ට මුරුක්කු.. මමයි හැදුවෙ.."

හීන ලෝකෙකින් මිදුනා වගේ මං ගැස්සුනා. මුරුක්කු පුරවපු ලා නිල් පාට තැටියකුත් අතේ තියාගෙන ෂහනාස් මං ඉස්සරහම හිටියා. මුරුක්කුවක් ගන්න ගමන් මං වටපිට බැලුවා. රාජ්වත්, අමානි අක්කවත් පේන්න හිටියෙ නෑ. ඒ ඩිංගට මේ දෙන්නට මොකද වුණේ..?

"මුරුක්කු රසයිද පාට්නර්.."

"රසයි බෝතික්කියෙ.."

ෂබ්ගෙ මූණ උඩ තිබ්බ හිනාවට උඩින් තවත් හිනාවක් ඇඳුණා.'

"ඉස්.. තෑං.. අංජලීව හම්බවුණාද..?"

අර පිරිසිදු හිනාවම මූණෙ තියාගෙන ෂහනාස් ඇහුවා. අනේ පුංචි කෙල්ලේ.. මං කොහොමද ඔය ප්‍රශ්නෙට උත්තරයක් දෙන්නෙ..

"ම.. ඔව්.."

අංජලීත් එක්ක සිද්ධවුණ කතාබහ වචනයක් නෑරම මං ෂහනාස් එක්ක කිව්වා. එයාගෙ මූණට ඇවිල්ල තිබ්බෙ මොකක්දෝ අමනාපයක මං සලකුණු.

"එක තීරණයක් අරගෙන ඔයා අංජලිව හම්බවෙන්න ගිය එක හොඳයි විහඟ.. ඒත්.. ඒත්.. මට නම් තේරෙන්නෙ නෑ.. අංජලී මේ නටන්න හදන නාඩගම මොකක්ද කියලා. ඔයා මේ තරම් කියල ඉවරවෙලත් වැඩක් වුණේ නැහැනෙ. අනික අපි කී දෙනෙක් නම් කිව්වද..? අපි කොහොමද තවත් එයාට මේ ගැන පහදාදෙන්නෙ..? අංජලීට මේ තරම් මුරන්ඩු වෙන්න තරම් දෙයක් ඔයා කරල නෑ විහඟ.."

ෂහනාස් ඒ අන්තිමට කිව්ව කතාව නම් සහතික ඇත්ත කියල මට හිතුණා. ඒත් ඒ කතාව ඇත්ත වුණා කියලා මගේ ඔලුව උඩ තියෙන ප්‍රශ්නෙට උත්තර හම්බවෙන්නෙ නැහැනෙ.

"හැමදේම ඉස්සර තිබුණා වගේ හරි ගස්ස ගන්න පුළුවන් නම් හොඳයි ෂකී.. ඒත් දැන් කරන්න කිසිම දෙයක් නෑ.. ඒත් ඔයාට දෙයක් කියල යන්න ඕන.. එහෙම නොකළොත් උඩ ඉන්න දෙයියන්ගෙන් වත් මට සමාවක් නෑ.."

ෂහානස් එයාගෙ ලස්සන ඇස් ලොකු කරගෙන මං දිහා බලන් හිටියා. ඒ මූණෙ පිරිල තියෙන අහිංසක ආදරේ ගැන හිතට තේරෙද්දි මට දැනුණෙ මහා පසුතැවිල්ලක්.

"මං.. මං ආයෙ අංජලීගෙ පස්සෙන් යන්නෑ ෂබී.. මං ආයෙ යන්නෑ.. ඔය වුණා වගේ පුංචි සිද්ධියකට මාව එයාගෙ ජීවිතෙන් අයින් කරල දාන්න පුළුවන් නම් මං කොහොමද එයාව මැරී කරල ජීවත්වෙන්නෙ.. මං මේ තරම් පස්සෙන් ඇවිත් පුන පුනා කියද්දි මාව සත පහකට ගණන් ගන්නැත්නම් මට තව මොනවද ෂබී එයා කියන්නෙ..? ඒ කකුල් දෙක ගාව වැද වැටෙන්නාද..? නෑ ෂබී.. ආදරේ වෙනුවෙන් ඕන පරිත්‍යාගයක් කරන්න මට පුළුවන්. ඕන දුකක් විඳින්න පුළුවන්.. ඒත් ඒ වගේ දෙයක් මං කරන්නෙ නෑ.."

"ම්.. ඔයා කියන්න හැදුවෙ වෙන දෙයක් විහඟ.."

"ඔව්.. මං කතාවෙන් පිට පැන්නා.. මෙච්චර කාලෙකට මාව වෙන කෙනෙකුට අයිතියි කියල දැන දැනම ඔයා මගේ ළඟින් හිටියා.. එකම පාරක්වත් ඔයා මගේ හිත රිද්දුවෙ නෑ.. ඔයා නිතරම බැලුවෙ මගේ සතුට ගැන.. තවත් ටිකක් කල් ගියොත් ඔයාටත් මාව ඇණයක් වෙනවා.. ම්.. මං ඒ දේට කැමති නෑ.."

"ඔයා ඔය හිතන විදියෙ දෙයක් මං නිකංවත් ඔයාට කියල තියෙනවද විහඟ.. මට කියන්න මං මොනවද කරන්න ඕන කියලා.. ඔයා කියන ඕනම දේකට මං කැමතියි.. තවත් මෙව දිගින් දිගට ඇදී ඇදී යනව මට බලන් ඉන්න බෑ.."

"මගේ හිත හොඳටම තුවාල වෙලා ඉවරයි ෂබී.. මෙහේ ඉන්න ඉන්න මාව පිච්චෙනවා වැඩියි.. මේ හැමදේම දරාගන්නත් මට බෑ.. මං යනවා ෂබී.. මේ හැම දෙයක්ම දාල මං යනවා.."

මං කිව්ව දේ අදහගන්න බැරුව වගේ ෂහනාස් මං දිහා බලන් හිටියා.. ඒ ඇස්වලට එක පොදියට කඳුළු පිරුණා.

"ඒ.. එතකොට ම.. මං.. අ.. අනේ විහඟ.. ම.. මං.."

'මාව දාලා යන්නෙපා' කියල පුංචි එකෙක් කෑගහල කියනව වගේ ෂහනාස් මගේ අතේ එල්ලුණා. මේ වෙලා තියෙන දුක් කාන්දරාව උඩට තවත් දුකක් ගන්න මගේ හිත ඉඩ දුන්නෑ.. මං හෙමින් සීරුවේ ෂහනාස්ගෙ අත මගේ අතින් අයින් කරා.

"මට සමාවෙන්න ෂබී.. මගේ ජීවිතේ පැටලිලා තියෙන්නෙ.. ඔයාවත් ඒකට ඇදල ගන්න මට බෑ.. අමාරුවෙන් හරි අරගෙන තියෙන මේ තීරණේත් එක්ක මට යන්න දෙන්න.. මාව නවත්තන්න එපා.."

"ඔ.. ඔයා යන්නෙ කොහෙද කියලවත් මට කියන්න.."

"මං හැටන් යනවා ෂබී.. පුළුවන් තරම් කල් එහේ ඉන්නවා.. එහෙමත් බැරිවුණොත් මං කාන්තා ගාවට යනවා.."

"අ.. අනේ දෙයියනේ.."

ෂහනාස් අඬාගෙනම ලඟම තිබ්බ කාමරේ ඇතුලට දුවගෙන ගියා. මගේ හිතට දැනුණෙ මහා හිස් බවක්. ඒ හිස් බව හිතේ තියාගෙනම රාජ්ටවත් නොකියා මං ගෙදරින් එළියට බැස්සා.

* * * * *

"ඒ කියන්නෙ.. ඒ කියන්නෙ උඹ හැටන් යනවා.. ආ... පොඩි.. කියපං.. මටත් අහෙන්න ඒ ටික කියපං.."

වැඩ ඇරිල ආපු ගමන් මද්දු අයියා මාව කන්න හදනවා.. ෂුවර් එකට මූට රාජ් ෆෝන් කරන්න ඇති.. මං කියපුව ෂහනාස් රාජ්ට කියන්න ඇති.. මේක අදම පත්තුවුණ එකනෙ වැඩේ..

"ඇයි උඹ කතා කරන්නැත්තෙ පොඩී.. උඹ මක්කොම තීරණ ගන්නෙ උඹේ හිත හදාගන්න.. එතකොට උඹ නැති වුණහම තුවාල වෙන අපේ හිත් හදන්නෙ කවුද..?"

"ම.. මං වෙන මොනව කරන්නද මද්දු.. තවත් මෙහේ හිටියොත් මාව පිස්සෙක් වෙවි.."

"උඹට ආදරේ නැති කෙනෙක් පස්සෙ දුවන එක අන්තිම මෝඩකමක් පොඩී.. හිතනව නම් අන්න ඒ ගැන හිතපං.. උඹට ආදරේ කරන්නෑ, උඹ ගැන හිතන්නෑ කියල උඹේ මූණටම කිව්වට පස්සෙත් තවත් අංජලී ගැන උඹ හිතනව නම් උඹ කරන්නෙ උඹටම වල කපා ගන්නෙක.."

"අංජලී මගෙන් බලාපොරොත්තු වෙන්නෙත් ඒ දේනෙ.."

"බම්බුව.. මාව යකා කරන්නෙපා පොඩී.. උඹට ඕන ඕන විදියට නටන්න දුන්නා හොඳටම ඇති.. උඹ කරන්න යන්නෙ මහා පිස්සු වැඩ.. බලපං.. අර මුස්ලිම් ගර්ල් ආවා බැන්ක් එකට.. හොඳටම පව් පොඩී.."

"ෂහනාස්.."

"ඔව්.. අඩනවා හෝ ගාලා.. දෙයියන්ගෙ නාමෙට විහගට කොහේවත් යන්න දෙන්නෙපා කිව්වා. උඹ කිව්වලු උඹ ගැන අයිතියක් එයාට නැති කතාවක්. අයිති නැති වුණත් ඇත ඉඳන් හරි උඹ දිහා හැමදාකම බලන් ඉන්නවා කිව්වා.. මටත් කරන්න දෙයක් නෑ.. කෙල්ල මාව හම්බවෙන්න එන්න කලිනුත් හොඳටම අඬලා.. කතා කරගන්නවත් බෑ.."

මද්දු කිව්ව දෙයින් මගේ මොළුව තවත් අවුල් වුණා. දෙයියනේ

මේ ප්‍රශ්නෙට මට උත්තරයක් හම්බවෙන්නෙම නැද්ද..? ඇයි මට මේ තරම් කරදර කරන්නෙ..? හැම පැත්තක් ගැනම හිතද්දි මගේ ඔළුවත් රිදෙන්න ගත්තා.

"දැන් මද්දු මට මොනවද කරන්න කියන්නෙ..?"

"මං මුකුත් කියන්නෙ නෑ පොඩී.. ඒත් තව ඩිංගක් හිතපං.. කලින් වගේ ජීවිතේ අවුල් කරගන්න හදන්නෙපා.. උඹ හිතන්නෙ මෙහෙන් ඈත්වෙලා ගියහම හැමදේම හරියාවි කියලද..? ආ.. හැම ප්‍රශ්නයක්ම මෙහේ තියෙද්දි උඹ යනවා.. ඒක නොමේ පොඩී කරන්න තියෙන්නෙ.."

මද්දු අයියා එහෙම කියලා නැවැත්තුවා.

"එහෙනම්..?"

"අර ඉස්සර ඉඳපු පොඩී වෙයන්.. මං ගාව ඉඳපු පාට්නර් වෙයන්.. නිතරම හිනාවෙලා ඉඳපු විහඟ වික්‍රමසිංහ වෙයන්.. අංජලීට පේන්න මිනිහෙක් වගේ කෙලින් ඉඳපං.. කෙල්ලෙක් නැතිවුණා කියල ජීවිතෙන් පැරදිලා යන්නෙ මෝඩයො.. කොන්දක් නැති ඇයො.. උඹට සිරා කොන්දක් තියෙද්දි කොන්දක් නැති ඇයො කරන වැඩ කරන්නෙපා.. තේරුණානේ.."

තේරුණාදත් අහනවා.. පොල්ලකින් ගැහුවා වගේ මට ඒක නම් බොක්කටම වැදුනා. මද්දුගෙ කතාව කොයි තරම් ඇත්තද..

"අනිත්තෙකා මේ හැමදේටම මුල උඹ නිසං ඉන්නෙක.. ඉස්සරහට බැන්කින් එග්සෑම් එනවා.. අපි ලියමු.. මං සපෝර්ට් කරන්නම්.. ඊත් එක්කම පොඩී උඹට තව දෙයක් කියන්න ඕන.. ඒ දේ තේරුම් ගන්න බලපං.."

මද්දු අයියා වෙනද වගේ විහිලුවෙන් කතා කරේ නෑ. මිනිහ කතා කරපු හැම වචනෙකම මගේ ජීවිතේට ගන්න ඕන හුඟාක් දේවල් තිබුණා. හිතේ තිබ්බ හැමදේම පැත්තකට දාලා මං මද්දු අයියා දිහා බලන් හිටියෙ ඒකයි.

"ආදරේ ගැන කියනව නම් පොඩී.. අපි ආදරේ කරන අයට අපි පැලෙන්න ආදරේ කරල වැඩක් නෑ.. ආදරේ කරපං අපිට ආදරේ කරන අයට.."

මද්දු අයියා කාමරෙන් ගිහිල්ලා හුඟ වෙලා යනකනුත් මිනිහ කිව්ව ඒ කතාව මගේ ඔලුවෙ එහෙට මෙහෙට දුව දුව තිබ්බා.

* * * * *

මද්දු අයියත් එක්ක කතා කරාට පස්සෙ හැටන් යන එක ගැන දෙපාරක් හිතන්න මට සිද්ධ වුණා. ඒත් අංජලී මාව එයාගෙ ජීවිතෙන් ඈත් කරා කියල මතක් වෙද්දි මගේ හිත පිච්චිලා ගියා. කොයිම වෙලාවකවත් මට ඒ වේදනාවෙන් ඈත්වෙන්න පුළුවන් වුණේ නෑ. ඒත් තවත් දුරට නොලැබෙන දෙයක් පස්සෙ දුවන එකෙන් වෙන්නෙ මට මාවම නැතිවෙන එක කියලත් මං දැනන් හිටියා.

"පොඩී.. මං බැන්ක් එකට යනවා.."

අම්මා මගේ කාමරේට එබුණා.

"ඇයි අම්මා හදිසියේ.."

"බලන්නකො.. මද්දුට උදේ මතක් කරලත්, අර චෙක් දෙක ගෙදර දාලා ගිහින්නෙ.. මේ ළමයගෙ ඔලුවෙ මොනව තියෙනවද මංදා.."

අම්මා ගියාට පස්සෙ මුළු ගේම නිශ්ශබ්ද වුණා. මගෙ හිතට ඩිංගෙන් ඩිංග මහා පාලුවක් දැනෙන්න ගත්තා. ඒ පාලුව අස්සෙන් ෂහනාස්ගෙ හඳක් වගේ සුදු මූණ මට මැවිල පෙනුණා. හිතේ තියෙන හැමදේම අතෑරල දාල ෂබී ළඟට වෙලා ඉන්න තියෙනව නම් කියල මට එකපාරටම හිතුණා. පහුවෙච්ච කාලෙ දිහා බලපුවහම ෂහනාස් තරම් වෙන කවුරුවත් මාව තේරුම් ගත්තෙ නෑ කියල මගේ හිත කිව්වා. මේ හැම දුක් කන්දරාවම අමතක කරලා ෂහනාස් එක්ක ජීවිතේ ගෙනියන්න තියෙනව නම් කියල මට ඩිංගෙන් ඩිංග හිතෙන්න ගත්තා. ඒත් මං කොහොමද මේවා ෂබීට කියන්නෙ.. එයා ඉස්සරහම අංජලීව මට මින කියලත් මං කිව්වනෙ.. ආයෙත් මගේ මූලුව යකාගෙ කම්මල වගේ වුණා.

දෙයියනේ මට මේ ප්‍රශ්නෙනුත් ගැලවීමක් ඇත්තෙම නැද්ද..? හතර අතේ කල්පනා කර කර ඉන්නකොට තමයි ගෙදර බෙල් එක වදිනව ඇහුණෙ. මේ වෙලාවෙ කවුද..? අම්මට මොනව හරි අමතක වෙලා ආයෙත් ඇවිල්ල ඇති. එහෙම හිතාගෙන මං දොර ඇරියා. දෙයියනේ.. මගේ ඇස් ඉස්සරහ හිටිය කෙනා දැක්කහම මට දැනුණෙ මහා පුදුමයක්.. ෂහනාස්..

"ම.. මං ඔයා ගැන හිතුව විතරයි ෂබී.."

එයාව දැක්ක ගමන් මට කියවුණා. හඳක් වගේ සුදු මූණ උඩට ආවෙ හිත පිස්සු වට්ටන තරම් ආදරේ හිනෙන පුංචි හිනාවක්. ෂහනාස් මගේ අතින් අල්ල ගත්තා.

"ඒ කියන්නෙ පාට්නර් හැටන් යන්නෑ කියනෙකද..?"

ගේ ඇතුළට එන ගමන් ෂබී මගෙන් ඇහුවා. ඒ මූණ සන්තෝසෙන් පිරිලා.

"ඔව්.. ෂබී.. මං හැටන් යන්නෑ.. ඒත්.. ඒත්.."

"කියන්න.. මං අහන් ඉන්නෙ.."

"මේ පහුවෙච්ච දේවල් හැම දෙයක්ම අමතක කරල දාන්න මට ඔයාගෙ උදව් ඕන ෂබී.. මගේ ළඟින් ඉඳගෙන ඔයා ඒ දේ කරනව නේද..?"

මං අහපු දේට ෂහනාස්ගෙ නිල් ඇස්වලට කඳුළු පිරුණා.

"ඕ.. ඔයා වෙනුවෙන් මට මැරෙන්න උනත් පුළුවන් විහඟ.. ඔයා මහොම හරි මාව ලං කරගන්නෙක ගැන මට කොයි තරම් සතුටුද කියල ඔයා දන්නව නම්.."

"ම... මං දන්නවා ෂබී.. මං දන්නවා.. මාව දැක්ක දවසෙ ඉඳලා ඔයාගෙ හිතේ හිටියෙ මං විතරයි.. මං ඉස්සෙල්ල කිව්වෙ හැම දෙයක්ම අමතක කරන්න මට උදව්වෙන්න කියලා.. ඒ විතරක් මට මදි ෂබි.. අද ඉඳන් හැමදාටම ඔයා මගේ ළඟින් ඉන්න ඕන.. මට ඔයාව ඕන ෂබී.. මං ඔයාට ආදරෙයි ෂබී.. මං ඔයාට ආදරෙයි.."

මං ඒ ටික කිව්වෙ හුඟාක් හෙමීට. ෂහනාස් ගැස්සිල යනව මං හොඳටම දැක්කා. එයාගෙ රෝස පාට කම්මුල් දිගේ කඳුලු බිංදුවක් දෙකක් නිදහසේ ගලන් ගියා.

"අ.. අනේ දෙයියනේ.. ඔයාගෙන් ඔය ටික අහගන්න මං කොයි තරම් කාලයක් බලන් හිටියද විහඟ.. මට.. මට නම් මේක හීනයක් වගේ.."

ෂහනාස් මගේ ළඟට කුරුළු වුණා. කම්මුල දිගේ ගලන්

ගියපු කඳුළු බිංදුවක් පිහිදාල මං ඒ නළල මහා ආදරේකින් ඉඹ ගත්තා.

"හීනයක් නෙමේ ඈනී.. මං තීරණයක් ගත්තා.. මොන ප්‍රශ්නෙ ආවත් මං ඔයාව දාලා යන්නෑ.. අපි ඉක්මනට බඳිමු බෝනික්කියෙ.."

මං කිව්ව දේට ඈහනාය් මුකුත්ම කිව්වෙ නෑ.. ඒ සුදු මූණ මැද්දෙ තිබ්බෙ මහා ලොකු සතුටක්. ඒ සතුට හැමදාකම මේ අහිංසක කෙල්ලගෙ හිත උඩ තියෙනව කියල මං මගේ හිතට දිවුර ගත්තෙ ඈබීගෙ සුදු මූණ තවත් පාරක් ඉඹින ගමනුයි.

**- නිමි -**

LIMITED
ook
ankan e-community